321 වන කාණ්ඩය - 13 වන කලාපය | 2025 ඔක්තෝබර් 21වන අඟහරුවාදා
தொகுதி 321 - இல. 13 | 2025 ஒக்ரோபர் 21, செவ்வாய்க்கிழமை
Volume 321 - No. 13 | Tuesday, 21st October, 2025

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන [තීරුව 2121]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 2121]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 2125]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 2125]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2131-2171]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
"සුව සැරිය" ගිලන් රථ සේවාව සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු [තීරුව 2173]
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සපයන සේවාවන් වැඩිදියුණු කිරීම [තීරුව 2185]

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල ගැටලු:
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 2191]

වී සඳහා සාධාරණ අවම සහතික මිලක් නියම කිරීම සහ සහල් මිල නියාමනය කිරීම:
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2197]

ශ්‍රී ලංකා රේගුව විසින් රඳවාගෙන තිබෙන ශුද්ධ වූ කුර්ආනයේ දෙමළ පරිවර්තන නිදහස් කිරීම:
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2203]

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [තීරුව 2209]

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත:
නියෝග [තීරු 2210-2291]

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත:
තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරුව 2291]

කල්තැබීමේ යෝජනාව:
"දේශගුණික සමෘද්ධි සැලැස්ම" ක්‍රියාත්මක කිරීම [තීරු 2295-2308]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
மார்பகப் புற்றுநோய் தொடர்பிலான விழிப்புணர்வூட்டும் நிகழ்ச்சித்திட்டம் [ப: 2121]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 2121]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2125]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 2125]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2131-2171]

தனி அறிவித்தல் மூல வினா:
"சுவ செரிய" நோயாளர் காவு வண்டிச் சேவை மற்றும் சுகாதாரத் துறையிலுள்ள பிரச்சினைகள் [ப: 2173]
ஓய்வூதியத் திணைக்களத்தினால் அளிக்கப்படும் சேவைகளை மேம்படுத்தல் [ப: 2185]

கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகள்:
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 2191]

நெல்லுக்கான நியாயமான குறைந்தபட்ச உத்தரவாத விலை மற்றும் அரிசி விலையை ஒழுங்குறுத்தல்:
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 2197]

இலங்கை சுங்கத்தின் தடுப்பிலுள்ள புனித அல்-குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை விடுவித்தல்:
புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 2203]

பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2209]

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2210-2291]

தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்:
திருத்தப்பட்டவாறு, மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 2291]

ஒத்திவைப்புப் பிரேரணை:
"காலநிலை சுபிட்சத் திட்டத்தை" நடைமுறைப்படுத்தல் [ப: 2295-2308]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Awareness Programme on Breast Cancer [Col. 2121]

AUDITOR-GENERAL'S REPORT [Col. 2121]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2125]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2125]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2131-2171]

QUESTION BY PRIVATE NOTICE:
"Suwa Seriya" Ambulance Service and Issues in Health Sector [Col. 2173]
Improvement of Services Provided by Department of Pensions [Col. 2185]

ISSUES IN EDUCATION AND HIGHER EDUCATION SECTORS:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 2191]

ASSURANCE OF A FAIR MINIMUM GUARANTEED PRICE FOR PADDY AND REGULATION OF PRICE OF RICE:
Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 2197]

RELEASE OF TAMIL TRANSLATIONS OF HOLY QUAR'AN HELD BY SRI LANKA CUSTOMS:
Statement by Minister of Buddhasasana, Religious and Cultural Affairs [Col. 2203]

BETTING AND GAMING LEVY (AMENDMENT) BILL:
Read the First time [Col. 2209]

NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT:
Regulations [Cols. 2210-2291]

PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL:
Read the Third time, and passed as amended [Col. 2291]

ADJOURNMENT MOTION:
Implementation of the "Climate Prosperity Plan" [Cols. 2295-2308]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ඔක්තෝබර් 21වන අඟහරුවාදා
2025 ஒக்ரோபர் 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st October, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
மார்பகப் புற்றுநோய் தொடர்பிலான விழிப்புணர்வூட்டும் நிகழ்ச்சித்திட்டம்
AWARENESS PROGRAMME ON BREAST CANCER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ඔක්තෝබර් මාසයට යෙදෙන ගෝලීය පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීම" සංකේතවත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින්, 2025 ඔක්තෝබර් 22 දින, එනම් හෙට දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්හට පැළඳීම සඳහා ලාංඡනයක් බෙදා හැරීමට කටයුතු සූදානම් කර ඇත.

ඒ අනුව, හෙට දින පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරයන්ට එම ලාංඡනය මන්ත්‍රී පිවිසුමේ දී ලබා දීමට කටයුතු කරනු ලබන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

එසේම, එදින හැකි සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් රෝස පැහැති හෝ රෝස පැහැය සහිත ඇඳුමින් සැරසී පැමිණෙන ලෙස ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVI හා XVII කොටස්, තෙවැනි කාණ්ඩයේ XIV කොටස සහ නවවැනි කාණ්ඩයේ VIII කොටස මම ඉදිරිපත් කරමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Welfare Benefits Board for the year 2022.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Report of the General Sir John Kotelawala Defence University for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Annual Report of the University of Colombo Institute for Agro-Technology and Rural Sciences for the year 2023; and

(ii) Annual Report of the Postgraduate Institute of Agriculture of the University of Peradeniya for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Performance Reports of the Commission to Investigate Allegations of Bribery or Corruption for the Fourth Quarter of the year 2024 and the First and Second Quarters of the year 2025.

I move that these Reports be referred to the Committee on Constitutional Affairs.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Rules made by the Minister of Finance, Planning and Economic Development under Section 32 of the Excise Ordinance (Chapter 52) regarding the time period for payment of duty on the production of liquor and levying of fee on 05th September, 2025; and

(ii) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 relating to Special Commodity Levy and published in Gazette Extraordinary No. 2451/10 of 25th August. 2025.

I move that the Rules and the Order be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

- Order made by the Minister of Finance, Planning and Economic Development upon the recommendations of the Colombo Port City Economic Commission and the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary, No. 2445/02 of 14th July, 2025;
- Order made by the Minister of Finance, Planning and Economic Development upon the recommendations of the Colombo Port City Economic Commission and the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary, No. 2445/03 of 14th July, 2025;
- Order made by the Minister of Finance, Planning and Economic Development upon the recommendations of the Colombo Port City Economic Commission and the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary, No. 2445/04 of 14th July, 2025; and
- Order made by the Minister of Finance, Planning and Economic Development upon the recommendations of the Colombo Port City Economic Commission and the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary, No. 2445/05 of 14th July, 2025 - [The Hon. (Dr.) Harini Amarasuriya]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මිල නියම කිරීමේ කමිටුව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සියලු පරදු දරන්නන් විමසා සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන ඇතුළු වෙනත් සියලු අදාළ සාධක පිළිබඳ සැලකිල්ලට ගෙන 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118(4) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූලි 21 දිනැති අංක 2446/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2023 වර්ෂය සඳහා 1990 සුවසැරිය පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Health, Media and Women's Empowerment on -

(i) Annual Report of the State Pharmaceuticals Manufacturing Corporation of Sri Lanka for the year 2022;

(ii) Annual Report of the Sri Jayewardenepura General Hospital and Postgraduate Medical Training Centre for the year 2022;

(iii) Annual Report of the Associated Newspapers of Ceylon Limited for the year 2022; and

(iv) Annual Performance Report of the Department of Government Printing for the year 2024,

which were referred to the Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තා;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තා;

(iv) 2021 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(v) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)

Hon. Speaker, I present a petition from Mr. M. A. Nishshanka Bandara of No. B1/G2, Maradana Road, Colombo 10.

ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, මාඉටිපේ, ඒ.ජී. ගුණරත්න මාවත, අංක 33/1 යන ලිපිනයෙහි පදිංචි බර්ට් ඩන්කන් අබේවීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

[ගරු නලින් හේවගේ මහතා]

(2) බටපොල, දික්කැල, ශ්‍රී අනෝමදස්සි මාවත යන ලිපිනයෙහි පදිංචි ඩී.ඩී. ජනක අමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බී. ආරියවංශ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
ගරු කථානායකතුමනි, ගිනිගත්හේන, ගෝනාවල යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. පියල් වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු කථානායකතුමනි, ලුණුවිල, බණ්ඩිරිප්පුව, ගාලවත්ත, අංක 76/3 යන ලිපිනයෙහි පදිංචි ආර්.බී. ජනක සුරංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු කථානායකතුමනි, පන්නිපිටිය, මාබුල්ගොඩ, අංක 09 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.එස්.සී. කුමාරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු කථානායකතුමනි, යක්කල, පිටුවල්ගොඩ, අලුත්ගම, අංක 15/එල්/ඒ යන ලිපියෙහි පදිංචි ඊ.එච්.ඒ.කේ. රාමනායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු කථානායකතුමනි, මහරගම, යහන්පත් මාවත, නන්දන ගාර්ඩන්ස්, අංක 29 යන ලිපිනයෙහි පදිංචි එස්. ගුරුගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විපක්ෂය වෙනුවෙන්, විනාඩි දෙකක් ඇතුළත කරුණු දෙකක් පිළිබඳව පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 60වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසු විදේශ කටයුතු ඇමතිතුමා මේ සභාවට ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. ඊට පසුව මන්ත්‍රීවරු ගණනාවක් එතුමාගෙන් විවිධ ප්‍රශ්න නඟනකොට විපක්ෂය හැටියට අපි ඉල්ලීමක් කළා, ඒ පිළිබඳව විවාදයක් ලබා දෙන්න කියලා. විදේශ කටයුතු ඇමතිතුමා ඒකට බොහොම කැමති වෙලා එකඟත්වය පළ කළා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ඒ විවාදය සඳහා නොවැම්බර් මස 04වැනි දා ලබා දෙන්න පුළුවන් කියන එක තමයි එදා ප්‍රකාශ වුණේ. නමුත්, එදින එතුමාට කාර්යබහුල නිසා විවාදය සඳහා එම දිනය ලබා දෙන්න බැරි බව සඳහන් පණිවුඩයක් අපට ලැබී තිබෙනවා. මේ සතියේ පාර්ලිමේන්තු රැස්වීම්වලින් අනතුරුව පාර්ලිමේන්තුව ආපසු රැස් වෙන්නේ නොවැම්බර් 07වැනි දා අය වැය ඉදිරිපත් කරන දවසේ. දෙසැම්බර් 05වැනි දා දක්වාම තිබෙන්නේ අය වැය විවාදය. සාමාන්‍යයෙන් අය වැය විවාදයෙන් පසු මේ අවුරුද්දේ නැවත පාර්ලිමේන්තුව රැස් වෙන්නේ නැහැ. එම නිසා විදේශ කටයුතු ඇමතිතුමා මේ සභාවේ සිටින අවස්ථාවේදී මම අහනවා, අපට එම විවාදය සඳහා අවස්ථාවක් ලබා දෙන්න පුළුවන්ද කියලා. එහෙම බැරිම නම්, මේ තිබෙන තත්ත්වය යටතේ අය වැය විවාදයේදී විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට අදාළ කාරක සභා අවස්ථාවේදී වැඩිපුර පැය 2ක කාලයක් අරගෙන මේ ගැනත් සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු කථානායකතුමනි, ඇත්තටම ඒ පිළිබඳ විවාදයකට කාලය වෙන් කරන්න අපි සූදානම්. නොවැම්බර් 04වැනි දා ප්‍රශ්නය තිබෙන්නේ, වතිකානු විදේශ කටයුතු ඇමතිවරයා ශ්‍රී ලංකාවට පැමිණෙන එකයි. රජයයන් දෙක අතර ගිවිසුම් කිහිපයකටත් අපි එතුමාත් එක්ක එළඹෙන්න සූදානම් කරලා තිබෙනවා. එදිනට ක්‍රියාකාරකම් කිහිපයක් යෙදිලා තිබෙනවා. එම නිසා ඒ දිනය තමයි අපහසු තත්ත්වයක තිබෙන්නේ. ඔබතුමා යෝජනා කළ පරිදි අය වැය විවාදයේ අපේ අමාත්‍යාංශයට අදාළ කාරක සභා අවස්ථාවේදී කාල සීමාව පැය දෙකක් දීර්ඝ කරලා, එම විවාදය පවත්වමු. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හැබැයි, අපට දවසක විවාදයක් අවශ්‍යයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දවසක විවාදයක් අවශ්‍ය නම්, Parliamentary Business Committee එකේදී සාකච්ඡා කරලා, සුදුසු දිනයක් යොදා ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ආපසු Parliamentary Business Committee එකේදී කථා කරලා,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් අවශ්‍යයි. පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කළ කන්ටේනර් තුන්සිය ගණන සම්බන්ධයෙන් අපි විශේෂ කාරක සභාවක් ඉල්ලුවා. ඔබතුමා ඒ සඳහා එකඟත්වය පළ කළා. එම කාරක සභාවේ අපේ සංයුතිය කෙසේද යන්න පිළිබඳව ඔබතුමා නිවේදනය කරනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට අදාළ කණ්ඩායම නම් කරලා ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. රට පුරාම මේ දවස්වල අයහපත් කාලගුණ තත්ත්වයක් වාර්තා වෙනවා. මම නියෝජනය කරන ගාලු දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක ගංවතුර අවදානමකුත් පවතිනවා. ජනතාව මේ දිහා බලාගෙන ඉන්නවා. මේක ක්ෂණිකව කරන්න ඕනෑ වැඩක්. රජය ඒ වෙනුවෙන් කරන වැඩ පිළිවෙළ මොකක්ද? ඒ කටයුතු කඩිනම් කරලා, ඉක්මනින් ඒවාට සහන දෙන එක ගැන පැහැදිලි කරන්න කියාත් අපි ඉල්ලනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහාත්, මේකට සම්බන්ධ අනෙකුත් අමාත්‍යාංශ හරහාත් දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු හරහාත් ඒ අවශ්‍ය කටයුතු කඩිනමින් දියත් කරමින් පවතිනවා. සහන කටයුතු සහ ජනතාව මුදා ගැනීමේ කටයුතු සියල්ල සිදු වෙමින් පවතිනවා. ඇත්තටම තමන්ගේ ප්‍රදේශවල මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට හෝ අපේ මන්ත්‍රීවරුන්ට දැනුම් දුන්නොත් ඒ කටයුතු කඩිනම් කර ගන්න පහසු වේවි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මේ කාරණය කියන්න කැමැතියි. විශේෂයෙන්ම මේ ආපදා තත්ත්වය තුළ ආපදා කළමනාකරණ කමිටු හරහා සිදු විය යුතු සේවාව ඉක්මනින්ම ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. උදාහරණයක් හැටියට මම ඔබතුමාට මාතර දිස්ත්‍රික්කය ගැන කියන්නම්. ලවණ බාධක ප්‍රශ්නය නිසා ගොවිබිම් විශාල ප්‍රමාණයකට හානි සිදු වෙන්නට යනවා. ඒ වාගේම අපට වාර්තා වන ආකාරයට මේ ආපදා තත්ත්වය නිසා දැනටමත් මිනිස් ජීවිත තුනක් අහිමි වෙලා තිබෙනවා. අපි පසුගිය කාල වකවානුව තුළ දුටුවා, විශේෂයෙන් ඔබතුමන්ලාගේ රතු බලකාය වැනි බලකායන්වලින් වැඩසටහන් ක්‍රියාත්මක වනවා. ඒ වැඩසටහන්වලට අමතරව රජයෙනුත් වැඩ පිළිවෙළක් සූදානම් කරන්න. විපක්ෂයේ අපිත් සූදානම්, මේ අමාරු වෙලා තිබෙන මොහොතේදී විශේෂයෙන් මේ ආපදා කළමනාකරණ වැඩසටහනට අපේත් දායකත්වය ලබා දෙන්න.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඒ ඔක්කෝටම ඉස්සෙල්ලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේ ආපදා තත්ත්වය ඉදිරි දිනවල වර්ධනය වෙනවාය කියන තත්ත්වය තුළ ඒ සම්බන්ධයෙන් වන රජයේ වැඩ පිළිවෙළ, වැඩසටහන මොකක්ද කියන එක හෙට උදේ, එහෙම නැත්නම් අද දවස තුළම හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන් නම් එය ඉතා වැදගත් වෙනවා. මේක අපි මහජනතාව වෙනුවෙන් අහන ප්‍රශ්නයක්; ආපදාවට ලක් වුණු ජනතාව වෙනුවෙන් අහන ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න,- *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(අ) යටතේ මම ඔබතුමාගෙන් අවසරය ඉල්ලා සිටිනවා, අදහසක් ප්‍රකාශ කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විදේශ කටයුතු ඇමතිතුමා අපව නොමඟ යවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එය විවාදයට කාරණයක් නොවෙයි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පාර්ලිමේන්තුවේ විවාදයකදී දවස පුරාම ඇමතිතුමා ඉන්නේ නැහැ, ගරු කථානායකතුමනි. විවාදය පවත්වනවා, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය. එතුමාට විනාඩි 10ක හෝ 15ක උත්තරයක් දෙන්න තිබෙන්නේ. හැබැයි, ඒ කටයුත්තට,- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -725/2025- (2), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන: ඖෂධ මිලදී ගැනීම්
சுகாதார அமைச்சு மற்றும் இணைந்த நிறுவனங்கள்: மருந்துக் கொள்வனவு
MINISTRY OF HEALTH AND AFFILIATED INSTITUTIONS: PURCHASE OF MEDICINES

825/2025

2. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සහ එයට අනුබද්ධ ආයතන විසින් මිලදී ගනු ලබන ඖෂධ සඳහා වර්ෂයකට වියදම් කරනු ලබන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල, අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාර්ෂික ඖෂධ අවශ්‍යතාවයෙන් දේශීය වශයෙන් මිලදී ගනු ලබන ඖෂධ ප්‍රමාණය, විදේශීය වශයෙන් මිලදී ගනු ලබන ඖෂධ ප්‍රමාණය සහ ඒ සඳහා වැය වන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඖෂධ ඇණවුම් කිරීමේ කාල වකවානු තීරණය කිරීමේ ක්‍රමවේදය කවරේද;

(v) ඇණවුම් කරන ලද යම් ඖෂධයක් සැපයීම ප්‍රමාද වන්නේ නම්, ඊට වගකිවයුතු නිලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுகாதார அமைச்சு மற்றும் அதனோடு இணைந்த நிறுவனங்களால் கொள்வனவு செய்யப்படும் மருந்துகளுக்கு ஆண்டொன்றுக்குச் செலவிடப்படும் மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி தொகையானது, அமைச்சுக்கும் அதனோடு இணைந்த ஒவ்வொரு நிறுவனத்துக்கும் ஏற்ப வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) வருடாந்த மருந்துத் தேவைப்பாட்டில் உள்நாட்டில் கொள்வனவு செய்யப்படும் மருந்துகளின் அளவு, வெளிநாட்டிலிருந்து கொள்வனவு செய்யப்படும் மருந்துகளின் அளவு மற்றும் அவற்றுக்குச் செலவிடப்படும் பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மருந்துப் பொருட்களுக்கான அனுப்பல் கட்டளைகளை முன்வைக்கும் காலப்பகுதியைத் தீர்மானிக்கும் நடைமுறை யாது என்பதையும்;

(v) அனுப்பல் கட்டளையிடப்பட்ட ஏதேனும் மருந்துப் பொருட்களை விநியோகிப்பதில் தாமதம் ஏற்படுமாயின், அதற்குப் பொறுப்புக் கூறவேண்டிய உத்தியோகத்தர் யார் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House of the -

(i) total amount of money spent per year on medicines that are purchased by the Ministry of Health and its affiliated institutions;

(ii) breakdown of the said amount into the Ministry and its affiliated institutions, separately;

(iii) amount of medicines purchased locally and from foreign countries to fulfil the annual requirement of medicines and the amount of money that is spent on purchasing them, separately;

(iv) methodology under which the time frame for ordering medicines is determined; and

(v) officer who is responsible for any delay in the supply of a medicine that has been ordered?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සහ එයට අනුබද්ධ ආයතන විසින් ඖෂධ සඳහා 2025 වර්ෂයට අදාළව වියදම් කිරීමට අපේක්ෂිත මුළු මුදල - සෞඛ්‍ය අමාත්‍යාංශය	රුපියල් 183,800,000,000.00 (රුපියල් බිලියන 183.8)
දේශීය වෛද්‍ය අංශය විසින් පළාත් රෝහල් සඳහා	රුපියල් 200,000,000.00 (රුපියල් මිලියන 200)

(ii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට -SPC- 2024 වර්ෂයේ සත්‍ය වියදම රුපියල් බිලියන 48යි. 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රුපියල් බිලියන 90යි.

Health System Response Project (AIIB) යටතේ 2024 වර්ෂයේ වියදම තිබුණේ රුපියල් බිලියන 9.9යි. 2025 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනය රුපියල් බිලියන 7.7යි.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ -SPMC- 2024 වර්ෂයේ සත්‍ය වියදම රුපියල් බිලියන 26යි. මෙවර රුපියල් බිලියන 30යි.

වෛද්‍ය සැපයීම් අංශයේ - MSD එකේ - 2024 වර්ෂයේ සත්‍ය වියදම රුපියල් බිලියන 37යි. මෙවර රුපියල් බිලියන 37.8යි. මේ කියන්නේ, local manufacturersලාට දෙන මුදල.

රේඛීය අමාත්‍යාංශයට අදාළ රෝහල් සඳහා.

ඒ කියන්නේ ගරු මන්ත්‍රීතුමනි, local purchase කරන්න. ඇත්තටම මේක හදිසි තත්ත්වයක් සඳහා තමයි තිබෙන්නේ. ඒකට පසුගිය වසරේ රුපියල් බිලියන 21ක් වියදම් කරලා තිබුණා. නමුත් අපි මේ වසරේ රුපියල් බිලියන 20ක් ඇස්තමේන්තු කර තිබෙනවා.

දේශීය වෛද්‍ය අංශය සඳහා 2024 වර්ෂයේ වියදම, රුපියල් මිලියන 100යි. මෙවර රුපියල් මිලියන 200යි.

(iii) 2024/2025 වර්ෂය සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් හඳුන්වා දී ඇති ප්‍රමුඛතා ලැයිස්තුවට අදාළව අයිතම 862ක් රෝහල් සහ සෞඛ්‍ය ආයතනවල භාවිතය සඳහා අනුමත කර ඇත. එහිදී ඖෂධ 246ක් දේශීයව මිලදී ගැනීම සිදු කරනවා. මේ සඳහා 2025 වසර වෙනුවෙන් කැබිනට් අනුමැතියට අනුව රුපියල් බිලියන 46.72ක ඇණවුම් මේ වන විටත් ලබා දී ඒවා ලබා ගනිමින් පවතිනවා.

තවද, විදේශයෙන් ආනයනය කරනු ලබන අයිතම සංඛ්‍යාව 616ක් වන අතර, 2025 වසර සඳහා අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව -SPC- වෙත ඇණවුම් නිකුත් කර තිබෙනවා. ඒ ඇණවුම් නිකුත් කිරීම ජනවාරි 31වන දා වනකොට අවසන් කළා. ඒ අනුව මම කලින් කිව්වා වාගේ රුපියල් බිලියන 90ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි මේක මුලින් ඇස්තමේන්තු කළේ බිලියන 60ක් පමණ. මොකද, පසුගිය අවුරුද්දේ වියදම් කර තිබෙන්නේ දින 48ක් නිසා. නමුත්, බිලියන 60, දැන් බිලියන 90 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉදිරි මාස එකහමාර තුළ තවත් බිලියන 20ක් පමණ ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට පසුගිය අවුරුද්දට වඩා දෙගුණයකටත් වැඩි -සියයට 230කට වැඩි - මුදලක් අපි SPC එකට ලබා දෙනවා. ඒ නිසා තමයි local purchaseවලට වියදම් කරන මුදල් ප්‍රමාණය ටිකක් අඩු වෙලා තිබෙන්නේ.

(iv) වසර දෙකකට වරක් පවත්වනු ලබන වට්ටෝරු සමාලෝචන කමිටුව - Formulary Revision Committee එක - මඟින් නිර්දේශ කරන ලද අයිතම ලැයිස්තුවකට අදාළව විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්වත් සංගම්වලින් සැදුම්ලත් කමිටුවක් මඟින් ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කරනු ලැබේ.

ඒ අනුව තමයි මම කලින් කියපු ඖෂධ 862ක් ප්‍රමුඛතා ලැයිස්තුගත කරලා තිබෙන්නේ.

ඒ අනුව වර්ෂය අවසාන කාර්තුවේදී ආයතනවලින් ලබා ගන්නා වාර්ෂික ඇස්තමේන්තුව පදනම් කරගෙන ඉදිරි වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම මාස 11ක පොරොත්තු කාලයක් සහිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ආනයනික ඖෂධ ලබා ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඇණවුම් ලබා දීම සාමාන්‍ය ක්‍රමවේදය වෙනවා. අපි ජනවාරි 31 දිනට කලින් ඇණවුම් අරගෙන SPC එකට ලබා දෙනවා.

ඒ අනුව සෑම වර්ෂයකම ආයතනික ඇස්තමේන්තුව වර්ෂයේ හතරවන කාර්තුවේදී ලබාගෙන ඉදිරි වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම ආනයනික ඖෂධ සඳහා ඇණවුම් ලබා දීම කාලසටහනකට අනුව සිදු වෙනවා. එසේම දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඖෂධ සඳහා සෑම වර්ෂයකම තුන්වන කාර්තුව අවසානයේදී ඇණවුම් ලබා දීම වෛද්‍ය සැපයීම් අංශය මඟින් සිදු කරනු ලබනවා.

මේ වන විට ඒ ඇණවුම් ලබා දීම හරියට කරලා තිබෙන බවත්, ටෙන්ඩර් ක්‍රියාවලිය හරියට සිදු වෙමින් පවතින බවත් මට සහතික කරලා කියන්න පුළුවන්.

(v) ඔබතුමා අහන්නේ ඇණවුම් කරන ලද ඖෂධයක් ප්‍රමාද වීම ගැන. ඇණවුම් කළ ඖෂධයක් සැපයීම ප්‍රමාද වන්නේ නම්, එම ඇණවුමට අදාළ සැපයුම්කරු ඒ සඳහා වගකිව යුතු අතර, ඔහු සමඟ එළඹෙන ලද ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ලබයි. තවද, එම සැපයීම නියමිත කාලයට සිදු නොවීම නිසා ඇති වන තොග හිඟතාවට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ වෛද්‍ය සැපයීම් අංශය එක්ව ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් කටයුතු කරනවා.

ගරු මන්ත්‍රීතුමා, ඇණවුම හරියට දුන්නාම, ඇත්තටම ටෙන්ඩර් ක්‍රියාවලියට දින අපි tender guidelinesවලින් නියම කරලා තිබෙනවා නේ. එතකොට මෙහි යම් හෝ ප්‍රමාදයක් සිදු වෙනවා නම් සිදු වෙන්නේ තාක්ෂණික ඇගැයීම් කමිටුව - TEC එක - ගන්නා කාලය අනුව. මොකද, TEC එක අපට මේ කාලය කියලා නැහැ. එහි සිදුවන ක්‍රියාකාරිත්වය මඟින් තමයි ඒ කටයුතු සිදු වන්නේ. නමුත් එහිත් ප්‍රමාදය අපි අවම කරමින් යනවා. සැපයුම, ඇණවුම භාර දුන්නාට පස්සේ ඒක අපට ලැබීමේ ක්‍රියාවලියේදී ඇත්තටම විවිධ ප්‍රමාදයන් තිබීම සම්බන්ධව සැපයුම්කරු තමයි වග කියන්නට ඕනෑකම තිබෙන්නේ.

(ආ) පැන නොනඟී.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි, මේ අවුරුද්දේ වෙන් කරපු මුදල්වලින් කොච්චරක් දැනට ඉතුරු වෙලා තිබෙනවාද, දාපු tenderවලින් tender award නොකරපු ඒවා කීයක් තිබෙනවාද, ඒ හරහා බෙහෙත් මොන වාගේ ප්‍රමාණයක හිඟතාවක් තිබෙනවාද කියලා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් හොඳටම මේ ගැන දන්නවා. 2024 වර්ෂයේ ඇණවුම් කරලා 2024 වර්ෂයේ ටෙන්ඩර් කළා නම් තමයි මේ වසරේදී සැපයුම ලැබෙන්නේ. එතකොට 2026 වර්ෂය සඳහා ඇණවුම නියමිත පරිදි ජනවාරි 31ට කලින් MSD එකට ආපු නිසා, ඒ වාගේම ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරපු නිසා,- මම මේ සංඛ්‍යාලේඛන අද මගේ විවාදයේදී ඉදිරිපත් කරන්නම්- අපි සැලකිය යුතු මට්ටමකින් දැන් ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කර තිබෙනවා.

ඒ නිසා තමයි මම සංඛ්‍යාවක් හැටියට මෙය කියන්නේ. රුපියල් බිලියන 60ක් SPC එකට වෙන් කර දුන්නාට පසුව ඒක ප්‍රමාණවත් වුණේ නැති නිසා රුපියල් බිලියන 80 දක්වා වැඩි කළා. දැන් එය රුපියල් බිලියන 90 දක්වා වැඩි කරලායි තිබෙන්නේ. තවත් රුපියල් බිලියන 20ක් වියදම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අපට ලොකු විශ්වාසයක් තිබෙනවා, ලබන අවුරුද්දේ මාර්තු වනකොට අප place කරපු මේ ටෙන්ඩර් ප්‍රමාණයට අදාළ කරන තොග ප්‍රමාණ නියමිත පරිදි ලැබේවි කියා. ඒ නිසා ඒක ගැටලුවක් වෙන්නේ නැහැ. ඒ කාරණයට මම තව කොටසක් එකතු කරන්නම්. සමහර තැන්වල සමහර ටෙන්ඩර්වලට ඉදිරිපත් නොවීමේ ගැටලුවක් පැන නැඟී තිබෙන්නේ, සමහර ලියාපදිංචි සැපයුම්කරුවන් ඒ ටෙන්ඩර්වලට ඉදිරිපත් නොවීම හෝ ටෙන්ඩර් ක්‍රියාවලියේ ඇති වන ගැටලුවක් නිසා retender වීමයි. මම එහි ඉලක්කම ඉදිරිපත් කරන්නම්. ඒ හැරුණාම, සාමාන්‍ය පරිදි ඒ කටයුතු සිදු වෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ඔබතුමා කිව්වා අද විවාදයේදී කරුණු දක්වන්නම් කියලා. ගරු ඇමතිතුමනි, අද විවාදයට ගන්නා කාරණය සම්බන්ධව උසාවියේ නඩුවක් තිබෙනවා. Sri Lanka Chamber of the Pharmaceutical Industryහි CA/Writ/25/2025 කියන නඩු අංකය යටතේ නඩුවක් තිබෙනවා, උසාවියේ. එතකොට මේක විවාදයට ගන්නා එක සාධාරණද? ඒකට උත්තරයක් දෙන්න. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට අදාළව මම අහන්නේ මේකයි. ඔබතුමා දැන් කිව්වා වෙන් කරපු මුදල් ප්‍රමාණවත් නැති නිසා ඒ ටික වැඩි කර දෙන්නත් කටයුතු කළා කියලා. 2026 වර්ෂයට අදාළව සියලු ටෙන්ඩර් මේ අවුරුද්දේ සිදු කරමින් පවතිනවා. ලබන අවුරුද්දේ කිසිම බෙහෙත් හිඟයක් ඇති වෙන්නේ නැහැ කියලා ඔබතුමාට වගකීමෙන් කියන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
රුපියල් බිලියන 183.8ක් වෙන් කර තිබෙනවා සමස්තයක් හැටියට ඖෂධ සහ medical devices ගෙන්වාගන්න. අපට පුළුවන් ඒ රුපියල් බිලියන 183.8න් SPC එකට කොච්චරද, SPMC එකට කොච්චරද, local manufacturersලා සඳහා කොච්චරද, local purchase කරන්න කොච්චරද කියලා වෙන් කරගන්න සහ ඒවායේ යම් යම් වෙනස්කම් කරන්න.

නමුත් ඒ රුපියල් බිලියන 183.8 කියන එක ඖෂධ, ශල්‍ය උපකරණ සහ වෛද්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා භාණ්ඩාගාරය අප වෙනුවෙන් වෙන් කරලා තිබෙන මුදලයි. ඒක කොහේවත් අඩුවක් නිසා වෙන් කළා නොවෙයි. මොකද, කලින් සැරේ SPC එක අවුරුද්දටම රුපියල් බිලියන 48ක් නම් වැය කරලා තිබෙන්නේ, මම හිතනවා මේ වෙලාවේ රුපියල් බිලියන 110ක් ඕනෑ වෙයි කියලා එක සැරේ පුරෝකථනය කරගන්න බැහැ කියලා. ඒ අනුව අපි රුපියල් බිලියන 60ක් දුන්නා. රුපියල් බිලියන 80ක් දෙනවා, රුපියල් බිලියන 90ක් දෙනවා. රුපියල් බිලියන 110 දක්වා දෙනවා.

ඊළඟට ඔබතුමා අහපු ප්‍රශ්නය බොහොම වැදගත්, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා. ඒක තමයි, ලබන අවුරුද්දේ බෙහෙත් හිඟයක ප්‍රශ්නයක් නැතුව යන්න පුළුවන් වෙයිද කියන එක. මගේ බලාපොරොත්තුව ඒක තමයි. ඒ වෙනුවෙන් අපේ පැත්තෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කරනවා. හැබැයි අපි හිතමුකෝ, යම් විධියකට ඔක්කෝම පරීක්ෂා කරලා ගෙනෙන ලද ඖෂධයක purchases 5කට වඩා වැඩි ප්‍රමාණයක quality fail වුණා කියලා. ඒක කලින් කියන්න පුළුවන් දෙයක් නොවෙයි නේ. ලෝකයේ ඕනෑම රටක ඖෂධ සම්බන්ධ කාරණාවේදී එවැනි යම් යම් ගැටලු පැනනඟින්න පුළුවන්. සමහර විට සැපයුම්කරුවන්ගේ තිබෙන විවිධ කරුණු මත යම් යම් කාලවල සැපයුමේ ප්‍රශ්න පැනනඟින්න පුළුවන්. නමුත්, ඒවා කළමනාකරණය කර ගනිමින් පුළුවන් උපරිම ඖෂධ ප්‍රමාණයක් ලබා දීම අපි සහතික කරනවා. ඒක තමයි අපේ වගකීම.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමා, මෙය විවාදයට සුදුසුද කියන එක- *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම හිතනවා, ඔබතුමා ඒ කරුණු විවාදයේදී මතු කළා නම් හොඳයි කියලා. ඒ කියන්නේ, අපි මේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ සම්මත කරලා ජනතාවට අඩු මිලට ඖෂධ ලබා දීමේ කාර්යයට විපක්ෂයක් හැටියට ඔබතුමා එකඟයිද, එහෙම නැත්නම්, සමාගම්වලට ඕනෑ හැටියට, ඕනෑ ඕනෑ විධියට පාලන මිලක් නැතුව- *[බාධා කිරීමක්]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නැහැ, නැහැ, ඒක විවාද කරන එක සුදුසුයිද කියන එක විතරයි මම ඇහුවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක විවාද කරන්න පුළුවන්. ඒ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ සම්මත කරන්න පුළුවන්. සම්මත කළාට පස්සේ maximum ceiling price එකත්, maximum retail price එකත් අනුව NMRA එකට කටයුතු කරන්න බලය ලැබෙනවා. මේකට අවස්ථා කීපයකම උත්සාහ කළා. නමුත්, කලින් ආණ්ඩුවල හිටපු ඇමතිවරුන්ටත් මේක කරගන්න බැරි වුණේ ඔය කියන Chamber එක නඩු ගිහින් විවිධ අවස්ථාවල අධිකරණ නියෝග ලබා ගැනීම නිසා.

නමුත්, අධිකරණය ඒ අතුරු තහනම් නියෝගය අයින් කරලායි තිබෙන්නේ. ඔක්තෝබර් 30වන දා නඩු දිනයක්. නඩුව ඉදිරියට පැවැත්වුණාට අතුරු තහනම් නියෝගයක් නැහැ. ඒ අනුව මේ ගැසට් එක සම්මත කරන්න පුළුවන්. ඇත්තටම ඔබතුමන්ලාට අවශ්‍ය නම් කරුණු දක්වන්න පුළුවන්, මේ ගැසට් එක අවශ්‍ය නැහැ, මිල වැඩි කළාට කමක් නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -859/2025- (2), ගරු සුසන්ත කුමාර නවරත්න මහතා.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මන්මුනෙයි පත්තු ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිකරුවන්: දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදීම
மண்முனைப்பற்று பிரதேச செயலகப் பிரிவில் அரச காணிகளில் குடியிருப்போர்: அளிப்பு உறுதி அல்லது காணி அனுமதிப்பத்திரம்
OCCUPANTS OF STATE LANDS IN MANMUNAI PATTU DS DIVISION: PROVISION OF DEEDS OF GRANT OR LAND PERMITS

879/2025

4. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාල සීමාවේදී මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deeds of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permits) ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணியற்ற மக்கள் தங்களுக்குக் காணியொன்றைப் பெற்றுக்கொள்வதற்காக 2017.01.01 முதல் 2025.03.31 திகதி வரையான காலப்பகுதிக்குள் மண்முனைப்பற்று பிரதேச செயலகத்தில் விண்ணப்பித்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு அளிப்பு உறுதி (Deeds of Grant) அல்லது காணி அனுமதிப்பத்திரம் (Land permits) வழங்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகளில் குடியிருப்பவர்களில் பலருக்கு இன்றுவரை அளிப்பு உறுதி அல்லது காணி அனுமதிப்பத்திரம் வழங்கப்படாதுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு இதுவரை காணி உறுதி அல்லது காணிஅனுமதிப்பத்திரம் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that applications have been submitted to the Manmunai Pattu Divisional Secretariat by landless persons during the period from 01.01.2017 to 31.03.2025 with the aim of acquiring land;

(ii) if so, the number of such persons, their names and other relevant details;

(iii) whether such persons have been issued with Deeds of Grant or Land Permits; and

(iv) if so, the number of such persons along with their names and relevant details?

(b) Will he also inform this House -

(i) whether he is aware that the majority of the persons who have settled down in

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

government lands in the Manmunai Pattu Divisional Secretary's Division have not been issued with Deeds of Grant or Land Permits so far;

(ii) if so, the number of such persons, their names and other relevant details; and

(iii) the reasons for not issuing Deeds of Grant or Land Permits to the aforementioned persons so far?

(c) If not, why?

ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)

(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම 01හි සඳහන් වේ. දීර්ඝ ඇමුණුමක් වන බැවින් මා එය **සභාගත*** කරනවා.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) ඇමුණුම 02 යටතේ පහත පරිදි දක්වා ඇත.

ඇමුණුම 02

අංක 2008/4 දරන චක්‍රලේඛ අනුව ඉඩම් කච්චේරියේ ලියාපදිංචි කර බලපත්‍ර ලබාදීමට ඇති පුද්ගලයින් ගණන

1. සෙල්වා නගර් නැගෙනහිර

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	පාක්කියරාසා විජයරාසා	198021903521	8	කතිර්කාමතම්බි පාර, සෙල්වා නගර් නැගෙනහිර
2	සෙල්ලයියා නල්ලම්මා	506152631V	12	සෙල්වා නගර් නැගෙනහිර
3	සුලස්කාන්තන් ඩිලානි	200085102499	12	නාවලර් පාර, සෙල්වා නගර් නැගෙනහිර
4	අසෝකැආසා මනෝවිත්තියා	895902373V	38	කනපතිපිල්ලයි පාර, සෙල්වා නගර් නැගෙනහිර
5	සුරෙස්මහේස්වරන් සූරියකලා	718244625V	11	කාලි කෝවිල පාර, සෙල්වා නගර් නැගෙනහිර
6	සත්තියේස්වරන් පවතාරණි	200281904329	20	කනේසන් පාර, සෙල්වා නගර් නැගෙනහිර
7	සත්තියේස්වරන් කීර්තිකා	200465902722	20	කනේසන් පාර, සෙල්වා නගර් නැගෙනහිර
8	සෙල්ලතුරයි යෝකරාසා	621672843V	11	මධ්‍යයම පාර, සෙල්වා නගර් නැගෙනහිර
9	නඩරාසා ඉන්තිරලෙට්චුමි	728313323V	8	නාවලර් පාර, සෙල්වා නගර් නැගෙනහිර
10	තවරාසා වේතනායකි	675784051V	8	කන්නකි අම්මන් පාර, සෙල්වා නගර් නැගෙනහිර
11	යෝකේස්වරන් වරතරාජන්	766430856V	140	මධ්‍යයම පාර, සෙල්වා නගර් නැගෙනහිර
12	උශාන්තිනි සුතේශ්	87213273V	21	සෙල්වා නගර් නැගෙනහිර
14	නාගමනි තිරුවෙල්වි	196770101432	16	RDS පාර, 1 වැනි හරස්
15	සාමිත්තම්බි සිවානන්තම්	671221192V	80	ගංඉවුර පාර, ආරයම්පති
16	අරුලප්පු ජෙයක්කුමාරි	198270104230	8	මාර්ක්කාර් පාර, සෙල්වා නගර් නැගෙනහිර
17	සත්තියසේලන් සත්තියරූපන්	812742850V	20	තීර්තකරයි පාර, සෙල්වා නගර් නැගෙනහිර
18	තම්බියප්පා මහේස්වරි	537513586V	20	මධ්‍යයම පාර, සෙල්වා නගර් නැගෙනහිර
19	ක්‍රිශ්නපිල්ලයි ශ්‍රී රාමචන්ද්‍රන්	661962070V	10.37	කුමාරසාමි පාර, සෙල්වා නගර් නැගෙනහිර
20	නූහුත්තම්බි මුහම්මතු ඉශාක්	921563124V	9	72, ජායා පාර, නව පාලමුනයි
21	කාසිප්පිල්ලයි සරස්වති	675991766V	20	මධ්‍යයම පාර, සෙල්වා නගර් නැගෙනහිර
22	සෝමනාතන් කන්තසාමි	540706905V	10	කතිර්කාමතම්බි පාර, සෙල්වා නගර් නැගෙනහිර

2. සෙල්වා නගර්

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	සිරිතේවි පුවනේස්වරන්	816594588V	15	කොක්කට්ටිචෝලයි
2	පූපාලප්පිල්ලයි පාලච්චන්තිරන්	195729510037	40	විපුලානන්තපුරම්, පළුකාමම්
3	නිර්මලකුමාර් විනූසා	938074690V	48	ආරයම්පති 01
4	ප්‍රසාත් ජෙයන්තිනි	928340325V	14	මධ්‍යයම පාර, සෙල්වා නගර් නැගෙනහිර
5	මුහම්මතු යූසුප් කතේජ බීවි	698141433V	12.3	මයියවාඩි පාර, සෙල්වා නගර්
6	පෙරින්පරාසා ජයන්තන්	901903123V	10	සිවන් කෝවිල පාර, සෙල්වා නගර්

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

3. පාලමුනයි

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	මුහම්මතු මුහම්මතු හරීස්	199125900160	12.5	අක්සා පල්ලිවායල් පාර, පාලමුනයි
2	අබ්දුල් මජිතු සිත්ති ජුනෛතා	706183400V	8	පරිනාස් පාර, පාලමුනයි
3	කලන්තර් ලෙබ්බෙ මුහමට් පායිස්	681141871V	17	අබ්දුල් මජීඩ් පාර, පාලමුනයි
4	අබ්දුල් වාහිතු ජාරියා	197961703521	8	හිජ්රා පාර, පාලමුනයි 10
5	මුහම්මතු සරිපු මුහම්මතු ඉම්දාත්	200325013576	38	හිස්බුල්ලාහ් පාර, පාලමුනයි 11
6	මුහම්මතු සරිපු මුහම්මතු ඉස්පාක්	199926700649	34	හිස්බුල්ලාහ් පාර, පාලමුනයි 11

4. වෙඩර් කුඩියිරුප්පු

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	කණේස් විමලාතේවි	886224680V	10	මුහුදු වෙරළ පාර, තාළංකුඩා 03
2	පතන්මාතන් වක්සල	975190946V	20	කන්නකි අම්මන් කෝවිල පාර, තාළංකුඩා
3	යෝසප් අන්පුවිලි	828312294V	18	වීර්පත්තිරන් කෝවිල පාර, තාළංකුඩා 02
4	තම්බිරාසා කලාවති	886014660V	12	සමෘද්ධි බැංකුව පාර, වෙඩර් කුඩියිරුප්පු
5	සන්තිරමෝහන් පපිතා	906842955V	10	සමෘද්ධි බැංකුව පාර, වෙඩර් කුඩියිරුප්පු

5. ආරයම්පති නැගෙනහිර

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	කිරුපාකරන් වෙණ්ණිලා	196981910097	10	නවරෙට්නරාජා විද්‍යාලය පාර, ආරයම්පති නැගෙනහිර
2	පිරපාකරන් ඩිනෝතිනි	836671805V	15	මුහුදු වෙරළ පාර, ආරයම්පති නැගෙනහිර
3	මහාලිංගම් වේණිතා	878384326V	12	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
4	අමල්රාජ් ජාක්කුලින්	807780433V	10	නවරෙට්නරාජා විද්‍යාලය පාර, ආරයම්පති නැගෙනහිර
5	සෙල්ලත්තම්බි නල්ලම්මා	457641469V	11	ප්‍රධාන පාර, ආරයම්පති නැගෙනහිර

අංක 2008/4 දරන චක්‍රලේඛ අනුව ඉඩම් කච්චේරියි පැවැත්වීමට ඇති පුද්ගලයින් ගණන

1. ආරයම්පති නැගෙනහිර

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	මුරුහුප්පිල්ලයි වසන්ති	916881169V	15	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
2	රුබන් ප්‍රෙමසුන්තරි	876720965V	10	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
3	සාමිත්තම්බි තවරාසා	600490109V	25	පාරති පටුමග, ආරයම්පති නැගෙනහිර
4	මුහමතු ෆාරුක් මුහමතු නජ්මි	841893859V	15	ජාජියාර් පටුමග, කාත්තන්කුඩි
5	ප්‍රස්කාන්ත් කිරිජා	976493257V	11	මුහුදු වෙරළ පාර, ආරයම්පති නැගෙනහිර
6	කසේසපිල්ලයි සරස්වති	455016053V	20	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
7	තර්මලින්කම් නිර්මලා	196880803818	10	එහෙඩ් නිවාස සැලසුම් පාර, ආරයම්පති නැගෙනහිර
8	කුමාරවේල් කරුණයිරාසා	792912273V	10	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
9	තෙවනායගන් සිරිවිජයන්	8631436008V	15	මුහුදු වෙරළ පාර, ආරයම්පති නැගෙනහිර
10	නඩරාජා කිරිජා	957504094V	8	බහුකායී පාර, ආරයම්පති නැගෙනහිර
11	ඩයාන්ති ජෙයාකරන්	886464118V	9	පාරති පටුමග, ආරයම්පති නැගෙනහිර
12	සිවපාලන් සුකිර්තමලර්	66521217V	10	කිරාමකෝට්ටු පාර, ආරයම්පති නැගෙනහිර
13	සිවානන්තම් සන්තිරකුමාර්	801393578V	15	තීර්ත්තක්කරයි පාර, ආරයම්පති නැගෙනහිර
14	අලගරත්තිනම් යාලිනි	986611738V	13	පාරති පටුමග, ආරයම්පති නැගෙනහිර
15	තම්බිපිල්ලයි ප්‍රකලාවති	196984704238	10.91	නවරත්තිනරාසා පාර, ආරයම්පති නැගෙනහිර
16	සින්නත්තම්බි මල්ලිකා	197451202159	15	නවරත්තිනරාසා පාර, ආරයම්පති නැගෙනහිර
17	ඉරාජේන්තිරන් තර්මිරන්	791051762V	46	කනක්කුප්පිල්ලයි පාර, ආරයම්පති නැගෙනහිර
18	මුහම්මතු අසනාර් ශම්සාත් බෙහම්	815422910V	8	හයිරාත් පටුමග, ආරයම්පති නැගෙනහිර
19	S.P.මෆාසා	895814202V	10	ඉරාසා ආලිම් පාර, ආරයම්පති නැගෙනහිර
20	M.M.S.මුෆිතා	857961110V	10	ඉරාසා ආලිම් පාර, ආරයම්පති නැගෙනහිර
21	අහුමතු ලෙබ්බයි පවුසියා	726193800V	8	7වැනි හරස්, කර්බලා, ආරයම්පති නැගෙනහිර
22	මානික්කවාසකර් සසිකුමාර්	823453353V	18	මුහුදු වෙරළ පාර, ආරයම්පති නැගෙනහිර
23	මුහම්මතු කනිපා උම්මුසල්මා	587933497V	10	තිරුනීටෘක්කේණි, ආරයම්පති නැගෙනහිර
24	සිවසුප්පිරමනියම් තවමනි	637441531V	18	ප්‍රධාන පාර, ආරයම්පති නැගෙනහිර

[ගරු අරවින්ද සෙනරත් මහතා]

25	තවනේන්තිරන් ජෙයක්කුමාරි	736782952V	15	තිරුනීටෑක්කේණි, ආරයම්පති නැගෙනහිර
26	තෞෆීක් සිල්මියා	837633290V	8	කර්බලා පාර, ආරයම්පති නැගෙනහිර
27	සරිපුත්තම්බි රනායා උම්මා	197382303433	8	
28	රුහුල්ලා මුර්ශිනා	786981123V	8	
29	ජෙයරාජ් වික්ටර් ජෙගනාතන්	198524304341	45	ඤානසූරියම් චතුරශ්‍රය, මඩකලපුව
30	ජෙයරාජ් වික්ටෝරියා ජෙයමලර්	198753303275	30	සින්න ඌරණි, මඩකළපුව
31	වසන්තරාසා විසයරාසා	700450333V	40	තිරුනීටෑක්කේණි

2. පුතුක්කුඩියිරුප්පු දකුණ

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	සාමිත්තම්බි සාවිත්තිරි	197561002702	80	ජේ.පී.කනපතිපිල්ලයි, පුතුක්කුඩියිරුප්පු
2	තිරුනාවුක්කරශු ඩර්සිකා	200475800728	80	පුන්නයඩි පාර, පුතුක්කුඩියිරුප්පු 5
3	තර්සනා පොලුක්ශාන්	199865800379	80	ජේ.පී.කනපතිපිල්ලයි, පුතුක්කුඩියිරුප්පු
4	සාමිත්තම්බි ප්‍රේමරාණි	775441119V	80	ජේ.පී.කනපතිපිල්ලයි, පුතුක්කුඩියිරුප්පු

3. පුතුක්කුඩියිරුප්පු

අනු අංකය	සම්පූර්ණ නම	ජා.හැ.ප.අංකය	P	ලිපිනය
1	සින්නත්තම්බි විනායගමූර්ති	683062510V	20	ජේ.පී.කනපතිපිල්ලයි, පුතුක්කුඩියිරුප්පු
2	පොන්නම්බලම් කෝකිලවතනි	766271146V	20	පුන්නයඩි පාර

(iii) • රජයේ ඉඩම් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් අතරින් යම් පිරිසක් ඉඩම් කච්චේරි සඳහා සහභාගි නොවීම.

• පර්චස් 8කට අඩු ඉඩම්වල පදිංචි ඉල්ලුම්කරුවන් ප්‍රතික්ෂේප වීම.

• ඉඩම් ආරාවුල් පවතින රජයේ ඉඩම්වලට එම ආරාවුල් නිරාකරණය නොකර බලපත්‍ර ලබා දීමට නොහැකි වීම.

(ඇ) අදාළ නොවේ.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நன்றி! மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் சுமார் 30 சதவீத முஸ்லிம்கள் வாழுகிறார்கள். இந்தப் பிரதேச செயலாளர் பிரிவில் நீண்ட காலமாக அரச காணிகளில் வசித்து வருகின்ற அந்த மக்களுக்கு இதுவரை Deed of Grant, Land Permit போன்ற எந்தவொரு பத்திரமும் வழங்கப்படவில்லை. அவர்கள் தொடர்ச்சியாகப் புறக்கணிக்கப்பட்டே வருகின்றார்கள். எனவே, இது தொடர்பில் உரிய நடவடிக்கையெடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රදේශවල වැඩිපුර තිබෙන්නේ රජයේ ඉඩම්. මේ වෙනකොටත් ජනතාවට අවශ්‍ය නිල ලේඛන ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඒ ප්‍රදේශවලට සම්බන්ධ වෙලා නිරීක්ෂණ කටයුතු කරමින්, ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙමින්, තොරතුරු එකතු කරගනිමින් ඉන්නවා.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இந்த மண்முனைப்பற்றுப் பிரதேச செயலாளர் பிரிவில் வாழுகின்றவர்களில் 30 சதவீதமானவர்கள் முஸ்லிம்கள்! நீண்ட காலமாக அரச காணிகளில் வசிக்கின்ற அவர்களுக்கு எந்தவொரு வேலைத்திட்டம் மூலமும் உறுதிப்பத்திரங்கள் வழங்கப்படாமல் இருக்கின்றன. இவ்வாறு அவர்கள் தொடர்ச்சியாக புறக்கணிக்கப்பட்டு வருகின்றார்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இது தொடர்பில் ஒரு விசாரணையை நடத்தி, உண்மையிலேயே அவர்கள் புறக்கணிக்கப்படுகிறார்களா என்ற விடயத்தைப் பார்க்க வேண்டும். குறிப்பாக, அரச காணிகளில் வசிக்கின்றவர்களை வெளியேற்ற வேண்டுமெனக் கூறி, முஸ்லிம்களுக்கு எதிராக மட்டும் வழக்குகளைத் தாக்கல் செய்கிறார்கள். குறித்த பட்டியலை எடுத்துப் பார்த்தால் உங்களுக்கு இந்த விடயம் தெரியவரும். இவ்வாறு முஸ்லிம்களுக்கு எதிராக மட்டும் அந்தப் பிரதேச செயலகத்தால் சில நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன. இது தொடர்பாக ஆராய்ந்து நடவடிக்கை எடுப்பதற்கு உங்களுடைய அமைச்சின் ஊடாக ஒரு குழுவை நியமிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ඉඩම් කොමසාරිස්තුමා හරහා මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල: සේවකයින්
இலங்கை மின்சார சபையின் கீழுள்ள பிராந்திய அலுவலகங்கள்: ஊழியர்கள்
REGIONAL OFFICES UNDER CEYLON ELECTRICITY BOARD: EMPLOYEES

901/2025

5. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටින්නේද;

(iii) ඒවාට අවශ්‍ය ඉංජිනේරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව සිටින්නේද;

(v) නොඑසේ නම්, ඉංජිනේරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) නව ඉංජිනේරුවන් බඳවා ගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) විදුලිය උත්පාදනය කරන ප්‍රභවයන් කවරේද;

(ii) එම එක් එක් ප්‍රභවයෙන් මේ වනවිට උත්පාදනය කරන ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය පුද්ගලීකරණය කරන්නේද;

(iv) එසේ නම්, එහි සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) මණ්ඩලය යටතේ පවතින සමාගම්වල මේ වනවිට ආරම්භ කර ඇති උපාය මාර්ගික වැඩසටහන්/ ව්‍යාපෘති කවරේද;

(ii) ඉහත එක් එක් සමාගමේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සමාගම්වල අතිරික්ත සේවකයන් සිටින්නේද;

(iv) එසේ නම්, අතිරික්ත සේවකයන් සංඛ්‍යාව එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ලංකා විදුලිබල සමාගම මඟින් ආවරණය කරන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையின் பிராந்திய அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(ii) அவற்றில் போதுமானளவு ஊழியர்கள் உள்ளனரா;

(iii) அவ்வலுவலகங்களுக்குத் தேவைப்படும் பொறியியலாளர்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்படி எண்ணிக்கையிலான பொறியியலா ளர்கள் உள்ளனரா;

(v) இன்றேல், பொறியியலாளர் வெற்றிடங்களின் எண்ணிக்கை யாது;

(vi) புதிய பொறியியலாளர்கள் ஆட்சேர்த்துக் கொள்ளப்படுவார்களா;

(vii) ஆமெனில், அதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மின்சாரம் உற்பத்தி செய்யப்படும் மூலங்கள் யாவை;

(ii) இன்றளவில் மேற்படி ஒவ்வொரு மூலத்தி லிருந்தும் உற்பத்தி செய்யப்படும் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) இலங்கை மின்சார சபை தனியார்மயப்படுத்தப் படுமா;

(iv) ஆமெனில், அதன் ஊழியர்கள் தொடர்பாக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சபையின் கீழுள்ள கம்பனிகளில் இன்றளவில் ஆரம்பிக்கப்பட்டுள்ள மூலோபாய நிகழ்ச்சித் திட்டங்கள்/ கருத்திட்டங்கள் யாவை;

(ii) இன்றளவில் மேற்படி ஒவ்வொரு கம்பனியிலும் பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) மேற்படி கம்பனிகளில் ஊழியர் மிகை காணப்படுகின்றதா;

(iv) ஆமெனில், மேற்படி ஒவ்வொரு கம்பனியிலும் காணப்படும் ஊழியர் மிகை வெவ்வேறாக யாது;

(v) இலங்கை மின்சாரக் கம்பனியால் எப்பிரதேசங் களுக்கு மின்சாரம் வழங்கப்படுகின்றது;

என்பதையும் அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he state -

(i) the number of regional offices of the Ceylon Electricity Board (CEB);

(ii) whether there are adequate employees in those offices;

(iii) the number of engineers required for those offices;

(iv) whether above number of engineers are available;

(v) if not, the number of existing engineer vacancies ;

(vi) whether new engineers will be recruited; and

(vii) if so, the measures taken in that regard?

(b) Will he also state -

(i) the sources of electricity generation;

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(ii) the units currently generated through each such source, separately;

(iii) whether the CEB will be privatized; and

(iv) if so, the measures to be taken regarding the employees?

(c) Will he further state -

(i) the strategic programmes/projects initiated by the companies under the CEB;

(ii) the number of employees currently working in each such company, separately;

(iii) whether there are excess employees in those companies;

(iv) if so, the number of excess employees in each company, separately; and

(v) the areas covered by the LECO?

(d) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 70කි.

(ii) ඒවායේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැත.

සටහන: ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව අනුව, බෙදාහැරීම් අංශ 01, 02, 03 හා 04 සඳහා සිටිය යුතු විධායක හා විධායක නොවන මුළු සේවක සංඛ්‍යාව 18,948ක් වේ. 2025.03.31 දිනට එම අංශ හතරෙහි සේවය කළ මුළු ස්ථිර හා අනියම් සේවක සංඛ්‍යාව 16,159කි. ඒ අනුව බෙදාහැරීම් අංශ 04 සඳහා පුරප්පාඩු 2,789ක් පවතී.

(iii) 70යි.

(iv) නැත.

(v) ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලවල පවතින ඉංජිනේරු පුරප්පාඩු සංඛ්‍යාව 09කි.

	විදුලි ඉංජිනේරුවන්	සිවිල් ඉංජිනේරුවන්
අත්‍යවශයෙන්ම සිටිය යුතු	421	10
සත්‍ය ලෙසම සිටින (2025.03.31 දිනට)	310	07
පුරප්පාඩු සංඛ්‍යාව (2025.03.31 දිනට)	111	03

(vi) ඔව්.

(vii) 2025.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අත්‍යවශ්‍ය තනතුරු සඳහා විදුලි ඉංජිනේරු තනතුරු 60, යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු 07 හා සිවිල් ඉංජිනේරු තනතුරු 03 සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට පුවත්පත් දැන්වීම් හා ලංවිම වෙබ් අඩවිය හරහා අයදුම්පත් කැඳවා, තරග විභාග පවත්වා, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා තෝරාගෙන ඇත.

නමුත්, ලංවිම ප්‍රතිව්‍යුහගතකරණය සිදුවෙමින් පවතින බැවින් හා නව බඳවා ගැනීම් අනුප්‍රාප්තික සමාගම් විසින් සිදු කිරීමට සැලසුම් කර ඇති බැවින් මෙම බඳවා ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.

(ආ) (i)

	විදුලි උත්පාදනය කරන ප්‍රභවයන්
ලංවිම	ප්‍රධාන ජල විදුලි
	තාප (තෙල්)
	තාප (ගල් අඟුරු)
	සුළං
ස්වාධීන පුද්ගලික විදුලි බලාගාර (IPP)	තාප
	කුඩා ජල විදුලි
	ජාලගත සූර්ය
	වහළ මත සූර්ය
	ඩෙන්ඩ්‍රෝ
	ජෛව ස්කන්ධ
	සුළං
	නාගරික ඝන අපද්‍රව්‍ය

(ii)

	විදුලි උත්පාදනය කරන ප්‍රභවයන්	**උත්පාදනය කරන ඒකක සංඛ්‍යාව (ගි.වො. පැය)**	
		2024	2025 (මැයි මස දක්වා)
ලංවිම	ප්‍රධාන ජල විදුලි	5,426.180	2,349.771
	තාප (තෙල්)	1,570.570	594.117
	තාප (ගල් අඟුරු)	5,481.544	2,322.648
	සුළං	382.974	114.497
ස්වාධීන පුද්ගලික විදුලි බලාගාර (IPP)	තාප	767.947	373.512
	කුඩා ජල විදුලි	1,473.223	530.817
	ජාලගත සූර්ය	256.554	110.738
	වහළ මත සූර්ය	866.554	573.211
	ඩෙන්ඩ්‍රෝ	84.614	43.985
	ජෛව ස්කන්ධ	13.983	5.934
	සුළං	409.027	116.969
	නාගරික ඝන අපද්‍රව්‍ය	68.458	30.538
එකතුව		**16,801.628**	**7,166.737**

(iii) නැත.

2024 ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලික සමාගම් 12කට බෙදා වෙන් කිරීමට යෝජනා කර තිබූ අතර ඒවායින් සමාගම් 7ක් සම්පූර්ණයෙන්ම පෞද්ගලීකරණය කිරීමටත්, තවත් සමාගමක් සියයට 49ක් දක්වා පෞද්ගලීකරණය කිරීමටත් ඉඩ සලසා තිබුණි. නව රජය බලයට පත්වීමෙන් පසුව 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනත මඟින් මෙම තත්ත්වය වෙනස් කර සම්පූර්ණයෙන්ම රජයට අයත් සමාගම් 06ක් පිහිටුවීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්නේ නැත.

(iv) සම්පූර්ණ සේවකයින් නව සමාගම් 04ක් සඳහා අනුයුක්ත කරන අතර, ඒ සඳහා අකමැති සේවකයින් හට දැනට ප්‍රසිද්ධ කර ඇති ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයට අනුගත වෙමින් සේවයෙන් ඉවත්ව යා හැකිය. සියලුම සේවකයින් රඳවා ගැනීමට රජය අපේක්ෂා කරයි.

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලංකා විදුලි පුද්ගලික සමාගම, ලංකා එනර්ජීස් සමාගම, ලංකා ගල් අඟුරු සමාගම පවතී.

ලංකා විදුලි පුද්ගලික සමාගම - LECO - පහත සඳහන් උපාය මාර්ගික වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- ආසියානු බැංකු ණය පහසුකම් යටතේ ලංකා විදුලි පුද්ගලික සමාගම යටතේ ඇති ප්‍රදේශවල මධ්‍යම වෝල්ටීයතා විදුලිය බෙදාහැරීම් ජාලය නවීකරණය කිරීම කරනු ලබයි.
- කැලණිය, කෝට්ටේ, නුගේගොඩ වැනි නාගරික ප්‍රදේශවල විදුලි සැපයුමේ අඛණ්ඩතාව පවත්වා ගැනීම, විදුලි බිඳවැටීම් අවම කිරීම හා පද්ධතියට සූර්ය බලය ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීම් පද්ධතිය සහ වෝල්ට් 33,000 විදුලි රැහැන් මාර්ග ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
- ලංකා විදුලි පුද්ගලික සමාගමේ මීගමුව, කැලණිය බල ප්‍රදේශවල වෝල්ට් 11,000 විදුලි රැහැන් පද්ධති වෝල්ට් 33,000 විදුලි රැහැන් පද්ධතියක් බවට වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම හා එම ප්‍රදේශවල ඇති ප්‍රාථමික උප පොළවල් වෝල්ට් 33,000 වහරු අංගන බවට වැඩි දියුණු කිරීම.
- වඩාත් පුළුල් සමාජ දැක්මක් යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව වැඩි දියුණු කිරීම සඳහා ලංකා විදුලි පුද්ගලික සමාගමේ කාන්තා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා ආරක්ෂාකාරී හා පරිසර හිතකාමී ලෙස විදුලිය භාවිතය පිළිබඳ සමාජය දැනුවත් කිරීම.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පවතින ලක්විජය බලාගාරයට අවශ්‍ය වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය හිඟයකින් තොරව නොකඩවා සැපයීම සිදු කරයි.

ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අබලි ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතියක් සහ වහල මත සවිකළ සූර්ය බල ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරයි.

(ii)

	ලංකා විදුලි පුද්ගලික සමාගම	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම
ඉංජිනේරුවන්	57	-	13
අනෙකුත් විධායක නිලධාරින්	106	10	07
විධායක නොවන නිලධාරින්	1111	10	56
එකතුව	1274	20	76

(iii) නැත.

(iv) නැත.

(v)
- මීගමුව ශාඛාව - මීගමුව මහ නගර සභාව, කටාන ප්‍රාදේශීය සභාව, ජා ඇල නගර සභාව, ජා ඇල ප්‍රාදේශීය සභාව, කටුනායක - සීදූව නගර සභාව
- කැලණිය ශාඛාව - කැලණිය ප්‍රාදේශීය සභාව, පෑලියගොඩ නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, මහර ප්‍රාදේශීය සභාව
- කෝට්ටේ ශාඛාව - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ කොටසක්, කොළොන්නාව නගර සභාව, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
- **නුගේගොඩ ශාඛාව** - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ කොටසක්, මහරගම නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව
- **මොරටුව ශාඛාව** - මොරටුව මහ නගර සභාව, පානදුර නගර සභාව, පානදුර ප්‍රාදේශීය සභාව
- **කළුතර ශාඛාව** - කළුතර මහ නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභාව
- **ගාල්ල ශාඛාව** - ගාල්ල මහ නගර සභාව, හික්කඩුව නගර සභාව, රත්ගම ප්‍රාදේශීය සභාව, අම්බලන්ගොඩ නගර සභාව, බලපිටිය ප්‍රාදේශීය සභාව

(ඈ) අදාළ නොවේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ පරිදි, ප්‍රධාන වශයෙන් ඔබතුමන්ලාගේ නව පනත අනුව සීමාසහිත ජාතික පද්ධති පාලන පෞද්ගලික සමාගම, සීමාසහිත ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා පෞද්ගලික සමාගම, සීමාසහිත ලංකා විදුලි ජනන පෞද්ගලික

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

සමාගම සහ සීමාසහිත ලංකා විදුලි බෙදා හැරීම් පෞද්ගලික සමාගම යන නව සමාගම් හතර යටතේ තමයි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. ගරු ඇමතිතුමා, පසුගිය 13වැනි දා සියලු වෘත්තීය සමිති ඔබතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වූවා. දැනුම් දීලා තිබෙන විධියට 27වැනි දා වනකොට මේ සියලු සේවකයන්ට වෙන් වෙන් වශයෙන් නව සමාගම්වල පත්වීම් ලබා ගන්න කියලා කියනවා. මේක නව පත්වීමක් ද? දැන් සේවකයන්ට ප්‍රශ්නයක් තිබෙනවා. අපට ලැබෙන තොරතුරු අනුව ඇමතිතුමා කියනවා, මේක පත්වීමක් නොවෙයි කියලා. මේක පත්වීමක් ද, එහෙම නැත්නම් මේ සම්බන්ධයෙන් කරන දැන්වීමක් ද කියලා ඔබතුමා අද අපට පැහැදිලි කරලා දෙන්න. පත්වීමක් ලැබෙනකොට, ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු හැටියට හිටපු කෙනෙකු නම් ඒ පත්වීමයි, මේ පත්වීමයි අතර තිබෙන වෙනස මොකක්ද? ඔහුගේ උසස්වීම් ක්‍රමවේදය මොකක්ද? ඔහුගේ වැටුප් තලය මොකක්ද? ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් මේ කාරණය සම්බන්ධයෙනුත් ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. විදුලි බිල වැඩි කිරීම සම්බන්ධයෙන් මුළු රටේම කතිකාවක් ඇති වුණා. විදුලි බිල වැඩි කිරීමක් වෙනවාද, නොවෙනවාද කියන ප්‍රශ්නයටත් ගරු ඇමතිතුමා හැටියට පිළිතුරක් දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
බොහොම ස්තුතියි ඔබතුමාට, අතුරු ප්‍රශ්න දෙකම එකවර ඇසීම පිළිබඳව.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
නැහැ, එක අතුරු ප්‍රශ්නයයි ඇහුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්න දෙකක් ඇහුවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
බොහොම අහිංසකව ඉල්ලන්නේ, මෙය රටේ ප්‍රශ්නයක් නිසා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න - *[බාධා කිරීමක්]*

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)"
ඔබතුමාගේ ප්‍රශ්න දෙකටම මම උත්තර දෙන්නම්. ගරු කථානායකතුමනි, පනත අනුව සියලු සේවකයන්ට දැනුම් දීමක් කර තිබෙනවා. ඇත්තටම පත්වීමක් නොවෙයි. "මේ සමාගමට ඔබව අනුයුක්ත කරන්න බලාපොරොත්තු වනවා" කියලා දැනුම් දීමක් කර තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
පත්වීමක් නොවෙයි?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
පත්වීමක් නොවෙයි. දැනුම් දීමක් නේ, කරලා තිබෙන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
දැනුම් දීමක්? පත්වීමක් නොවෙයි?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔව්. පත්වීමක් කියලා එම ලිපියේ කොහේවත් නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ආ, ඒක හරි. සාමාන්‍යයෙන් *[බාධා කිරීමක්]* කළ ප්‍රකාශයක් නේ. ඒක අතර වෙනසක් තිබෙන්න ඇති.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
සමහර විට වචනවල පොඩි පොඩි පරස්පරතා ඇති. අපි පනත නීතිය කියලා ගත්තාම, ඒ සම්බන්ධව දැනුම් දීමක් කරන්න තිබෙනවා. සේවකයනුත් ඔක්තෝබර් 27වැනි දාට ඉස්සෙල්ලා දැනුම් දෙන්න ඕනෑ, ඒගොල්ලෝ අනුයුක්ත වනවාද, එහෙම නැත්නම් ඉවත් වනවාද කියලා. එතැනදී කිසිම විධියකින් ඒගොල්ලන්ගේ තනතුරුවලට හානියක් සිදු වන්නේ නැහැ. ඒ අය දැරූ තනතුරුවලින් පහළ යැවීමක් හෝ ඉහළ යැවීමක්වත්, ඒගොල්ලන් දැනට ලබන වැටුප්වල වෙනසක්වත් සිදු වෙන්නේ නැහැ. ඇත්තටම ඒ අය තනතුරුවලින් ඉහළ යැවීමක් අපි බලාපොරොත්තු වනවා නම්, ආයතන පිහිටුවීමෙන් පසුව තමයි අපට එය සිදු කරන්න වෙන්නේ. එම නිසා අපි CEB එකේ තිබුණු තත්ත්වයම ලබා දෙනවා. ඒ ඇතුළේ තිබෙන ප්‍රශ්න ටික විසඳීම තමයි එතැන වෙන්නේ. මොකද, අපි පනත අනුව තමයි එය කරන්නේ. නීතියට පටහැනි කිසිම දෙයක් අපි කරන්නේ නැහැ. එම නිසා 27වැනි දාට කලින් සේවකයන් දැනුම් දෙන්න ඕනෑ. සේවකයෝ දැනුම් දුන්නත්, නොදුන්නත්, ඒගොල්ලන්ට දැනුම් දී ඇති පරිදි අනිවාර්යයෙන්ම අනුයුක්ත කිරීම සිදු වනවා කියන එක තමයි ප්‍රකාශ කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා අහනවා. ගරු ඇමතිතුමනි, විදුලි බිල සම්බන්ධයෙන් -

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
PUCSL එකෙන් කියලා තිබෙනවා නේද, විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියලා. එම නිසා ඒ ගැන අහන්න ප්‍රශ්නයක් නැහැ කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ මෙයයි.

පසුගිය දවසක ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් වෘත්තීය සමිති සමඟ සාකච්ඡාවක් පවත්වා තිබෙනවා, විශේෂයෙන්ම ඒකාබද්ධ ජාතික නිදහස් සේවක සංගමයේ සාමාජිකයන් සමඟ. ඒ වෙලාවේ ඒකට සහභාගි වුණු එම සේවක සංගමයේ ලේකම් සමින්ද ගමගේ මහත්මයාට ප්‍රහාර එල්ල කරලා, එම සේවක සංගමයේ සභාපති හැටියට කටයුතු කරන ප්‍රියන්ත මදුකුමාර මහතාව කාමරයක දාලා හිර කරගෙන ඔහුගේ phone එකේ තිබුණු දත්ත - data - ටික ඔක්කෝම මකලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමන්ලාගෙන් විශේෂයෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමන්ලාගේ පාර්ශ්වය තමයි පසුගිය කාලයේ ලංකා විදුලිබල මණ්ඩලයේ 23,000ක් සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් මහ පාරට බැහැලා කම්කරු අයිතිය වෙනුවෙන්, සේවක අයිතිය වෙනුවෙන්, රාජ්‍ය ආයතන සුරක්ෂා කිරීමේ මාතෘකාව යටතේ ඒ අයව පාරට බස්සවා උද්ඝෝෂණය කළේ. අද වාගේ දවසක වෘත්තීය සමිති නායකයෝ මෙවැනි සාකච්ඡාවකට යනකොට පහර දීමකට ලක්වීම අසාධාරණයි. ඒක අනීතිකයි. ඒක වැරදි ක්‍රියාවක්. එම නිසා ඔබතුමා වහාම ඒ පිළිබඳව නිවැරදි පරීක්ෂණයක් කරන්න. එම සමිතියේ ලේකම්, සමින්ද ගමගේ මහතාට පහර දීම පිළිබඳවත්, ප්‍රියන්ත මදුකුමාර මහතාගේ phone එක උදුරාගෙන ඔහුව හිර කරගෙන, ඔහුගේ phone එකේ තිබුණු දත්ත ටික මකා දැමීම පිළිබඳවත් අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීම ඉතාම වැදගත්. මොකද, 23,000ක සේවක අයිතිය වෙනුවෙන් තමයි ඒ අය ඔබතුමා සමඟ සාකච්ඡාවට පැමිණියේ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ වෘත්තීය සමිතියෙන් ඒ ගැන විමසුවා නම් මීට වඩා වැදගත් කියලා මම හිතනවා. මොකද, ඔබතුමා නොදන්නවා වුණාට එතුමන්ලා පවා ඔහුව එළියට දමන්න කියලා බොහෝ හඬ නැඟුවා. මොකද, ඔහු හිටපු සේවකයෙක්. ප්‍රසිද්ධියේම අල්ලස් - bribes - අරගෙන සේවයෙන් පහ කළ පුද්ගලයෙක්.

ඕනෑ නම් මම කියන්නම්, ඔහු හිටපු මන්ත්‍රීවරයකුගේ පාර්ශ්වයෙන් තමයි ඉන්නේ. ඔහු, තුම්මුල්ලේ උපවාස කළ මන්ත්‍රීවරයාගේ පාර්ශ්වයේ කෙනෙක්. ඔහු අලුතෙන් වෘත්තීය සමිතියක් පිහිටුවා තිබෙනවා. අනෙක් වෘත්තීය සමිති ඔක්කෝම ඔහුට විරුද්ධයි. ඔහුට CEB එකට ඇතුළු වෙන්න බැහැ. රැස්වීමට ආවාම මම ඔහු ගැන දැනගෙනත් ඔහුව තියාගෙන හිටියා, කමක් නැහැ, වෘත්තීය සමිතියක කෙනෙක් නේ කියලා. හැබැයි සාමදානව කළ ඒ සාකච්ඡාව කඩාකප්පල් කරන්න එළියෙනුත් කෙනෙක් ගෙනැල්ලා වැරදි විධියට වීඩියෝ කළා. ඒගොල්ලන්ගෙන් හැරෙන්න වෙනත් ඕනෑම වෘත්තීය සමිති නායකයකුගෙන් එම සිද්ධිය පිළිබඳව අහන්න. ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතියේ නායකයාගෙන් අහන්න, කොහොමද ඒ වෘත්තීය සමිති සාකච්ඡාව අපි කරගෙන ගියේ කියලා. ඔබතුමන්ලා කොහේ හරි යන කුණක් විතරක් මේ සභාවට කර ගහගෙන එන්න එපා. ඇත්ත විස්තරය අහලා ඒ අනුව කටයුතු කරන්න.

එතැනදී බාධා කරනකොට මගේ ආරක්ෂාවට ඉන්න ආරක්ෂක නිලධාරින් ඔහුව එළියට දැම්මා තමයි, ඒක වීඩියෝවල තිබුණා. ඒ මනුස්සයා මට ගහනවා ගහනවා කිය කියා ආපහු දොරෙන් ඇතුළට යන්න හදනවා. ඒ රඟපෑම තේරුම් ගන්න. නිකම් පදනමක් නැතිව මේ සභාවේ කථා කරන්න එපා. අපි ඒවා පොලීසියට දැනුම් දීලා තිබෙනවා. පොලීසියෙන් අවශ්‍ය තොරතුරු අරගෙන, පරීක්ෂණ කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනීවි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දෙවෙනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ සභාව තුළ වැරදි තොරතුරු කියන්න හොඳ නැහැ. මොකද, අපේ වෘත්තීය සමිතියක් - සමගි ජන බලවේගයේ වෘත්තීය සමිතියක් - විදුලිබල මණ්ඩලයේ නැහැ. එතුමා කියනවා, අපේ වෘත්තීය සමිති නියෝජිතයෝ එතැන හිටියා කියලා. අපේ වෘත්තීය සමිතියක් එතැන නැහැ. ඒ නිසා වැරදි තොරතුරු මේ සභාවේ කියන්න එපා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -958/2025- (2), ගරු අජිත් ගිහාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගොවීන්, වෙළෙඳුන් සහ පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය: ගනු ලබන ක්‍රියාමාර්ග
விவசாயி, வியாபாரி மற்றும் நுகர்வோரைப் பாதுகாத்தல்: நடவடிக்கை
SAFEGUARD OF INTERESTS OF FARMERS, TRADERS AND CONSUMERS: ACTION TAKEN

995/2025

7. **ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ආහාර භෝග නිෂ්පාදනයේ යෙදී සිටින ගොවියාගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බවත්;

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

(ii) ඒ සඳහා, ගොවීන් විසින් විශාල ශ්‍රමයක් සහ මුදලක් යෙදවිය යුතු බවත්;

(iii) එසේ වුවද, කෘෂි නිෂ්පාදන සඳහා ශ්‍රමයට සහ වියදමට සරිලන සාධාරණ මිලක් නොලැබීමෙන් ගොවීන් පීඩාවට පත් වී සිටින බවත්;

(iv) කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේදී, පාරිභෝගිකයාටද ඉහළ මිලක් ගෙවීමට සිදුවී ඇති බවත්;

(v) ගොවියා සහ පාරිභෝගිකයා අතරමැද සිටින තොග වෙළෙන්දා සහ සිල්ලර වෙළෙන්දා විසින් අධික ලාභ ලබන බවත්;

(vi) ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම පීඩාවට පත් කරන ඉහත ක්‍රමය වෙනස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, ගොවියා, වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන තිදෙනාම ආරක්ෂා වන ආකාරයේ වැඩ පිළිවෙළක් මේ සඳහා සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பயிர் உற்பத்தியில் ஈடுபட்டுள்ள விவசாயிகளின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்த வேண்டும் என்பதையும்;

(ii) அதற்கென விவசாயிகள் மிக அதிகமான உழைப் பையும் பணத்தையும் ஈடுபடுத்த வேண்டி யுள்ளது என்பதையும்;

(iii) ஆயினும், உழைப்பையும் செலவையும் ஈடுசெய் யக்கூடிய நியாயமான விலை விவசாய உற்பத்திகளுக்குக் கிடைக்காமையின் காரண மாக விவசாயிகள் பாதிக்கப்பட்டுள்ளனர் என்பதையும்;

(iv) விவசாய உற்பத்திகளைக் கொள்வனவு செய்யும் போது, நுகர்வோரும் அதிக விலையைச் செலுத்த வேண்டியேற்பட்டுள்ளது என்பதையும்;

(v) விவசாயிக்கும் நுகர்வோருக்கும் இடைநடுவே உள்ள மொத்த வியாபாரியும் சில்லறை வியாபாரியும் அதிக இலாபத்தை ஈட்டுகின்றனர் என்பதையும்;

(vi) விவசாயிகள் மற்றும் நுகர்வோர் ஆகிய இரு தரப்பினரையும் பாதிக்கின்ற மேற்படி வழிமுறையை மாற்றியமைக்க வேண்டும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், விவசாயி, வியாபாரி மற்றும் நுகர்வோர் ஆகிய மூவரையும் பாதுகாக்கும் வகையிலான வேலைத்திட்டமொன்று இதற்கெனத் தயார் செய்யப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he accept that -

(i) the living conditions of the farmers engaged in producing crops should be uplifted;

(ii) farmers have to put in a lot of effort and invest a large amount of money on it;

(iii) nevertheless, farmers are distressed as they do not get a price commensurate with the effort and expenditure on their agri produce;

(iv) consumers have also had to pay high prices when buying agricultural products;

(v) the wholesale and retail traders who are in between farmer and consumer earn excessive profits; and

(vi) this system, which makes both farmer and consumer suffer, should be changed?

(b) If so, will he inform this House whether a course of action which safeguards the interests of farmers, traders and consumers be formulated in this regard?

(c) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

හෝග නිෂ්පාදනයේ යෙදී සිටින ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බව පිළිගනිමි.

(ii) ඔව්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත නිෂ්පාදන වියදම් සමීක්ෂණ වාර්තාවට -2023/24 මහ- අනුව ගොවීන් විසින් ප්‍රධාන කෘෂි හෝග කිහිපයක් සඳහා නිෂ්පාදනයේදී ශ්‍රමය සඳහා හෙක්ටෙයාරයකට දරනු ලබන වියදම හා මුළු නිෂ්පාදන වියදමෙහි සාමාන්‍ය ආසන්න අගය මම කියන්නම්. මොකද, දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ.

(a) වී වගාව සැලකීමේදී හෙක්ටෙයාරයකට ගොවියෙකුට සාමාන්‍යයෙන් රුපියල් 340,000ක වියදමක් යනවා. මේකෙන් සියයට 33ක්ම තිබෙන්නේ ශ්‍රමය.

(b) බඩඉරිඟු වගාව සැලකීමේදී හෙක්ටෙයාරයකට වියදම රුපියල් 325,000ක් පමණ වන අතර, මේකෙන් සියයට 34ක්ම තිබෙන්නේ ශ්‍රමය.

(c.) බී ළූනු වගාව සැලකීමේදී හෙක්ටෙයාරයකට වියදම රුපියල් ලක්ෂ 12ක් පමණ වන අතර, මේකෙන් සියයට 54ක්ම තිබෙන්නේ ශ්‍රමය.

(d.) අමු මිරිස් වගාවේ නිෂ්පාදන වියදම හෙක්ටෙයාරයකට රුපියල් 805,000ක් පමණ වන අතර, මේකෙන් සියයට 50ක්ම තිබෙන්නේ ශ්‍රමය.

(e) රතු ලූනු වගාවේ නිෂ්පාදන වියදම හෙක්ටෙයාරයක් සඳහා රුපියල් ලක්ෂ 16ක පමණ වන අතර, මේකෙන් සියයට 29ක්ම තිබෙන්නේ ශ්‍රමය.

ඒ අනුව ගොවි ජනතාව තම වගා කටයුතු සඳහා සැලකිය යුතු වියදමක් කරනවා. එම වියදම ඇතුළේ ශ්‍රමය සඳහා විශාල මුදලක් තිබෙනවා. වැඩි විස්තර ඇමුණුමෙහි සඳහන් වේ.

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත නිෂ්පාදන වියදම් සමීක්ෂණ වාර්තාව -2024/2024 මහ- අනුව කෘෂි නිෂ්පාදන සඳහා හෙක්ටෙයාරයකට ශුද්ධ ලාභ ප්‍රමාණවල වැඩි විස්තර ඇමුණුමෙහි සඳහන් වනවා. මෙම නිෂ්පාදනවල වියදම උච්චාවචන වනවා. එම තත්ත්වය මත අදාළ වියදමෙහි ආසන්න අගය මම කියන්නම්.

(a) වී වගාවේදී වගාවේ ශුද්ධ ලාභය වාරි ප්‍රදේශ සඳහා හෙක්ටෙයාරයකට රුපියල් 157,000කි. එහෙත් වර්ෂා පෝෂිත කලාපවල වගා කරන ගොවීන්ගේ ලාභ පංගුව මීට වඩා අඩු වෙනවා.

(b) බඩඉරිඟු වගාව සැලකීමේදී වගාවේ ශුද්ධ ලාභය හෙක්ටෙයාරයකට රුපියල් 142,000ක් පමණ වෙනවා.

(c) බී ලූනු වගාව සැලකීමේදී වගාවේ ශුද්ධ ලාභය සාමාන්‍යයෙන් හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 21කි.

(d) අමු මිරිස් වගාවේ ශුද්ධ ලාභය හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 20කි.

(e) රතු ලූනු වගාවේ ශුද්ධ ලාභය හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 10ක වාගේ ලාභ පංගුවක් ගොවි ජනතාවට ගන්න පුළුවන් වෙනවා.

මෙය නිශ්චිතම තත්ත්වය නොවෙයි. තිබෙන තත්ත්වය මත දළ වශයෙන් ගණන් බැලූ විට ලැබෙන තත්ත්වය තමයි මේ.

- ශ්‍රී ලංකාවේ 2024 වර්ෂයේ ජාතික දරිද්‍රතා රේඛාව ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත පරිදි මාසයකට පුද්ගලයෙකුට රුපියල් 16,619ක් අවශ්‍ය වනවා. එය පවුලකට නම් රුපියල් 58,167ක් පමණ වනවා.
- ඒ අනුව ශ්‍රී ලංකාවේ බහුතර ගොවි ප්‍රජාව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින බව දක්වන්න පුළුවන්. ගොවියාගේ තත්ත්වය මේක තමයි. මේක තමයි යථාර්ථය.

(iv) නැත.

මේ වන විට මිල ස්ථාවරව පවතී.

2014 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා 2013 පාදක වර්ෂය ලෙස ගනිමින් සකස් කරන ලද ආහාර සඳහා වූ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ මාසික අගයන් අනුව පාරිභෝගිකයන්ට ආහාර සඳහා දැරීමට සිදුවන වියදම් සංසන්දනය පිළිබඳ වැඩි විස්තර ඇමුණුමෙහි සඳහන් වනවා. මෙය දීර්ඝ ඇමුණුමක්. එම නිසා ඇමුණුම **සභාගත*** කරනවා.

(a) ශ්‍රී ලංකාවේ පැවති උද්ධමනයත් සමඟ 2014 වර්ෂයේ සිට 2021 වර්ෂයේ පළමු කාර්තුව තෙක් සියයට 50කින් පමණ ආහාර කාණ්ඩයේ භාණ්ඩ හා සේවාවල මිල වැඩි වීමක් සිදුව ඇත.

(b) එහෙත් එතැන් පටන් පැවති ආර්ථික අර්බුදයත් සමඟ 2021 පළමු කාර්තුවේ සිට 2024 පළමු කාර්තුව දක්වා කාලය තුළ ආහාර කාණ්ඩයේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් දෙගුණ වී ඇත.

(c) 2024 පළමු කාර්තුවේ සිට 2024 අවසන් කාර්තුව දක්වා ආහාර කාණ්ඩයේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් සියයට 6කින් පමණ අඩු වී තිබෙනවා.

(d) 2024 අවසන් මාසයේදී ආහාර කාණ්ඩයේ භාණ්ඩ හා සේවාවල මිල සියයට 4කින් පමණ නැවත ඉහළ යාමක් වාර්තා වන අතර, 2025 පළමු කාර්තුව අවසන් වනතෙක් එම කාණ්ඩයේ සැලකිය යුතු මිල විචලනයක් වාර්තා වී නොමැත. ඒ අනුව ආර්ථිකය ප්‍රකෘති වීමත් සමඟ ආර්ථික අර්බුද සමයෙන් පසු පාරිභෝගික භාණ්ඩවල -විශේෂයෙන්ම ආහාර කාණ්ඩයේ- සැලකිය යුතු මිල ඉහළ යාමක් වාර්තා වෙලා නැහැ.

(v) ගොවියා හා පාරිභෝගිකයා අතර සිටින පාර්ශ්වකරුවන් සංඛ්‍යාව අළෙවි ජාල අනුව වෙනස් වන අතර දැනට ලංකාවේ සාම්ප්‍රදායික වෙළෙඳ ජාල -ආර්ථික මධ්‍යස්ථාන, තොග වෙළෙඳ පොළවල්, පොළ ක්‍රමය-, සුපිරි වෙළෙඳසැල්, සෘජු වෙළෙඳාම හා මාර්ගගත ආදී ක්‍රම දකින්න පුළුවන්. දැනට ගොවියාගේ නිෂ්පාදනවලින් සියයට 80ක් පමණ සාම්ප්‍රදායික වෙළෙඳ ජාල හරහා පාරිභෝගිකයා දක්වා හුවමාරු වනවා.

- ගොවියාගේ නිෂ්පාදන පාරිභෝගිකයා දක්වා රැගෙන යෑමේ වෙළෙඳ ජාලය තුළ එකතු කරන්නා, ප්‍රවාහනය කරන්නා, තොග වෙළෙන්දා (නිෂ්පාදන ප්‍රදේශවල), කොමිස් වෙළෙන්දා, තොග වෙළෙන්දා (පාරිභෝගික ප්‍රදේශවල), සිල්ලර වෙළෙන්දා යන පාර්ශ්වකරුවන් දැකිය හැකි අතර නිෂ්පාදන වාහනවලට පැටවීම, වාහනවලින් බෑම සඳහා ශ්‍රමිකයින් සම්බන්ධ වෙනවා.
- විවෘත වෙළෙඳ පොළ ක්‍රමයක් තුළ අළෙවි ජාලය තුළ සිටින පාර්ශ්වකරුවන් යම් ලාභයක් මත එම සේවා සපයනු ලබන අතර පාඩුවට තම සේවා සපයනු නොලැබේ. අනෙක් අතට එම අවස්ථා නිසා රටේ ශ්‍රම බලකායට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහි වී තිබෙනවා.
- ගොවියා හා පාරිභෝගිකයා අතර සිටින පාර්ශ්වකරුවන් නොමැතිව ගොවියාට තම නිෂ්පාදන පාරිභෝගිකයාට රැගෙන යෑම අසීරු කටයුත්තක්.
- ගොවියා හා පාරිභෝගිකයා අතර පාර්ශ්වකරුවන් අඩුම වෙළෙඳ ජාලය ලෙස මාර්ගගත - online - ක්‍රමය දක්වන්න පුළුවන්.

(vi) ඔව්, ගොවියාට ලාභදායී හා සුවපහසු ජීවන රටාවක් තිබිය යුතු බව පිළිගනිමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නාමල් කරුණාරත්න මහතා]

එසේ වුවත්, ගොවියාගේ ආදායම වැඩි කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ගෙන තිබෙනවා. උදාහරණ වශයෙන් පොහොර සහනාධාරය ලබා දීම මඟින් භෝග ඵලදායීතාව වැඩි කිරීමට කටයුතු කිරීම, නව නිෂ්පාදන තාක්ෂණය හඳුන්වා දීම, නව බීජ ප්‍රභේද හඳුන්වා දීම, ගුණාත්මක බීජ නිෂ්පාදනය හා වෙළෙඳ පොළේ පවතින බීජවල ගුණාත්මකභාවය, තත්ත්ව පරීක්ෂා කිරීම ආදී ක්‍රියාමාර්ග ඒ යටතේ ගනිමින් පවතිනවා.

ඒ සඳහා අඩු පාර්ශ්වකරුවන් ප්‍රමාණයක් සම්බන්ධ වන වෙළෙඳ ජාල ප්‍රවර්ධනය කිරීම කළ යුතු වෙනවා. යටිතල පහසුකම් වැඩි කිරීම, ප්‍රාදේශීය ඇසුරුම් මධ්‍යස්ථාන නිෂ්පාදන ප්‍රදේශවල ඇති කිරීම, ඉල්ලුමට සරිලන සැපයුම පමණක් වෙළෙඳ පොළ තුළ සැපයීම සිදු කිරීම, සමුපකාර ක්‍රම ශක්තිමත් කිරීම සහ අතිරික්ත නිෂ්පාදන තාවකාලිකව ගබඩා කළ හැකි ශීතාගාර ඇති කිරීම ආදී විකල්ප වෙළෙඳ ජාල ශක්තිමත් කිරීම කළ යුතු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර කෙටි කරන්න. ඔබතුමා දැන් විනාඩි 10ක් අරගෙන තිබෙනවා, පිළිතුර ලබා දීමට.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

පසු අස්වනු හානි අවම වෙළෙඳ ජාලයන් ප්‍රවර්ධනය කිරීම, ඇසුරුම්වල ආරක්ෂිතව ගොවීන්ගේ නිෂ්පාදන වෙළෙඳ පොළට සපයන ජාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම කළ යුතු වෙනවා.

(ආ) නිෂ්පාදන වියදම් අඩු කර ගැනීම සඳහා කෘෂි භෝග ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම හා ව්‍යාප්ති ක්‍රියාවලිය මඟින් නව තාක්ෂණය ගොවීන් වෙත ලබා දීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් අඛණ්ඩව සිදු කරගෙන යනවා. ඒ අනුව ගොවි ජනතාවගේ මෙම ගැටලු විසඳා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරලා, මේ වනවිට එය ක්‍රියාවට නැංවීම ආරම්භ කර තිබෙන බව ප්‍රකාශ කරනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

විස්තරාත්මකව, සාධනීය පිළිතුරක් ලබා දීම සම්බන්ධව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉතිහාසයේ කෘෂි භෝගවල මිල උච්චාවචනය ඉතා විෂම ආකාරයට තිබුණේ. සමහර අවස්ථාවලදී අපට එය සිතා ගැනීමට පවා අපහසු වුණා. උදාහරණයක් ගත්තොත්, එක් අවස්ථාවකදී අමු මිරිස් කිලෝවක තොග මිල රුපියල් 1,400ක් පමණ වුණා මට මතකයි. නමුත්, මාස දෙක තුනකට පසුව එහි මිල රුපියල් 80 දක්වා පහත බැස්සා. මිල ඉහළ යෑමේදී පාරිභෝගිකයා පීඩාවට පත් වන බව අපි දන්නවා. ඒ වාගේම මිල පහළ බැසීමේදී ගොවියා පීඩාවට පත් වෙනවා. ඒ නිසා මෙම තත්ත්වය වෙනස් කර ගැනීමට වාගේම දළ වශයෙන් ස්ථාවර මිලක් පවත්වාගෙන යෑමට ක්‍රමවේදයක් තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා උත්තරයක් ලබා දෙයි කියලා මම හිතනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කිරීම එක වතාවටම කරන්න අමාරුයි. අපේ ජනාධිපතිතුමා අලුත් සහල් මංගල්‍යයේදී ප්‍රකාශ කළා, "ගොවීන්ගේ අනෙකුත් ප්‍රශ්න සියල්ලම බේරන්න පුළුවන්. නමුත් වෙළෙඳ පොළ ප්‍රශ්නය බේරන්න අපිට කන්න තුන හතරක් ලබා දෙන්න" කියලා. ඒ අනුව අපි වී ගොවියාගේ ගැටලුවට සැලකිය යුතු උත්තරයක් ලබා දීලා තිබෙනවා. මේ වෙනකොට මුංඇට අස්වනු නෙළීම ආරම්භ කරලා තිබෙනවා. ඒකටත් අපි රජය විධියට යම් මැදිහත්වීමක් සිදු කරනවා. ඒ වාගේම ලොකු ලූනු ගොවියාගේ ගැටලුව ඇත්තටම ටිකක් සංකීර්ණ වුණා. නමුත් රජයේ මැදිහත්වීමෙන් සහ පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් ලොකු ලූනු මිලදී ගැනීම ආරම්භ කළා. ඒ වාගේම අර්තාපල් මිලදී ගැනීමත් ආරම්භ කළා. ඒ විධියටම බඩ ඉරිඟු සම්බන්ධයෙන් මැදිහත් වෙන්නත් අපි මේ වෙනකොට සැලසුම් සකස් කරලා තිබෙනවා. අපි එකින් එකට ක්‍රමානුකූලව වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කිරීමට මැදිහත් වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මෙම නිෂ්පාදනවලට අගය එකතු කරලා වටිනාකමක් ඇති කරලා, වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය, අනෙකුත් අමාත්‍යාංශත් සම්බන්ධ කරගෙන මේ වෙනකොට වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේකත් පළමුවැනි අතුරු ප්‍රශ්නයටම අදාළයි. ඇත්තටම අධික ලෙස මිල උච්චාවචනය වීම නිෂ්පාදනය කරන ප්‍රමාණය මත තමයි රඳා පවතින්නේ. ඔබතුමා දන්නවා, ඉතිහාසය ගත් විට සමහර අවස්ථාවලදී ගොවියෙක් භෝගයක් නිෂ්පාදනය කළාම ඒ අවට ඉන්න අනෙක් ගොවියනුත් ඊළඟ වතාවේ ඒ භෝගයම විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කළ බව. ඊට පසුව සිදු වෙන්නේ මිල විශාල වශයෙන් පහළ යන එකයි. මෙන්න මේ තත්ත්වය වෙනස් කර ගැනීම සඳහා අවශ්‍යතාව මත පදනම් වූ භෝග සැලැස්මක් අපට නිර්මාණ කර ගැනීමට නොහැකිද?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඔව්, ඇත්තටම අපි වගා සැලැස්මකට යන්න ඕනෑ. අපට දේශීය පරිභෝජනය සඳහා ඒ, ඒ භෝග කොච්චර අවශ්‍ය වෙනවාද, ඒ සඳහා කොච්චර භූමියක්, පොහොර සහ වතුර අවශ්‍යද ආදී වශයෙන් වගා සැලැස්මක් අවශ්‍යයි. එවැනි සැලැස්මකට අපි යා යුතුයි. කොහොමත් මේ වෙනකොට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සැලසුම් කර තිබෙනවා, අඩු භූමියකින් වැඩි ඵලදාවක් ලබා ගැනීමේ ක්‍රමවේදයක්. ඒ කටයුත්තට අපි දැන් අත ගහලා තිබෙනවා. ඒ අනුව එක පැත්තකින් නිෂ්පාදනය වැඩි කර ගැනීම තුළ නිෂ්පාදන පිරිවැය අඩු කර ගන්න පුළුවන්. ඊට පසුව වැඩි වන නිෂ්පාදනයට අනුව ඇති වන වෙළෙඳ පොළ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ. ඒ සඳහා විශේෂයෙන්ම අගය එකතු කරපු කර්මාන්ත පද්ධතියකට යන්න ඕනෑ. වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අපි කෘෂිකර්ම අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ පහම ඒකාබද්ධ වෙච්ච වැඩ පිළිවෙළකට යන්න සැලසුම් කරලා තිබෙනවා. අපි ඉදිරි දිනයකුත් යොදා ගෙන තිබෙනවා, මේ අමාත්‍යාංශ පහම ඒකාබද්ධව ඒ ගැන සාකච්ඡා කරලා, ඊට අදාළ වැඩ පිළිවෙළකට යන්න.

අවසාන වශයෙන් ගත්තොත්, නිෂ්පාදනය වැඩි කිරීමට අපි මැදිහත් වෙනවා. ඒ වාගේම ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩු කිරීම සඳහා අපි උපරිමයෙන් මැදිහත් වෙනවා. වැඩි වන නිෂ්පාදනයට අදාළව අගය එකතු කරලා ඒවා කල් තබා ගැනීමටත්, අතුරු නිෂ්පාදනවලට ගිහින් ඊට අදාළව රටට වටිනාකම් එකතු කරමින් රටේ ආර්ථිකය නඟා සිටුවීමටත්, පාරිභෝගිකයාට හොඳ භාණ්ඩ අඩු මිලකට ලබා ගැනීමට හා ගොවියාට සාධාරණ මිලක් ලබා ගැනීමටත්, ගොවියා, පාරිභෝගිකයා සහ අතරමැදියා කියන සියලු පාර්ශ්ව සතුටු කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට යන්නත් අපි මේ වෙනකොට සැලසුම් කරලා තිබෙනවා. අපි ඒ ක්‍රියාවලියට මූලාරම්භයක් අරගෙන තිබෙන බව මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1313/2025- (1), ගරු නිශාන්ත පෙරේරා මහතා.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බන්ධනාගාර රැඳවියන්: විස්තර
சிறைக்கைதிகள்: விபரம்
PRISONS INMATES: DETAILS

1326/2025

9. ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පළමු බන්ධනාගාරය කවරේද;

(ii) එම බන්ධනාගාරය ආරම්භ කරන ලද අවස්ථාවේදී එහි රඳවන ලද රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා කවරේද;

(v) එම එක් එක් බන්ධනාගාරයේ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව ස්ත්‍රී හා පුරුෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) බන්ධනාගාරයක් තුළ එක් රැඳවියෙක් වෙනුවෙන් වෙන්කර ඇති ඉඩ ප්‍රමාණය වර්ග අඩි කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වයඹ පළාතේ ඇති විශාලතම බන්ධනාගාරය කවරේද;

(ii) එහි රඳවා තැබිය හැකි උපරිම රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2025 අගෝස්තු මාසයේ එම බන්ධනාගාරයේ එක් දිනක රඳවා සිටි රැඳවියන්ගේ සාමාන්‍ය අගය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அமைக்கப்பட்ட முதலாவது சிறைச்சாலை யாது என்பதையும்;

(ii) மேற்படி சிறைச்சாலை ஆரம்பிக்கப்பட்ட சந்தர்ப்பத்தில் அங்கு தடுத்து வைக்கப்பட்ட கைதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இன்றளவில் இலங்கையில் காணப்படும் சிறைச்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அச்சிறைச்சாலைகள் யாவை என்பதையும்;

(v) இன்றளவில் அவ்வொவ்வொரு சிறைச்சாலை யிலும் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கையானது, ஆண், பெண் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(vi) சிறைச்சாலை ஒன்றில் கைதி ஒருவருக்கென ஒதுக்கப்பட்டுள்ள இடப்பரப்பு சதுர அடியில் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வடமேல் மாகாணத்தில் அமைந்துள்ள மிகப் பெரிய சிறைச்சாலை யாது என்பதையும்;

(ii) அங்கு தடுத்து வைக்க இயலுமான ஆகக்கூடிய கைதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2025ஆம் ஆண்டு ஓகஸ்ட் மாதத்தில் மேற்படி சிறைச்சாலையில் நாளொன்றில் தடுத்து வைக்கப்பட்ட கைதிகளின் சராசரி எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) name of the first prison that was established in Sri Lanka;

(ii) number of inmates that were held in that prison when it commenced operations;

(iii) number of prisons that are in Sri Lanka at present;

(iv) names of the said prisons;

(v) number of inmates currently held in each of the said prisons, separately for male and female inmates; and

(vi) cell space allocated per inmate in a prison in square feet?

[ගරු සුජීව දිසානායක මහතා]

(b) Will he also inform this House the -

(i) name of the largest prison in the North-western Province;

(ii) maximum number of inmates that can be held in the said prison; and

(iii) average number of inmates that were held in the said prison on a single day in August 2025?

(c) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වැලිකඩ බන්ධනාගාරය වර්ෂ 1844දී පිහිටුවන ලදී.

(ii) ඒ සඳහා දත්තයන් නොමැත.

(iii) ඇමුණුම 01 යටතේ දක්වා ඇත.

(iv) ඇමුණුම 01 යටතේ දක්වා ඇත.

ඇමුණුම 01 **සභාගත*** කරමි.

ඇමුණුම 01

Table 1.1

PRISON INSTITUTIONS OF SRI LANKA

1.1.1 **Prison Headquarters, Colombo 09, Sri Lanka.**
(Functioning under the Ministry of Justice, Human Rights and Legal Reforms, Sri Lanka)

1.1.2 **Center for Research and Training in Corrections, Colombo 09.**

1.2.0 **Closed Prisons - (For Convicted Prisoners) - 04**

1.2.1 Welikada Prison
1.2.2 Mahara Prison
1.2.3 Bogambara Prison
1.2.4 Angunakolapelessa Prison

1.3.0 **Remand Prisons - 18**

1.3.1 Colombo
1.3.2 Jaffna
1.3.3 Anuradhapura
1.3.4 Batticaloa
1.3.5 Badulla
1.3.6 Galle
1.3.7 Matara
1.3.8 Negombo
1.3.9 New Magazine
1.3.10 Kegalle
1.3.11 Trincomalee
1.3.12 Kalutara
1.3.13 kuruwita
1.3.14 Boossa
1.3.15 Monaragala
1.3.16 Polonnaruwa
1.3.17 Wariyapola
1.3.18 Vavuniya

1.4.0 **Work Camps - 10**

1.4.1 Homagama
1.4.2 Meetirigala
1.4.3 Kandewatta
1.4.4 Weerawila *
1.4.5 Pitabeddara
1.4.6 Hangilipola
1.4.7 Wariyapola (Under controlling by Wariyapola Remand Prison)
1.4.8 Kuruwita (Under controlling by Kuruwita Remand Prison)
1.4.9 Kadurugas-ara (Thunkama)
1.4.10 Ambepussa*

1.5.0 **Open Prison Camps - 02**

1.5.1 Pallekelle *
1.5.2 Anuradhapura (Under controlling by Anuradhapura Remand Prison)

1.6.0 **Training Schools - 01**

1.6.1 Training School for Youthful Offenders, Homagama.

1.7.0 **Correctional Centres for Youthful Offenders - 02**

1.7.1 Pallansena C.C.Y.O. - Closed Prison and Open Camp
1.7.2 Taldena C.C.Y.O. - Open Camp *
* These Institutions are used as Centres for Drug Rehabilitation Operations.

1.8.0 **Lock - Ups - 23**

Name of Lock - ups		District
1.8.1 Ampara	-	Ampara
1.8.2 Avissawella	-	Colombo
1.8.3 Balangoda	-	Rathnapura
1.8.4 Balapitiya	-	Galle
1.8.5 Elpitiya	-	Galle
1.8.6 Chilaw	-	Puttalam
1.8.7 Puttalam	-	Puttalam
1.8.8 Embilipitiya	-	Rathnapura
1.8.9 Gampaha	-	Gampaha
1.8.10 Gampola	-	Kandy
1.8.11 Hambantota	-	Hambantota
1.8.12 Kalmunai	-	Ampara
1.8.13 Kilinochchi	-	Kilinochchi
1.8.14 Kuliyapitiya	-	Kurunegala
1.8.15 Kurunegala	-	Kurunegala
1.8.16 Maho	-	Kurunegala
1.8.17 Mannar	-	Mannar
1.8.18 Matale	-	Matale
1.8.19 Mullaitivu	-	Mullaitivu
1.8.20 Hatton	-	Nuwara Eliya
1.8.21 Nuwara Eliya	-	Nuwara Eliya
1.8.22 Panadura	-	Kalutara
1.8.23 Point Pedro	-	Jaffna

(v) ඊට අදාළ දත්ත පත්‍රිකාව මට ලැබුණා. එය ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

ඇමුණුම 02 **සභාගත*** කරමි.

ඇමුණුම 02

Morning Un-Lock on 07th of Octoberr 2025

Institutions	Convicted All Total		Unconvicted All Total		TOTAL
	M	F	M	F	
Welikada .P	2994	97	76	626	3793
Prison Hospital	145	0	171	0	316
Colombo R.P	29	0	3572	0	3601
Magazine R.P	60	0	2903	0	2963
Mahara .P	651	0	3157	0	3808
KandeWatte W.R.C	46	0	0	0	46
Meethirigala W.C	14	0	0	0	14
Gampaha	1	0	4	0	5
Bogambara R.P	[illegible]	41	1226	74	2245
Gampola	1	0	0	0	1
Hatton	1	0	0	0	1
Matale	0	0	0	0	0
Angunakolapelessa.P	709	55	1046	30	1840
Kadurugas Ara. W.C	47	0	0	0	47
Embilipitiya	0	0	0	0	0
Hambantota	0	0	0	0	0
Anuradhapura R.P	214	2	785	41	1042
Anuradhapura W.C	164	0	0	0	164
Trincomalee R.P	76	0	326	19	421
Kalutara R.P	106	6	1717	148	1977
Panadura	0	0	0	0	0
Kuruwita R.P	114	3	925	24	1066
Kuruwita W.C	143	0	0	0	143
Avissawella	0	0	0	0	0
Balangoda	0	0	0	0	0
Batticaloa R.P	119	3	635	45	802
Kalmune	0	0	0	1	1
Badulla R.P	57	1	393	26	477
Nuwaraeliya	3	0	2	0	5

Morning Un-Lock on 07th of Octoberr 2025

Institutions	Convicted All Total		Unconvicted All Total		TOTAL
	M	F	M	F	
Galle R.P	128	0	1377	63	1568
Elpitiya	1	0	10	0	11
Balapitiya	1	0	5	0	6
Matara R.P	89	3	302	30	424
Pitabeddra W.C	14	0	0	0	14
Negambo R.P	162	6	1835	113	2116
Chilaw	0	0	0	0	0
Vavunia R.P	80	0	226	11	317
Mannar	0	0	0	0	0
Kegalle R.P	88	0	885	0	973
Kurunegala	1	0	0	0	1
Ambepussa W.C	249	0	0	0	249
Wariyapola R.P	212	7	1388	74	1681
Hangilipola W.R.C	49	0	0	0	49
Maho	1	0	0	0	1
Kuliyapitiya	1	0	0	0	1
Puttam	0	0	0	0	0
Jaffna Prison	202	3	856	33	1094
Boossa Prison	80	0	366	0	446
Polonnaruwa R.P	75	0	265	4	344
Monaragala R.P	95	1	339	17	452
Ampara	1	0	2	0	3
Pallekele O.P.C	666	0	0	0	666
Homagama W.C	281	0	0	0	281
WeeraWila W.C	384	0	0	0	384
Pallansena C.C.Y.O	353	0	296	0	649
Taldena C.C.Y.O	369	0	0	0	369
GRAND TOTAL	6598	208	16938	1034	24778

M - Male
F - Female
Con -Condemned
P.T.A - Prevention of Terrorism Act.
T.S.Y.O -Traning School Of Youthfull Offenders

P - Prison
R.P - Remand Prison
W.R.C -Work Released Camp
W.C -Work Camp
L .Up -Lock-ups

(vi) සිර කුටියක (cell) වර්ග මීටර 5.4 (එක් අයෙකුට)
සිර කුටියක (cell) වර්ග මීටර 3.4 (එක් අයෙකුට වැඩි නම්)
ශාලාවක (ward) වර්ග මීටර 3.5 (එක් අයෙකුට)

(ආ) (i) වාරියපොළ බන්ධනාගාරය.

(ii) 418කි.

(iii) සාමාන්‍ය 1,636කි.

(ඇ) අදාළ නොවේ.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන් වාරියපොළ බන්ධනාගාරය ස්ථානගත කරලා තිබෙන්නේ ගම්මානයක් මැද්දේ. ඒකට ප්‍රධාන මාර්ගයේ ඉඳලා සාමාන්‍යයෙන් කිලෝමීටර එකහමාරක් විතර ඇතුළට යන්න ඕනෑ. මේ බන්ධනාගාරයට වයඹ පළාතේ බොහෝ ප්‍රදේශවලින් රැඳවියන් ගෙනැල්ලා නතර කර තිබෙනවා. ඔවුන් බලන්න විවිධ ප්‍රදේශවල ජනතාව ඒ ගම්මානය හරහා ඇතුළට ගමන් කරනවා. ඒ නිසා මේ වෙනකොට විශාල අනාරක්ෂිතභාවයක් ඒ ප්‍රදේශය

තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ මතු වෙලා තිබෙන අනාරක්ෂිතභාවය පහ කරන්නට, ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් තිබෙනවා, අඩුම වශයෙන් පොලිස් මුරපොළක් හෝ දමන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ වාගේ පියවරකට අධිකරණ අමාත්‍යතුමා හැටියට උත්තරයක් දෙනවාද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේ ගොඩක් රිමාන්ඩ් බන්ධනාගාර මීට පෙර ඇති කරපු ස්ථානවලම තමයි තිබෙන්නේ. එහි ගමේ ජනතාවට යම් ගැටලුවක්, මොනවා හරි පැහැදිලි කිරීමක්, බියක් හෝ දැනෙනවා නම්, එය විසඳන්න අපි පියවර ගන්නට ඕනෑ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරලා, අවශ්‍ය නම් ඉල්ලූ පරිදි පොලිස් මුර පොළක් පවත්වන්න කටයුතු කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මාත් සමඟ ඒ ගැන පොඩ්ඩක් සාකච්ඡා කරලා එම ගැටලුව ලිපියකින් ඉදිරිපත් කරන්න කියලා. එතකොට මට ඒ සඳහා මැදිහත් වෙන්න පුළුවන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ සහාය ද ඇතුව.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. වාරියපොළ බන්ධනාගාරය තුළ අක්කර 25කට එහා දැවැන්ත භූමියක් තිබෙනවා. මම හිතන විධියට, අපේ අධිකරණ අමාත්‍යතුමා ප්‍රකාශ කරපු ආකාරයට ඒකේ සාමාන්‍යයෙන් රඳවන්න පුළුවන් රැඳවියන් ප්‍රමාණය 418යි.

නමුත් මෙහි රැඳවියන් 1,600කට එහා ප්‍රමාණයක් දවස ගණනේ රැඳී සිටින නිසා පාරිසරික ප්‍රශ්න ගොඩක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම, ඒ අවට ගම්මානයේ තිබෙනවා විශාල වැවක්. මේ බන්ධනාගාරයෙන් නිකුත් කරන බොහෝ අපද්‍රව්‍ය ඒ වැවට මුසු වෙනවා. ඒ නිසා පාරිසරික ප්‍රශ්නයක් මතු වෙනවා. මේ ආසන්නයේ දැදුරු ඔය ආශ්‍රිත ජල පිරිපහදු මධ්‍යස්ථානය තිබෙනවා. ඒකටත් මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එම බන්ධනාගාර භූමිය තුළ අලුතින් ගොඩනැඟිලි ඉදිකිරීමට හැකියාව තිබෙනවා. ඒ නිසා ඉදිරි අය වැයේදී ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඒ පහසුකම් ටික සපයන්න මැදිහත් වනවාද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, උත්තරය, ඔව්. මක් නිසාද, අපි බැලුවොත් අපේ සමස්ත රැඳවියන් තබාගන්න පුළුවන් ප්‍රමාණය දස දහස් ගණනක්. ඊට වඩා අධික ප්‍රමාණයක් දැන් රිමාන්ඩ් බන්ධනාගාරවල සහ සාමාන්‍ය සිර ගෙවල් තුළ සිටිනවා. මේ වන විටත් අපි අලුතින් ගොඩනැඟිලි හදන්නත්, සමහර බන්ධනාගාර වෙනත් ස්ථානවලට විතැන් කරන්නත් කටයුතු කරමින් යනවා. ඒ වාගේම, ඔබතුමා කියන කාරණය නිවැරදියි. මා වාරියපොල බන්ධනාගාරය ගැන නොදන්නවා වුණාට ගොඩක් බන්ධනාගාරවල රැඳවියන් ප්‍රමාණය වැඩි වීම නිසා සෞඛ්‍යාරක්ෂක ප්‍රශ්නත් ඉස්මතු වෙලා තිබෙනවා. මම අනිවාර්යයෙන්ම මේ ගැන අවධානය යොමු කරනවා. මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉදිරියේදීත් මට මේ පිළිබඳ තවත් කරුණු දක්වන්න කියලා. මා මේ සම්බන්ධව පියවර ගන්නම්. මොකද, ඒ රැඳවියන්ගේ ආරක්ෂාවත් ඕනෑ, වටපිටාවේ වෙසෙන ජනතාවගේ ආරක්ෂාවත් ඕනෑ. ඒ සියල්ල බලන්න කටයුතු කරනවා.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු දෙනියායේ පිහිටි ඉඩම: වර්තමාන තත්ත්වය
தெனியாயவிலுள்ள இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணி: தற்போதைய நிலை
LAND IN DENIYAYA OWNED BY CEYLON PETROLEUM CORPORATION: CURRENT STATUS

1343/2025

10. ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල- මාදම්පේ ප්‍රධාන මාර්ගයේ, රත්නපුර දිසාවට හැරෙන දෙනියාය, 51 හන්දියේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ඉඩමක් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩමේ වර්තමාන තත්ත්වය සහ භාවිත කරනු ලබන කාර්යය කවරේද;

(iii) මීට පෙර ඉහත ඉඩමේ ඉන්ධන පිරවුම්හලක් පිහිටුවා තිබූ අතර මේ වනවිට එය වසා දමා ඇති බව දන්නේද;

(iv) එය වසා දැමීමට හේතුවූ කරුණු කවරේද;

(v) එම ඉඩමේ නව ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබේද;

(vi) එම ඉන්ධන පිරවුම් හල කඩිනමින් ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் கொட்டபொல பிரதேச செயலாளர் பிரிவில், காலி - மாதம்பை பிரதான வீதியில், இரத்தினபுரி பக்கம் திரும்பும் தெனியாய 51வது சந்தியில், இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணியொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி காணியின் தற்போதைய நிலையும் எத்தேவைகளுக்காக அக்காணி பயன்படுத்தப்படுகின்றது என்பதையும்;

(iii) இதற்கு முன்னர் மேற்படி காணியில் எரிபொருள் நிரப்பு நிலையமொன்று அமைக்கப்பட்டு இருந்ததுடன், தற்போது அது மூடப்பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

(iv) அதனை மூடுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி காணியில் புதியதோர் எரிபொருள் நிரப்பு நிலையத்தை நிர்மாணிப்பதற்குத் தேவையான நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) மேற்படி எரிபொருள் நிரப்பு நிலையத்தை துரித கதியில் நிர்மாணிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether there is a land owned by the Ceylon Petroleum Corporation at Junction 51, Deniyaya on the Galle-Madampe Main Road towards Ratnapura in the Kotapola Divisional Secretary's Division of the Matara District;

(ii) if so, the current condition of it and the purpose for which the said land is currently used;

(iii) whether he is aware that a filling station was previously established on the said land and that it has now been closed;

(iv) the reasons for the closure of the said filling station;

(v) whether necessary steps have been initiated to construct a new filling station on the said land; and

(vi) whether steps will be taken to promptly construct the said filling station?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රාදේශීය ලේකම් විසින් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දෙන ලද ඉඩමක් සංස්ථාව සතුව පවතී.

(ii) එම ඉඩමෙහි බෙදුම්පළක් පැවැති අතර, එය 2019.07.18 දින සිට ක්‍රියාත්මක නොවේ. දැනට එම ඉඩමෙහි බෙදුම්පළ ගොඩනැඟිලි හා භූගත ටැංකියක් පවතී.

(iii) ඔව්. පිරවුම්හල 2019.07.18 දින සිට වසා ඇත.

(iv) පැවැති බෙදුම්කාරිත්වය සංස්ථා ගිවිසුම්වලට පටහැනිව තෙවන පාර්ශ්වයක් වෙත පැවරීමට අදාළව ලැබුණු තොරතුරු මත, ප්‍රාදේශීය කළමනාකාර (දකුණ) විසින් විමර්ශන අංශය වෙත 2019.01.07 දිනැති ලිපිය මඟින් පැමිණිලි කිරීමෙන් පසු විමර්ශනය කර වසා දමා ඇත.

මෙහි බෙදුම්කාරිත්වය දැරූ කේ.කේ. හෙට්ටිආරච්චි මහත්මිය මියගිය බව දැනගත් පසු ප්‍රාදේශීය කළමනාකාර (දකුණ) විසින් ප්‍රදේශයේ අදාළ ග්‍රාම නිලධාරි වෙතින් ඒ බව සනාථ කරගෙන ඇති අතර, 2021.01.05 දිනැති ලිපිය මඟින් ඒ සම්බන්ධව සංස්ථාව වෙත දන්වා ඇත.

(v) පාලනාධිකාරියේ තීරණයක් අනුව ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී.

(vi) පාලනාධිකාරිය ගනු ලබන ඉදිරි තීරණ මත සිදු වේ.

(ආ) සංස්ථා පාලනාධිකාරිය ගනු ලබන තීරණ මත සිදු වේ.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේක ඉතා වැදගත් සංචාරක කලාපයක පිහිටි ස්ථානයක්. ඒ වාගේම ගාල්ල - මාදම්පේ ප්‍රධාන මාවත ඔස්සේ දෙනියායෙන් මාදම්පේ දෙසට හැරෙන, සුප්‍රසිද්ධ 51 හන්දිය කියන ස්ථානයේ තමයි මෙම ඉඩම පිහිටා තිබෙන්නේ. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මේ ස්ථානයේ ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිත කරන්න ඔබතුමාගේ පැත්තෙන් කටයුතු කරනවා නම් එය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා ප්‍රදේශයේ ප්‍රසිද්ධ සමුපකාර ආයතන දෙකක්ම, එනම් මොරවක්කෝරළයේ තේ නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය සහ සීමාසහිත කොටපොල විවිධ සේවා සමුපකාර සමිතිය යන ආයතන දෙකම ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, හැකි ඉක්මනින් මෙය ඉදිකිරීම සඳහා පියවරක් ගත හැකිද කියලා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඇත්තටම මම හිතනවා, දැන් ඒ සඳහා සැලසුම් සකස් කරමින් පවතින හින්දා ඒ ඉල්ලීම මට යොමු කළොත් කාටද දෙන්නේ කියන එක අපිට ඉක්මනින් තීරණය කරන්න පුළුවන් වෙයි කියලා. මොකද, සමුපකාරයක් හින්දා අපිට ලොකු ගැටලුවක් වෙන එකක් නැහැ. ඒ කටයුතු කරන්න පුළුවන්, අවශ්‍යතාව අනුව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නවක වදය: පාලනය කිරීම සඳහා පියවර

ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகத்தில் இடம்பெறும் பகிடிவதை: கட்டுப்படுத்துவதற்கான நடவடிக்கை

RAGGING AT SRI JAYEWARDENEPURA UNIVERSITY: CONTROL MEASURES

725/2025

1. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඇති පීඨවල මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පීඨය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලයේ මේ වනවිට නවක වදය ඉතා උග්‍ර ලෙස ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக் கழகத்தில் உள்ள பீடங்களில் கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை, பீடம் வாரியாக தனித்தனியே யாது என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி பல்கலைக்கழகத்தில் பகிடிவதை மிகத் தீவிரமாக இடம்பெற்று வருவதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அந்நிலையை கட்டுப்படுத்துவ தற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of students currently studying at each of the faculties of the University of Sri Jayewardenepura, separately;

(ii) whether she is aware that ragging is currently being carried out severely in the above-mentioned university; and

(ii) if so, the steps that will be taken to control this situation?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

පීඨය	උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාපීඨය	4,532
ව්‍යවහාරික විද්‍යාපීඨය	3,014
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යාපීඨය	5,319
වෛද්‍ය විද්‍යාපීඨය	1,160
තාක්ෂණ පීඨය	1,875
ඉංජිනේරු පීඨය	886 *
සම සෞඛ්‍ය විද්‍යාපීඨය	1,031 *
දන්ත වෛද්‍ය පීඨය	116
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	385
පරිගණක පීඨය	435
එකතුව	18,753

සටහන: * ඉංජිනේරු සහ සම සෞඛ්‍ය විද්‍යාපීඨවල දැනට කණ්ඩායම් 5ක් ඇත. අවසාන විභාගය ජූලි මස අවසානයේ පැවැත්වීමට නියමිතය.

(ii) 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවකවදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතෙහි අර්ථ නිරූපණයට අනුව විශ්වවිද්‍යාලයේ බොහෝ පීඨයන්හි නවකවදය ඇත. එහෙත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මේ වන විට නවකවදය ඉතා උග්‍ර ලෙස ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කරමි.

මීට පෙර ප්‍රධාන පිරිමි නේවාසිකාගාර සංකීර්ණයෙහි ප්‍රථම වසර සිසුන්ට නේවාසික පහසුකම් සපයනු ලැබුවද මේ වන විට විශ්වවිද්‍යාලයෙන් බාහිරව ප්‍රථම වසර පිරිමි සිසුන් නේවාසික කිරීමෙන් සහ විනයාධිකාරි, නියෝජ්‍ය විනයාධිකාරිවරුන්, ආරක්ෂක අංශය, ශිෂ්‍ය විනය පාලක නිලධාරින්, ශාලාධිපතිවරුන් හා උප ශාලාධිපතිවරුන්ගේ දැඩි අධීක්ෂණය නිසාවෙන් නවකවද සිද්ධීන් ඇති වීම වළක්වා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ලබයි. තාක්ෂණ පීඨයේ එකම නේවාසිකාගාර ගොඩනැඟිල්ලක වසර 4හිම සිසුන් නේවාසික කිරීම ගැටලුසහගත වන අතර එකී පීඨයේද ප්‍රථම වසර සිසුන් බාහිර නේවාසිකාගාරයන්හි නේවාසික කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

යම් සිදුවීමකදී ඒ පිළිබඳව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ඉතාමත් ඉක්මනින් ගනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය විධිමත් ක්‍රමවේදයක් ද ස්ථාපනය කොට ඇත. ඒ අනුව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමේදී අධිකරණයට කරුණු වාර්තා කොට ගැටලු විසඳාගත් අවස්ථා ද තිබේ.

(iii) විශ්වවිද්‍යාලය තුළ සිසුන් අතර සිදුවන අකටයුතුකම් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විනය මණ්ඩලයක් පත් කර ඇති අතර හිංසනය සිදු කරන සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කොමිෂන් සභා චක්‍රලේඛ අංක 946, ශිෂ්‍ය විනය පිළිබඳ 1986 අංක 01 දරන අතුරු ව්‍යවස්ථාව සහ 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවකවදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත යටතේ දඬුවම් කිරීම සිදු කරනු ලැබේ.

ඉහත අතුරු ව්‍යවස්ථාව අනුව විශ්වවිද්‍යාලයේ විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විනය මණ්ඩලයක් සංස්ථාපනය කොට ඇත. එකී විනය මණ්ඩලය පහත තැනැත්තන්ගෙන් සමන්විත වේ.

1. උපකුලපතිතුමා.
2. විනයාධිකාරිතුමා.
3. පීඨාධිපතිවරුන්.
4. අධ්‍යක්ෂ/ශිෂ්‍ය සුබසාධක
5. ප්‍රධාන වෛද්‍ය නිලධාරි
6. පාලක සභාවේ පත් කරන ලද සාමාජිකයින් අතුරින් තෝරා පත් කරන ලද දෙදෙනෙක්.
7. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (නීති) ලේඛකාධිකාරි හෝ ඔහුගේ නාමිකයා නිල බලයෙන් විනය මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

විශ්වවිද්‍යාලයේ විනය ක්‍රියාමාර්ග ගැනීමට ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විනයාධිකාරි තනතුර සඳහා පත් කොට ඇති අතර විශ්වවිද්‍යාලයේ මේ වන විට ස්ථාපිත කොට ඇති පීඨ 10 සඳහාම නියෝජ්‍ය විනයාධිකාරිවරුන්, පොදු වශයෙන් විනයාධිකාරිවරුන්, විනයාරක්ෂක නිලධාරින්, ශිෂ්‍ය උපදේශකවරුන් සහ ආරක්ෂක අංශය පත් කොට ඇත.

මීට අමතරව ගරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ඇමතිතුමියගේ උපදෙස් මත පත් කොට ඇති විශ්වවිද්‍යාල පද්ධතියේ සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන තුළ පවතින නවකවදය, හිංසනය හා සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීම සඳහා වූ ජාතික කාර්ය සාධක බලකාය තුළින් ද මෙරට විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන තුළ ප්‍රචණ්ඩත්වයෙන් තොර වටපිටාවක් සහ සංස්කෘතියක් නිර්මාණය කිරීමටත් ඒ වෙනුවෙන් අදාළ වූ මැදිහත්වීම් සිදු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

පුත්තලම දිස්ත්‍රික්කයේ, පල්ලකන්දල් දේවස්ථානය: ආගමික කටයුතු පවත්වාගෙන යෑම

புத்தளம் மாவட்டத்திலுள்ள பல்லகந்தல் தேவாலயம்: மத வழிபாடுகளை மேற்கொள்ளல்

PALLAKANDAL CHURCH, PUTTALAM DISTRICT: PERFORMANCE OF RELIGIOUS ACTIVITIES

958/2025

6. ගරු ගයාන් ජනක මහතා (ගරු අජිත් ගිහාන් මහතා වෙනුවට)

(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு அஜித் கிஹான் சார்பாக)

(The Hon. Gayan Janaka on behalf of the Hon. Ajith Gihan)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පල්ලකන්දල් දේවස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බාධා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தின், பல்லகந்தல் தேவாலயத்தில் மத வழிபாடுகளை மேற்கொள்வதற்கு வனசீவராசிகள் திணைக்களம் மற்றும் வனப் பாதுகாப்புத் திணைக்களத்தின் உத்தியோகத்தர்கள் இடையூறு செய்வதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that the officials of the Department of Wildlife Conservation and the Department of Forest Conservation are obstructing the performance of religious activities at the Pallakandal Church in the Puttalam District; and

(ii) if so, the reasons for that?

(b) If not, why?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ආගමික කටයුතු පවත්වාගෙන යාමට බාධා පමුණුවන්නේ නැත.

(ii)
- පල්ලකන්දල් දේවස්ථානය සහ දේවස්ථානයේ ප්‍රවේශ මාර්ගය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන විල්පත්තු ජාතික උද්‍යානය තුළ පිහිටා ඇත. එබැවින්, මෙම දේවස්ථානයට පිවිසීම හා වන්දනාමන කිරීමේ කාර්යයන් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඍජු මැදිහත්වීමක් නොමැත. මෙම දේවස්ථානය පිහිටි භූමිය විල්පත්තු ජාතික උද්‍යානය තුළ පිහිටිය ද, දේවස්ථානයේ ආගමික කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කිසිදු ආකාරයක කොන්දේසි පැනවීමක් හෝ බාධා කිරීමක් සිදු කර නොමැති අතර දෙපාර්තමේන්තු නිලධාරීන් පවත්නා නීති රාමුවෙන් බැහැරව කටයුතු කිරීම සම්බන්ධව පැමිණිලි ලැබී නොමැත.
- තවද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික උද්‍යාන තුළට ඇතුළුවීමට නෛතික ප්‍රතිපාදන පවතින්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් ලබා ගෙන හෝ වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ 3(3)අ වගන්තිය ප්‍රකාරව සාම්ප්‍රදායික පරිචය අනුව අත්කරගෙන ඇති අයිතිවාසිකම් යටතට ගැනෙන කටයුත්තක් සඳහා පමණි.
- වනාතවිල්ලුව ශාන්ත ජූඩ් දේවස්ථානයේ පාලනාධිකාරිය විසින් සෑම මසකම පළමු අඟහරුවාදා දින දේවස්ථානයේ සිදු කරන පූජාව පැවැත්වීම සඳහා අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලීම් කර ඇති අතර උක්ත පූජාව සාම්ප්‍රදායික කටයුත්තක් බව සනාථ කර ගැනීමට තරම් ප්‍රමාණවත් තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් එවැනි තොරතුරු දේවස්ථානය සතුව පවතින්නේ නම් කඩිනමින් අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් වනාතවිල්ලුව ශාන්ත ජූඩ් දේවස්ථානයෙන් ඉල්ලා සිටි නමුත් මේ වනතෙක් සෑම මසකම පළමු අඟහරුවාදා දින දේවස්ථානයේ සිදු කරන පූජාව සාම්ප්‍රදායික කටයුත්තක් බව සනාථ කිරීමට ප්‍රමාණවත් තොරතුරක් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර නොමැත. එබැවින් ශාන්ත ජූඩ් දේවස්ථානයේ පාලනාධිකාරිය විසින් සෑම මසකම පළමු අඟහරුවාදා දින දේවස්ථානයේ සිදු කරන පූජාව සාම්ප්‍රදායික කටයුත්තක් බව පිළිගත හැකිදැයි සනාථ කර ගැනීමට මෙම කරුණ නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත.
- පල්ලකන්දල් දේවස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිසිදු බාධාවක් සිදු නොකරන අතර මෙම දේවස්ථානය ජාතික උද්‍යානයක් තුළ පිහිටා ඇති බැවින් දේවස්ථානය වෙත පැමිණෙන බැතිමතුන් හා දේවස්ථානයේ පාලනාධිකාරිය විසින් වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය කරන අවස්ථාවලදී පමණක් නීතිය ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් කටයුතු කර ඇත. තවද, ජාතික උද්‍යානය තුළ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ද මෙම දෙපාර්තමේන්තුව විසින් නීතිය ක්‍රියාත්මක කර ඇති නමුත් එය පල්ලකන්දල් දේවස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමට බාධා කිරීමක් නොවන බවද ප්‍රකාශ කරමි.

ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

"සුව සැරිය" ගිලන් රථ සේවාව සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු
"சுவ செரிய" நோயாளர் காவு வண்டிச் சேவை மற்றும் சுகாதாரத் துறையிலுள்ள பிரச்சினைகள்
"SUWA SERIYA" AMBULANCE SERVICE AND ISSUES OF HEALTH SECTOR

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුව සෞඛ්‍ය මානව අයිතිවාසිකමක් ලෙස සලකනවා. කාර්යක්ෂම සෞඛ්‍ය සේවයක් ඇති කිරීමටත්, ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සෞඛ්‍ය සේවාවක් සැපයීමට මෙන්ම රෝගීන්ගේ අයිතීන් සහ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමට වර්තමාන රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා ජනතාව වෙත පොරොන්දු වී තිබෙනවා.

කෙසේ වුවත්, වර්තමාන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පවතින අතිවිශාල ගණනක් වූ ගැටලු හේතුවෙන් රෝගීන් මෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත වන සෞඛ්‍ය සේවකයන් ද දැඩි අපහසුතාවට පත්ව ඇති තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කරවීම පිණිස ජාතික වැදගත්කමකින් යුත් පහත සඳහන් ප්‍රශ්න මම මේ අවස්ථාවේ යොමු කර සිටිනවා.

1. 2025.10.12 දිනැති පුවත්පත් දැන්වීමක් මඟින්, ඕනෑම තැනැත්තෙකුට පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවා සහ හදිසි ප්‍රතිචාර සේවා නොමිලේ ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති 1990 සුව සැරිය පදනමේ ගිලන් රථ සේවයේ නම වෙනස් කොට "1990 ශ්‍රී ලංකා හදිසි වෛද්‍ය සේවය" වශයෙන් නම් කරනු ලැබ තිබෙන්නේ කුමන හේතුවකටද? එසේම එම ගිලන් රථවල වර්ණය වෙනස් කිරීමට කටයුතු කර තිබේද? ඒ කවදා සිටද?

2. අනතුරක් සිදු වූ ස්ථානයට වඩාත් වේගයෙන් ළඟා වන ගිලන් රථ සේවයක් ලෙස ලොව පිළිගෙන ඇති 1990 සුව සැරිය ගිලන් රථ සේවයේ පරමාර්ථ වෙනස් කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද? පසුගිය වසර තුළ සුව සැරිය පදනම පනත යටතේ හදිසි ප්‍රතිචාර සේවා සහ පූර්ව රෝහල් ප්‍රතිකාර ලබා දිය යුතු ආකාරය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ගැසට් කරනු ලැබ ඇති රෙගුලාසි මොනවාද? ඒවා මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

   ගරු කථානායකතුමනි, 1990 සුව සැරිය ගිලන් රථ සේවය මේ රටට ගෙන එන කොට එය 'විදේශීය රහස් ඔත්තු සේවයක කුමන්ත්‍රණයක්' කියලා තමයි මේ සමාජයේ ප්‍රචාරය කළේ. මෙහිදී විශේෂයෙන්ම අපි ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමාගේ මෙහෙයවීමෙන් තමයි ඒ සුව සැරිය සේවා ව්‍යාපෘතිය මේ රටේ ජනතාවට පරිත්‍යාගයක් වශයෙන් ලැබුණේ. මොනවාටද, එහි නම වෙනස් කරන්නේ? මොනවාටද, එහි පාට වෙනස් කරන්නේ? ඒ මොන ලජ්ජා නැති වැඩක්ද?

3. ආර්ථික අර්බුදයෙන් පසු රටින් පිටව යන වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන් සහ හෙද හෙදියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි වී තිබෙනවා. 2023, 2024 සහ 2025 වර්ෂවල පිළිවෙළින් මේ දක්වා රට හැර ගිය වෛද්‍යවරුන් විශේෂඥ වෛද්‍යවරුන්, හෙද හෙදියන් සහ අනෙකුත් වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාව අදාළ ක්ෂේත්‍ර සමඟ වෙන් වෙන් වශයෙන් කොපමණද? මේ හේතුවෙන් රජයේ රෝහල්වල ඇති වී තිබෙන පුරප්පාඩු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියැළෙන්නන්හට ප්‍රමාණවත් වැටුප් නොලැබීම මෙම බුද්ධි ගලනයට හේතුව බව රජය පිළිගන්නේද? මෙම බුද්ධි ගලනය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙතෙක් ගෙන ඇති නිශ්චිත පියවර මොනවාද?

4. වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දුකරණය සිදු කරන රජයේ රෝහල්වල ඒ සඳහා අවශ්‍ය වන AVF ඉඳිකටුවල - needles - හිඟයක් පවතින බව රජය දන්නේද? මේ හේතුවෙන් අසරණභාවයට පත්ව ඇති වකුගඩු රෝගීන්ට සහන සැලසීම සඳහා රජය විසින් ගනු ලබන කඩිනම් පියවර මොනවාද?

5. කැබිතිගොල්ලෑව වැනි දුෂ්කර ප්‍රදේශවල රජයේ රෝහල්වල පවතින භෞතික සහ මානව සම්පත්වල හිඟය හේතුවෙන් එම රෝහල්වල කාර්ය මණ්ඩලය සහ මහ ජනතාව අත්විඳින දුෂ්කරතාව සම්බන්ධයෙන් රජයේ යෝජිත කඩිනම් වැඩ පිළිවෙළ කුමක්ද?

   අපි පසුගිය දවසක කැබිතිගොල්ලෑව රෝහලට රුධිර කාන්දුකරණ කට්ටලයක් පරිත්‍යාග කළා. එම රෝහලේ හොඳ ඉදිරි සංවර්ධන සැලැස්මක් නිර්මාණය කරලා තිබුණා. අපි රජය උනන්දු කරවනවා එම ඉදිරි සංවර්ධන සැලැස්ම ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා.

   එම ප්‍රදේශවලට වඩාත් අවශ්‍ය වන නව වෛද්‍ය සංකීර්ණ හා ශල්‍ය සංකීර්ණ ඉදිකිරීම සහ රුධිරකාන්දුකරණ ඒකකය සංවර්ධනය කිරීම කළ යුතුයි, කාර්ය මණ්ඩල සඳහා නිල නිවාසය ඉදිකිරීම කළ යුතුයි. එවැනි ගැටලු කෙරෙහි මේ වන විට රජයේ අවධානය යොමු කර තිබේද? නොඑසේ නම් ඒ මන්ද?

   ගරු ඇමතිතුමනි, බරපතළ හිඟයක් තිබෙනවා කාර්ය මණ්ඩලයේ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා විසඳුමක් ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

6. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සුදුසුකම් ඇති, ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් 301දෙනෙකුගේ කොන්ත්‍රාත් සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සඳහා 2023.10.01 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කරන ලද නමුත්, 2025 වර්ෂයේදී එම සේවකයින්ගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු නොකිරීමට හේතු මොනවාද?

7. මෙම කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකිරීම හේතුවෙන් එම මදුරු මර්දන සහායකයින් අත්විඳිමින් සිටින අපහසුතා සහ ආර්ථික දුෂ්කරතා සම්බන්ධයෙන් රජය දැනුවත්ද? මදුරු නාශක ඉසින සේවාව රටේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය සේවාවක් වන බැවින්, මෙම සේවකයින්ගේ සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ ඔවුන්ගේ සේවා ආරක්ෂාව සහතික කිරීමට රජය සතු වැඩ පිළිවෙළක් තිබේද?

8. මෙම මදුරු මර්දන සහායකයින් ස්ථිර සේවයට ඇතුළත් කර ගැනීම සඳහා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද? එසේ නම්, ඒ සඳහා වන කාලරාමුව කුමක්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මෙම ප්‍රශ්නය ඇසුවාට බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමනි. සෞඛ්‍ය සේවය සම්බන්ධයෙන් ඇසුවා වුණාට මෙහි ක්ෂේත්‍ර 5ක ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා මම කාලය අරගෙන පිළිතුර ඉදිරිපත් කරන්නම්.

1. 2018 අංක 18 දරන 1990 සුව සැරිය පදනම පනතේ පූර්විකාව ප්‍රකාරව පළ වූ පුවත්පත් දැන්වීමෙහි 1990 අංකය හෝ "සුව සැරිය පදනම" යන නාමය ඉවත් කිරීමක් සිදු කර නොමැත.

   එම පනතේ පූර්විකාව ප්‍රකාරව පදනමේ පරමාර්ථය පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ හා හදිසි ප්‍රතිචාර සේවාව ලෙස පුවත්පත් දැන්වීමේ පැහැදිලිව සඳහන් කොට ඇත. ගිලන් රථවල වර්ණය වෙනස් කිරීමට කිසිදු තීරණයක් ගෙන නොමැත.

   2015-2020 කාලයේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ඇතුළු ඔබතුමන්ලාගේ ආණ්ඩුව, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් මැදිහත් වෙලා ගෙනාපු 1990 ගිලන් රථවල ඔබතුමන්ලා ගාපු කොළ පාට අපි එහෙමම තියාගෙන යනවා. ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා. එය නවීකරණය කළ යුතුයි. වැදගත්ම දේ ඒකයි. විශේෂයෙන්ම හදිසි ප්‍රතිචාර සේවා සහ emergency medical services ලෝකයේ ව්‍යාප්ත වෙමින්, නවීකරණය වෙමින් පවතිනවා. මොකද, අප මේ සේවයට බඳවා ගන්නේත් Emergency Driversලා, Emergency Medical Techniciansලා බව ඔබතුමාත් දන්නවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව වැදගත්ම දේ තමයි, 1990 කියන අංකය ජනතාවට ඕනෑම වෙලාවක මතක හිටින ලෙස register කරන එක. ඒ නිසා කිසි වෙනසක් වෙන්නේ නැහැ. ඒ කියන්නේ, "සුව සැරිය පදනම" යන්නෙහි හෝ 1990 කියන එකෙහි හෝ ඒ කොළ පාට වර්ණයෙහි හෝ කිසිදු වෙනසක් වන්නේ නැහැ. ලෝකයේ අලුත් වන තත්ත්වයන් අනුව ඒකට අලුත් තාක්ෂණය එකතු කරමින් පුළුවන් තරම් නවීකරණය කරන්න අපි උත්සාහ කරනවා.

   අප මේ වෙනුවෙන් කරපු දේවල් කියන්න මෙය වෙලාව නොවෙයි. නමුත්, මේ වෙනුවෙන් මේ වසරට පමණක් අපි අය වැයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කළා. ඒ වාගේම EMTsලා බඳවා ගැනීම කරමින් පවතිනවා. තවත් ගිලන් රථ 100ක් ලබා ගන්න ඉන්දියානු රජයත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා. ඒ වාගේම තවත් ගිලන් රථ 45ක්, එනම් 20ක් ණය ආධාර යටතේත්, 25ක් ප්‍රදානයක් ලෙසත් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබීමට නියමිතයි. ඒ අනුව මේ ගිලන් රථ බලඇණිය 500ක් දක්වා වර්ධනය කරලා ඒකට අවශ්‍ය කාර්ය මණ්ඩලයට උසස් තාක්ෂණය සහිත පුහුණුව ලබා දීලා නවීකරණ කටයුතු කිරීමට අපි මැදිහත් වෙනවා. මා හිතන විධියට, මෙම සේවය ආරම්භ කරන්නට මැදිහත් වෙච්ච අයගේ ප්‍රාර්ථනාව ඉටු වන්නේ සහ ඔවුන්ට වටිනාකමක් එන්නේ මෙම සේවය ලෝකයේ පවතින අවශ්‍යතා අනුව ඉදිරියට වර්ධනය වුණොත් තමයි. ඒ නිසා මේ කටයුත්ත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාරගෙන අපේ සෞඛ්‍ය සේවාවේ කොටසක් බවට පත් කරමින් කටයුතු කරගෙන යනවා.

2. 2018 අංක 18 දරන 1990 සුව සැරිය පදනම පනතේ පූර්විකාව ප්‍රකාරව පදනමේ පරමාර්ථය ලෙස සඳහන් කර ඇති පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ හා හදිසි ප්‍රතිචාර සේවාව යන්න වෙනස් කිරීම සඳහා රජය කිසිදු ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැත.

   පසුගිය වසර තුළ පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ හා හදිසි ප්‍රතිචාර සේවාව හා සබැඳිව කිසිදු රෙගුලාසියක් ගැසට් කිරීමට කටයුතු කර නොමැත.

3. • විශේෂඥ වෛද්‍ය නිලධාරීන්

කාරණය	2023	2024	2025.10.17 දිනට
සේවය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව	16	26	14

• වෛද්‍ය නිලධාරීන්

		2023	2024	2025.10.07 දින දක්වා
වැටුප් රහිත විදේශ නිවාඩු	වෛද්‍ය නිලධාරීන්	453	388	203
	දන්ත වෛද්‍ය නිලධාරීන්	45	16	14
සේවය හැරයාම	වෛද්‍ය නිලධාරීන්	159	217	233
	දන්ත වෛද්‍ය නිලධාරීන්	20	11	25
ඉල්ලා අස්වීම	වෛද්‍ය නිලධාරීන්	154	186	75
	දන්ත වෛද්‍ය නිලධාරීන්	12	07	06
එකතුව	වෛද්‍ය නිලධාරීන්	766	791	511
	දන්ත වෛද්‍ය නිලධාරීන්	77	34	45

• හෙද නිලධාරීන්

කාරණය	2023	2024	2025.03.31 දක්වා
අනුමත වැටුප් රහිත විදේශ රැකියා නිවාඩු ලබා ඇති හෙද නිලධාරීන්	502	420	284

ඇත්තටම වසර පහක වැටුප් රහිත විදේශ නිවාඩු කියන එක සෞඛ්‍ය අමාත්‍යාංශයට දැඩිව බලපා තිබෙනවා. ඒ නිසා තමයි, අපි ආයතන සංග්‍රහය අනුව නිවාඩු ලබා ගැනීමට අවස්ථාව ලබා දීලා, ඒ සම්බන්ධයෙන් සීමා කිරීමක් සිදු කරලා තිබෙන්නේ.

මේ හේතුවෙන් රජයේ රෝහල්වල ඇති වෙලා තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව මෙසේයි.

- වෛද්‍ය නිලධාරීන්

දිවයින පුරා පිහිටා ඇති රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා 2025.01.31 දිනට අනුමත ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව	25,573
එදිනට සේවයේ නිරතව සිටි ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව	24,278
2024.10.30 දිනැති පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් පත්වීම් යටතේ 2025.09.15 දින පත් කර ඇති ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව	1,374

ඇත්තටම 2017-2018 cadre එක අනුව තමයි මේ බඳවා ගැනීම් සිදු කරලා තිබෙන්නේ. දැන් cadre revision එකක් යන නිසා අපට මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් මේ කාර්ය මණ්ඩලය වැඩි කර ගන්න පුළුවන්. ඔබතුමන්ලාට පෙනෙනවා ඇති, අනුමත කාර්ය මණ්ඩලය 25,573යි, දැනට එයින් 24,278ක් අපට ඉන්න බව.

- හෙද නිලධාරීන්

අනුමත සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
46,263	43,195	3,068

මෑතකදී මේ සඳහා 3,147ක් අලුතින් බඳවා ගත්තා. ඒ වාගේම ගිය සතියේ අපි 294කට පත්වීම් ලබා දුන්නා. තව 5,200ක් පුහුණුව ලබමින් සිටිනවා. ඒ අනුව මේ සඳහාත් අපි අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගත යුතුයි.

ඊළඟට අහන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියැළෙන්නන්හට ප්‍රමාණවත් වැටුප් නොලැබීම නිසාද මේක සිද්ධ වෙන්නේ කියලා. ඒක එහෙම නොවෙයි. ඔබතුමන්ලා දන්නවා ඇති, මේ කිසිදු ශ්‍රේණියක රාජ්‍ය නිලධාරීන්, කිසිදු ක්ෂේත්‍රයක නියැළෙන්නන් පාරට බැහැලා ඉල්ලීම් නොකළත්, අපි ඔවුන්ට දැනෙන මූලික වැටුප් වැඩිවීමක් පසුගිය අය වැයේදී ලබා දුන් බව. ඒක සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් අදාළයි. ඒ අනුව සාමාන්‍ය වශයෙන් ගත්තොත්, විශේෂඥ වෛද්‍යවරයෙකුට තිබුණු රුපියල් 88,000ක මූලික වැටුප රුපියල් 156,000 දක්වා වැඩි කළා. II ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකුට තිබුණු රුපියල් 58,305ක මූලික වැටුප රුපියල් 101,370 දක්වා වැඩි කළා. I ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකුට තිබුණු රුපියල් 71,805ක මූලික වැටුප රුපියල් 125,670 දක්වා වැඩි කළා. මේ සියලුදෙනාට 2027 වර්ෂයේ අතට ලැබීමට නියමිත මූලික වැටුප පදනම් කරගෙන, ඒගොල්ලන්ගේ extra duty එකේ දීමනා ලැබෙනවා, ඒ වාගේම PH එකේ දීමනා ලැබෙනවා. ඒ සියලු දීමනා ලැබෙනවා.

ඊළඟට හෙද නිලධාරීන් ගත්තොත්, III ශ්‍රේණියේ හෙද නිලධාරියෙකුට ලැබුණු මූලික වැටුප රුපියල් 32,525යි. එය රුපියල් 54,920 දක්වා වැඩි කළා. II ශ්‍රේණියේ හෙද නිලධාරියෙකුට ලැබුණු රුපියල් 37,635ක මූලික වැටුප රුපියල් 64,110 දක්වා වැඩි කළා. I ශ්‍රේණියේ හෙද නිලධාරියෙකුට ලැබුණු රුපියල් 44,965ක මූලික වැටුප රුපියල් 77,330 දක්වා වැඩි කළා. මේ අයට ඒ මත පදනම් වෙලා අතිකාල සහ නිවාඩු දින දීමනා ලැබෙනවා. ඒ වාගේම විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරියෙකුට ලැබුණු රුපියල් 50,200ක මූලික වැටුප රුපියල් 86,800 දක්වා වැඩි කළා.

ඊළඟට, වෛද්‍ය රසායනාගාර වෘත්තිකයන් - MLTs - සඳහා ලැබුණු රුපියල් 32,080ක මූලික වැටුප රුපියල් 54,120 දක්වා වැඩි කළා. ඒ, III ශ්‍රේණියේ නිලධාරියෙකුට. II ශ්‍රේණියේ නිලධාරියෙකුට රුපියල් 37,190ක් ලෙස තිබුණු මූලික වැටුප රුපියල් 63,310 දක්වා වැඩි කළා. I ශ්‍රේණියේ නිලධාරියෙකුට තිබුණු මූලික වැටුප රුපියල් 44,520යි, ඒක රුපියල් 76,530ක් දක්වා වැඩි කළා. මේ අයටත් අතිකාල, අමතර රාජකාරි දීමනා ඇතුළු සියල්ල මේ මූලික වැටුප මත පදනම් වෙලා වැඩි වෙනවා.

විශේෂඥ වෛද්‍ය නිලධාරි, වෛද්‍ය නිලධාරි, හෙද නිලධාරි සහ වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී යන තනතුරුවල වැටුප් පරිවර්තන සිදු වී ඇති ආකාරය විස්තරාත්මකව ඇමුණුම 01, 02 සහ 03 මඟින් දක්වා තිබෙනවා. ඒවා දීර්ඝ ඇමුණුම්. එම ඇමුණුම් මම **සභාගත*** කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, යම් කෙනෙකු රට අත්හැර යනවා නම් යන්නේ වැටුප් මත පදනම්ව පමණක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, රටේ ආර්ථිකයට සාපේක්ෂව මේ මොහොතේ දිය හැකි ඉහළ වැටුප් වැඩිවීමක් ඔවුන්ට ලබා දී තිබෙන බව. ආර්ථිකය වර්ධනය වන වේගය අනුව අපට මේ ගැන ඉදිරියේදී තවත් සලකා බලන්න පුළුවන්. නමුත්, අපි ඔවුන් ගෙදර ගෙන යන වැටුප වැඩි කිරීම සඳහා 2027 වර්ෂයේ අතට ලැබෙන මූලික වැටුපට අදාළව සියලු දීමනා වැඩි කරලා මේ වන විට ලබා දීලා තිබෙනවා. මේ අයට සේවය අත්හැර යෑම සඳහා විවිධ හේතු බලපානවා ඇති. ඉන් බොහොමයක් අපි නිරාකරණය කරගෙන යනවා. සමහර විට පරිපාලනයේ තිබෙන යම් යම් දුර්වලතා, සේවා ස්ථානයේ තිබෙන ප්‍රශ්න යනාදියත් අපි දැන් පුළුවන් තරම් නිරාකරණය කරගෙන යනවා, මේ අය රට තුළ රඳවා ගැනීම සඳහා.

4. මේ යටතේ ඔබතුමා අහන්නේ වකුගඩු රෝගීන්ට ලබා දෙන fistula needles ගැන. මම මේ ගැන මීට කලිනුත් පැහැදිලි කළා. මේ fistula needles අපට මාසයකට 40,000ක් පමණ වුවමනා කරනවා. මේකේ fixed සහ rotatable කියලා වර්ග දෙකක් තිබෙනවා. විපක්ෂ නායකතුමනි, මේ ටෙන්ඩරය භාර ගත් සැපයුම්කරු අපට අවශ්‍ය rotatable කියන එක වෙනුවට fixed එක ගෙනාවා. කිසිම ක්‍රමවේදයක් නැහැ, ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරලා රජයට - වෛද්‍ය සැපයුම් ඒකකයට - ඒ ප්‍රමාණය ලබා ගන්න. ටෙන්ඩර් එක ගත් කෙනා අවසාන මොහොතේ ගෙනැල්ලා දෙන එක අපේ තිබෙන පිරිවිතරයන්ට ගැළපෙන්නේ නැත්නම්, ක්‍රමවේද උල්ලංඝනය කරලා ඒක ගන්න අපට බැහැ. එතකොට අපට කරන්න පුළුවන් ක්‍රමවේදය තමයි, ප්‍රාදේශීය මිලදී ගැනීම්වලින් - local purchasesවලින් - ඒවා ගැනීමට රෝහල්වලට අවස්ථාව සලසා දෙන එක. අපි හැම රෝහලකටම ඒ සඳහා අවස්ථාව ලබා දී තිබුණා. ඒකට තිබෙන ක්‍රමවේදය කෙටි කළා, ඒකට තිබෙන බාධක ඉවත් කර දුන්නා. ඒ අනුව අපි රජයෙන් ලබා දුන් මුදල් වියදම් කරලා ප්‍රාදේශීය මිලදී ගැනීම් කරලා ඒ රෝගීන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කිව්වා. ඒ අනුව අපි අලුතින් සාකච්ඡා කරලා, rotatable fistula needles 460,000ක් මේ වනකොට ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ඒක දැන් තිබෙන්නේ SPC clearance සිදු කරගන්න තත්ත්වයේ. සතියක් යනකොට සියලු රෝහල්වලට ඒ අවශ්‍ය ප්‍රමාණය ලබා දෙන්න අපට පුළුවන්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

විපක්ෂ නායකතුමනි, අවුරුද්දකට සරිලන fistula needles ප්‍රමාණය අපි දැන් ලංකාවට ගෙනැල්ලා තිබෙන්නේ. මේකට ඇත්තටම වියදම් වෙන්නේ රුපියල් 57යි. ඩොලර්වලින් ගත්තොත් ඩොලර් දශම එකයි නවයයි. හැබැයි, ප්‍රාදේශීය මිලදී ගැනීම් කරන්න අපි මුදල් ලබා දී තිබියදී මේ සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස කථා බහ කළාට පස්සේ වෙච්ච දේ දන්නවාද? රුපියල් 57ට, 60ට ගන්න පුළුවන් needle එක රුපියල් 700ට, 800ට ගියා. මේවා සම්බන්ධයෙන් අපි ප්‍රශ්නයක් මතු කරනවා වාගේම ඒ ප්‍රශ්නයේ side effect එකත් බලන්න ඕනෑ. එළියේ මේක ව්‍යාපාරයක් කරගෙන ඉන්න අය මෙවැනි අවස්ථාවකදී කොතරම් ලාභයක් ලබා ගන්න උත්සාහ කරනවාද කියන එක අපි බලන්න ඕනෑ. මම දන්නවා, සමහර තැන්වල මේ needle එක රුපියල් 1,100ටත් ගියා. ඔව්, ප්‍රාදේශීය මිලදී ගැනීම්වලදී සමහර තැන්වලින් අපි ගත්තේත් ඒ ගණනටම තමයි. එහෙම සිද්ධ වෙන්නේ අපි යම් ක්‍රියාවලියක් ආරම්භ කරමින් ඉදිරියට අරගෙන යනකොට සමහර විට මේ සැපයුම්කරුවන්ටම වුවමනාවක් තිබෙනවා, කොහොම හරි මේ පිරිවිතර පැත්තකට දාලා මේක ආණ්ඩුව පැත්තට තල්ලු කරන්න. එහෙම නැත්නම්, ලංකාවේ ලොකු අර්බුදයක් තිබෙනවා කියලා මවාපෑමක් කරලා මිල වැඩි කරන්න. දැන් ප්‍රශ්නයක් නැහැ, 460,000 clear කරමින් පවතිනවා. අපි දවස් කිහිපයක් යනකොට රෝහල්වලට ඒවා ලබා දෙනවා.

5. මේ ප්‍රශ්නයෙන් ඔබතුමා අහන්නේ කැබිතිගොල්ලෑව වැනි දුෂ්කර ප්‍රදේශවල රජයේ රෝහල්වල පවතින භෞතික සහ මානව සම්පත් හිඟය සම්බන්ධයෙන්. මා දැක්කා, ඔබතුමා ඒ ප්‍රදේශයට ගිහිල්ලා B. Braun එකේ haemodialysis machine එකකුත් ලබා දුන්නා. ඒකට බොහොම ස්තුතියි. තවත් එහෙම තැන් තැන්වලට ලබා දීපුවා තිබෙනවා. සමහර වෙලාවට අපට ලබා දෙන ඒවාත් පරිත්‍යාග හැටියට අපි භාර ගන්නවා. ඔබතුමා කියන එක හරි. ඒ කියන්නේ, සමහර රෝහල්වල සමහර උපකරණ ක්‍රියාත්මක කරගෙන අඛණ්ඩව සේවා සැපයීමට තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නැහැ. *[බාධා කිරීමක්]* Haemodialysis machine එකක්. ඇත්තටම උතුරු මැද පළාතේ අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල රෝහල්වලට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා හෙදියන් ලබා දී තිබෙනවා. Cadre එක අනුමත කර ගන්නකල් සහ ඊළඟ හෙද පුහුණුවීම් එනකල් මේ ප්‍රශ්නය ටික කාලයක් තිබේවි.

දිවයින පුරා ව්‍යාප්තව පවත්නා රජයේ රෝහල්වල පවතින භෞතික සහ මානව සම්පත් හිඟය පිළිබඳව සොයා බලා එම සම්පත් හැකි උපරිම ප්‍රමාණයෙන් ලබා දීමට විවිධාකාරයෙන් අපි පියවර ගනිමින් සිටිනවා. ඉන් කීපයක් මා කියන්නම්.

I. ප්‍රාථමික මට්ටමේ වෛද්‍ය ප්‍රතිකාර මෙන්ම රෝග හඳුනා ගැනීමේ සේවා වැඩිදියුණු කිරීම සඳහා ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන පිහිටුවීමත්, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත ප්‍රාථමික සෞඛ්‍ය සහ ද්විතීයික සෞඛ්‍ය සංවර්ධනය සඳහා අපි අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමිනුත් තිබෙනවා.

II. ද්විතීයික සහ තෘතියික මට්ටමේ සෞඛ්‍ය සේවා ආයතනවල (රෝහල්වල) යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් තිබේ.

III. නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කරමින් පවතී. ඒ ගැන මම වැඩි විස්තර කරන්න යන්නේ නැහැ. පසුගිය කාලයේ සිට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදු කරමින් පවතිනවා.

IV. ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය ක්‍රමවත් කිරීම. ගරු විපක්ෂ නායකතුමනි, ඒ යටතේ තමයි අපි ඔබතුමා කියන දුෂ්කර පළාත්වල රෝහල්වල ඒ තිබෙන ප්‍රශ්නය විසඳන්න කටයුතු කරමින් ඉන්නේ.

ඔබතුමා 6, 7 හා 8 කියන ප්‍රශ්නවලින් අසා තිබෙන්නේ ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් පිළිබඳවයි. ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා 2016.08.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2017 මාර්තු මස සිට වරින් වර සෞඛ්‍ය කාර්ය සහායකයින් - ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් - 1,500ක් දෙවසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගත්තා. ඒ අය බඳවා ගත්තේ 2017 මාර්තු මාසයේ. එම ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින්ගෙන් දිගටම ඉල්ලීමක් තිබුණා, ඒ අය ස්ථිර කරන්න කියලා. 2017දී ඉල්ලුවා. එතකොට ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබුණේ. 2018දී ඉල්ලුවා. එතකොටත් තිබුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. 2019දීත් ඉල්ලුවා. 2020දීත් ඉල්ලුවා. ඒ කාලවල ඔබතුමන්ලාගේ ආණ්ඩු තිබුණේ. 1,500ක් බඳවා ගෙන තිබුණා. ඒ අය ස්ථිර කිරීම ප්‍රමාද වෙන්න, ප්‍රමාද වෙන්න මොකද වුණේ? එම තරුණ කණ්ඩායම් සේවයෙන් ඉවත් වෙලා ගියා. අවසානයේ 1,169ක් ඉතුරු වෙලා හිටියා.

ඔබතුමන්ලා පිළිගන්නවා ඇති, ඔවුන් ඩෙංගු මර්දනයේදී ක්ෂේත්‍රයේ ලොකු කාර්යභාරයක් කරන අය බව. හැබැයි, 2017 ඉඳන් වසර අටක් ඔවුන් ස්ථිරවීමක් නොමැතිව ක්ෂේත්‍රයේ කටයුතු කරමින් හිටියා. ඊට පසුව එම 1,169 අපි කාණ්ඩ දෙකකට වෙන් කළා. එකක් තමයි, එතැන හිටියා 8 ශ්‍රේණිය සමත් 847දෙනෙක්. ඒ අයට NVQ සහතිකයක් ලබා දීලා, ඒකෙන් තෝරා ගත් 640දෙනෙකුට පත්වීම් ලබා දුන්නා. පසුගිය ජූනි මාසයේ 05වැනි දා 640දෙනෙක් ස්ථිර කළා. තව 27දෙනෙක් අගෝස්තු මාසයේ 18වැනි දා ස්ථිර කළා. ඒ අනුව හිටපු කට්ටියගෙන් 8 ශ්‍රේණිය සමත් 666දෙනෙක් දැන් ස්ථිර කර තිබෙනවා. දැන් ඒගොල්ලන්ගේ ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම කාට හෝ සැකයක් තිබුණා නම් ඒ අයව ස්ථිර කරයි ද කියලා, ඒ අයගෙන් 8 ශ්‍රේණිය සමත් NVQ සහතිකය තිබෙන අය ස්ථිර කර තිබෙනවා. තව ඉතුරු වුණේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත් 301දෙනෙක්. ඒ 301දෙනා සම්බන්ධව කටයුතු කරන්න ගියාම ගැටලුවක් මතු වුණා, ගරු විපක්ෂ නායකතුමනි. සාමාන්‍ය පෙළ සමත්, මේ විධියට බඳවාගෙන ස්ථිර නොකළ අය 6,000ක් විතර රජයේ විවිධ ආයතනවල ඉන්නවා. මේ ගැන අපි අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් තිබෙන කමිටුවේදී වාර ගණනක් සාකච්ඡා කළා. ඩෙංගු මර්දන සහායකයින්ට ප්‍රමුඛතාව ලබා දෙන්න ඕනෑ කියලා අපි අවශ්‍යතාව අනුව තීන්දු කළා. හැබැයි, පොදුවේ ගත්තොත්, O/L සමත් අයට පොදු තීන්දුවක් ගන්න ඕනෑකම නිසා සහ එම ආයතනවල කොතරම් පුරප්පාඩු තිබෙනවා ද කියලා දැන ගන්න කාලයක් ගත වන නිසා තමයි O/L සමත් අය ස්ථිර කිරීමට යම් කාලයක් ගත වෙලා තිබෙන්නේ. මෙවර අය වැයේදී මුදල් විෂය භාර අමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයා ඒ අය ස්ථිර කිරීම් සම්බන්ධයෙන් අපේ තීන්දුව ප්‍රකාශයට පත් කරයි. ඒ අය ස්ථිර කරනවා. භය වෙන්න ඕනෑ වෙන්නේ එහි අනෙක් පැත්ත වුණා නම්. O/L සමත් අය ස්ථිර කරලා ඊට වඩා පහළ සුදුසුකම් තිබෙන අය අපි ස්ථිර නොකර හිටියා නම් තමයි භය වෙන්න සහ කලබල වෙන්න තිබුණේ. කවුරුවත් කලබල වෙන්න එපා. පසුගිය ජූනි මාසයේ ඉඳලා අපි NVQ සහතිකය තිබෙන අයත් ස්ථිර කරලා තිබෙනවා. අපි මේ අයව අනිවාර්යයෙන්ම ස්ථිර කරනවා.

මම ලබන සතියේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා, ඒ දක්වා මේ අයගේ සේවා කාලය දීර්ඝ කරන්න. ඒකට මාස දෙක තුනක කාලයක් ගත වනවා නේ. අපි අය වැයේදී මේ යෝජනාව ඉදිරිපත් කරනවා. එතකොට කිසි

ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කාටවත් ප්‍රශ්නයක් නොවන ආකාරයට ඒගොල්ලන් ස්ථිර කිරීමේ කටයුතු කරන්න සූදානම්. අවුරුදු අටක් විතර තිස්සේ මේ අයට තිබුණු බලාපොරොත්තුවක් තමයි රාජ්‍ය සේවයට බැඳිලා, ස්ථිර සේවකයන් බවට පත් වීම. අපි එය ඉෂ්ට කරලා තිබෙනවා. ඒ අනුව එම එක්දහස් එකසිය ගණනටම ස්ථිර පත්වීම් ලබා දෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දීර්ඝ උත්තරයට ස්තුතියි.

ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ වන විට රෝහල් පද්ධතියේ පවතින බරපතළ ඖෂධ හිඟය සම්බන්ධව. මම ඔබතුමාටම පෙන්නුම් කරන්නම්, වෙන කොහේවත් නොවෙයි, කළුතර රෝහලේ තත්ත්වය. කළුතර රෝහලේ ඖෂධ වර්ග 100කට වැඩි ප්‍රමාණයක හිඟයක් පවතිනවා. ඔබතුමාගේ දැන ගැනීම සඳහා එම විස්තර ටික මම සභාගත කරන්නම්. ඒ සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒ වාගේම ශල්‍යකර්මවලදී යොදා ගන්නා මැහුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍යවල හිඟයක් තිබෙනවා. කොළඹ ජාතික රෝහල ඇතුළු ප්‍රධාන පෙළේ රෝහල් රැසක CT, MRI, angiogram වැනි විකිරණ තාක්ෂණ පරීක්ෂණ ප්‍රමාණිකව සීමා වෙලා තිබෙනවා. ඒ වාගේම -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක වැදගත් කාරණයක්. මට තව විනාඩියක් දෙන්න.

කොළඹ ජාතික රෝහල ඇතුළු ප්‍රධාන රෝහල් රැසක හදවත් සැත්කම් පෝලිම 2029 වසර දක්වා දික් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අදාළ ප්‍රශ්නය පැහැදිලි කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඔබතුමා කිව්වා, kidney dialysis process එක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටු ගැන. ඒවායේ quality fail වුණා, fixed and rotatable කියලා වර්ග දෙකක් තිබුණා, වැරදි වර්ගයක් ගෙනාවා යනාදී වශයෙන් කිව්වා. මම ඔබතුමාට යෝජනා කරනවා, යම්කිසි ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක වෙනකොට ඒ අදාළ company එක වැරදි උපකරණය ගෙනාවාම ඔවුන්ට financial penalty එකක් ඉහළින්ම ගහන විධියකට ඒ agreement එක අත්සන් කිරීම ඉතාමත් වැදගත් බව. එතකොට වැරදි එක ගෙන ඒම තුළ ඔවුන්ට financial penalty එකක්, මූල්‍යමය පාඩුවක් සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, පැහැදිලි කිරීම කෙටියෙන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

ඔබතුමා මේ කටු ප්‍රශ්නය පිළිබඳව වැඩිපුර කථා කරමින් කිව්වා, රුපියල් 60ට, 70ට තිබුණු එක රුපියල් 800 දක්වා ඉහළ ගියා කියලා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - Consumer Affairs Authority එක - තිබෙන්නේ මොකටද? මේ වාගේ වැරදි විධියට මිල අධික කරලා අළෙවි කරන ඒවා raid කරලා, එහෙම වැරදි කරන අය ප්‍රසිද්ධ කරන්න තමයි ඒ අධිකාරිය තිබෙන්නේ. එහෙම කරන්න පටන් ගත්තාම අනිවාර්යයෙන්ම අනෙක් අය කරන වැරදි නතර කරයි. කළුතර රෝහලේ ඖෂධ වර්ග 100ක සහ උපකරණවල අඩුපාඩු තිබෙනවා. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

මේක ජාතික ප්‍රශ්නයක්, මේක මුළු රෝහල් පද්ධතියටම තිබෙන ප්‍රශ්නයක්. ඒකට විසඳුමක් ලබා දෙන්න කියලා මම බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩි දෙකක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අදාළ පැහැදිලි කර ගැනීමක් විතරයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ගරු ඇමතිතුමාට ස්තුති කරන්න කැමැතියි. මම 2018දී පාර්ලිමේන්තුවේ ඔය පැත්තේ ඉඳගෙන තමයි 1990 සුව සැරිය පදනම පනත ඉදිරිපත් කළේ. අපි නිර්මාණය කළ "සුව සැරිය" කියන නමේ දේශපාලන අරමුණක් කිසිසේත්ම නැහැ. සිසු සැරිය තිබෙනවා, සුව සැරිය තිබෙනවා. "සුව සැරිය" සහ "சுகப்படுத்தும் சேவை" කියලා භාෂා දෙකෙන්ම මේක තිබෙනවා. දෙමළෙන් "சுகப்படுத்தும் சேவை" කියන්නේ සුව සැරිය කියන එකම තමයි. මේ පනතේ කිසිම තැනක අපි මෙය ජාතික හදිසි ගිලන් රථ සේවය කියලා නම් කරලා නැහැ, ගරු ඇමතිතුමනි. එහෙම කරන්න අපට ඕනෑකමක් තිබුණෙත් නැහැ. මම විස්තර කියන්න යන්නේ නැහැ. ඔබතුමා දන්නවා ගිලන් රථ සේවා දෙකක් තිබෙන බව. ආණ්ඩුවට අයත් එකක් තිබෙනවා, ඒක intra-hospital. රෝගියෙක් ත්‍රීවිලර් එකේ අරගෙන යනවා වෙනුවට විතරයි අපි මේ විසඳුම ගෙනාවේ. ගරු ඇමතිතුමනි, මේ තිබෙන්නේ අලුත් letterhead එක. මේකේ තිබෙන්නේ "ජාතික හදිසි ගිලන් රථ සේවය" කියලා. මේකේ "සුව සැරිය" කියන එක නැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සුව සැරිය හලලාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, "සුව සැරිය පදනම" කියලා වුවියට, පෙනෙන්නේ නැති වෙන්න ගහලා තිබෙනවා. එහෙම නොවෙයි නේ තිබෙන්න ඕනෑ, මේක තමයි සුව සැරිය. ඒක වෙනස් කරන්න එපා, ගරු ඇමතිතුමා. මිනිස්සු ඒ නමට පුරුදුයි; ඒකට කැමැතියි. මේ ඔබතුමන්ලාගේ අලුත් පාට. *[බාධා කිරීමක්]* ඒ වෙනස කරන්න එපා. *[බාධා කිරීමක්]* මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔබතුමාත්, මමත් මේ ගැන කථා කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා - *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, please give me a few seconds and I will finish.

මම ගරු ජනාධිපතිතුමාටත් මේක ගැන කිව්වා, පත් වුණු දවසේම පාර්ලිමේන්තුවේ දී. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේක මාරු කළෙත් නැහැ, රනිල් වික්‍රමසිංහ මහත්තයා මාරු කළෙත් නැහැ. ලංකාවේ වැඩිපුරම දෙනෙක් ආදරය කරන සේවාව මේක.

හරි, ඒක පැත්තකින් තියන්නකෝ. අනෙක් කාරණය මේකයි. මේකේ objective එක වෙනස් කරන්න එපා. *[බාධා කිරීමක්]* Sir, you are also a doctor. You know that very well. මේකේ objective එක වෙනස් කරන්න එපා. මේකේ objective එක ලෙස තිබෙන්නේ, "පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවා සහ හදිසි ප්‍රතිචාර" කියලා. දැන් ඔබතුමන්ලා කියන්නේ මොකක්ද? "හදිසි සත්කාර හා පූර්ව රෝහල් ගිලන් රථ සේවා" කියලා. ඉතින්, අරමුණ වෙනස්. පූර්ව ප්‍රතිචාර කියන්නේ first aid, emergency response එකක්. Ambulances කියන්නේ වෙන වැඩක්. ඒ, පුද්ගලයෙකුව දාගෙන යන එක. මෙය පූර්ව රෝහල් ambulance service එකක් විතරයි. ගරු ඇමතිතුමා, මම මේ පනත එදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පක්ෂ, විපක්ෂ කිසිම කෙනෙකුගෙන් කිසිම objection එකක් නැතිව අපි මේක සම්මත කර ගත්තා. ඒ නිසා මේ සේවාව ඉහළට ගෙන යන්න ඕනෑ. අදටත් ලෝකයේ ඉහළම ambulance සේවාවක් කියලා World Bank එකෙන් මේක පිළිගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි සුබ පතනවා, ගිය අවුරුද්දේත් මේ සඳහා රුපියල් බිලියන 5ක් වෙන් කළා. මේ අවුරුද්දේත් වෙන් කරනවා. නමුත් ඒ වෙනස් කිරීම් කරන්න එපා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පසුගිය කාලවල සෞඛ්‍ය ඇමතිවරුන් හැටියට ගරු රාජිත සේනාරත්න මැතිතුමා සිටියා, ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා සිටියා. සෞඛ්‍ය සේවාවේදී රාජිත සේනාරත්න, රමේෂ් පතිරණ වාගේ ඇමතිවරුන් ආරම්භ කරපු වැඩසටහන් අපි නවීකරණය කරමින්, සංවර්ධනය කරමින් යනවා. එහෙම තමයි මේ කටයුතු වෙන්නේ. සමහර කටයුතු තිබෙනවා, baton එකක් වාගේ ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. අපි, 1990 ගිලන් රථ සේවය සෞඛ්‍ය සේවයේ කොටසක් හැටියට සලකා කටයුතු කරනවා. මොකද, අපට වැදගත් වන්නේ රෝගීන්ගේ ජීවිත බේරා ගැනීම. ඒක සෞඛ්‍ය සේවාවේ අඛණ්ඩ කොටසක් හැටියට තමයි ගමන් කළ යුතු වන්නේ.

විශේෂයෙන්ම ගිලන් රථ සේවාව සම්බන්ධයෙන් ගත්තොත්, රෝහල්වල තිබෙන ambulance service එක සහ 1990 service එක සම්බන්ධයෙන් අපි emergency physiciansලා සමඟ, ඒ අයගේ College එක සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කරනවා; අවශ්‍ය දැනුවත් කිරීම් කරනවා. මොකද, 1990 සේවය පවත්වාගෙන යැමේදී emergency physiciansලාගේ කාර්යභාරය අතිවිශාලයි. ඒ අයත් මේකට සම්බන්ධ කරගෙන තමයි මේ සියලු නවීකරණ කටයුතු කරමින් ඉදිරියට අරගෙන යන්න උත්සාහ කරමින් ඉන්නේ. එම නිසා මම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් එක්ක වාදයකට පැටලෙන්න යන්නේ නැහැ. මම මගේ උත්තරය දෙනකොට මීට කලින් පැහැදිලිව කිව්වා, මෙහිදී අපට වැදගත් වන්නේ සේවාව සංවර්ධනය කිරීම මිසක්, ඕනෑම හදිසියකදී මෙම අංකය ජනතාවට මතක සිටින අංකයක් බවට පරිවර්තනය කිරීම මිසක්, මේකේ ගහලා තිබෙන කොළ පාට හෝ ගහලා තිබෙන සමනලයෙක් හෝ වෙන මොකක් හෝ දෙයක් වෙනස් කරන එක නොවෙයි කියලා. ඒ පාට එහෙමම පවතිනවා, 1990 එලෙසම පවතිනවා, සුව සැරිය පදනම එලෙසම පවතිනවා. පනතේ තිබෙන වචන, පනතේ පරමාර්ථ වැඩිදියුණු කරමින් පවත්වාගෙන යනවා. ඒක තමයි අපි කරමින් යන්නේ. ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් මණ්ඩලයක් ගරු ජනාධිපතිතුමා විසින් පත් කළා. අපි තමයි ඒක යෝජනා කළේ. යුද හමුදාවේ විශ්‍රාමික මේජර්වරයෙක්, ව්‍යාපාරිකයෙක්, වෛද්‍යවරයෙක් සහ නීතිඥවරයෙක් ඇතුළු මේකට මැදිහත් විය හැකි රටේ වෙනත් ක්ෂේත්‍රවල හැකියාවන් පෙන්වපු, දක්ෂතා සහිත කණ්ඩායමක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අය මේ කටයුතු ඉදිරියට කරගෙන යාවි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි අහන්නේ, "සුව සැරිය" කියන නම වෙනස් කරනවාද කියන එකයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
"සුව සැරිය" කියන එක තිබෙනවා, කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඒවා ප්‍රචාරය කරනවා. ඒ වාගේම අවශ්‍ය නම් කෝට්ටේ bus halt එකේත් ඒ නම ගහලා දෙන්නම්. ඒ ඔක්කෝම කරන්නම්. ඒවා තිබෙනවා. බය වෙන්න එපා. ඒවා වචනත් එක්ක පැටලෙන්නේ නැහැ. කවුරුන් හෝ කෙනෙක් මේ රට වෙනුවෙන් යම් දෙයක් කළා නම්, ලෝකය ඉස්සරහට යන තත්ත්වයන් එක්ක තව කවුරුන් හෝ කණ්ඩායමක් ඒක වර්ධනය කරමින් අරගෙන යනකොට ඒවා පටන් ගත් අය සතුටු වෙන්න ඕනෑ. ඒකයි මම කිව්වේ, මම එතුමාට ස්තුතිවන්ත වෙනවා කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි සතුටු වෙනවා. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඊකේ එල්ලෙන්න එපා, අපරාදේ. අපි නොකරපු වැඩක් ගැන කියන එකෙන් ඔබතුමා ලොකු හානියක් කර ගන්නවා. අපි මේක සංවර්ධනය කරන්න යනකොට, - *[බාධා කිරීමක්]* ගිලන් රථවල ටයර් මාරු කරන්නයි, බැටරි මාරු කරන්නයි අපි කාගෙන්වත් අහන්න ඕනෑ නැහැ නේ. අපි මේ සේවය සංවර්ධනය කරමින් යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

II

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සපයන සේවාවන් වැඩිදියුණු කිරීම

ஓய்வூதியத் திணைக்களத்தினால் அளிக்கப்படும் சேவைகளை மேம்படுத்தல்

IMPROVEMENT OF SERVICES PROVIDED BY DEPARTMENT OF PENSIONS

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2) இன்கீழ் கௌரவ பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களிடம் எனது கேள்வியைக் கேட்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நமது நாட்டில் சுமார் 700,000க்கும் அதிகமான ஓய்வூதியம் பெறுபவர்கள் வாழ்கின்றனர். நீண்ட காலம் அரச சேவையில் இருந்து ஓய்வுபெற்றவர்களுக்கான சேவை நலனைக் கருத்திற்கொண்டு செயற்படவேண்டிய ஓய்வூதியத் திணைக்களம், ஓய்வூதிய தாரர்களுக்கு மட்டுமன்றி ஏனைய அரச திணைக்களங்களுக்கும் ஒரு சிம்ம சொப்பனமாகக் காணப்படுகின்றது. எந்த வகையான ஓய்வூதியதாரரோ அல்லது அரச திணைக்கள உத்தியோகத்தரோ, யார் என்ன தேவைக்காகச் சென்றாலும் அங்குள்ள வரவேற்புப் பகுதியில் இருக்க வைத்தே அவர்களுக்குப் பதில் சொல்லப்படுகின்றது. நீண்ட நேரம் வரிசையில் நின்றும்கூட, மேல் மாடிகளில் உள்ள சம்பந்தப்பட்ட திணைக்கள உத்தியோகத்தர்களிடம் உள்ளகத் தொலைபேசியில் தொடர்புகொண்டு பதில் சொல்லும் முறையே பின்பற்றப்படுகின்றது. இவ்வாறு மூடிவைக்கப்பட்ட ஒரு திணைக்களமாக அது இயங்குவது ஏனென்று அனைவரும் அங்கலாய்க்கின்றனர். அதேசமயம், இத்திணைக்களம் ஆற்றுகின்ற சேவையைக் குறைத்து மதிப்பிட முடியாது. ஆனாலும், இத்திணைக்களம் அதன் சேவை தேவையானவர்களிடமிருந்து தூரப்படுத்தப்படுவதென்பது பாரிய மனக்குறையாகக் காணப்படுகின்றது. அந்த வகையில், பின்வரும் வினாக்களை நான் கேட்கின்றேன்:

1. தனது ஓய்வூதியம் தொடர்பில் ஏதேனும் சேவைக்காகத் திணைக்களத்துக்குச் செல்பவருக்கு, கிரமமான முறையில் உரிய அதிகாரியை அல்லது உத்தியோகத்தரை நேரடியாகச் சந்தித்துப் பேசும் சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்க முடியுமா?

2. பொதுவாக எந்தவொரு சந்தர்ப்பத்திலும் தொலைபேசியில் திணைக்களத்தைத் தொடர்பு கொள்ள முடியாத நிலை காணப்படுவதாலும், விசேடமாக சேவையிலுள்ள அதன் hotline இலக்கத்தை அடைய முடியாதிருப்பதாலும், வயது முதிர்ந்த காலத்தில் ஓய்வூதியதாரர்கள் நேரடியாக நீண்ட தூரம் பயணித்துக் கொழும்புக்கு வருவது சிரமம் என்பதாலும் ஏதேனும் பொருத்தமான முறையில் நேரம் ஒதுக்கப்பட்டுச் சம்பந்தப்பட்ட திணைக்களத்தின் மூலம் அல்லது பிரதேச செயலகங்கள் மூலம் இணையவழி நேரலை உரையாடல்களைத் திணைக்களத்துடன் மேற்கொள்ளும் முறைமை ஒன்றை நடைமுறைப்படுத்த முடியுமா?

3. மாவட்டச் செயலகங்கள் மற்றும் பிரதேச செயலகங்கள் ஊடாக ஓய்வூதியதாரர்களுக்குத் தற்போது வழங்கப்படுகின்ற சேவைகளை மேலும் மேம்படுத்தி வழங்கவும் அவர்களின் சிரமங்களைக் குறைக்கவும் நடவடிக்கை எடுக்க முடியுமா? இது தொடர்பில் அனைத்து மாவட்டங்களினதும் பிரதிநிதித்துவங்கள் உள்வாங்கப்பட்டுத் தேசிய ரீதியில் ஓய்வூதியதாரர்களின் ஆலோசனைக்குழு ஒன்றை உருவாக்குவது திணைக்கள நடவடிக்கைகளின் மேம்பாட்டுக்குப் பொருத்தமானதா என்பது பற்றி அறிவிக்க முடியுமா?

4. அரச மற்றும் ஏனைய நிறுவனங்களின் தேவைகளுக்காக அத்திணைக்களங்களின் உத்தியோகத்தர்கள் ஓய்வூதியத் திணைக்கள அதிகாரிகளைச் சந்திப்பதற்கு மாதத்தில் இரண்டு நாட்களை விசேடமாக ஒதுக்க முடியுமா? அவ்வாறு ஓய்வூதியம் தொடர்பாக ஏனைய அரச நிறுவனங்களில் கடமையாற்றுகின்ற உத்தியோகத்தர்களுக்கான விசேட online முறைமை ஒன்றை உருவாக்குவது பற்றி ஏதேனும் புதிய திட்டங்கள் உள்ளனவா? ஓய்வூதியதாரர், அவரது நிறுவனம் மற்றும் ஓய்வூதியத் திணைக்களம் என்பன ஒரே நேரத்தில் இணையவழி நேரலைத் தொடர்பினை ஏற்படுத்திக்கொள்ள ஏற்பாடு செய்வது பொருத்தமானதாக அமையுமா?

5. ஓய்வூதியத் திணைக்களத்தால் வழங்கப்படுகின்ற ஒவ்வொரு கொடைகளுக்குமான புதிய விண்ணப்பங்கள் கிடைக்கப்பெற்று எவ்வளவு காலத்திற்குள் அவை வழங்கப்படும் என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

6. ஓய்வூதியம் தொடர்பாகச் சம்பந்தப்பட்ட திணைக்களங்கள் online விண்ணப்பங்களைச் சமர்ப்பிக்கின்றபோது ஓய்வூதியதாரர் அதனைப் பார்வையிடும் சந்தர்ப்பத்தை வழங்க அல்லது அச்சுப் பதிப்புப் பிரதியைச் சரிபார்த்து உறுதிப்படுத்திக் கொள்ளக்கூடிய முறைமை ஒன்றினை ஏற்படுத்த முடியுமா?

7. சில சந்தர்ப்பங்களில், உச்ச வயதெல்லைக்கப்பால் நியமனம் பெற்று சம்பந்தப்பட்ட திணைக்களங்களி னூடாக இந்த நாட்டுக்கு நீண்ட காலம் சேவை செய்தவர்களின் சேவைக் காலத்தைக் கருத்திற் கொண்டு ஓய்வூதியம் வழங்கப்பட முடியாமல் இருக்கின்றவர்களுக்கு ஓய்வூதியத்தை வழங்கக்கூடிய வகையில் தேவையான சட்ட ஏற்பாடுகளைச் செய்து அவர்களுக்கான ஓய்வூதியத்தை வழங்குவதற்கான நடவடிக்கைகளை எடுக்க முடியுமா? இல்லையெனில் ஏன் என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. සෑම සතියකම සඳුදා දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මහජන දිනය පැවැත්වෙනවා. සඳුදා දින රජයේ නිවාඩු දිනයක් වුවහොත් පමණක් සතියේ වෙනත් දිනයක් මහජන දිනය ලෙස නම් කිරීම සිදු කරනු ලබනවා.

   මහජන දිනය පැවැත්වෙන සඳුදා දිනයේදී සේවාලාභීන්ට සෘජුවම එක් එක් විෂයය සම්බන්ධයෙන් වගකීම පවරා ඇති මාණ්ඩලික නිලධාරින් හෝ අංශ ප්‍රධානීන් මුණගැසීමටත්, ගැටලු සාකච්ඡා කිරීමටත්, සිදුකර ගැනීමට අපේක්ෂිත කාරණය පිළිබඳව තොරතුරු ලබා ගැනීමටත් අවස්ථාව සලස්වා තිබෙනවා.

   සතියේ ඉතිරි දින හතර තුළ ද සේවාලාභීන්ට තමාට අවශ්‍ය සේවාව ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට හැකියාව පවතින අතර, එම දිනයන්හිදී පැමිණෙන මහජනතාවගේ ගැටලු පිළිබඳව විමසීමට හා අවශ්‍ය තොරතුරු ලබා දෙමින් එම කටයුත්ත අධීක්ෂණය සඳහා මාණ්ඩලික නිලධරයකු නම් කිරීම සිදු කර තිබෙනවා. එසේ නම් කරන මාණ්ඩලික නිලධරයා තමා වෙත වගකීම පවරා ඇති දිනයේදී දෙපාර්තමේන්තුවේ ඉදිරිපස විමසීම් කවුළුවේ රැඳී සිටිමින් එම දිනය තුළ දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන මහජනතාවගේ සේවා අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමේ වැඩ පිළිවෙළක් මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

   තවද, විදේශ විශ්‍රාම වැටුප් අංශය හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය වැනි සේවාලාභීන් නිරන්තරයෙන් විමසීම් ඉදිරිපත් කරන අංශවලට අදාළව තොරතුරු ලබා දීම සඳහා එම අංශ නියෝජනය කරමින් නිලධරයකු දෙපාර්තමේන්තුවේ ඉදිරිපස විමසීම් කවුළුව අසල සතියේ දින පහේදීම පෙර වරු 8.30ට සිට පස් වරු 4.15 දක්වා සේවයේ යෙදවීමට කටයුතු කර තිබෙනවා.

2. දෙපාර්තමේන්තුව වෙත දෛනිකව ඉදිරිපත් වන දුරකථන ඇමතුම්වලින් යම් ප්‍රමාණයකට පිළිතුරු ලබා දීම සිදු කළත්, සියලු දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමේ ගැටලුව මේ වන විට පවතිනවා. අපි ඒ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය මූලික විධිවිධාන මේ වන විට සකස් කර තිබෙනවා.

   කෙසේ වෙතත්, 1970 ක්ෂණික දුරකථන ඇමතුම් අංකය වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා වැඩිපුර නිලධාරින් ප්‍රමාණයක් යෙදවීමටත්, දුරකථන සඳහා පිළිතුරු ලබා දීම වෙනුවෙන් වෙනමම තනතුරු 15ක් ඇති කර ඒ සඳහා බඳවා ගැනීම් සිදු කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් තිබෙනවා.

   අවශ්‍යතාව අනුව දිවයිනේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධරයන් සමඟ මාර්ගගත ක්‍රමවේදය මඟින් විශ්‍රාම වැටුප් විෂයට අදාළ රාජකාරි කටයුතු සාකච්ඡා කිරීම මේ වන විටත් සිදු කරමින් පවතිනවා.

   දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධරයන් මඟින් විශ්‍රාමික ප්‍රජාව මාර්ගගතව සම්බන්ධ කරගනිමින් ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට හැකි වැඩ පිළිවෙළක් සකස් කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දැනුම් දීමට කැමැතියි.

3. (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ යෙදී සිටින නිලධාරින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ වන විට කටයුතු කරමින් තිබෙනවා.

   (ii) රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව මේ වන විට ස්ථාපිත කර ඇති බැවින් දිවයිනේ සියලු දිස්ත්‍රික්කවලට අදාළ විශ්‍රාම වැටුප් විෂය සම්බන්ධ සියලු කරුණු එම කාරක සභාව වෙත අදාළ මහජන නියෝජිතයන් හරහා ඉදිරිපත් කිරීමට මේ වන විටත් හැකියාව පවතිනවා.

4. (i) සෑම සතියකම මහජන දිනය පැවැත්වෙන සඳුදා දිනයේදී ද, අනෙකුත් ඕනෑම දිනයකද රාජ්‍ය ආයතනවල විශ්‍රාම වැටුප් විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් හා අංශ ප්‍රධානීන් මුණගැසීමට දැනටමත් අවස්ථාව ලබා දීලා තිබෙනවා.

   (ii) විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මේ වනවිටත් සිදු කරනු ලබයි. විශ්‍රාමිකයින් වෙත ගෙවීම් සිදු කිරීමේදී පවතින ගැටලු අදාළ ආයතනවලින් එම වැඩසටහන්වලදී ඉදිරිපත් කිරීම සිදු කරන අතර, එම අවස්ථාවලදී ඒ සඳහා විසඳුම් ලබා දීම දැනට ක්‍රියාත්මක වන ක්‍රමවේදය වේ.

5.
   - විමධ්‍යගත ක්‍රමවේදය ඔස්සේ අඩුපාඩු රහිතව ඉදිරිපත් කරනු ලබන විශ්‍රාම වැටුප් අයදුම් පත්‍රයක් පරීක්ෂා කර අනුමත කිරීමෙන් පසුව එළඹෙන මාසයේදී ප්‍රථම විශ්‍රාම වැටුප හිමිගැන්වීම සිදු කරනු ලැබේ.

   - මධ්‍යගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කරනු ලබන්නේ විනය නියෝග, අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන්වීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම, වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමෙන් පසුව නැවත රාජ්‍ය සේවයට එම තනතුර සඳහාම පැමිණෙන නිලධාරින්ගේ විශ්‍රාම ගැන්වීම, වයස අවුරුදු 45ට පසුව ලබා දී ඇති පත්වීම්වලට අදාළ විශ්‍රාම ගැන්වීම්වලට අදාළ විශ්‍රාම වැටුප් අයදුම් පත්‍ර වේ. එම අයදුම් පත්‍රවලට අදාළ ලිපි ලේඛන අදාළ ආයතනවලින් නිවැරදිව ඉදිරිපත් කිරීම බොහෝ විට සිදු නොවේ. එබැවින් එම අඩුපාඩු ලිපි ලේඛන ගෙන්වා ගැනීම සඳහා වාර ගණනාවක් අදාළ ආයතන වෙත දැනුම් දීමට සිදු වන අතර, ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.

   විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 හා එහි සංශෝධන මඟින් ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2018 මඟින් ද විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කර තිබෙනවා. ඒ අනුව නිලධරයෙකු විශ්‍රාම යෑමට මාස 3කට පෙර විශ්‍රාම වැටුප් අයදුම් පත්‍රය මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස උපදෙස් ලබා දී තිබෙනවා. නමුත්, ඇතැම් ආයතන විසින් බොහෝ විට අයදුම් පත් ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන්නේ නිලධරයා විශ්‍රාම යෑමෙන් පසුවයි. එයද විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රමාදවීමට හේතුවක් වී තිබෙනවා.

- විමධ්‍යගත හෝ මධ්‍යගත ක්‍රමවේදය යටතේ පළමු විශ්‍රාම වැටුප හිමිගැන්වීමෙන් පසුව එළඹෙන මාස 2ක කාලය තුළ විශ්‍රාම පාරිතෝෂිකය හිමිගැන්වීම සිදු කෙරේ. දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව ඒක සිද්ධ වෙන්නේ. මේ වනවිට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී තිබෙනවා.

- වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය වෙත අඩුපාඩු රහිතව ඉදිරිපත් කරන අයදුම් පත්‍ර සඳහා මාස 2ක පමණ කාලයක් තුළදී මරණ පාරිතෝෂිකය ද, මාස 3ක පමණ කාලයක් තුළදී වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ද ගෙවීම් කිරීමට කටයුතු කරමින් පවතී.

6. නිලධරයා සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසුව විශ්‍රාම වැටුප් අයදුම් පත්‍රය ඔහු අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතනය වෙතින් විශ්‍රාමික නිලධරයා වෙත යොමු කර එහි තොරතුරු නිවැරදි බවට අත්සන් ලබා ගැනීමෙන් පසුව අයදුම් පත්‍රය මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර එහි සඳහන් තොරතුරු නිවැරදි බව විශ්‍රාමිකයා විසින් තහවුරු කරන බැවින්, දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් නැවත විශ්‍රාමිකයා වෙත ලබා දීමට අවශ්‍ය නොවන බව නිරීක්ෂණය වේ. අයදුම් පත්‍රයේ පිටපතක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වන්නේ නම් නිලධරයා අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතනයේ පවතින ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් පිටපතින් ඡායා පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීමට හැකියාව පවතිනවා.

7.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/94 අනුව රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගත හැකි උපරිම වයස් ප්‍රමාණය අවුරුදු 45ක් වේ.

- එසේ වුවත්, විවිධ අවස්ථාවලදී වයස අවුරුදු 45 ඉක්මවා රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සිදු කර ඇති අතර, එවැනි සේවකයින් වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට පෙර එවැනි පත්වීම් සිදු කිරීම් සම්බන්ධයෙන් මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය වෙතින් අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය වේ.

- අමාත්‍ය මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා දීමෙන් පසුව වුවද ඉහත පරිදි වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති අය වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්විය හැක්කේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුපක් හිමිගැන්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් පමණි.

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුපක් හිමිගැන්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා පහත සඳහන් පරිදි වේ.

  (i) ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්වීමක් ලබා තිබීම.

  (ii) ඉහත තනතුරෙහි සේවයේ ස්ථිර කර තිබීම.

  (iii) මාස 120ක දළ සේවා කාලයක් සේවයේ යෙදී තිබීම.

  (iv) විධිමත් පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වා තිබීම.

- විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති නම් ඔවුන්ගේ සේවා කාලය අනුව එක් වරක් පමණක් හිමිගන්වන සේවා පාරිතෝෂිකයක් හෝ කරුණා සහගත දීමනාවක් හිමිගැන්වීම සිදු කිරීමට හැකියාව පවතී. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටියෙන් කරුණු පැහැදිලි කරගන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ அமைச்சர் அவர்களே, நன்றி! உண்மையிலே நமது நாட்டுக்காகப் பல வருடங்கள் சேவைசெய்து ஓய்வூதியத்தை எதிர்பார்த்து இருப்பவர்களுக்கான சில விசேட திட்டங்களை எதிர்காலத்தில் செயற்படுத்துவதாகக் கூறியிருந்தீர்கள். இருந்தாலும், இப்போது கூடுதலாக நடைமுறையிலுள்ள online systemமூலம் விண்ணப்பிக்கும் போது அது வேலை செய்வதில்லையென ஓய்வூதியக்காரர்கள் சொல்கிறார்கள். வயதுபோனவர்கள் தூர இடங்களிலிருந்து ஓய்வூதியத் திணைக்களத்துக்கு வரவேண்டிய தேவைப்பாடு இருப்பதால், இதுபோன்ற முக்கியமான விடயங்களில் கவனம் செலுத்தி, விரைவாக அதிலுள்ள குறைபாடுகளை நிவர்த்தி செய்வதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், 45 வயதுக்குப் பிறகு அரச சேவையில் இணைந்தவர்களுக்கும் ஓய்வூதியம் வழங்கக் கூடிய விதத்தில் நடவடிக்கை எடுக்க வேண்டும். அதாவது, சட்டத்திருத்தங்களைச் செய்தாவது அவர்களுக்கு ஓய்வூதியத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏனென்றால், ஒரு மாற்றத்தை ஏற்படுத்துவதற்காகத்தான் மக்கள் உங்களை ஆட்சிக்குக் கொண்டுவந்து இருக்கிறார்கள். எனவே, அவர்களுக்கும் ஓய்வூதியத்தைப் பெற்றுக் கொடுப்பதற்கான ஏற்பாடுகளைச் செய்து கொடுக்குமாறு உங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු සමහර කාරණා පිළිබඳව අපි රජය හැටියට මේ වනවිට තීරණ අරගෙන, ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මඟින් මේ පිළිබඳව ලැබෙන ඉල්ලීම් සියල්ල සලකා බලමින් ඔවුන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පියවර ගනිමින් සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල ගැටලු: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகள்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

ISSUES IN EDUCATION AND HIGHER EDUCATION SECTORS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් 2025.09.12වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 2025.05.31 දිනට සියලුම ජාතික හා පළාත් පාසල්හි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පළාත් මට්ටමින් ඉදිරිපත් කළ හැකි අතර, එය පහත පරිදි වේ. කොට්ඨාස මට්ටමින් ඉදිරිපත් කිරීමේදී විශාල දත්ත ප්‍රමාණයක් ඉදිරිපත් කළ යුතු වන බැවින් එහි මෘදු පිටපත ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

පළාත් පාසල් / ජාතික පාසල්		පුරප්පාඩු සංඛ්‍යාව
ජාතික පාසල්		1501
පළාත් පාසල්	බස්නාහිර	4630
	දකුණ	2513
	මධ්‍යම	6318
	වයඹ	2990
	ඌව	2780
	උතුරු මැද	1568
	නැඟෙනහිර	6613
	සබරගමුව	3994
	උතුර	3271
එකතුව		36178

ඉදිඉදිරියේදී සිදු කිරීමට නියමිත බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

(a) දිවයිනේ ජාතික පාසල්වල විද්‍යා, ගණිත, තාක්ෂණ විෂයයන්, විදේශ භාෂා හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය යටතේ වන විෂයයන් සඳහා පවතින අපොස (උසස් පෙළ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා 2024.07.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීමෙන් අනතුරුව වැඩ භාර නොගත් සුදුසුකම්ලාභීන් 353ක් සඳහා ඉදිරි මාස 02 තුළදී බඳවා ගැනීම සිදු කිරීමට නියමිතය.

(b) අංක 2233 හා 2021.06.18 දිනැති ගැසට් නිවේදනය අනුව දිවයිනේ ජාතික පාසල් සඳහා විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් 92 සඳහා නැවත ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම මත එම පරීක්ෂණය 2025.08.19 දින පැවැත්වූ අතර, ඒ අනුව ඉතුරු පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් 33දෙනෙකු ප්‍රංශ, ජපන්, චීන, කොරියන්, ජර්මන් හා හින්දි යන විෂයයන් 06 සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

(c) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් පත්‍රයක් නිකුත් කරන ලද නමුත් එම ගැසට් පත්‍රයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ නඩු හේතුවෙන් අතුරු නියෝගයක් මත 2023.03.25 දින පැවැත්වීමට නියමිත වූ විභාගය පැවැත්වීම තාවකාලිකව නතර කර ඇති බැවින් මේ දක්වා එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇති අතර, අනෙකුත් උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීමටද නොහැකි වී ඇත.

ඒ අනුව එම ගැසට් නිවේදනය මඟින් බඳවා ගැනීමට අපේක්ෂිත වූ ගුරු පුරප්පාඩු ප්‍රමාණය අවුරා තැබීමට සිදුවන අතර, ඊට අමතරව තවදුරටත් පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචන කමිටුවට ඉල්ලීම් ඉදිරිපත් කර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

2. දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයන් ඉගැන්වීම සඳහා සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ හිඟතාව මඟ හරවා ගැනීම පිණිස "ආගම් විෂයන් ඉගැන්වීම සඳහා ධර්මාචාර්ය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට බඳවා ගැනීම" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 2017/ED/E/06 සහ 2017.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අංක අමප/17/0456/742/007 හා 2017.05.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ධර්මාචාර්ය සමතුන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2087 හා 2018.08.31 දරන ගැසට් නිවේදනය නිකුත් කර ඇති අතර, ගැසට් නිවේදනය ප්‍රකාරව බඳවා ගැනීමේ තරග විභාගය 2019.05.25 දින පවත්වා ඇත.

එලෙස ආගමික විෂයන් ඉගැන්වීම සඳහා ධර්මාචාර්ය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමට අදාළ උක්ත තරග විභාගය 2019.05.25 දින පවත්වා ඇතත්, එම විභාගය පවත්වන කාලය වන විට ප්‍රමාණවත් පුරප්පාඩු නොමැති වීම මත බඳවා ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා

ඇත. ඉන් අනතුරුව 2020 වසරේදී නැවත පුරප්පාඩු පැවති විෂයන් සඳහා පමණක් ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සඳහා සලකා බලා ඇත. ඒ අනුව ජාතික පාසල්හි පුරප්පාඩු පැවති කතෝලික හා ඉස්ලාම් ආගම්වලට අදාළව පමණක් උක්ත සඳහන් ලිඛිත විභාගය සමත් වූ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට සමාන අයදුම්කරුවන් ප්‍රමාණයක් ඇතුළත් ලේඛනයක් විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන එම ලේඛනයෙහි ඇතුළත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා 2020.10.16 සහ 20 දිනැතිව කැඳවා ඇත. ඒ අනුව 2020.10.16 දින අදාළ සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද නමුත් 2020.10.20 දින පැවැත්වීමට තිබූ සම්මුඛ පරීක්ෂණය එවකට පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය රට තුළ උග්‍ර වීම හේතුවෙන් දින නියමයකින් තොරව කල් තබා ඇත.

එමෙන්ම රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2021.08.28 දිනැති සංදේශයට අදාළ අංක 21/1596/304/134 හා 2012.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2022.04.26 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය අය වැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදු කර තිබුණ ද, මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබීමේ නිර්දේශ යටතේ නැවත වරක් මෙම බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත.

මෙම ගැසට් නිවේදනය යටතේ සිදු කිරීමට නියමිත වූ බඳවා ගැනීම් අවසන් වී නොමැති අතර, අදාළ අයදුම්කරුවන් විසින් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ලද අභියාචනාවක් සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් දෙන ලද තීරණයක් අනුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල පමණක් 2024 ජූනි මාසයේදී අන්තර්ජාලය වෙත නිකුත් කර ඇත. මීට අදාළව ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීමට නොහැකිවූ බැවින් ප්‍රායෝගික පරීක්ෂණයට අදාළ ලකුණු නොමැතිව උක්ත ලකුණු නිකුත් කිරීම සිදුව තිබේ.

කෙසේ වුවත්, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා හදාරා විද්‍යා පීඨවලින් වාර්ෂිකව ගුරු සේවය සඳහාම පිට වන ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්හට ගුරු පත්වීම් ලබා දීම අනිවාර්යයෙන් කළ යුතු බැවින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාර්ෂිකව ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්හට එම ආගමික විෂයන් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ පත්වීම් ලබා දී ඇත.

එමෙන්ම, අංක අමප/19/විවිධ/066 හා 2019.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සංවර්ධන නිලධාරි සේවයේ භික්ෂූන් වහන්සේලා ගුරු සේවයට බඳවා ගැනීම යටතේ ජාතික පාසල් හි බුද්ධාගම විෂය සඳහා ගුරු පත්වීම් අවස්ථානුකූලව ලබා දී ඇති අතර, පළාත් පාසල් සඳහා ද උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවා ගැනීම් සිදුකරන ලෙසට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පසුගිය කාලවකවානුව තුළ අදාළ තනතුරු පුරප්පාඩු සඳහා ඉහත පරිදි බඳවා ගැනීම් සිදුකර ඇත.

අදාළ විෂයන්හි පළාත් සභා පාසල් තුළ මේ වන විට පවතින පුරප්පාඩු පිළිබඳව පළාත් බලධාරීන්ගෙන් විමසන ලද අතර, එම විෂයන්හි සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් නොමැති බව දන්වා ඇත. එමෙන්ම ජාතික පාසල්වලද මෙම විෂයන්හි පුරප්පාඩු නොමැති බැවින් උක්ත විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව පත්වීම් ලබා දීම කළ නොහැක.

ආගමික විෂයයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අදාළව නිකුත් කරන ලද අංක 2087 ගැසට් නිවේදනය ප්‍රකාරව අදාළ බඳවා ගැනීම් එම කාල වකවානුව තුළ සිදු කිරීමට නොහැකි වීම මත හා එම වකවානුවේදී සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් නොමැති වීම මතත් මේ වන විට පවතින සීමිත පුරප්පාඩු ප්‍රමාණයද 2024 වර්ෂයේ විද්‍යාපීඨවලින් පිටවන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් වෙත වෙන් කිරීම හේතුවෙන් 2019.05.25 දින පවත්වනු ලැබූ තරග විභාගයේ ප්‍රතිඵල මත ආගමික විෂයයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සිදු නොකිරීමට අදාළව වන නිර්දේශයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර උපදෙස් විමසන ලදී. එහිදී ඒ සම්බන්ධයෙන් වන නිර්දේශයන් සඳහා අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02/03/13/2017 හා 2025.05.09 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

3. පාසල්වලට අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් නැවත රාජ්‍ය ආයතනවලට යොමු කිරීමේ වැඩ පිළිවෙළක් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර නැත.

   මෙම කරුණට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 77/2023 (F/R), 78/2023, 88/2023, 95/2023 හා අභියාචනාධිකරණ නඩු අංක 576/2023 යටතේ නීති කෘත්‍යයක් සිදු කරන බැවින් එම අධිකරණ තීරණය ලැබීමෙන් පසු එම නියෝගය පරිදි කටයුතු කරනු ලැබේ.

4. අංක 865/03 දරන 1995.04.03 දිනැති පැරණි ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට ප්‍රථම ගුරු සේවයේ අභ්‍යාසලාභී නිලධාරීන් ලෙස කටයුතු කළ අභ්‍යාසලාභීන් ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කර ඇත. නමුත් අංක 1885/38 දරන 2014.10.23 දිනැති නව ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ගුරු සේවයේ තනතුරු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට නියමිතව ඇත්තේ විවෘත තරග විභාගයක ප්‍රතිඵල හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බැවින් ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ගෙන් පරිබාහිරව කටයුතු කිරීමේ හැකියාවක් නොමැත.

5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මතුව ඇති ගැටලු නිරාකරණය සඳහා පත් කළ විද්වත් කමිටුව විසින් සකස් කළ මූලික වාර්තාව හා එහි නිර්දේශ වාර්තාව මා වෙත ලබා දී ඇත. අවසාන වාර්තාව ලැබුණු පසු ඒ පිළිබඳ තීරණයක් ගැනීමට නියමිතව ඇත.

6. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන් හි කටයුතු කරනු ලබන ආචාර්යවරුන්ගේ නාම ලේඛනය සහ අධ්‍යාපන සුදුසුකම් ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

   තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සිදු වී ඇති අක්‍රමිකතා සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර ඇති අතර, එම වාර්තාව ඉදිරියේදී මා වෙත ඉදිරිපත් කරනු ඇත.

7. රජය දැනුවත් ය.

   ඒ සම්බන්ධයෙන් රජය ගත් පියවර

   i. වෛද්‍ය ශිෂ්‍ය පුහුණුව සඳහා අවශ්‍ය මහාචාර්ය ඒකක පිහිටුවීමට වාට්ටු සහ අනිකුත් පහසුකම් සපයා ඇත. මහාචාර්ය ඒකකවල අවශ්‍යතාව අනුව එම ඒකක සඳහා වෛද්‍යවරුන් 22ක්

***** *පුස්තකාලයේ තබා ඇත.*

* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

අනුයුක්ත කර ඇත. අවශ්‍ය භෙද කාර්ය මණ්ඩලය හා අනෙකුත් සේවකයින් ලබාදීමට අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කර ඇත. ඒ අනුව 2025 සැප්තැම්බර් මස 15 සිට සිසුන් සඳහා මහාචාර්ය සායනික පුහුණුව ආරම්භ කෙරේ.

ii. ශිෂ්‍ය සහ ආචාර්යවරුන්ගේ පොදු සහ කාර්යාල පහසුකම් සඳහා රෝහල තුළ වෙනමම ගොඩනැඟිලි දෙකක් ලබා දී ඇති අතර, දැනට එහි අලුත්වැඩියා කටයුතු සැලසුම් කර ඇත.

iii. ගල්ලස්ස මාතෘ හා ළමා රෝහලේ හත්වන තට්ටුව ශිෂ්‍ය හා අධ්‍යයන දෙපාර්තමේන්තු පහසුකම් සැලසීම සඳහා නවීකරණය කෙරෙමින් පවතී.

iv. දිවා හා රාත්‍රී කාලවල පැවැත්වෙන සායනික පුහුණුවට සහභාගි වන අවසන් වසර සිසුන් සඳහා රෝහලට නුදුරින් ගොඩනැඟිලි 4ක් මොරටුව විශ්වවිද්‍යාලය විසින් කුලී පදනම මත ගෙන නේවාසිකාගාර ලෙස යොදාගෙන ඇත.

v. මෙයට අමතරව පළමු වසර දෙක තුළ පාඨමාලාව හදාරන සිසුන් සඳහා නවීන ප්‍රායෝගික පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් දැනටමත් මොරටුව විශ්වවිද්‍යාලය පරිශ්‍රයේ තනා ඇත.

vi. කළුතර රෝහලට කිට්ටුවෙන් සුදුසු ඉඩමක් වෛද්‍ය පීඨය වෙත වෙන් කිරීමට කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඉතාම කෙටියෙන් කියන්න. මොකද, කාලය සැහෙන ප්‍රමාණයක් මිඩංගු වෙලා තිබෙනවා මේ ප්‍රශ්න සඳහා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම කෙටියෙන් අහන්නම්.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය ලබා දුන් පිළිතුරුවල පරස්පර කරුණු 3ක් තිබෙනවා. මම ඒ ටික ඔබතුමියට ඉදිරිපත් කරනවා. කරුණාකර, මේවා ගැන නැවත සොයා බලන්න. විශේෂයෙන්ම ධර්මාචාර්ය විභාගය ගැන ඔබතුමිය පිළිතුරක් දුන්නා. විභාගය පැවැත්වුණේ 2019.05.25වැනි දා. 2020.10.16වැනි දා ප්‍රතිඵල නැතිව interview කර තිබෙනවා. ඔබතුමිය කියපු ආකාරයට ප්‍රතිඵල ලබා දී තිබෙන්නේ 2024දී. ඇත්තවශයෙන්ම එතැන බරපතළ අක්‍රමිකතාවක් සිද්ධ වෙලා තිබෙනවා. නැවත නැවතත් විභාග පවත්වන්නට පෙර ඒ පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල අනුව ඒ පත්වීම් ටික ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය කියා අපි යෝජනා කරනවා.

ඊළඟ කාරණාව වශයෙන් මා ඔබතුමියට පෙන්වන්න හදන්නේ මේකයි. සංවර්ධන නිලධාරි ක්ෂේත්‍රයේ 16,600ක් ගුරු සංවර්ධන නිලධාරීන් හැටියට කටයුතු කළා, විශේෂයෙන් කොරෝනා වසංගතය කාලයේ සහ ඉන්පසුව රට බංකොලොත් වුණු කාලයේ, අමාරුකම් රැසක් මැද. ඔබතුමිය දැනගන්නට ඕනෑ, මේ සභාවේ සිටින මැති ඇමතිවරුන් ගණනාවක්, ඒ 16,600 ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන පොරොන්දුව ලබා දී තිබෙන බව. ඒ විතරක් නොවෙයි. සමථකරණ තීන්දුවක් තිබෙනවා අධිකරණයේ. ඒ සමථකරණ තීන්දුවේ තිබෙන දේ තමයි, වසර 3ක කාල වකවානුවක් තුළ Postgraduate Diploma එක සම්පූර්ණ කිරීමේ කොන්දේසිය සහ එතෙක් ඒ අය අභ්‍යාසලාභී ගුරුවරුන් හැටියට 2-II ශ්‍රේණියට බඳවා ගැනීම. ඒ දේ කරන්න බැරි ඇයි කියන එක බරපතළ ගැටලුවක්. අපේ ගරු ලාල් කාන්ත මැතිතුමාත් දන්නවා, ගරු වසන්ත සමරසිංහ මැතිතුමාත් දන්නවා, ඒවා පිළිබඳ වීඩියෝපටත් තිබෙන බව. ඒවා රහසිගත දේවල් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඉක්මනින් අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය පැහැදිලි කිරීමට දැන් විනාඩි 2ක් ගත්තා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
16,600ක් වන ඒ ගුරු සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්නට කටයුතු කරන්නේ නැත්තේ ඇයි? ඒ වාගේම, රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක් ඉන්නවා. ඔබතුමියම කියා තිබෙනවා උපාධි ක්ෂේත්‍රයේ 52,000ක් ඇබෑර්තු තිබෙනවා කියලා. ඇයි, ඒ රැකියා විරහිත උපාධිධාරීන් 35,000ට රැකියා ලබා දීමට වාගේම අර ගුරු සංවර්ධන නිලධාරීන් 16,600 ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමට, එම පත්වීම් ලබා දීමට කටයුතු නොකරන්නේ? අවසාන කාරණාව මෙයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා එක පැහැදිලි කරවාගැනීමක් විතරක් කරගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ, අවසාන කාරණාව.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය කිව්වා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ ගැටලු ගැන වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා කියලා. මම ඔබතුමියට කියන්න කැමැතියි, එහි විෂය නිර්දේශ අනීතිකව සංශෝධනය කර තිබෙන බව. ඒ වාගේම එම පීඨය සතුව යටිතල පහසුකම් නැහැ, දේශනශාලා නැහැ, විද්‍යාගාර නැහැ. මේ වාගේ අඩුපාඩුකම් රැසක් තිබෙනවා. ඒ නිසා සීමාවාසික පුහුණු අවස්ථාත් නැහැ. මේ අඩුපාඩු පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරලා ඒවාට විසඳුම් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා ඉතාම කෙටියෙන් සඳහන් කරන්නම්. මගේ පිළිතුරේ පරස්පරයක් මතු වුණේ නැහැ. මා කිව්වේ 2024 RTI application එකකින් ඒ තොරතුරු ලබාගත් බවයි.

සංවර්ධන නිලධාරින් පිළිබඳ මේ පාර්ලිමේන්තුව තුළ මම අවස්ථා ගණනාවක ප්‍රකාශ කර තිබෙනවා. ඒ ප්‍රශ්නය පිළිබඳව අපි ඉතාම අවබෝධයෙන් වැඩ කරන්නේ. නමුත්, අධිකරණයේ යන ක්‍රියාමාර්ගවලටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අපට දීලා තිබෙන නිර්දේශ අනුවත් තමයි අපට ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න සිදු වෙලා තිබෙන්නේ. කාලයක් තිස්සේ හිටපු ඇමතිවරුන් කරපු මැදිහත්වීම් තුළින් ඔවුන්ට අසාධාරණයන් සිද්ධ වෙලා තිබෙනවා කියන එක ගැන අපි සියලු දෙනා කථා කර තිබෙනවා. ඒ නිසාම තමයි කාලයක් තිස්සේ ඇදි ඇදී තිබෙන එම ප්‍රශ්නය විසඳන්න අපි මැදිහත් වී සිටින්නේ. අපේ ගරු අධිකරණ ඇමතිතුමාගේත් උපදෙස් ලබාගෙන ඒ සම්බන්ධයෙන් කල් ගිය නඩුවලට අදාළව දින ලබාගෙන, ඉතාම කෙටි කලකින් ඒ අධිකරණ ක්‍රියාවලිය අවසන් කරගෙන ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. හැබැයි, අපි මැදිහත් වෙන්නේ නීතිය අනුව, ගරු ව්‍යවස්ථාව අනුව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අපට දීලා තිබෙන නිර්දේශ අනුවයි. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය පිළිබඳව ඒ වාර්තාව ඉල්ලා සිටියේ මමයි. ඒ නිසා ඒ වාර්තාව අනුව සහ ඒ නිර්දේශ අනුව ක්‍රියා කරනවා. ඒකත් අපේ කාලයේ සිද්ධ වෙච්ච වැරැද්දක් නොවෙයි. නමුත් ඒක නිවැරදි කරන්න අපි ක්‍රියාමාර්ග ගනිමිනුයි ඉන්නේ. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා.

වී සඳහා සාධාරණ අවම සහතික මිලක් නියම කිරීම සහ සහල් මිල නියාමනය කිරීම: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நெல்லுக்கான நியாயமான குறைந்தபட்ச உத்தரவாத விலை மற்றும் அரிசி விலையை ஒழுங்குறுத்தல்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று

ASSURANCE OF A FAIR MINIMUM GUARANTEED PRICE FOR PADDY AND REGULATION OF PRICE OF RICE: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2025.09.11වැනි දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. දේශීය ගොවීන්ගේ වී නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලැබිය යුතු බව මෙන්ම සහල් මිල පාරිභෝගිකයන්ට දැරිය හැකි මට්ටමේ සාධාරණ එකක් විය යුතු බව රජය පිළිගන්නා අතර මේ වන විට ඒ සඳහා ක්‍රියා කර ඇත. මෙහිදී දේශීය වී තොග මිල දී ගැනීමේ අවම මිලක් ගණනය කිරීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහ අත්දැකීම්වලින් යුතු නිලධාරින්ගෙන් යුත් කමිටුවක් මඟින් ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වී කිලෝ එකක නිෂ්පාදන පිරිවැය ගණනය කර එයට සියයට 30ක ලාභාංශයක් එක් කර වී වර්ග අනුව මෙම අවම මිල දී ගැනීමේ මිල නියම කර ඇත.

(වගුව - 1: 2025.08.04 දිනැති අමප/25/1366/808/007-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය)

වී වර්ගය	**අවම මිලදී ගැනීමේ මිල (Rs./Kg)**	
	තෙතමනය 14% හෝ ඊට අඩු (ප්‍රමිතිගත වී)	**තෙතමනය 14% - 22% (තෙත වී)**
නාඩු	120	102
සම්බා	125	105
කිරි සම්බා	132	112

වගුව - 1: 2025 යල කන්නයේ රජය මඟින් ප්‍රකාශිත වී මිල දී ගැනීමේ අවම මිල

ඉහත මිල ගණන් යටතේ වී අලෙවි මණ්ඩලයේ ගබඩා 146ක් දිවයින පුරා ව්‍යාප්තව තබා ගනිමින් ප්‍රමිතිගත වී මිල දී ගැනීමට සෘජුව දායක වීමට රජය ක්‍රියා කර ඇති අතර, ඊට අමතරව ඔඩපණ ණය වැඩසටහන හරහා සහනදායී පොලී පදනම මත පෞද්ගලික අංශයට වී මිල දී ගැනීම සඳහා වාණිජ බැංකු මඟින් ණය නිකුත් කර ඉහත මිල ගණන් යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා පෞද්ගලික අංශය වී මිලදී ගැනීම අධීක්ෂණය කරමින් වී මිලදී ගැනීමටත් රජය දායක වේ. ඒ අනුව වී තොග සඳහා සාධාරණ මිලක් ලැබීම තහවුරු වී ඇති බව රජයේ විශ්වාසයයි.

ඉහත වී මිල දී ගැනීමේ අවම මිල ගණන් යටතේ මේ වන විට වී අලෙවි මණ්ඩලයෙන් පමණක් 2025.09.17 දින වන විට වී මෙට්‍රික්ටොන් 48,705.984ක් මිල දී ගෙන ඇත. විස්තර ඇමුණුම 01හි පහත පරිදි දක්වා ඇත.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

ඇමුණුම - 01

2025 යල කන්නය - වී මිලදී ගැනීමේ වැඩසටහන

2025.09.10 දිනට ප්‍රගති වාර්තාව (දිස්ත්‍රික්ක අනුව)

	දිස්ත්‍රික්කය	ගොවීන් ගණන	ගොවීන්ගෙන් සෘජු මිලදී ගැනීම(කි.ග්‍රෑ.)					වටිනාකම (රු.)					මුළු එකතුව(කි.ග්‍රෑ.)	වටිනාකම (රු.)
			නාඩු		සම්බා		කීරි සම්බා	නාඩු		සම්බා		කීරි සම්බා		
			සුදු	රතු	සුදු	රතු		සුදු	රතු	සුදු	රතු			
1	අම්පාර	5602	10,723,788.0	11,320,631.0	11,379.0	-	-	1,286,854,560	1,358,475,720	1,422.375	-	-	22,055,798.0	2,646,752,655
2	අනුරාධපුරය	2427	7,306,341.0	313,321.0	77,406.0	-	1,754.0	876,760,920	37,598,520	9.675,750	-	231.528	7,698,822.0	924,266,718
3	බදුල්ල	46	88,916.0	-	-	-	-	10,669,920	-	-	-	-	88,916.0	10,669,920
4	මඩකලපුව	80	242,334.0	11,596.0	4,210.0	-	2,445.0	29,080,080	1,391.520	526,250	-	322,740	260,585.0	31,320,590
5	කොළඹ												-	-
6	ගාල්ල												-	-
7	ගම්පහ	52	70,421.0	2,695.0	10,927.0	-	-	8,450,520	323,400	1,365,875	-	-	84,043.0	10,139,795
8	හම්බන්තොට	340	7,242.0	911,501.0	-	-	-	869,040	109,380,120	-	-	-	918,743.0	110,249,160
9	යාපනය	0	-	-	-	-	-	-	-	-	-	-	-	-
10	කළුතර												-	-
11	නුවර	12	31,015.0	-	-	-	-	3,721,800	-	-	-	-	31.015.0	3,721,800
12	කෑගල්ල												-	-
13	මුලතිව්	765	269,952.0	2,552,811.0	-	-	-	32,394,240	306,337.320	-	-	-	2,822.763.0	338,731,560
14	කුරුණෑගල	95	249,735.0	393.0	5,928.0	-	192.0	29,968,200	47,160	741.000	-	25,344	256,248.0	30,781,704
15	මන්නාරම	179	156,955.0	593,077.0	-	63,420.0	-	18,834,600	71,169,240	-	7,927,500	-	813,452.0	97,931,340
16	මාතලේ	74	242,625.0	-	-	-	-	29,115,000	-	-	-	-	242.625.0	29.115,000
17	මාතර	0	-	-	-	-	-	-	-	-	-	-	-	-
18	මොණරාගල	432	301,822.0	1,127,527.5	9,372.0	4,293.0	-	36,218,640	135,303,300	1,171,500	536,625	-	1,443,014.5	173,230,065
19	වවුනියාව	202	103,078.0	562,686.0	5,557.0	4,318.0	2,974.0	12,369,360	67,522,320	694,625	539,750	392,568	678.613.0	81,518,623
20	නුවර එළිය												-	-
21	පොළොන්නරුව	773	2,825,515.0	598,587.0	1,103.0	-	-	339,061,800	71,830,440	137,875	-	-	3,425,205.0	411,030,115
22	පුත්තලම	548	1,892,310.0	-	21,397.0	-	2,532.0	227,077,200	-	2,674,625	-	334,224	1,916,239.0	230,086,049
23	රත්නපුර	319	23,427.0	784,707.0	-	3,547.0	-	2,811,240	94,164,840	-	443.375	-	811.681.0	97,419,455
24	ත්‍රිකුණාමලය	157	301,549.0	219,638.0	2,606.0	-	-	36,185,880	26,356,560	325,750	-	-	523.793.0	62,868,190
25	කිලිනොච්චිය	227	349,757.0	497,996.0	860.0	-	2,559.0	41,970,840	59,759,520	107,500	-	337,788	851.172.0	102,175,648
	එකතුව	12,330	25,186,782.0	19,497,166.5	150,745.0	75,578.0	12,456.0	3,022,413,840	2,339,659,980	18,843,125	9,447,250	1,644,192	44,922,727.5	5,392,008,387

පසුගිය කාල පරිච්ඡේදය තුළ වෙළෙඳ පොළ සහල් මිල ඉතා ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් පාලන මිලක් පැනවීමට සිදු වූ නමුත්, අද වනවිට පනවන ලද පාලන මිලටත් වඩා අඩු මිලට වෙළෙඳ පොළෙන් සහල් මිලදී ගැනීමට පාරිභෝගිකයාට හැකියාව ලැබී ඇත.

සාමාන්‍යයෙන් නාඩු වී ප්‍රභේදවලට වඩා අඩු අස්වැන්නක් කීරි සම්බාවලින් ලැබෙන අතර සහල් කෙටීමේදී කීරි සම්බාවල පසු අස්වනු හානි නාඩුවලට සාපේක්ෂව වැඩිය. මේ අනුව කීරි සම්බා වී කිලෝග්‍රෑම් 1ක නිෂ්පාදන වියදම නාඩුවලට සාපේක්ෂව වැඩිය. මේ අනුව කීරි සම්බා මිල නාඩු මිලට වඩා ඉහළින් පැවතිය ද නාඩු වගා කිරීම ගොවීන්ට වාසි සහගතය. කීරි සම්බා මිල නාඩු මිලට සමාන වනවිට හෝ ඊට පහළ යන විට කීරි සම්බා වගා කිරීමෙන් පාඩු ලැබිය හැකිය. ඒ අනුව පවතින කන්නයේ ඒ, ඒ වී වර්ගයේ වී මිල සහ ගොවීන්ගේ රුචිකත්වය අනුව ඊළඟ කන්නයේ වගා කරන වී වර්ග තීරණය වීම සිදු වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත අනුව සියයට 90ක් නාඩු වී වර්ග වගා කර ඇති බව පැවසීම නිරවද්‍ය දත්තයක් නොවේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති දත්ත අනුව, නාඩු සියයට 77.45ක්, සම්බා සියයට 10.15ක්, කීරි සම්බා සියයට 10.5ක්, දිගටි වී සියයට 0.4ක්, වෙනත් සියයට 1.5ක් ලෙස 2024/2025 මහ කන්නයේ වී වගා කර ඇත. පසුගිය කාලයේ පැවති නාඩු හිඟයත් සමඟ නාඩු වී සඳහා හොඳ මිලක් ලැබුණු අතර නාඩු වී සහ කීරි සම්බා වී අතර මිල පරතරය අඩුවීමක් සිදු විය. මෙහිදී නාඩු වී වගා කිරීම වැඩි වාසි සහගත වූ බැවින් නාඩු වගා වපසරිය වැඩි වී කීරි සම්බා වගා කළ ප්‍රතිශතය සුළු වශයෙන් අඩු වී ඇත.

2. සහල් ආනයනය කිරීම, සහල් ආනයන පාලන බලපත්‍ර යටතේ සිදු වන බැවින් බාස්මතී සහල් හැර අනෙකුත් සහල් වර්ග ආනයනය කිරීම මේ වනවිට සිදු නොවේ. එසේ වුවත්, රට තුළ සහල් හිඟයක් ඇති වී වෙළෙඳ පොළ සහල් මිල පාරිභෝගිකයාට දැරිය නොහැකි මට්ටමක පවතින අවස්ථාවකදී පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම උදෙසා ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවෙහි සාකච්ඡාකොට ගනු ලබන තීරණයන්ට අනුව සහල් ආනයනය පිළිබඳව සලකා බලනු ඇත.

3. වී සඳහා අවම මිල තීරණය කළ කමිටුව වී වගාව සහ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුම සහ අත්දැකීම් පවතින නිලධාරින්ගෙන් සමන්විත අතර, ඔවුන් දිවයින පුරා වී වගාවේ දත්ත ලබා ගෙන සාදා ඇති නිෂ්පාදන වියදමට සියයට 30ක ලාභාංශයක් එකතු කර වී සඳහා අවම වී මිලදී ගැනීමේ මිල නියම කර ඇති අතර, පාරිභෝගිකයාට ලබා දිය හැකි අවම මිලට සහල් පාලන මිල නියම කර ඇත. මෙම පාලන මිලටත් අඩුවෙන් වෙළෙඳ පොළෙහි මේ වනවිට අළෙවි වන බව දක්නට ඇත.

4. අම්පාරේ ගබඩා නිසි ලෙස භාවිත කරයි. වී මිලදී ගැනීම අඛණ්ඩව සිදු කෙරේ. ගබඩා විවෘතව පවතින අතර අම්පාර දිස්ත්‍රික්කයේ වත්මන් තොග මට්ටම ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම - 02

2025 යල කන්නය - වී මිලදී ගැනීමේ වැඩසටහන

අනු අංකය	ගබඩාව	මුළු එකතුව (මෙ.ටො.)
දිස්ත්‍රික්කය - අම්පාර		
1	අඩ්ඩාලච්චේන	848.863
2	පොතුවිල් 1	524.498
3	අක්කරපත්තු 2	696.671
4	පානම	352.396
5	ලාහුගල	342.28
6	මාන්තොට්ටම	1573.633
7	සමන්තුර 01	2072.785
8	පාලම් කදවුර 02	564.882
9	අම්පාර 02	2152.179
10	කොහොබාන 02	794.226
11	කොහොබාන 01	526.797
12	ගොනගොල්ල	1062.65
13	තම්බැට්ට	1022.342
14	රජගලතැන්න	382.82
15	තෙල්ලිකැලේ	1247.215
16	වීරගොඩ 01	1038.674
17	පරගහකැලේ	567.649
18	පොල්වත්ත	758.608
19	සදුන්පුර	745.224
20	පන්නල්ගම	138.949
21	දොලකන්ද	40.592
22	කුඩාගල	119.833
23	පාලමුනේ	332.675
24	මහඔය 01	350.814
25	දමන	1081.907
26	එරගම	1360.937
27	කෝමරිය 02	1355.699
එකතුව		**22055.798**

5. ශ්‍රී ලංකාව තුළ සහල් හිඟයක් ඇති වී වෙළෙඳ පොළ සහල් මිල පාරිභෝගිකයාට දැරිය නොහැකි මට්ටමක පවතින අවස්ථාවකදී පාරිභෝගිකයා ආරක්ෂා කිරීම උදෙසා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව මඟින් අවශ්‍ය නියාමනයන් සිදු කර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඔස්සේ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලබයි.

එමෙන්ම ප්‍රතිපත්තිමය තීරණ උදෙසා ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව මඟින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිපත්ති සකස්කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ.

6. සියයට 99.9ක් පමණ ගොවීන් නව වැඩිදියුණු වී ප්‍රභේද භාවිත කරන බැවින් පොහොර ඌනතාවකදී සෘජු ලෙස අස්වනු අඩු වීමට එය හේතුවක් වේ.

සාමාන්‍ය පරිදි පොහොර යෙදවූ වර්ෂයක් ලෙස 2020 වර්ෂය සැලකූ විට එම වර්ෂය තුළ වී සඳහා යූරියා මෙට්‍රික් ටොන් 403,058ක් බෙදා හැර ඇති අතර 2024 වර්ෂයේදී යූරියා මෙට්‍රික් ටොන් 215,255ක් බෙදා හැර ඇත.

මෙය සියයට 46.6ක අඩුවීමකි. ඊට සමගාමීව 2020දී වී අස්වැන්න හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 4.5 සිට 2022 වර්ෂයේදී හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 3 ලෙසද (සියයට 33.3ක අඩුවීමක්) සහ 2024 වර්ෂයේදී හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 3.8ක් ලෙසද අස්වනු අඩු වීම සිදුවී ඇත.

වී වගාවේ වියදම සන්සන්දනාත්මකව සලකා බැලීමේදී 2023/2024 මහ කන්නයේ පොහොර සඳහා අක්කරයකට රුපියල් 46,890ක් වැය වී ඇති අතර, 2024/2025 මහ කන්නයේ එය රුපියල් 22,851ක් දක්වා අඩු වී ඇත. ඒ අනුව 2023දී වී වගාවේ අක්කරයකට වැය කළ මුළු මුදල වන රුපියල් 146,056, 2024 වනවිට රුපියල් 137,917 දක්වා අඩු වී ඇත.

යූරියා මිල 2023දී කිලෝග්‍රෑම් 1ක් රුපියල් 461ක්, 2024දී යූරියා කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් 177-180 දක්වාත්, MOP කිලෝග්‍රෑම් 1ක් රුපියල් 398 සිට රුපියල් 217 දක්වාත්, TSP කිලෝග්‍රෑම් 1ක් රුපියල් 256 සිට රුපියල් 244 දක්වාත් අඩු වී ඇත.

මේ අනුව වී කිලෝග්‍රෑම් 1ක නිෂ්පාදන වියදම රුපියල් 59.37ත්, රුපියල් 81.73ක් අතර පවතිද්දී වී කිලෝග්‍රෑම් 1ක් සඳහා රජය ප්‍රකාශිත අවම වී මිලදී ගැනීමේ මිල රුපියල් 120-132 අතර පවත්වා ගැනුණි. එමඟින් වී කිලෝග්‍රෑම් 1ට ගොවීන්ට රුපියල් 38-73ක ලාභයක් ලැබේ.

7. වෙළෙඳ පොළ සහල් මිල පාරිභෝගිකයාට දැරිය නොහැකි මට්ටමක පවතින විටදී, අසාධාරණ මිල ඉහළ යෑමක් සිදුවන අවස්ථාවකදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා පාරිභෝගිකයා ආරක්ෂා කිරීම උදෙසා අවශ්‍ය මැදිහත් වීම වෙළෙඳ වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. (පාලන මිලක් පැනවීම, වෙළෙඳ පොළ අධීක්ෂණය) එමෙන්ම ලංකා සතොස අළෙවි සැල් ජාලය ඔස්සේ සහනදායී මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ පාරිභෝගිකයාට ලබා දීමට කටයුතු කරනු ලබයි. තවද, අත්‍යවශ්‍ය භාණ්ඩ සහනදායී මිල ගණන් යටතේ පාරිභෝගිකයාට ලබා දීම සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් තොග වෙළඳ මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.

8. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති වී ප්‍රභේද සියල්ල අක්කරයට බුසල් 200 (හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 10) ඉක්මවන අස්වනු විභවයක් පවතින නව වැඩිදියුණු වී ප්‍රභේද වන අතර සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 73ක් වැනි පහළ අගයක පවතී.

මෙහිදී විභව අස්වනු ලබා ගැනීමට ගුණාත්මක බිත්තර වී භාවිතය, සමතුලිත පැළෑටි පෝෂණය, ජල පාලනය, වල් පාලනය, රෝග පළිබෝධ පාලනය ආදී තාක්ෂණික පැකේජයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. මෙම නව තාක්ෂණික පැකේජය ප්‍රායෝගිකව ගොවීන් භාවිත කරන මට්ටමට ගෙන ඒම සඳහා රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් සකසා ඇත. එමෙන්ම සහල් කර්මාන්තය තිරසාරව පවත්වා ගැනීමට වෙළෙඳ පොළ හසුරුවමින් අගයදාම සංවර්ධනය දීර්ඝ කාලීන සැලසුමට අයත් වේ.

ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල සහල් පරිභෝජනය වසරකට කිලෝග්‍රෑම් 114ක් වන අතර, ඒ අනුව වාර්ෂික සහල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් මිලියන 4.8ක් බව ගණනය කර ඇත. 2028 වර්ෂයේ මෙම ඉලක්කය සපුරා ගැනීමේ

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

අරමුණෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ "විශේෂ යාය වැඩසටහන" මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර, එමඟින් 2025 අවසානයේ සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 4.1ක්ද, 2028 වන විට එය හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 4.2ක්ද ලෙස ඉහළ දමමින් සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.8ක ඉලක්කයක් ළඟා කර ගැනීමට අපේක්ෂිතය.

9. ශ්‍රී ලංකාවේ රේගු වාර්තාවලට අනුව 2025 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මස 31 දක්වා සහල් මෙට්‍රික් ටොන් 112,040ක් ආනයනය කර ඇත.

ආනයනික සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා මුළු බදු වටිනාකම රුපියල් 65.00ක් වේ. මෙය විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් ආවරණය වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2025 යල කන්නයේ වී මෙට්‍රික් ටොන් මිලියන 2.2ක අස්වැන්නක් ලැබීමට නියමිත අතර, මෙම අස්වැන්නෙන් ඊළඟ මහ කන්නයේ (2025/2026 මහ) බිත්තර වී අවශ්‍යතාව සඳහා මෙට්‍රික් ටොන් මිලියන 0.08ක් සහ අනෙකුත් අපතේ යෑම් සඳහා වී මෙට්‍රික් ටොන් මිලියන 0.13ක් අඩු කළ විට සහල් අවශ්‍යතාව සඳහා වී මෙට්‍රික් ටොන් මිලියන 1.99ක් ඉතිරි වේ. එමඟින් සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.29ක් ලබා ගත හැකි අතර, මාසික පාරිභෝජනය සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ 2ක් ලෙස ගණන් බැලූ විට මාස 06ක කාලයකට ප්‍රමාණවත් බව පෙනී යන බැවින් සහල් ආනයනය කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොමැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමාගේ අමාත්‍යාංශ නිවේදනය.

ශ්‍රී ලංකා රේගුව විසින් රඳවාගෙන තිබෙන ශුද්ධ වූ කුර්ආනයේ දෙමළ පරිවර්තන නිදහස් කිරීම: බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

இலங்கை சுங்கத்தின் தடுப்பிலுள்ள புனித அல்-குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை விடுவித்தல்: புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று

RELEASE OF TAMIL TRANSLATIONS OF HOLY QUR'AN HELD BY SRI LANKA CUSTOMS: STATEMENT BY MINISTER OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් 2025.08.20වන දින ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයටයි මා පිළිතුරු ලබා දෙන්නේ. දීර්ඝ පිළිතුරක් තිබෙන බැවින්, කාලය පිළිබඳවත් සලකා බලා එහි හරය ඉතා නිවැරදිව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

1. 2019ට පෙර ශුද්ධ වූ කුර්ආනයේ පරිවර්තන හෝ ඉස්ලාම් පොත් නිදහස් කිරීම සඳහා සමස්ත ලංකා ජමියතුල් උලමා සංවිධානයෙන් නිර්දේශ පොදුවේ ලබාගෙන තිබෙනවා. මේ කටයුත්ත හසුරුවනු ලබන්නේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හරහායි.

කෙසේ වුවත්, 2019 අප්‍රේල් පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය නව උපදෙස් මාලාවක් මේ සඳහා නිකුත් කළා. ඒ අනුව කුර්ආනයේ පරිවර්තන හෝ අරාබි පොත් සුදුසුකම් සහිත මුස්ලිම් විද්‍යාර්ථයින් විසින් සමාලෝචනය කර වෙනත් කිසිදු ආගමක් විවේචනය කරන හෝ පරිභව කරන පාඨ නොමැති බව තහවුරු කළ යුතු බව දැනුම් දීලා තිබෙනවා. එම විස්තර ඇමුණුම 01 සහ 02හි සඳහන් වනවා. ඒ අනුව දෙපාර්තමේන්තුවෙන් විද්‍යාර්ථීන් නම් කරන ලෙස ඉල්ලා ඇති අතර, ඒ මත පදනම්ව සමාලෝචන කමිටුවක් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පිහිටුවා තිබෙනවා.

කමිටු සාමාජිකයන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හරහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබා දුන් මාර්ගෝපදේශ හා රාමුව යටතේ තමයි පත් කරනු ලැබුවේ. විස්තර ඇමුණුම 03 සහ 04 මඟින් දක්වා ඇත.

කුර්ආනය පරිවර්තන හා ඉස්ලාම් පොත් ආනයනය සඳහා සුවිශේෂී උපදෙස් හා මාර්ගෝපදේශ ආරක්ෂක අමාත්‍යාංශය මඟින් නිකුත් කර තිබෙනවා. මෙම රාමුව යටතේ සමාලෝචන කමිටුව ද්‍රව්‍ය පරීක්ෂා කර නිර්දේශ ලබා දීම තමයි සාමාන්‍යයෙන් කෙරෙන්නේ. ඇමුණුම 05 සහ 06 මඟින් විස්තර දක්වා ඇත.

2. අංක FCSU 8233306 දරන කන්ටේනරයේ අඩංගු වෙලා තිබෙන ශුද්ධ වූ කුර්ආන පහත සඳහන් තොගය ඒ නිර්දේශ ප්‍රකාරව තහනම් කරනු ලැබ තිබෙනවා. විස්තර ඇමුණුම 07 මඟින් දක්වා ඇත.

භාණ්ඩය	ප්‍රමාණය
අරාබි බසින් ශුද්ධ වූ කුර්ආනය	25,000
ශුද්ධ වූ කුර්ආනය (දෙමළ පරිවර්තනය)	15,640
ශුද්ධ වූ කුර්ආනය (දෙමළ)	9,720
ශුද්ධ වූ කුර්ආනය (සිංහල)	1,200

කලින් සඳහන් කරන ලද කන්ටේනරයේ තොගයෙන් අරාබි බසින් ශුද්ධ වූ කුර්ආන පිටපත් 25,000ක් නිකුත් කර තිබෙනවා, ගැටලුවකින් තොරව. විස්තර ඇමුණුම 08 මඟින් දක්වා ඇත.

ඉතිරි ශුද්ධ වූ කුර්ආන පරිවර්තන පිටපත් 26,560 (දෙමළ හා සිංහල භාෂාවලින්) ශ්‍රී ලංකා රේගුව භාරය යටතේ දැනට රඳවා ගෙන තිබෙනවා.

පොත් සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා දී නොමැති අතර, පරිවර්තන සඳහා ප්‍රතිෂ්ඨාපිත රාමුවේ අවශ්‍යතා ආනයනික කුර්ආන පරිවර්තන සම්පූර්ණ නොකරන බැවින් අවශ්‍ය නිෂ්කාසන ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට නොහැකි වී තිබීමයි මෙහි ගැටලුව වන්නේ. ඇමුණුම 09, 10, 11 මඟින් විස්තර දක්වා ඇත.

ඇමුණුම් 01 සිට 11 දක්වා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

3. මෙම තීරණය ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී ගනු ලැබුවා. එහි උද්ධෘතයේ තිබෙන්නේ මෙහෙමයි.

"ගැටලු සහගත පොත් මුල් ප්‍රකාශකයන් විසින් නිවැරදි අධෝලිපි, නිවැරදි අර්ථ විවරණ අදාළ පිටුවල ඇතුළත් කර ඇත්නම් මිස නිකුත් නොකළ යුතුය."

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අපි ටික දවසක් තිස්සේ ඉඳලා උත්තර දෙන ප්‍රශ්නයක්. මේ නොගැළපීම්, ඒ වාගේම දීර්ඝ උද්ධෘතවලට අදාළ references පැහැදිලි නොකරපු තැන් තිස්ගණනක් තිබෙනවා. ඒවා පැහැදිලි කර ගන්න තමයි ආරක්ෂක කවුන්සලයෙන් මඟ පෙන්වීම කරලා තිබුණේ. ඒක කරන්නේ ඇත්තටම ආගම් අතර, ජනප්‍රජාවන් අතර කිසිදු ආකාරයකින් සංහිඳියාවට පලුද්දක් ඇති වීම අපේ අපේක්ෂාව නොවන නිසා.

අන්තර් ආගමික සමගිය ද ආරක්ෂා කරමින් කිසිදු සමාජ අසමගියක් ඇතිවීම වළක්වාලමින් නිසි පරිවර්තන සහ පැහැදිලි කිරීම් මුස්ලිම් ප්‍රජාව වෙත ලබා විය යුතුය කියන එකයි අපේ අදහස.

4. 2019ට පෙර මෙම අවශ්‍යතාව තිබුණේ නැහැ. ඔබ දන්නවා, 2019න් පස්සේ තමයි ටිකක් තීව්‍ර පරීක්ෂාව ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත කෙරෙන්නේ කියන එක. මේ සඳහා විද්වතුන් නම් කරන ලෙස දැනුම් දුන්නාට පස්සේ මේ විද්වත් කණ්ඩායම තමයි ග්‍රන්ථ පරීක්ෂාවට නම් කරනු ලැබුවේ. 2021 එය ස්ථාපිත කිරීමේ සිට කමිටුව ස්වේච්ඡාවෙන් අඛණ්ඩව සේවය කරන බව කියන්නට ඕනෑ. ශාස්ත්‍රපති ෂෙයික් අක්‍රම් නූර්අමිත්, ඒ වාගේම ෂෙයික් ආචාර්ය ඒ. අස්වර් අසාහීම්, ෂෙයික් මුර්ෂිද් මුලාෆර්, ශාස්ත්‍රපති ෂෙයික් සැකී අහමඩ්, ශාස්ත්‍රවේදී ෂෙයික් ඒ.එච්. ඉහ්සනුදීන්, නීතිවේදී ෂෙයික් මුෆ්ති මුස්තෆා රාසා සෆාර්, ඒ වාගේම අධ්‍යාපනපති ෂෙයික් එම්.ආර්.එම්. සිල්මි කියන විද්වත්, ගෞරවනීය කණ්ඩායම තමයි මේ සඳහා පත් කර තිබෙන්නේ.

5. සමාලෝචන කමිටුව ශුද්ධ වූ කුර්ආනයේ අරාබි අනුවාදයට පමණක් අනුමැතිය ලබා දී තිබෙනවා, ගරු කථානායකතුමනි. පරිවර්තිත අනුවාදයන් අවශ්‍ය රාමුවට අනුගත නොවූ බැවින් අනෙක් ඒවා නිර්දේශ වෙන්නේ නැහැ. ඒ නිර්දේශ නොවීමට ප්‍රධාන හේතූන් වශයෙන් වගන්ති 4ක් තිබෙනවා. ඒ පිළිබඳව මා කෙටියෙන් සඳහන් කරන්නම්.

2.3 වගන්තිය

කුර්ආනයේ පරිවර්තනවල අවශ්‍ය ස්ථානයන්හි ජිහාඩ් සහ අනෙකුත් ඒවායේ පද වැනි විශේෂයෙන්ම නිසි පැහැදිලි කිරීම් නොමැති විට පාඨකයා විසින් වැරදි ලෙස තේරුම් ගැනීමට හැකියාව ඇති 'ආයාත්' - පද - අධෝලිපි මඟින් පැහැදිලි කිරීම් සටහන් කළ යුතුය කියන එක.

2.4 වගන්තිය

කුර්ආනයේ පරිවර්තනවල සර්ව බලධාරී අල්ලාහ් දෙවියන් සහ ඔහුගේ ප්‍රිය මුහම්මද් අනාගත වක්තෘතුමා (ඔහුට සාමය ලැබේවා), අනෙකුත් අනාගත වක්තෘවරු, දේවදූතයන් සහ කුර්ආනයේ සඳහන් භක්තිමත් පුරුෂයන් හා කාන්තාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා සුදුසු ගෞරවනීය වචන යොදා ගත යුතුය. ඉහත සඳහන් අයට අගෞරවනීය ලෙස සැලකෙන වචන භාවිත කර තිබේ නම් නිෂ්කාසනය සඳහා නිර්දේශ නොකෙරේ.

6.3 වගන්තිය

හන්බාලි හෝ මාලිකිෆික් පදනම් කර ගත් පොත් මෙන්ම ෆට්වාහි පොත් ආනයනය කළ හැක්කේ පර්යේෂණ හා යොමු කිරීමේ අරමුණු සඳහා පමණි.

8.3 වගන්තිය

වෙනත් චින්තන සහිත පාසල් පදනම් කර ගත් ඉස්ලාම් පොත් නිසි සාධාරණීකරණය සමඟ පර්යේෂණ හා යොමු කිරීමේ අරමුණු සඳහා පමණක් අවසර ලැබේ.

ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ ක්‍රම තමයි අනුගමය කළේ.

මේ මහා සංවාදය ඉස්සරහට ඇවිල්ලා 2025 ජූනි 23 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවති රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මේ දක්වා ආරක්ෂක මණ්ඩලයේ නියම දැඩි ලෙස ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ, මම කලින් කියූ පරිදි අප සියලුදෙනාගේ සංහිඳියාව පතා. ජාතික ආරක්ෂාවේ අවශ්‍යතාවන්ට සම්පූර්ණ අනුකූලභාවය සහතික කරමින් එයට සමගාමීව මුස්ලිම් ප්‍රජාවේ ආගමික මත ආරක්ෂා කරමින් සහ රට පුරා අන්තර් ආගමික සමගිය ආරක්ෂා කරමින් දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු මෙම රාමුව තුළ තමයි ඉස්සරහට ගෙන යන්න සිදු වන්නේ, ගරු කථානායකතුමනි.

ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නවලට දෙන්න තිබෙන පිළිතුර එයයි. බොහොම ස්තුතියි.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, இது இலங்கையில் வாழும் கிட்டத்தட்ட 25 இலட்சம் முஸ்லிம்களுடைய பிரச்சினை! மன்னர் பஹ்த் அல்-குர்ஆன் பிரசுரிப்பு நிலையத்தில் பிரசுரிக்கப்பட்ட கிட்டத்தட்ட மூன்று இலட்சம் அல்-குர்ஆன் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகள் இலங்கைக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றன. இன்று பாவனையிலுள்ள அல்-குர்ஆன் பிரதிகளை ஒத்ததாகவே அவை காணப்படுகின்றன. கிட்டத்தட்ட 30 வருடங்களுக்கு முன்னர், இதே அல்-குர்ஆன் பிரதிகளை நான் எடுத்திருக்கின்றேன். சுங்கத்தில் தடுத்து வைக்கப்பட்டுள்ள அல்-குர்ஆன் பிரதிகளை விடுவிப்பது தொடர்பில் ஆராய குழுவொன்று நியமிக்கப்பட்டு இருக்கின்றது. அந்த Review Committeeஇன் சட்டபூர்வ தன்மை என்ன? என நாங்கள் கேட்கின்றோம். அது பற்றி எங்களுக்குத் தெரிந்தாக வேண்டும்.

அந்த Review Committeeஇல் இருக்கின்ற 8 பேரும், இலங்கையில் இருக்கின்ற 25 இலட்சம் முஸ்லிம்களுடைய புனித அல்-குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை நாட்டுக்குள் விடுவிக்காமல் இருப்பதற்குரிய முடிவை எடுக்க முடியாது. ஏனெனில், அவர்களுக்கு எமது மார்க்க அடிப்படையிலான முடிவுகளை எடுக்க முடியாது. நீங்கள் இந்த விடயத்துக்கு 2019ஆம் ஆண்டு நடைபெற்ற 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலைக் காரணம் காட்டுகின்றீர்கள். ஆனால், இந்த நாட்டில் அதைவிடப் பெரிய யுத்தமே நடந்தது. அப்போதுகூட, அந்தச் சமூகம் சார்ந்த புனித நூல்கள் இலங்கைக்குக் கொண்டுவரப்பட்டன. அப்போது இது போன்ற Review Committee நியமிக்கப்பட்டதா? இல்லை! எனவே, நீங்கள் இந்தக் Committeeஇன் சட்டபூர்வ தன்மையை எங்களுக்குச் சொல்ல வேண்டும். இதனோடு சம்பந்தப்பட்ட இன்னும் சில விடயங்களை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இன்றைக்கு இளைஞர்கள் smartphoneஇல் Play Store, App Store, YouTube மூலம் அல்-குர்ஆனின் மொழிபெயர்ப்பைத் தேடினால் இதே மொழிபெயர்ப்புத்தான் அதிலும் இருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් පැහැදිලි කරන්න. ඔබතුමා දැනටත් විනාඩි දෙකක් අරගෙන තිබෙනවා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, இது எங்களுடைய சமயம் சார்ந்த முக்கியமான ஒரு பிரச்சினை என்றபடியால், எங்களுடைய அடிப்படை உரிமை மீறப்படுகின்ற ஒரு விடயமாக இருக்கின்றபடியால், இவ்விடயம் சம்பந்தமாக உள்ள சந்தேகங்களை நிவர்த்தி செய்துகொள்வதற்கு எனக்குச் சந்தர்ப்பம் தர வேண்டும். நான் உங்களுக்கு எந்தச் சந்தர்ப்பத்திலும் இடையூறு ஏற்படுத்துவதில்லை.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
புனித அல்-குர்ஆனை அதன் அசல் வடிவில் எவ்வித விளக்கக் குறிப்பும் இன்றி, அரபு மொழியிலும் தமிழ் மொழியிலும் வாசித்து விளங்கக்கூடிய சந்தர்ப்பம் என்பது இலங்கை வாழ் 25 இலட்சம் முஸ்லிம்களினதும் அடிப்படை உரிமை என்பதை நீங்கள் ஏற்றுக் கொள்வீர்களா? அதனை ஏற்றுக்கொண்டால், தடுத்து வைக்கப்பட்டுள்ள அல்-குர்ஆன் பிரதிகளை நீங்கள் விடுவிக்க வேண்டும். இந்தப் புனித நூலானது கிட்டத்தட்ட 50 மொழிகளில் மொழிபெயர்க்கப் பட்டு, பல நாடுகளுக்கும் அனுப்பப்படுகின்றது என்ற அடிப்படையில் நீங்கள் இந்த விடயத்தைப் பார்க்க வேண்டும். ஏனைய பிரச்சினைக் காலங்களிலும்கூட, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்! நான் முடிக்கின்றேன்.

எங்களைப் பொறுத்தவரையில், இந்த Review Committeeஇன் சட்டபூர்வத் தன்மை கேள்விக்குறியாக இருக்கின்றது. உங்களுக்கு அவ்வாறானதொரு குழுவை நியமிக்க வேண்டுமென்றால், எமது நாட்டிலுள்ள universitiesஇல் இருக்கின்ற இத்துறை சார்ந்த பேராசிரியர்களை அதற்கு நியமியுங்கள்! முஸ்லிம்களுடைய புனித நூல்தான் அல்-குர்ஆன்! இது சம்பந்தமான விடயத்தைக் கேலிக்கூத்தாக்குகின்றார்கள்; இதனைக் கேவலப்படுத்து கின்றார்கள். இந்த நிலைமையில் நீங்கள் இருக்கக் கூடாதென நாங்கள் கேட்டுக் கொள்கின்றோம். இந்த Review Committeeஇன் சட்டபூர்வத் தன்மை என்ன என்பதையும், அதற்குரிய அதிகாரத்தை யாருக்குக் கொடுப்பது என்பதையும் கௌரவ அமைச்சர் அவர்கள் எங்களுக்குத் தெளிவுபடுத்தினால் நல்லது.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, එතුමා අහන ප්‍රශ්නය පැහැදිලියි. මේ ශුද්ධ වූ කුර්ආන ජනතාවට මුදා හැරෙන්න ඕනෑ බව ඇත්ත. නමුත්, මම දීර්ඝව පැහැදිලි කළේ ඒ සම්බන්ධව දැනට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග සහ නීතිමය පසුබිම කොයි තරම් තාර්කිකව ගොඩනැඟිලා තිබෙනවාද කියන එක.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනවා සමාලෝචන කමිටුව ගැන. සමාලෝචන කමිටුව පත් කරලා තිබෙන්නේ ඒ ඒ සුදුසුකම් සහිත පුද්ගලයන්ගෙන්. සුදුසුකම් සහිතවම තමයි මම එම තනතුරු කියෙව්වේ. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අත්සනින් දුන් ලිපියකින් තමයි එම පත්වීම් කරලා තිබෙන්නේ. එතුමන්ලා සේවය කරන්නේ ස්වේච්ඡාවෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විමසා තිබෙනවා, ගෙවීම් කරනවාද, ගැසට් කරලා තිබෙනවාද කියලා. ගැසට් කිරීමේ වුවමනාවක් නැහැ, ගෙවීම් ලබන්නේත් නැහැ. එම මණ්ඩලය නුසුදුසු නම් ඔබතුමන්ලාට පුළුවන්, අපට ලිඛිතව ඒ බව දැනුම් දෙන්න. ඒක විධිමත්ව අපට දැනුම් දුන්නොත් අපට පුළුවන් නැවත ඒක සලකා බලන්න. මොකද හේතුව, එය අපි කාගේවත් වුවමනාවකට අත්තනෝමතික විධියට පත් කළ කමිටුවක් නෙවෙයි. මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳව උපදේශයක් අවශ්‍ය වුණාම ලබා ගන්න උපදේශක මණ්ඩලයක්, ඒ වාගේම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු පරිපාලන ව්‍යුහයක් තිබෙනවා. ඒ අනුව තමයි දැනට කටයුතු කරලා තිබෙන්නේ. ආරක්ෂක අමාත්‍යාංශයෙනුත් මේ සම්බන්ධව මාර්ගෝපදේශ සපයා තිබුණා. එම කමිටුව ඔබට විශ්වාස නැත්නම් අපට පුළුවන් ඔබගේ විකල්ප යෝජනාවට සවන් දෙන්න සහ ඒ අනුව කළ යුතු දේ කරන්න.

ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් රැස්වුණු කමිටුවේදී මේ ප්‍රශ්නය විසඳීමේ වුවමනාව ඇති තරම් පැහැදිලි කරලා දුන්නා. අප සියලුදෙනාගේත්, රජයේත් වුවමනාව ඒක. නමුත් ඔබතුමන්ලා දන්නවා, ඒක මුද්‍රණය වෙන්නේ අල් මදීනාවේ කියලා. මම දන්නා තරමින් මෙහේ මුද්‍රණය වුණේ නැහැ. ඊළඟට, ඒ references නිවැරදි කරලා, පිටු දෙක තුනක් හැටියට පොතේ අගට එකතු කරන්න පුළුවන්ද ආදී විකල්ප ගැන සාකච්ඡා කළා. නමුත්, ඒවා අවදානම් සහිතයි. ඒවා ඉවත් වෙන්න පුළුවන්. කාලයක් ගත වුණාම මේ ප්‍රශ්නයට වෙන විධියකට ඔරොත්තු දෙන, එහෙම නැත්නම් මුහුණ දෙන පොතක් අපේ සමාජයේ -එළියේ- තිබෙන්න පුළුවන්. ඒක තමයි අපේ වුවමනාව වුණේ. ඒ සියල්ල නිවැරදි කරලා නැවත ලංකාවේ මුද්‍රණය කරන්න පුළුවන් නම් මම හිතන්නේ ඒක එක විධියක්.

ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණා සම්බන්ධව මේ විධියට තමයි පැහැදිලි කරන්න වෙන්නේ. අපේ සද්භාවය වටහා ගන්න කියලා ආරාධනා කරනවා. ගැටලුවකින් තොරව මේ ප්‍රශ්නය විසඳා ගන්න ඔබතුමන්ලාගේ පැත්තෙන් විකල්ප යෝජනා ඉදිරිපත් කරනවා නම් එයටත් සවන් දෙන්න අපි සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම. අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය. *[බාධා කිරීමක්]* ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විවාදයකට යන්න බැහැ.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත
பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்
BETTING AND GAMING LEVY (AMENDMENT) BILL

" 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසිනි.

2025 නොවැම්බර් 04වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2025 நவம்பர் 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Nalinda Jayatissa on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education;

to be read a Second time upon Tuesday,04th November 2025 and to be printed; and to be referred to the Committee on Public Finance.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் கேட்ட கேள்வி தொடர்பில் இன்னும் கொஞ்சம் விளக்கமளிக்க விரும்புகின்றேன். ஏனென்றால், இது எமது சமூகம் சார்ந்த பாரியதொரு பிரச்சினை! இது இந்த நாட்டிலுள்ள கிட்டத்தட்ட 25 இலட்சம் முஸ்லிம்களுடைய பிரச்சினையென நான் ஏற்கெனவே கூறியிருந்தேன். கௌரவ அமைச்சர் அவர்களே, இவ்விடயம் தொடர்பில் நியமிக்கப்பட்டுள்ள Committeeஐ நான் குறை சொல்லவில்லை. இந்த Committeeஇல் இருக்கின்றவர்கள் எவ்வாறானவர்கள் என்று எனக்குத் தெரியாது. இந்த நாட்டிலுள்ள universitiesஇல் இத்துறை சார்ந்த பல பேராசிரியர்கள் இருக்கிறார்கள். இதற்கு ஒரு footnote தேவை -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණයේ point of Order එකක් නැහැ.

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත: නියෝග
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT: REGULATIONS

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මිල නියම කිරීමේ කමිටුව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සියලු පරදු දරන්නන් විමසා සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන ඇතුළු වෙනත් සියලු අදාළ සාධක පිළිබඳ සැලකිල්ලට ගෙන 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118(4) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූලි 21 දිනැති අංක 2446/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

To start the Debate, the Hon. (Dr.) Nishantha Samaraweera. You have seven minutes.

[අ.භා. 12.26]

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වන නියෝග පිළිබඳව අදහස් කිහිපයක් එකතු කිරීමට මම කැමැතියි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ලංකාව තුළ ඖෂධ ආනයනය, රෝහල් තුළ භාවිත වන සියලු ඖෂධ වර්ග, රටේ සමස්ත ක්‍රියාවලිය තුළ තිබෙන ඖෂධ සහ සුවඳ විලවුන් වර්ග පිළිබඳව සඳහන් වනවා. මේ පනත බලාත්මක වුණේ 2015 අවුරුද්දේ ඉඳලායි. පසුගිය කාලය තුළ මේ රටේ ජන සමාජයට ඖෂධ සපයා ගැනීම සම්බන්ධයෙන් බරපතළ ගැටලු ගණනාවක් තිබුණු බව අපි අත්දැක තිබෙනවා. විශේෂයෙන්ම ජන සමාජයක් විධියට තමන්ගේ රෝගාබාධවලට අදාළ වන ඖෂධ නිසි කලට, නිසි වේලාවට සපයා ගැනීම කියන එක අත්‍යවශ්‍ය කාරණයක්. ඒ සැපයුම් සම්බන්ධ සියලු නියාමනයන්ට අදාළ ආයතනය තමයි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය.

මේ සමස්ත සෞඛ්‍ය සැපයුම් ජාලය ගත්තාම, වෛද්‍ය සැපයුම් අංශය, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වාගේ ආයතන ගණනාවක් මේ ඖෂධ සැපයුම්

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

ක්‍රියාවලිය එක්ක ගැට ගැහිලා තිබෙනවා. ලංකාවට ආනයනය කරන ඖෂධ ලියාපදිංචි කිරීමේ - registration - ක්‍රියාවලිය සහ නියාමන ක්‍රියාවලිය කරන්නේ මේ ආයතනයෙන්. ඒ සඳහා අයදුම්පත් කැඳවලා, ඊට පස්සේ මේ ආයතනය නිරීක්ෂණ කටයුතු කරලා, ඒ ඖෂධයේ ගුණාත්මකභාවය, වෙනත් රටවල් නිකුත් කළ වාර්තා පවා සැලකිල්ලට ගන්නවා. ඒ වාගේ කරුණු විශාල ප්‍රමාණයක් අධ්‍යයනයකින් පසුව තමයි ලංකාවට ඖෂධයක් ආනයනය කරන්න අවස්ථාව සැලසෙන්නේ. මේ ක්‍රියාවලියට දළ වශයෙන් මාස 10ක -දින 300ක- විතර කාලයක් ගත වනවා. එහෙම ගෙනෙන ඖෂධ විශාල ප්‍රමාණයක් තිබෙනවා. සමහර වෙලාවට එකම ඖෂධ නාමය යටතේ ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක් ආනයනය කරනවා. මේ නිසා යම් ඖෂධයකට අදාළ උපරිම මිලක් රටට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. කලින් සම්මත වුණු පනත යටතේ මිල තීරණය කිරීමේ කමිටු තිබුණා; එවැනි හැකියාවක් හදලා තිබුණා. නමුත්, ඒ කමිටුවට නිශ්චිත ක්‍රමවේදයක් සකස් කරලා තිබුණේ නැහැ. එම නිසා පසුගිය යුගය පුරාම ඖෂධ ආනයනයේදී සහ විශේෂයෙන්ම ඖෂධ සැපයීමේදී මිල නියම කිරීමේ ක්‍රියාවලිය ගැටලු සහගත තැනකයි තිබුණේ. එම නිසා මිල නියම කිරීමේ කමිටුවට යම් නීතිමය බාධා මතුවෙලා තිබුණා; ඒක අභියෝගයට ලක්වෙලා තිබුණා. එසේ අභියෝගයට ලක් වුණේ නිකම් නොවෙයි, නිසි ක්‍රමවේදයක් රහිතව එම කමිටුව ස්ථාපිත වෙලා තිබුණු නිසායි. රටට ගෙන්වන ඖෂධවල නිශ්චිත මිල තීරණය කිරීමේ ක්‍රියාවලිය ගත්තාම, ඒ සඳහා වුවමනා ශක්තිය සැපයීම තමයි අද දවසේ මේ කාර්යභාරයෙන් කරන්න උත්සාහ කරන්නේ. මෙතෙක් කල් පැවති චකවානු ගත්තත්, maximum retail price එකක් නියම කරලා තිබෙනවා. හැබැයි, ඒක නියමිත සූත්‍රගත ක්‍රමයකට නොවෙයි නියම කරලා තිබුණේ. ඖෂධීය නාමයට - generic name එකට - අදාළව, ඒ කියන්නේ ගෙන්වන විවිධ වර්ගවලට - brandsවලට - අදාළව උපරිම මිලක් තීරණය කිරීම එකක්. ඒ වාගේම ගෙන්වන විවිධ ඖෂධ වෙළෙඳ නාමවලට අදාළව උපරිම මිල තීරණය කිරීම තව එකක්. මේ දෙක සඳහාම විධිමත් ක්‍රමවේදයක් මෙම නියෝග යටතේ යෝජනා කරනවා. ඒක තමයි රටට අත්‍යවශ්‍ය වෙලා තිබුණු කාරණය.

මෙතෙක් කල් තිබුණු ගණනය කිරීම හරහා සමහර විට ඉතාම අඩු මිලට ලබා ගත හැකිව තිබුණු ඖෂධවලටත් වැඩි මිලක් ගෙවන්න වුණා. ජන සමාජයට තමන්ගේ රෝගාබාධවලදී අත්‍යවශ්‍ය ඖෂධ සපයා ගන්නකොට සමහර වෙලාවට වැඩි මිලක් ගෙවන්න සිද්ධ වුණා. ඒ ක්‍රමය මෙතැනින් පසුව වෙනස් වෙනවා. ඒකට තමයි මේ නව ක්‍රමය හඳුන්වා දී තිබෙන්නේ. ඖෂධ ආනයනයේදී CIF value එක මත පදනම් වෙලා, තීරු බදු ඇතුළු කොටස්, ඒ අත්‍යවශ්‍ය දේවල්, බදු ඇතුළත් වෙනවා නම් ඒ බදු - tax - සහ වෙළෙඳ පොළ transport සඳහා ගෙවන මුදල, සේවකයන්ට ගෙවන මුදල කියන ඒ සියල්ල ඇතුළත් වුණු අවශ්‍යතාවන්ට යටත් සීමාවක් මෙතැනින් නිර්දේශ කරලා තිබෙනවා. අපි බොහෝ ඖෂධවලට tax අය කරන්නේ නැහැ. ඒ නිසා අපට පහසුවක් තිබෙනවා, ජන සමාජයට ඉතාම අඩු මිලට ඖෂධ සපයා ගැනීමේ ක්‍රියාවලියට යන්න. අපි මේ නියෝග අනුමත කිරීමේ මූලික වුවමනාව ලෙස දකින්නේ මේකයි. මෙතෙක් කාලයක් ඖෂධ මිල තීරණය කිරීමේදී මිල පාලන කමිටුවලට අවශ්‍ය වෙලා තිබුණු ශක්තිමත්භාවය නොමැති වීම නිසා මතු වුණු ගැටලු ප්‍රමාණයක් සමාජය තුළ තිබුණා. අන්න ඒක අවසන් කිරීම සඳහා තමයි අද දවසේ මෙම නියෝග අනුමත කරන්නේ. මෙම නියෝග අනුමත කිරීම හරහා ජන සමාජයට, විශේෂයෙන්ම රෝහල් පද්ධතියට, ඒ වාගේම පෞද්ගලික අංශය ඇතුළු සමස්ත ජාලයටම maximum retail price එකකුත්, ceiling price එකකුත් නියම කිරීම තුළින් අඩු මිලට සපයා ගත හැකි ඖෂධ උපරිම ප්‍රමාණය සපයන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ (ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, you have 14 minutes.

[අ.භා. 1.00]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙම නියෝග පනවන්නේ 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ සෞඛ්‍ය විෂය භාර ගරු ඇමතිවරයාට තිබෙන බලතල යටතේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 අංක 5 දරන පනත සම්මත වුණේ 2015 වර්ෂයේ 3වැනි මාසයේ 19 වැනි දා. අපි 2015 යහපාලන රජය යටතේ, ඒ මැතිවරණ ව්‍යාපාරයේ, ඖෂධ ක්ෂේත්‍රයේ යහපාලනය ස්ථාපනය කිරීම සඳහා වෙච්ච පොරොන්දුවක් ඉෂ්ට කරන්න තමයි මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා එදා ලෝක සෞඛ්‍ය සංවිධානයට, ඒ වාගේම UNCTAD සංවිධානයට හඳුන්වා දුන් අපේ රටටත්, ලෝකයටත් පිළිගන්න පුළුවන් ඒ ප්‍රායෝගික, සාධාරණ ඖෂධ ප්‍රතිපත්තිය අපේ රටේ නීතිය බවට පත් කරලා ඖෂධ මිල, ගුණාත්මකභාවය තහවුරු කරන නීති පද්ධතියක් ගොඩනැගීමට තිබෙන අවශ්‍යතාව අනුව ඖෂධ පිළිබඳ නියාමනය මේ රටේ නීතියේ කොටසක් බවට පත් කළේ. යහපාලන රජය ගැන, එහි අඩු පාඩුකම් ගැන බොහෝ දෙනෙක් කථා කළත් යහපාලන රජයේ අපට සතුටු වෙන්න පුළුවන්, ආඩම්බර වෙන්න පුළුවන්, අද මේ වර්තමාන රජයට තමන්ගේ මේ රාජ්‍ය පාලනය යාවත්කාලීන කිරීමේදී යොදා ගන්න පුළුවන් විධියේ ශක්තිමත්, පුළුල් නීතියක් 2015 අංක 5 දරන පනත මඟින් අපි ස්ථාපනය කර තිබෙනවා. ඒ පනත යටතේ තමයි මෙම නියෝග පැනවෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අංක 2 දරන ඖෂධ සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ නියෝග මඟින් වැදගත්ම කරුණු 2ක් එළිදක්වනවා. එකක් තමයි, උපරිම සිල්ලර මිල. අනෙක තමයි උපරිම බෙදා හැරීමේ මිල. මේවා හරි වැදගත්. රජය මේ කාරණය පිළිබඳව නව මිල සූත්‍රයක් හඳුන්වා දීම පිළිබඳවත්, ඒ හරහා පුළුල් විධියට පාරිභෝගිකයාට යහපතක් වන, නිෂ්පාදකයාට සහ වෙළෙන්දාට අසාධාරණයක් නොවන ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳවත් අපි විපක්ෂය හැටියට සතුටු වෙනවා. ඒ නිසා පළමුව මේ නියෝග වැදගත් බවත්, මේ නියෝග සුදුසු බවත්, මේ නියෝගවල අවශ්‍යතාවත් අපි තහවුරු කරනවා. ඒ සඳහා අවශ්‍ය වන නීතිමය පදනම සකස් කරන්න දායක වුණු අය හැටියට අපි ඒ ගැන සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ දෙනෙක් කථා කරන්නේ මිල ගැන. නමුත් අද වෙනකොට මිල එක ප්‍රශ්නයක් පමණයි. ඒක ප්‍රධාන ප්‍රශ්නය. නමුත් ගුණාත්මකභාවය පිළිබඳ

ප්‍රශ්නයට තවම විසඳුමක් ඇවිල්ලා නැහැ. ගුණාත්මකභාවය පිළිබඳ විවිධ පරීක්ෂණ වාර්තා අපි සලකා බැලුවත්, රට තුළ සහ රටින් එළියේ තිබෙන පරීක්ෂණ ගැන අපි විශ්වාසය තැබුවත්, අපි කවුරුත් දන්නවා, නිෂ්පාදකයා අනුව, නිෂ්පාදනය වන රට අනුව එකම ඖෂධයේ ගුණාත්මකභාවය වෙනස් වෙන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරුන් ඖෂධ නියම කරනකොට generic name එකෙන් නියම කරන්න කියලා අපි කිව්වාට, ඒ ගමන්ම කියනවා, අහවල් brand එකත් බලන්න කියලා. මොකද, පළපුරුද්දෙන් දන්නවා, මේකේ ගුණාත්මකභාවය වෙනස් කියලා. ඒ නිසා මිල නියම කිරීම පිළිබඳව මේ මිල සූත්‍රය හඳුන්වා දීම ඉතා වටිනවා වාගේම ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා තවදුරටත් රෙගුලාසි පැනවීමත්, තවදුරටත් පහසුකම් සැපයීමත්, තවදුරටත් සොයා බැලීමත්, පසුවිපරම් කිරීමත් අවශ්‍ය වෙනවා. ඒකත් නියාමනයේ වැදගත්ම කොටසක්.

ඊළඟ ගැටලුව තමයි, අද අපට මුහුණ දෙන්න වෙලා තිබෙන ප්‍රශ්නය. ඒ තමයි ඖෂධ ප්‍රමාණවත් ලෙස රජයේ රෝහල්වල නොමැතිවීම. ඖෂධවල මිල අධිකවීමත්, දුෂ්පත්කමත් එක්ක මේ රටේ අතිමහත් වූ ජනතාව තවම නිදහස් සෞඛ්‍ය කෙරෙහි විශ්වාසය තබනවා. තවම තමන්ගේ මූලික සෞඛ්‍ය අවශ්‍යතා වාගේම බරපතළ ශල්‍යකර්ම දක්වා වූ කටයුතු රජයේ රෝහලකින් කර ගැනීම ගැන ඔවුන් විශ්වාසය තබනවා. ඒ හරහා සැලකිය යුතු හොඳ සේවයක් ලැබෙනවා.

නිදහස් සෞඛ්‍යයත් අපේ අයිතියක්. අපි හැම වෙලාවේම කථා කරනවා, නිදහස් අධ්‍යාපනය ගැන. නමුත් නිදහස් සෞඛ්‍ය අයිතියත් අපි දිනාගත් අයිතියක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 76ක් මේ රටේ මොකුත් වෙලා නැහැ කිව්වාට, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සිටින 159ක් වෙච්ච මන්ත්‍රීතුමන්ලාටත්, සමස්ත 225දෙනාටමත් මේ පාර්ලිමේන්තුවට එන්න අවශ්‍ය කරන ඒ දැනුම, අවබෝධය ලබා දුන්නේ නිදහස් අධ්‍යාපනයෙන්. ඒ වාගේම තමයි අපි සියලු දෙනාම මේ නිදහස් සෞඛ්‍ය සේවාව ලබන්න වාසනාව ලබපු අය. නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍යයත් කියන මේ දෙක එකට යන්නේ. නිදහස් සෞඛ්‍යය පිළිබඳව ගත්තාම, එක පැත්තකින් රජය විසින් ප්‍රමාණවත් විධියට ඖෂධ සහ සෞඛ්‍ය සේවා සැපයීම සනාථ කරන අතර, අනෙක් අතට ගුණාත්මක ඖෂධ රට තුළ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ තිබීම තහවුරු කිරීමත් වැදගත් වෙනවා.

ගරු විපක්ෂ නායකතුමාත් සඳහන් කළා වාගේ අද වන විට කළුතර මහ රෝහලේ ඖෂධ 100ක් හිඟයි. මේක අද තිබෙන ලොකුම ගැටලුවක්. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, කළුතර - නාගොඩ මහ රෝහලේ පමණක් ඖෂධ වර්ග 100ක හිඟයක් තිබෙනවා. මම අපේ සෞඛ්‍ය ඇමතිතුමාට දොසක් කියන්නේ නැහැ. මේක, රටේම තිබෙන ප්‍රශ්නයක කොටසක්. ඒ වාගේම අපි දන්නවා එදිනෙදා අත්‍යවශ්‍ය වන්නා වූ - දියවැඩියා රෝගයට, හෘදය රෝගවලට සහ ඒ හා බැඳෙන අනෙකුත් සංකූලතාවලට - අවශ්‍යකරන ඖෂධ එක්කෝ නැහැ, එහෙම නැත්නම් ඒ ඖෂධවල හිඟයක් තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙන්නේ ඇයි?

මේ පිළිබඳව සාකච්ඡා කරන හැම වෙලාවකදීම පෙනෙන දෙය තමයි මිලදී ගැනීමේ ක්‍රියාවලිය විධිමත් නැති බව, එහෙම නැත්නම් කාර්යක්ෂම නැති බව. අපි සෑහෙන අවධානයක් යොදනවා, දූෂණය වළක්වන්න. ඒක වැදගත් දෙයක්. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණය වළක්වන්න අවධානය යොදනවාත් සමඟම මේ ක්‍රියාදාමය කාර්යක්ෂම වෙන්නත් ඕනෑ. අපි ප්‍රතිපත්තියක් විධියට ටෙන්ඩර් කරන්න ඕනෑ කියලා කියනවා. ටෙන්ඩර්වලත් තිබෙනවා, ඉක්මනින්, පහසුවෙන් දූෂණය අවම කරන ක්‍රියාදාමයක්. ඒ නිසා රාජ්‍යය විසින් මිලදී ගැනීමේ ක්‍රියාදාමය තුළ e-procurement ක්‍රියාදාමය තවදුරටත් ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමා දැනටමත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙන බව මම දන්නවා. නමුත් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම අවශ්‍යයි. ටෙන්ඩරයක් සඳහා විශාල කාලයක් ගත වෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවකයින් පරිස්සමින් කටයුතු කරන එකත් වැදගත්. ඒ විතරක් නොවෙයි, ඖෂධ නියමිත වෙලාවට, නියමිත ස්ථානවල තිබීමත් වැදගත් වෙනවා.

මම රජයට දෝෂාරෝපණය කරනවා නොවෙයි. මම රජයට ආයාචනා කරනවා, රජයෙන් ඉල්ලා සිටිනවා, නියම වෙලාවට නියමිත ප්‍රමාණයට අවශ්‍ය ඖෂධ මේ රට තුළ ස්ථාපනය කරන්න කියලා. ඒ සඳහා නවීන තාක්ෂණය මත පදනම් වෙච්ච දූෂණයෙන් තොර වැඩ පිළිවෙළක් ස්ථාපනය කිරීම ඔබතුමන්ලාගේ වගකීමක්. ඒ සඳහා වන නීතිමය පදනම 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත මඟින් ඇති කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි පැනවීමත්, අවශ්‍ය කරන කාර්ය පටිපාටි සකස් කිරීමත් ගරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ වගකීමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද දවසේ සුවසැරිය ගිලන් රථ සේවය ගැන කථා කළා. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, සුවසැරිය ගිලන් රථ සේවයේ අංකය, වර්ණය සහ එහි අරමුණු වෙනස් නොකරන බවට ප්‍රකාශ කිරීම සම්බන්ධව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැටලුව ඇති වුණේ කොහොමද? ගරු ඇමතිතුමනි, ඔබතුමා රජය පැත්තෙන්, අද පාර්ලිමේන්තුවේදී මේ කාරණය අවසානාත්මකව කියනකම්, රජයේ නියෝජ්‍ය ඇමතිවරු මොනවාද කිව්වේ? චතුරංග අබේසිංහ මැතිතුමා මේ රජයේ ප්‍රධාන ප්‍රකාශකයෙක්. එතුමා ලස්සනට කථා කරනවා. ඒ වාගේම එතුමාට ලොකු ප්‍රේක්ෂකයින් පිරිසකුත් ඉන්නවා. නමුත් එතුමා කිව්වේ ඔබතුමා කියපු දෙය නොවෙයි. එතැන පරස්පරයක් තිබෙනවා. එතුමා කියන්නේ මොකක්ද? එතුමා කියන්නේ මේ වර්ණය වෙනස් කරන්න ඕනෑ කියලායි. එතුමා කියන්නේ මේ නම වෙනස් කිරීම හරි කියලායි. ඒ වාගේම එතුමා මේකේ පුරෝගාමීන්ව පිළිගැනීමත් ප්‍රතික්ෂේප කරනවා. එතැනයි ගැටලුව තිබෙන්නේ.

ඒ නිසා රජය එක මතයක හිටියා නම් හරි. විශේෂයෙන් මේ "සුවසැරිය" කියන නම ඒ ප්‍රධාන ප්‍රචාරණ කටයුතුවලින් ඉවත් වීමත්, ඒ හරහා මතු වුණු මේ ප්‍රශ්නයත් පක්ෂ පාට භේදයක් නැතිව සමාජයේ විවේචනයට ලක් වුණා. දීර්ඝ කාලයක් දේශපාලනයේ නිරත කෙනෙක් හැටියට අපි ඔබතුමාව දන්නවා. විපක්ෂයේ ඉන්නකොට රටේ පොදු ප්‍රශ්නවලදී අපි එකට කටයුතු කරලා තිබෙනවා. ඔබතුමා කවදාවත් මෙච්චර පටු විධියට කල්පනා කරන්නේ නැහැ. නමුත් එහෙම පටු විධියට කල්පනා කරන පිරිසක් ඔබතුමන්ලාගේ රජයේ ඉන්නවා.

සති දෙකක් වෙනවා, මේ ප්‍රශ්නය මතුවෙලා. මිනිස්සු ඉතා කම්පාවට පත් වුණා. රජය ගැන විවේචන ඇති වුණා. ඒ නිසා මෙවැනි කාරණා ගැන පැහැදිලි, නිශ්චිත ප්‍රතිපත්තියක් තිබීම වැදගත්. ඒ වාගේම විෂය භාර ඇමතිවරයාත්, රජයේ ප්‍රබල නියෝජ්‍ය ඇමතිවරුනුත් අතර, -තවත් මන්ත්‍රීවරු ගණනාවක් මේ ගැන වගකීමකින් තොරව කථා කළා- මේ හරහා මතු වන පරස්පරය තුළ මේ ආයතනය ගැන අවිශ්වාසයක් ඇති වෙන්න පුළුවන්. ඒ හරහා ඒ තිබෙන ක්‍රියාදාමවලට බාධා ඇති වෙන්න පුළුවන්; සේවාවන් සැපයීම සම්බන්ධයෙන් බාධාවක් ඇති වෙන්න පුළුවන්.

එදා මේ සුවසැරිය හඳුන්වා දෙන වෙලාවේදී මටත්, ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාටත් සිදුවුණා, රූපවාහිනී විවාදවලට ගිහිල්ලා මේ කරන්න යන්නේ යහපත් දෙයක් බවත්, මේක ඉන්දියානු RAW ඔත්තු සේවයේ කොටසක් නොවන බවත්, මේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අරගෙන එන වාහන සහ ඒවායේ තිබෙන උපකරණ ජාත්‍යන්තර ප්‍රමිතිය සතු බවත්, ඒවාට යොදන සේවකයින් සඳහා ජාත්‍යන්තර සහ දේශීය පුහුණුව නිසි අයුරින් ලැබෙන බවත් මහ ජනතාවට සනාථ කරන්න. ගරු ඇමතිතුමනි, එදා මට මතකයි, ඒ පළමුවැනි ambulance එක හොරණ රෝහලට ගියාම හොරණ රෝහලේ වෛද්‍යවරයා රෝගියා භාර ගන්න බැහැ කිව්වා. ඉන්පසුව තමයි සුවසැරිය ambulance එක පොලිසියේ නතර කරන්න සිදු වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකෙන් හොඳක් වුණා. ඒක වෙනම කථාවක්. සුවසැරිය ambulance එක රෝහලට භාර ගැනීම මුල් අවස්ථාවේ ප්‍රතික්ෂේප කළා. හැබැයි, ඒ හරහා තමයි සුවසැරිය ambulance එක ලංකාවේ හැම පොලිස් ස්ථානයකම නතර කර තැබීම සඳහා වන ක්‍රමවේදය ආරම්භ කළේ.

මම දන්නවා, රජය එම සේවාව සඳහා විශාල මුදලක් ආයෝජන කරන්න සූදානම් බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේම එහි තාක්ෂණය දියුණු කරන්න ඕනෑ; යාවත්කාලීන කරන්න ඕනෑ. ඒ වාගේම, අරමුණ වෙනස් කරනවා නම්, පනත සංශෝධනය කරන්න ඕනෑ. මොකද, 1990 සුවසැරිය පදනම පනතේ සඳහන් "සුවසැරිය" නම නීතියේ කොටසක් බවට පත් කරලායි තිබෙන්නේ. ඒ කියන්නේ, "සුවසැරිය" කියන නම "1990 සුවසැරිය" කියන brand එක මේ රටේ නීතියේ කොටසක් බවට පත් කරලායි තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, 1990 අංකය වෙනස් නොකරන බව ඔබතුමා කිව්වා. "සුවසැරිය" නම වෙනස් නොකරන බවත් කිව්වා. මොනවා හරි වෙනසක් කරන්න ඕනෑ නම් එය අනිවාර්යයෙන්ම නීතියේ කොටසක් බවට පත් වෙන්න ඕනෑ; මේ පාර්ලිමේන්තුවේ ඒ නීතිය සම්මත කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ඊට වඩා ගොඩක් වැඩ තිබෙනවා. පාර්ලිමේන්තුව මෙවැනි අවශ්‍ය නැති කාරණාවලට කාලය වැය කරයි කියලා මම හිතන්නේ නැහැ. නමුත් මේ ඇති වුණු අවුල් සහගත තත්ත්වය පිළිබඳව රජය වගකියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි ප්‍රශ්නයක් ඇති වුණු වහාම ඒ ප්‍රශ්නයට ප්‍රතිකර්මයක් යෙදුවා නම් කිසිදු ගැටලුවක් මතු වන්නේ නැහැ.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කයයි. මම දන්නවා, ඔබතුමා මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය කළුතරට ගෙන එන්න පුරෝගාමීව කටයුතු කළ බව. ඒක බොහොම වැදගත් පියවරක්. අපේ දිස්ත්‍රික්කයේ තිබෙන අඩු පාඩුවක් ඒ හරහා මහ හැරෙනවා වාගේම නාගොඩ මහ රෝහල සමඟ ඇති වන ඒ පද්ධතිය තුළ රෝගීන්ට වඩාත් හොඳ සේවයක් සැලසෙනවා; මහාචාර්ය ඒකකයන් ඇති වෙනවා.

2015ට කලින් නාගොඩ මහ රෝහල රෝගියෙකු නොයන තැනක් ලෙසයි කල්පනා කළේ. නාගොඩ රෝහලට යනවා කියන එක මරණය වැළඳ ගන්නවා වාගේ දෙයක් කියලායි ඒ කාලයේ කල්පනා කළේ. 2015 අපේ යහපාලන ආණ්ඩුව නාගොඩ මහ රෝහල, හොරණ මූලික රෝහල ඇතුළුව අපේ දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල් හැම එකකම වාගේ යටිතල පහසුකම් ඉතා විශාල විධියට දියුණු කළා. ඔබතුමා ඊයේ පෙරේරා බේරුවල ආසනයේ රෝහලක් විවෘත කළා. බොහොම හොඳයි. ඇත්ත වශයෙන්ම ලොකු පහසුකම් ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාගේ රජයත් විශාල සහායක් ලබා දීලා උපකරණ සැපයීම මඟින් ලොකු හයියක් ලබා දීලා තිබුණා. මේ ආකාරයට කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අතිවිශාල වෙනසක් ඇති කරන්න පුළුවන්කම ලැබුණා.

නමුත් මට ඔබතුමාට එක කරුණක් කියන්න අවශ්‍යයි, ගරු ඇමතිතුමනි. ඒ, පානදුර මූලික රෝහල ගැනයි. එම රෝහල වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍යයි. මක් නිසාද, අතිවිශාල ජනගහනයක් පානදුර කේන්ද්‍ර කරගෙන අද ජීවත් වෙනවා. ඒ වාගේම ජනගහනය දිනෙන් දින වැඩි වෙනවා. ඒ කියන්නේ, එක අතකින් කොළඹ ජනගහනය යම් ප්‍රමාණයකින් අඩු වෙනවා; කළුතර දිස්ත්‍රික්කයේ ජනගහනය වැඩි වෙනවා. අමතර මැතිවරණ ආසනයකුත් දැන් අපට එකතු වුණා. තවදුරටත් ජනගහනය වැඩි වෙමින් තිබෙනවා. පානදුර මූලික රෝහල දියුණු කිරීම සඳහා මීට වසර 10කට කලින් ජර්මන් රජයේ ආධාර අපට ලැබුණා. ජර්මන් රජයේ ආධාර ලැබිලා ඒ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා සැලසුම් සකස් කරන කොට ජර්මන් රජයෙන් අපට ලැබුණු මුදල් ප්‍රමාණය ඒ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව -ඒ ගොඩනැඟිලි සම්පූර්ණයෙන් ඉදි කරලා අවසන් කරන්න තරම් ප්‍රමාණවත් නොවන බව- තේරුම් ගිය නිසා ඒ ව්‍යාපෘතිය අත්හැරලා දැම්මා. රජයට මුදල් අමාරුකම් තිබෙන බව දන්නා නමුත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ජාත්‍යන්තර ආධාරයක් ලැබෙන විට පානදුර මූලික රෝහල සංවර්ධනය පිළිබඳව ප්‍රමුඛතාවකින් කටයුතු කරන්න කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පානදුර ගැන හොඳින්ම දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ වාගේම හොරණ මූලික රෝහලත් දියුණු කිරීමට ඔබතුමාගේ රජය කටයුතු කරන බව අපි දන්නවා. 2015-2020 කාලය තුළ අපි එය විශාල වශයෙන් දියුණු කළා. නමුත් තවදුරටත් හොරණ රෝහලේ සහ ඒ දිස්ත්‍රික්කයේ තිබෙන අනෙකුත් ආනුෂංගික රෝහල්වල තත්ත්වය වැඩි දියුණු කරන්න ඔබතුමාට ශක්තිය තිබෙනවා. අපට ලොකු ආඩම්බරයක්, සෞඛ්‍ය ඇමතිවරයා අපේ දිස්ත්‍රික්කයේ ඉන්න එක; රජයේ ප්‍රධාන, බලගතු ඇමතිවරයෙකු අපේ දිස්ත්‍රික්කයේ ඉන්න එක. ඔබතුමා මුළු රටටම සලකන ගමන් ඔබතුමාගේ දිස්ත්‍රික්කයට -අපේ දිස්ත්‍රික්කයට, කළුතර දිස්ත්‍රික්කයට- වඩාත් හොඳින්, වඩාත් සාධාරණව සලකයි කියලා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. (Dr.) Nalinda Jayatissa. You have 16 minutes.

[අ.භා. 1.14]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණු ගැනත් සැලකිලිමත් වෙමින් මම කථාව ආරම්භ කරන්නම්. විශේෂයෙන් අපේ කළුතර දිස්ත්‍රික්කයේ ශික්ෂණ රෝහලක් තිබෙනවා; ඒ වාගේම දිස්ත්‍රික් මහ රෝහලක් හොරණ තිබෙනවා; අපට මූලික රෝහල් තුනක් තිබෙනවා. ද්විතීයික හා තෘතීයික සත්කාර ඒකක හැටියට ඒ රෝහල් පද්ධතිය වැඩිදියුණු කළ යුතුයි. එය කිරීමට විශේෂයෙන් අපි කල්පනා කරනවා. දැන් බස්නාහිර පළාතත්, ගාල්ල දිස්ත්‍රික්කයත් එකතු වුණාම ලක්ෂ 75ක විතර ජනතාවක් ආවරණය වෙනවා.

රටේම සෞඛ්‍ය පද්ධතිය ගැන බලන අතරේ ජනතාව වැඩිපුර කේන්ද්‍රගත වන ස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහිත් අපි අවධානය යොමු කර තිබෙනවා. රජයක් හැටියට අපි අපේ රටේ ජනතාවට ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ, ආරක්ෂිත ඖෂධ අඛණ්ඩව සැපයීම සහ රජයේ පද්ධතියෙන් පිට සාධාරණ මිලකට ඖෂධ සැපයීම සම්බන්ධයෙන් වග කියනවා; ඒ වගවීමට බැඳෙනවා.

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත මඟින් ඒ ඖෂධවල ගුණාමත්මකභාවය, ආරක්ෂිතභාවය සහ මිල නියාමනය කිරීමට බලය පැවරුණා. ඒ අනුව එම පනතේ 3 (අ) වගන්තිය අනුව ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරැදි තත්වයෙන් යුතු ඖෂධ සහ වෛද්‍ය උපකරණ සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීමට නීතිමය ප්‍රතිපාදන අපට ලැබී තිබෙනවා. ඒ වාගේම ඒ පනතේ 118 (1) අනුව ඖෂධ ආදිය සඳහා මිල නියම කිරීමේ කමිටුවක් පත් කිරීමට ද බලයක් තිබෙනවා. ඒ පනතේ 118 (2) (අ) අනුව මිල නියම කරනු ලැබීමට අවස්ථාව තිබෙනවා. එම පනත ඉදිරිපත් කරලා වසර කීපයකට පසුව ඒ කරුණු සියල්ල සලකා බලා එවකට හිටපු ඇමතිවරයා විසින් මිල නියම කිරීමේ කමිටුවක් ප්‍රකාශයට පත් කළා. එම මිල නියම කිරීමේ කමිටුවේ වර්තමාන සභාපතිවරයා හැටියට Dr. Palitha Abeykoon කටයුතු කරනවා. ඔබතුමන්ලා දන්නවා, ඔහු අපේ ක්ෂේත්‍රයේ විශේෂඥයෙකු වන බව සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශකවරයෙකු හැටියට දශක ගණනාවක් තිස්සේ කටයුතු කරන කෙනෙකු වන බව.

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත සම්මත කළාට පසුව අවස්ථා කීපයකදී එවකට හිටපු සෞඛ්‍ය ඇමතිවරයා විසින් ඖෂධවල මිල පාලනය කිරීම සඳහා ගැසට් නිවේදන කීපයක් නිකුත් කරනු ලැබුවා. උදාහරණයක් ලෙස 2016 ඔක්තෝබර් 21වන දා ඖෂධ 48ක මිල නියම කරන්නත්, 2017 දෙසැම්බර් 14වන දා එම ඖෂධ 48හි මිල සියයට 5කින් වැඩි කරලා මිල නියම කරන්නත්, 2019 මැයි 15වන දා ඒ ඖෂධ 48ට තවත් ඖෂධ 12ක් එකතු කරලා ඖෂධ 60ක මිල නියම කරන්නත් -උපරිම සිල්ලර මිලක් නියම කරන්න- කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමාත් සඳහන් කළ ආකාරයට ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත අනුව බලය පැවරෙන මිල නියම කිරීමේ කමිටුව විසින් ඖෂධ සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමට එරෙහිව අපේ රටට ඖෂධ ආනයනය කරන අයගේ සංගමය - Sri Lanka Chamber of the Pharmaceutical Industry - අධිකරණ ක්‍රියා මාර්ගයක් ගත්තා. ඒ අධිකරණ ක්‍රියා මාර්ගය ගත්තේ 2019 වර්ෂයේදී. ඒ අනුව ඒ ගොල්ලෝ කියා සිටියේ ජාතික ඖෂධ නියාමන අධිකාරියට මිල නියම කිරීමේ බලයක් නැහැ කියලායි. ඒ අය අතුරු තහනම් නියෝගයක් ඉල්ලා සිටියා. නමුත්, අධිකරණය අතුරු තහනම් නියෝගයක් ලබා දුන්නේ නැහැ; නඩු අහන්න අවස්ථාව ලබා දුන්නා. අතුරු තහනම් නියෝගයක් ලබා නොදීම නිසා ජාතික ඖෂධ නියාමන අධිකාරිය මේ මිල නියම කිරීමේ කමිටුව හරහා යම් යම් ඖෂධවල මිල පාලනයක් කළා; උපරිම සිල්ලර මිලක් ගැසට් කළා.

ඒ අනුව අවස්ථා 4කදී මිල නියම කරමින් ගැසට් නිවේදන නිකුත් කළා. 2021 අගෝස්තු 19වැනි දා ඖෂධවල මිල සියයට 9කින් වැඩි කරලා උපරිම සිල්ලර මිලක් - MRP එකක් - ගැසට් කළා. 2022 මාර්තු 15වැනි දා ඖෂධවල මිල සියයට 29කින් වැඩි කරලා ගැසට් කළා. 2022 අප්‍රේල් 29වැනි දා ඖෂධවල මිල සියයට 40කින් වැඩි කරලා මිල නියම කිරීමක් කළා. යළිත් වතාවක් 2023 ජුනි මස 15වැනි දා ඖෂධවල මිල සියයට 16කින් අඩු කරලා MRP එක ගැසට් කළා. මේ ගැසට් නිවේදන කීපය නිකුත් කළාට පසුව මම ඉහත කියපු Chamber එක යළිත් වතාවක් අභියාචනාධිකරණයට ගියා. ඒ ගොල්ලෝ කලින් කිව්වේ NMRA එකට මිල නියම කිරීමේ බලයක් නැහැ කියලායි. මේ වෙලාවේ අධිකරණයට කිව්වේ මිල සූත්‍රයක් නැතිව එහෙම මිල පාලනය කරන්න බලයක් නැහැ කියලායි. අන්න ඒ අවස්ථාවේදී අධිකරණය පාලන මිලක් නිකුත් කිරීම වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් ලබා දුන්නා. ඊට පසුව NMRA එක පැත්තෙන් මිල සූත්‍රයක් ප්‍රකාශයට පත් කළා. මිල සූත්‍රයක් ප්‍රකාශයට පත් කළාට පස්සේ ඖෂධ ආනයනකරුවන් යළිත් අධිකරණයට ගිහිල්ලා කිව්වා, මේ පනතේ හැටියට අදාළ පාර්ශ්වකරුවන්, එහෙම නැත්නම් ඒ සමාගම් විමසා නොවෙයි එම මිල සූත්‍රය හැදුවේ කියලා. ඒ කටයුතු ඉස්සරහට යනවිට එවැනි දෙයක් වුණා. මොකද, මේ පනතේ 118 (4) වගන්තියේ සඳහන්ව තිබෙනවා, "අනෙකුත් සියලු තැනැත්තන්ගෙන් විමසා..." කියලා. ඔන්න ඔය "විමසා" කියන වචනය තමයි මේකට ගත්තේ. එතකොට ඇත්තටම එවකට හිටපු සෞඛ්‍ය ඇමතිවරයා එක්ක සාකච්ඡා නොකළාට මේ මිල නියම කිරීමේ කමිටුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය එක්ක ඇති තරම් සාකච්ඡා කරලා තිබුණා. කෙසේ නමුත්, නීතිපතිවරයාගේ උපදෙස් මත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් මේ ගැසට් නිවේදනය ඉවත් කර ගත්තා. යළිත් වතාවක් 2025 ජූලි මාසයේ 21 වෙනිදා -මේ අවුරුද්දේ ජූලි 21 වෙනිදා- අපි 2446/34 දරන ගැසට් නිවේදනය නිකුත් කළා. එතකොට ඒ අදාළ පාර්ශ්වයන්ගෙන් විමසා මිල සූත්‍රයක් ඉදිරිපත් කරපු නිසා අධිකරණය විසින් ඒ අතුරු තහනම් නියෝගය ඉවත් කිරීමට කටයුතු කරලා දුන්නා.

යළිත් වතාවක් ඖෂධ ආනයනකරුවන්ගේ සංගමයත්, ඊට අමතරව මේ වන විට අපේ රටේ ඖෂධශාලා හිමියන්ගේ සංගමයත් කියන ආයතන දෙකම අධිකරණයට ගිහිල්ලා අතුරු තහනම් නියෝගයක් ඉල්ලුවා, මේ මිල පාලනය කිරීමට එරෙහිව. නමුත් අධිකරණය ඒ නියෝගය ලබා දුන්නේ නැහැ. ඒ අනුව අපි 2025.10.07 වෙනිදා මේ පාර්ලිමේන්තුවේ අනුමැතියට මේ ගැසට් නිවේදනයේ පළ කරනු ලැබූ නියෝග ඉදිරිපත් කළා. අද මේ නියෝග සම්මත කර ගන්න තමයි අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ. මම හිතනවා, අපේ රටේ ජනතාවට සාධාරණ මිලකට ඖෂධ ලබාදීම සඳහා වැදගත් වන මේ පියවර; ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2015 හදලා ඒ පනතින් බලය පැවරුණු ආකාරයට, අපට ලැබුණු බලය මේ පාර්ලිමේන්තුව විසින් උපයෝගී කරගෙන මේ රටේ ජනතාවට ඉහළම සාධාරණයක් කරයි කියලා. නමුත් ඇත්තටම මම කනගාටු වෙනවා, අද මේ නියෝග පාර්ලිමේන්තුවේ සම්මත නොවීමට අචේතනික හෝ සචේතනිකව හෝ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අදහස් දැක්වීම පිළිබඳව. නමුත් මම හිතනවා, මුළු පාර්ලිමේන්තුව මේ ගැසට් නිවේදනයේ පළ කරනු ලැබ, ඉදිරිපත් කරන ලද නියෝග සම්මත කර ගන්නට සහයෝගය ලබා දෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී අපි මේ ඖෂධ සම්බන්ධයෙන් මිල දෙකක් නියම කරනවා. එකක් Maximum Retail Price එක. ඒ කියන්නේ එක් එක් ඖෂධයට උපරිම සිල්ලර මිලක්. ඒක තනි තනි ඖෂධයට ලබා දෙන එකක්. ඒ සඳහා මිල සූත්‍රයක් තිබෙනවා. ඒ සූත්‍රය සකස් කිරීමේදී CIF අගය, තීරුබදු, බදු ඇතුළු ඒ නිෂ්පාදනයට යොදන බදු සහ අනික් පැත්තෙන් සැපයුම්දාමයට අදාළව එකතු කළ අගය මත ලාභය කියන මෙන්න මේ කරුණු සලකා බලා තිබෙනවා. ඒ ආශ්‍රයෙන් තමයි මේ සූත්‍රය සකස් කරලා තිබෙන්නේ. ඒක හදන්නේ තනි තනි නිෂ්පාදනයට. ඒ වාගේම තව එකක් තිබෙනවා, Maximum Ceiling Price කියලා. ඒ කියන්නේ ඖෂධ කාණ්ඩයක උපරිම ඉහළම සීමා මිල. තනි තනි නිෂ්පාදන තිබුණාට, ඒවා අයිති වන එක ඖෂධ කාණ්ඩයක් තිබෙනවා. ඒ කාණ්ඩයට උපරිම සීමා මිලක් නියම කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

උපරිම ඉහළම සීමා මිල නියම කිරීමේදී ඒ ඖෂධ කාණ්ඩයට අයත් ඖෂධ වර්ගවල වෙළඳපොළේ සියයට 85ක් පමණ ආවරණය වන තත්ත්වය සලකා ඒවායේ ඒ මිලේ මධ්‍යයනය තමයි ගන්නේ.

එතකොට අපි නිකම් හිතුවොත්, කුඩයක් වාගේ MCP - Maximum Ceiling Price - එක තිබෙනවා නම්, ඒකට යටින් තමයි මේ MRP - Maximum Retail Price - එක තිබෙන්නේ. තනි තනි නිෂ්පාදනවල මිල යටින් තිබෙනවා. ඒ සියල්ලට ඉහළින් ඒ කාණ්ඩයේ සීමාවක් උඩින් දානවා. අපි හිතමු, මේක ඇත්තටම සිද්ධ වෙන්නේ ඖෂධයක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අලුතෙන් ලියාපදිංචි වීමේදී, එහෙම නැත්නම් ලියාපදිංචිය අලුත් කර ගැනීමේදී මෙන්න මේ උපරිම සිල්ලර මිලට සහ උපරිම ඉහළම සීමා මිලට යටත්ව තමයි ඒ නිෂ්පාදනය ලියාපදිංචි කරන්නේ. එතකොට මේ MCP එක සහ විශේෂයෙන් MRP එක සකස් කිරීමේදී මේ මොහොතේදී ඒ ඖෂධයට රටේ පවතින මිලත්, ඒ ඖෂධය නිෂ්පාදනය කරන රටේ ඒ ඖෂධයේ මිලත් පිළිබඳව සලකා බලනවා. අපි හිතමු ඉන්දියාවේ නිෂ්පාදනය කරපු ඖෂධයක් ලංකාවට එනකොට ඉතා විශාල අගයකින් මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නට පුළුවන්. මේ සියලු තත්ත්ව සලකා තමයි MRP එකත්, MCP එකත් අපි යොදන්නේ. එතකොට යම් සමාගමක් මේ ඉදිරිපත් කරන උපරිම මිල සීමාවට එකඟ නැත්නම්, ඔවුන්ට ඒක සාකච්ඡා කරන්න මාස තුනක් ලබා දෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, මේ appeal එකට මාස හතරක් විතර ලබා දෙනවා. අන්න ඒ තත්ත්වයන් සම්පූර්ණ කළොත් තමයි අර ගුණාත්මක තත්ත්වය වාගේම, ඒ මිල සීමාවට එකඟ වුණොත් තමයි මේ registration එක ලබා දෙන්නේ. ඒ අනුව ඉදිරියේදී අර ඖෂධ 48කට, 60කට, 75කට කියන කාරණය නොවෙයි, අපේ රටට එන්න පුළුවන් ඖෂධ මේ සියල්ල ලියාපදිංචි කරන්න ඕනෑ, NMRA එකේ. NMRA එකේ ලියාපදිංචි කිරීමේදී ප්‍රධාන සාධකයක් බවට පත් වෙනවා, මේ උපරිම සිල්ලර මිලටත්, උපරිම ඉහළම සීමා මිලටත් අනුගත වීම.

ඒ වාගේම දැන් මේ සමාගම් පැත්තෙන්, නිෂ්පාදකයන්ගේ පැත්තෙන් සහ ආනයනකරුවන්ගේ පැත්තෙන් ආපු එක ඉල්ලීමක් තමයි රටේ ආර්ථිකයේ බරපතළ විචලනයක් සිදු වුණොත් හෝ විනිමය අනුපාතිකය විශාල ඉහළ යෑමක් සිදු වුණොත් මොකද වෙන්නේ කියන එක. ඒ අනුව, අපි වසරකට දෙවතාවක් මේ MRP - Maximum Retail Price - එක සමාලෝචනය කරනවා. එහෙම සමාලෝචනය කරන අතරේදීත් -අපි තාවකාලිකව උපකල්පනය කරමු ආර්ථිකයේ දැවැන්ත කඩාවැටීමක් හෝ මොකක් හෝ දෙයක් සිද්ධ වුණා කියලා, එහෙම නැත්නම් විනිමය අනුපාතිකයේ බරපතළ ප්‍රශ්නයක් ආවා කියලා- යළිත් මේ අගයන් ප්‍රතිශෝධනය කරන්නට සාකච්ඡා කරන්න අපි සූදානම්. හැබැයි, මෙතැනදී මේ වනකොට මෙතෙක් වෙළෙඳ පොළේ තිබෙන ඖෂධයක උපරිම සිල්ලර මිල මේ MCP එකට වඩා ඉහළින් තිබෙනවා නම්, MRP එක ඉහළ නම් MCP එකට වඩා, අර යටින් තිබෙන MCP එකට තමයි ඒගොල්ලන් ඒ ඖෂධය විකිණිය යුත්තේ. ඒ වාගේම, MCP එකට වඩා MRP එක ගොඩක් යටින් තිබෙනවා නම්, එහෙමයි කියලා MCP එක දක්වා උස්සන්න බැහැ. අර පවතින උපරිම සිල්ලර මිල අනුව ඒගොල්ලන් කටයුතු කළ යුතුයි. ඉහළ සීමාව තිබෙනවා. ඒ ඉහළ සීමාවට වඩා තනි ඖෂධයක් උඩින් තිබෙනවා නම් ඊට වඩා පහළට ගෙන්වන්න ඕනෑ. මෙහි සමස්ත වාසිය අදට හෙටට පමණක් නොවෙයි, වසර ගණනාවක් යනකල් මේ රටේ ජනතාවට ලබා දිය හැකි ඉතාම හොඳ සූත්‍රයක් සහ නියෝගයක් තමයි අද පාර්ලිමේන්තුවේ සම්මත කරන්නට යන්නේ.

ඇත්තටම මේ පනත උල්ලංඝනය කරනවා නම් පනතේ 131වන වගන්තිය අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් වෙනකොට ජාතික ඖෂධ නියාමන අධිකාරිය - ඇත්තටම අපේ රටේ ජනතාවට ලබාදෙන ඖෂධවල ගුණාත්මක තත්ත්වය, සාධාරණ මිල, සුරක්ෂිතභාවය සියල්ල වෙනුවෙන් වගකීමට බැඳී සිටින ආයතනය - අපි සැලකිය යුතු මට්ටමකට ගුණාත්මකව සංවර්ධනය කර තිබෙනවා කියා කියන්නට පුළුවන්. විශේෂයෙන්ම ගත්තොත්, අපේ ආණ්ඩුව බලයට පත් වෙනකොට මෙහි ලියාපදිංචිය සඳහා files 2,100ක් තිබුණා. ජනවාරි 01වැනි දා වෙනකොට files 1,589ක් ගොඩ ගැහිලා තිබුණා. අද වෙනකොට ඖෂධ සම්බන්ධයෙන් වන files 24 දක්වා අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම, ජනවාරි 01වැනි දා වෙනකොට ශල්‍ය උපකරණවල ෆයිල් 2,019ක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණා. මේ වෙනකොට ඒක 417 දක්වා clear කරගෙන තිබෙනවා. මේ NMRA එකේ ක්‍රියාකාරිත්වය ඇතුළේ අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා විශාල තදබදයක්, ප්‍රමාදයක් - backlog ඒකක් - නැතිව මේ ටික අවසන් කරගෙන යන්න.

පසුගිය කාලයේදී අපි මේ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වැඩි කළා. ඒ අනුව 119ක්ව සිටි අපේ staff එක 216 දක්වා වැඩි කරගන්න පුළුවන්කම ලැබුණා. දැන් අපි NMRA එකේ දවසකට කරන tests ප්‍රමාණය වැඩි කර තිබෙනවා. සාමාන්‍යයෙන් කරමින් සිටියේ මාසයකට tests 60ක් විතර. දැන් සාමාන්‍යයෙන් මාසයකට tests 280ක්, 300ක් දක්වා වැඩි කරගෙන තිබෙනවා. NMRA එකේ අලුත්වැඩියා කටයුතුවලට පසුගිය අය වැයෙන් මුදල් වෙන් වුණා. ඒ කටයුතු කරමින් පවතිනවා. ඒ වාගේම, අපට ආසියානු සංවර්ධන බැංකුව හරහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ WHO certification එකටත්, ISO certification එකටත් අවශ්‍ය කරන කටයුතු මේ වනකොට කරමින් ඉන්නවා. මේ සමස්ත ක්‍රියාවලිය ඇතුළේ තමයි අපට මේ ඖෂධ සම්බන්ධයෙන් මැදිහත් වීම කරන්න පුළුවන්කම ලැබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ මේ NMRA එක සහ ඒකට අදාළ පරීක්ෂණාගාරය ශක්තිමත් කිරීම තුළ, ඒ පරීක්ෂණ ක්‍රියාවලිය වේගවත් කිරීම තුළ එක් පැත්තකින් අපට ඖෂධවල ගුණාත්මක තත්ත්වය සහතික කරන්න පුළුවන්.

මේ වෙලාවේ මම තව ප්‍රශ්නයකට උත්තර දෙන්න කැමැතියි. ඒ, විපක්ෂ නායකතුමා අද මතු කර ගිය කරුණ, ඖෂධ 100ක් කළුතර රෝහලේ හිඟයි කියන එක සම්බන්ධවයි. දැන් මන්ත්‍රීවරු ඒක පුනරුච්චාරණය කරන්න පටන්ගෙන තිබෙනවා. මේක එතුමා සොයාගෙන අමුතුවෙන් කරන එකක් නොවෙයි බව මම කියන්නත් ඕනෑ. හැම රෝහලකම එක්කෝ සතියකට එක් වතාවක්, නැත්නම් සතියකට දෙවතාවක්, උපරිම සතියකට තුන් වතාවක් ඒ අය තමන්ගේ ප්‍රධාන ඖෂධවේදියා - chief pharmacist - විසින් ඒ රෝහලේ හිඟ වේ යැයි හිතන ඖෂධවල ලැයිස්තුවක් හදලා අපේ වෛද්‍ය සැපයුම් ඒකකයට එවනවා. ඒ අනුව, සතියේ මුල වෙච්ච අද දවසේ -ඊයේ නිවාඩු නිසා- නාගොඩ ශික්ෂණ රෝහල විසින් එක්කෝ ඒ අයට මේ මොහොතේ සමහර අඩුවක් තිබෙන, නැත්නම් තව සතියකින් දෙකකින් හිඟ වෙයි කියලා හිතෙන ඖෂධ ලැයිස්තුවක් හදලා වෛද්‍ය සැපයුම් ඒකකයට ඉදිරිපත් කරනවා. එතකොට වෛද්‍ය සැපයුම් ඒකකය කරන්නේ මොකක්ද දන්නවාද? මෙතැන ඇත්තටම ඖෂධ 100ක් නැහැ, මෙතැන තිබෙන්නේ 42යි. මම දන්නේ නැහැ, එතුමාට අර වෘත්තීය ප්‍රශ්නය වාගේ මේකත් පැටලුණාද කියලා. ගණන් කළා නම් හරි. ඊළඟට, surgical items කිහිපයක් තිබෙනවා. ඒවා මේ විවෘත දේවල්. ඒවා වෛද්‍ය සැපයුම් ඒකකයට එව්වාම වෛද්‍ය සැපයුම් ඒකකය බලනවා අපේ ගබඩා තුළ යම් ප්‍රමාණයක් තිබෙනවාද කියලා. ඊට පස්සේ මේවා ප්‍රාදේශීය මිලදී ගැනීම් සඳහා යොමු කරනවා. Local purchasesවලට අපි මුදල් දීලා තිබෙනවා. ඒ දේවල් එළියෙන් මිලදී ගැනීම සඳහා රජය මුදල් ලබා දීලා, ප්‍රාදේශීය මිලදී ගැනීම් කරලා නොමිලේ ජනතාවට ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙනවා.

ඒක තමයි ක්‍රියාවලිය. මේ ක්‍රියාවලිය ගැන එතුමාට අවබෝධයක් නැති එක ගැන මම ඇත්තටම කනගාටු වෙනවා. දෙදහස් ගණන්වල එතුමා පොඩි කාලයක් සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා හැටියටත් හිටියා ද කොහේද. මේක තමයි වෙන වැඩේ. මම උදේත් මේක ගැන කිව්වා. අපි රුපියල් බිලියන 60ක් SPC එකට දෙනකොට තව රුපියල් බිලියන 35ක් ප්‍රාදේශීය මිලදී ගැනීම් සඳහා දෙන්න සිද්ධ වුණේ වෙන මොකුත් නිසා නොවෙයි, ගිය අවුරුද්දේ සහ ඊට කලින් අවුරුදුවල මේ ක්‍රියාවලිය හරියට සිද්ධ නොකරපු නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න. උදාහරණයක් හැටියට මේ කාරණය ගැන මම කියන්නම්. Heparin කියන ඖෂධය දැන් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. තව ඖෂධයක් ගැන මම කියන්නම්. ජනවාරි 21වැනි දා තමයි Ipratropium ඖෂධය සඳහා අපිට - MSD එකට - order එක ලැබුණේ. පසුගිය මාර්තු 21 මේකේ ටෙන්ඩරය close කළා. පසුගිය ජූනි 06වැනි දා ටෙන්ඩරය award කළා. පසුගිය ඔක්තෝබර් 16 වෙනකොට මේකේ 160,000ක එක stock එකක් ලැබිලා තිබෙනවා. ඊළඟ එක තව මාස කිහිපයකින් හම්බ වෙනවා. එතකොට පසුගිය ජනවාරි 21වැනි දා order එක place කරපු එක අපිට ලංකාවට එන්නේ පසුගිය ඔක්තෝබර් 16. ඒක තමයි මේ ඖෂධ ක්‍රියාවලියේ හැටි. Heparin ඖෂධය ගත්තොත්, 2024 අප්‍රේල් මාසයේ 26වැනි දා එහි order එක place කළාම ඒක එන්නේ මේ අවුරුද්දේ ඔක්තෝබර් 27වැනි දා.

මේ ආදී වශයෙන් ගත්තාම, නියමිත කාලයේ අපේ රෝහල් පද්ධතියෙන් දත්ත සහ තොරතුරු එකතු කරගෙන වෛද්‍ය සැපයුම් ඒකකය ඒ ඇණවුම - තමන්ට අවශ්‍ය කරන ශල්‍ය උපකරණ, ඖෂධ - ගැන SPC එකට දැනුම් දුන්නාට පස්සේ ඒ අය ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරලා සාමාන්‍යයෙන් මාස 9ක් විතර ගත වෙනකොට ඖෂධ ප්‍රමාණය ලැබෙනවා. අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අපි ජනවාරි 31වැනි දා වෙනකොට MSD එක හරහා අපේ මේ සියලු අවශ්‍යතාවන් SPC එකට කියලා තිබෙනවා. ඒ අනුව ඒ ගොල්ලන් ටෙන්ඩර් කරන්න පටන් ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය වේගයෙන් සිදු වුණු නිසා ගිය අවුරුද්දේ සමස්ත අවුරුද්ද තුළම SPC එක වියදම් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 48යි. තවම මේ ඔක්තෝබර් මැද. මේ වෙනකෙට රුපියල් බිලියන 80ක් SPC එක වියදම් කරලා තිබෙනවා. ඒ ගොල්ලන්ට අපි මුදල් දීලා තිබෙනවා. තවත් රුපියල් බිලියන 30ක් විතර දෙන්න නියමිතයි. රුපියල් බිලියන 48යි ගිය අවුරුද්දේ SPC එක වියදම් කරලා තිබෙන්නේ. අපි රුපියල් බිලියන 110ක් SPC එක හරහා වියදම් කරනවා. අපි SPC එකට මුදල් ලබා දීලා ඒ ගොල්ලෝ ඖෂධ අරගෙන MSD එක හරහා ලබා දෙනකොට අපිට ප්‍රාදේශීය මිලදී ගැනීම් අඩු කරන්න පුළුවන්.

ඇත්තටම මේ ඖෂධ හිඟය අපි ක්‍රමානුකූලව නිවැරදි කරගෙන යනවා. ඒ වාගේ වෙලාවක මේ ක්‍රියාවලිය පහසු කරගන්න අපේම pharmacistsලා, අපේම directorsලා හරහා MSD එකට එවන document එකක් අරගෙන ඇවිල්ලා අරහේ ඖෂධ 100ක් හිඟයි, මෙහේ ඖෂධ 100ක් හිඟයි කියලා කිව්වාට තේරුමක් නැහැ. ඔබතුමන්ලා මේකෙදි සහාය දෙන්න ඕනෑ, මේ අධික මිලක් අය කරන සමාගම් පැත්තට නොවෙයි. ඖෂධ පිළිබඳව හීතිකාවක් හදලා ජනතාව බියට පත් කරන එක නොවෙයි කරන්න ඕනෑ. නැත්නම් මේකේ තිබෙන අනතුර මම කියන්නම්. යළිත් වතාවක් ඖෂධ සැපයුම සම්බන්ධයෙන් හදන්න හදන අවිශ්වාසය නිසා මේ ගැටලු ඇති වෙන්න පුළුවන්. පළමුවැනි එක, රෝහල්වල තිබෙන ඖෂධ නිකුත් කිරීමේදී - මේ පෘථග්ජන මිනිස්සු. ඉන්සියුලින් මාස දෙකකට නිකුත් කරන්න පුළුවන්කම තිබෙද්දි සමහර විට ඉන්සියුලින් මාසයකට නිකුත් කරලා රෝගීන් වැඩි ප්‍රමාණයකට මෙය ලබා දෙන්න පුළුවන් කියලා ඒ ගොල්ලෝ හිතන්න පුළුවන්. හැබැයි ඉන්සියුලින් තොග එනවා කියලා කියන්නේ, අපි ඒවා නියමිත වෙලාවට රෝහල්වලට ලබා දෙනවා.

දෙවැනි එක තමයි, අපිට ප්‍රාදේශීය මිලදී ගැනීම් හරහා යන්න සිද්ධ වෙනකොට - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා මේවා අල්ලන්න පුළුවන් කියලා එතුමා කිව්වාට ඒ ඖෂධය එළියේ හරි තිබෙනවා නම් රජයේ මුදල් වියදම් කරලා ඒක රෝහලට අරගෙන ජනතාවට නොමිලේ ලබා දෙන්නයි අපි කොහොම හරි බලන්නේ. එහෙම කරන්න යන ක්‍රියාවලියේදී මේ ගොල්ලෝ එළියේ තිබෙන ඖෂධ මිල වැඩි කරන්න කටයුතු කරන්න ඉඩකඩ තිබෙනවා.

ඒ නිසා මේක බොහොම සංවේදීව කළමනාකරණය කරගත යුතුයි. අපි ඒක කරනවා. අපි ඒකට මැදිහත් වෙලා ඉන්නවා. විශේෂයෙන් මේකට සම්බන්ධ ආයතන කිහිපයක් තිබෙනවා. ඒවා තමයි NMRA එක, SPC එක, SPMC එක සහ MSD එක. මේ ආයතනවල නිලධාරින් මේ සම්බන්ධයෙන් වගකීමක් සහිතව කටයුතු කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්. මේ නිලධාරින්ට - සභාපතිවරුන්ට, CEOsලාට, අධ්‍යක්ෂ මණ්ඩලවලට; directorsලාට - භාරගන්න සිද්ධ වුණේ හොඳට සුවපහසුව ක්‍රියාත්මක වුණු සෞඛ්‍ය අමාත්‍යාංශයක් නොවෙයි, බරපතළ ප්‍රශ්න තිබුණු තැනක්. දූෂණය ඉහවහා ගිය තැනක්. පසුගිය කාලයේ කරපු හැම වැඩක් ඇතුළේම හිත හොඳින් දමපු නිවේදන, චක්‍රලේඛ, පනත්, ගැසට් හරහා රිංගලා ගිහිල්ලා ගසා කාපු තැනක්; ජාවාරම් කරපු තැනක්. එහෙම තැනක අපි හරි ප්‍රවේශමෙන් තමයි වැඩ කටයුතු ආරම්භ කළේ. නමුත් මේ කටයුතු අපි සාර්ථකව කරගෙන යනවා කියලා දැන් ඒ අයට විශ්වාසයක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවට අවශ්‍ය ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ඖෂධ අඛණ්ඩව රෝහල් පද්ධතියට සපයන එකටත්, සාධාරණ මිලකට ඒවා ලබා දෙන එකටත් අපි වගවෙනවා කියන එක කියමින්, මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have nine minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 1.35]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග අනුමත කිරීම සම්බන්ධයෙන් කථා කළා. එතුමාගේ කථාවට අපි හොඳින් ඇහුම්කන් දුන්නා. අද මේ විවාදය ආරම්භයේම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා තමයි කථා කළේ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන විෂයභාර ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළා.

මෙම රෙගුලාසි පැනවීම සම්බන්ධයෙන් අපි නිර්ලෝභීව ස්තුතිවන්ත වෙනවා. මොකද, ඖෂධ කියන්නේ, මේ රටේ මනුස්සයින් ජීවත් කරවන දෙයක්. මනුස්සයෙක් බෙහෙත් ටිකක් ගන්නේ ජීවත් වෙන්න. ඖෂධ නොගෙන මැරිච්ච මිනිස්සු අනන්ත අප්‍රමාණව මේ රටේ ඉන්නවා. මම මේ ආණ්ඩුවට වැරදි කියනවා නොවෙයි. හුඟක් වෙලාවට පැනඩෝල් පෙත්ත ගන්න බැරිව, දියවැඩියාවට බෙහෙත් පෙත්ත ගන්න බැරිව මැරිච්ච මිනිස්සු ගැන ඉතිහාසයේත් අපි අහලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා පැහැදිලි කරපු විධියට මේ රෙගුලාසි තුළින් අපි බලාපොරොත්තු වෙනවා, එක පැත්තකින් ඖෂධ හිඟය නැති කරගන්න. අනෙක් පැත්තෙන් ගුණාත්මක ඖෂධ සාධාරණ මිලකට ලබා දෙන්න. ඒක තමයි අපේ බලාපොරොත්තුව.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දැන් කිව්වා මේ අමාත්‍යාංශවල තත්ත්වය ගැන. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ගත්තොත්, මෙය ලෝකයේ වැඩියෙන්ම ආදායම් ලබන ව්‍යාපාරයක්. ඒ නිසා තමයි මේකේ මාෆියාවක් බිහි වෙලා තිබෙන්නේ. මුළු ලෝකයේම ඖෂධ සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්න මතු වෙනවා. ලංකාවේ වුණත් ඒ ප්‍රශ්න මතු වෙනවා. ඒක නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමෙකුට සහ හිටපු ඇමතිවරයෙකුට සිරගත වෙන්න පවා සිද්ධ වුණේ, මේ ඉතිහාසයේ සිදුවීම් එක්ක. ඒ නිසා හරි පරිස්සමෙන් මේ වැඩ කරන්න ඕනෑ. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් හැටියට මම ඔබතුමාටත් මේ ගැන කියන්න කැමැතියි. ඔබතුමා කොච්චර සද්භාවයෙන් කටයුතු කළත්, කොච්චර විනිවිදභාවයෙන් කටයුතු කළත්, යම් යම් අවස්ථාවලදී මොන මොන දේවල් සිද්ධ වෙයිද කියලා අපි දන්නේ නැහැ. මොකද, ඔබතුමා වගේ නොවෙයි නේ අනෙක් අය. නලින්ද ජයතිස්ස ඇමතිවරයා වගේ අය නොවෙයි සමහර වෙලාවට ඉන්නේ. ඒ නිසා පරිස්සමෙන් කටයුතු කරන්න ඕනෑ. හැබැයි, මේක කළ යුතු දෙයක්.

අද උදේ විපක්ෂ නායකතුමා කථා කළා, කළුතර නාගොඩ රෝහල ගැන. නාගොඩ රෝහල දැන් හොඳ තත්ත්වයෙන් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි, යම් යම් තැන්වල අඩුපාඩුකම් තිබෙනවා. ඖෂධ සම්බන්ධයෙනුත් එහෙමයි. අපි ගම්වලට ගියාම මිනිස්සු කියනවා, "අනේ මම ඉස්පිරිතාලයට ගියා, මට බෙහෙත් ටික දුන්නේ නැහැ. මම පෝලිමේ හිටියා. ඊට පස්සේ අද නැහැ, ඊළඟ දවසේ එන්න කිව්වා" කියලා. මේ වගේ අඩුපාඩුකම් තිබෙනවා. සියයට සියයක්ම කරන්න බැහැ. හැබැයි, අඩුපාඩුකම් මඟ හරවා ගැනීම අපේ වගකීමක්.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට 371,640ක් මනාප දුන්නා. ඒ, ඓතිහාසික මනාප ප්‍රමාණයක්. ඒ නිසා ලේසියෙන් බේරෙන්නත් හම්බ වෙන්නේ නැහැ. මම මේ දෙන්නේ, බොහොම හොඳ අවවාදයක්. නලින්ද ජයතිස්ස ඇමතිවරයා කියන්නේ, සෞඛ්‍ය ඇමතිවරයා. මම මේ කළුතර දිස්ත්‍රික්කය ගැන කථා කරන්නේ. ඒ, අපි ඉපදිච්ච තැන, ඡන්දය ඉල්ලන තැන, අපි ඉන්න තැන. ඒ නිසා, කළුතර නාගොඩ රෝහලේ විතරක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයේ සමස්ත රෝහල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න කියලායි මම කියන්නේ. එහෙම නොවුණොත් මොකද වෙන්නේ? විපක්ෂ නායකතුමා කිව්වා නේ බෙහෙත් වර්ග 100ක් අඩුයි, මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මම කියන්නේ නැහැ, ඒක 100ක්ම කියලා. ඒ ගැන ඔබතුමා පැහැදිලි කළා නේ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ, විෂයභාර ඇමතිවරයා කළුතර දිස්ත්‍රික්කයේ වෙලා එතැන අඩුපාඩුකම් තිබෙනවා නම් අනෙක් තැන්වල කොහොමද කියන එක. එහෙම නේ අහන්නේ. අනෙක් තැන්වල කෙසේද? කථාවක් තිබෙනවානේ, "නියර මෙහෙම නම් කුඹුර කොහොමට ඇද්ද" කියලා. සමහර වෙලාවට ඒ වගේ චෝදනා එන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාට කියනවා, මේ රෝහල් පද්ධතිය ගැන විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කියලා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම ළඟදී ගියා පස්සර හොප්ටන් කියන වතු ඉස්පිරිතාලයට. ඒක පොඩි ඉස්පිරිතාලයක්. ඒ, ද්‍රවිඩ ජනතාව ජීවත් වන ප්‍රදේශයක තිබෙන පොඩි රෝහලක්. එතැනට ගියාම මම දැක්කා, ඒ රෝහලේ තිබෙන අඩුපාඩු. එහි අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ රෝහලේ වැසිකිළියක්වත් නැහැ. වෛද්‍යවරු දෙන්නෙක් ඉන්නවා. ඒ වෛද්‍යවරුන්ට යන්නවත් වැසිකිළියක් නැහැ. මම මේ ගැන හරියටම දන්නේ නැහැ. හැබැයි, මම මේ ගැන හොයලා බැලුවා. මේ රෝහල තවම තිබෙන්නේ වතුයටිතල පහසුකම් විෂයය යටතේ. නමුත්, මේකත් රෝහලක් නේ? දුප්පත් මිනිස්සු ජීවත් වන ප්‍රදේශයක තිබෙන පොඩි රෝහලක්. ඒ රෝහලට අවශ්‍ය ඖෂධවලත් යම් යම් අඩුපාඩු තිබුණා. මම එතැනට ගිහිල්ලා පැය තුන හතරක් හිටියා. මට එතැනට යන්න සිද්ධ වුණේ මගේ දියණිය ඒ රෝහලේ දැනට සේවය කරන නිසායි. මම එතැනට ගියාම ඒ අඩුපාඩු ටික දැක්කා. එතැනට එන්නේ දුප්පත් මිනිස්සු. මම මේ එක් ස්ථානයක් ගැන විතරයි කියන්නේ. විශේෂයෙන්ම අපි දැන් කථා කරන ප්‍රධාන රෝහල්වලට වැඩිය ගම්බදව තිබෙන රෝහල්වලට බෙහෙත් ගන්න එන මිනිස්සු ගැන අපි හිතන්න ඕනෑ. මොකද, පෞද්ගලික වෛද්‍යවරයෙක් ළඟට ගිහිල්ලා සල්ලිවලට බෙහෙත් ටික ගන්න පුළුවන් මිනිස්සු නොවෙයි ඒ ප්‍රදේශවල ඉන්නේ. වත්තේ මිනිස්සුන්ට යන්න තිබෙන එකම රෝහල මෙය නිසා මෙතැනින් තමයි ඒ අය තමන්ගේ බෙහෙත් ටික ගන්නේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඖෂධ මිල සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොකද, සමහර තැන්වල ක්‍රියාත්මක වන්නේ තනිකරම මාෆියාවක්. අද මිලදී ගත් ඖෂධය හෙට මිලදී ගන්නකොට කියනවා, මිල වැඩිවෙලා කියලා, ගරු ලාල් කාන්ත ඇමතිතුමනි. ඒකට ඒගොල්ලන් කියනවා, මේ අලුතෙන් ආපු එක කියලා. ඒ කියන්නේ, මේක අලුත් shipment එකක් කියනවා. ඒ කියන්නේ, අලුතෙන් නැවක් ඇවිල්ලා. ඖෂධයේ ගණන වැඩි වෙනකොට කියන්නේ අලුතෙන් නැවක් ආවා, ඒකෙන් තමයි එම ඖෂධ ආවේ කියලා. ඖෂධවල ගණන් මේ විධියට වැඩි වෙනවා නම් බුදු අම්මේ හැම දාම ලංකාවට බෙහෙත් ගෙනෙන නැව් එන්න ඕනෑ. බෙහෙත්වල මිල වැඩි කරන්න හිතුණාම කියන හේතු තමයි ඒ. ගරු ඇමතිතුමනි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් විතරක් නොවෙයි, විශේෂයෙන්ම මේ ඖෂධවල මිල වැඩි කිරීම සම්බන්ධයෙන් ඔබතුමාත් යම් වැඩ පිළිවෙළක් යොදන්න.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, පසුගිය දිනවල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් කිව්වා, "කාර්වල වීදුරුවේ තනතුරු ගහන්න බැහැ" කියලා. මේක වෛද්‍යවරුන්ටත්, නීතිඥ

මහත්වරුන්ටත් අදාළයි කියලා තිබෙනවා. අන්තර්ජාලයෙන් ලබා ගත් සැප්තැම්බර් මාසයේ 28වෙනි දා "දිනමිණ" පුවත් පතේ පළ වන එම ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

නමුත්, මේ ප්‍රශ්නය වෛද්‍යවරුන්ට බලපාන ආකාරය මම කියන්නම්. රථ වාහන නීතිය යටතේ යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක වෙනම දෙයක්. වාහනයක ගමන් කරන විට ඔහු වෛද්‍යවරයෙකු බවට සනාථ වීම හොඳයි. ඇයි මම ඒක හොඳයි කියන්නේ? වෛද්‍යවරයෙක් යන්නේ මොකටද? සමහර වෙලාවට අමාරු ලෙඩෙකුගේ ජීවිතය ගොඩ ගන්න වෙන්න පුළුවන්. මේ ස්ටිකරය වාහනයේ ඉදිරිපස තිබීම නිසා යම් විධියකින් ඔහුගේ වාහනය හඳුනා ගෙන එවැනි වෙලාවක ඔහුට යන්න මාර්ගයේ ඉඩ ලබාදේවි. ඒ වාගේ දේවල් තිබෙනවා. එහෙමනම්, කාර්වල වීදුරුවේ තනතුරු සහිත ලාංඡන ගහන එක නවත්වනවා නම් පාර්ලිමේන්තුවේ අපි මොකටද කාර් එකේ වීදුරුවේ අපේ තනතුර ගහගෙන යන්නේ? කාර් එකේ ගහගෙන යන්න කියලා අපටත් පාර්ලිමේන්තුවෙන් දෙනවා, "පාර්ලිමේන්තු මන්ත්‍රී" කියලා ස්ටිකරයක්. ඒකත් නවත්වන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, නීතිඥවරුන් හෝ වෛද්‍යවරුන් හඳුනා ගැනීම සඳහා යොදනු ලබන ස්ටිකරයක් හෝ වෙනත් යම් දෙයක් ඉවත් කරන්න කිසිම තීන්දුවක් රජය පාර්ශ්වයෙන් අරගෙන නැහැ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් හෝ පොලිසියෙන් එහෙම කිසිම තීන්දුවක් අරගෙනත් නැහැ. එවැනි ස්ටිකරයක් ගහගෙන ඉන්න එක ඔබතුමා කිව්වා වාගේම හදිසි අවස්ථාවලදී පමණක් නොවෙයි, රෝහල්වලට ඇතුළුවීමේ දී පවා පහසුවක් වනවා. මොකද, 500ක, 600ක කාර්ය මණ්ඩලයක් ඉන්න තැනක security එකෙන් දන්නේ නැහැ, මේ එන්නේ කවුද කියලා. ඒ නිසා වෛද්‍යවරුන් හඳුනාගැනීමේදී ඒක පහසුවක් වනවා. එම නිසා එවැනි ආකාරයට හඳුනා ගැනීම් සඳහා යොදා තිබෙන කිසිදු ලාංඡනයක් ඉවත් කරන්න රජය බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා බලන්න, සැප්තැම්බර් මාසයේ 28වෙනි දා "දිනමිණ" පත්තරේ. ඔබතුමා ජනමාධ්‍ය අමාත්‍යවරයා. ලේක් හවුස් එකෙන් තමයි දිනමිණ පත්තරය අච්චු ගහන්නේ. දිනමිණ පත්තරේ සඳහන් කරලා තිබෙනවා, "කාර්වල වීදුරුවේ තනතුරු ගහන්න බැහැ" කියලා. එම ලිපියේ වැඩිදුරටත් සඳහන් වනවා, වෛද්‍යවරුන්, නීතිඥ මහත්වරුන් තම තනතුරට අදාළව ගහලා තිබෙන මේ සියලු ලාංඡන ගලවන්න ඕනෑ, අලවන්න පුළුවන් ආදායම් බලපත්‍රය විතරයි කියලා. ගරු අමාත්‍යතුමනි, මුළු රටේම ඉන්න වෛද්‍යවරුන්ට ඔබතුමා අද ලබා දුන්නේ හොඳ පණිවුඩයක්. දැන් ඔබතුමාගෙන්මනේ එම උත්තරය ලැබුණේ. මම ප්‍රශ්නය ඇහුවා, ඔබතුමා උත්තරය දුන්නා. බොහෝ වෙලාවට අපි ගියාමත් වෛද්‍යවරුන් කියනවා, "මේක අල්ලයිද දන්නේ නැහැ, ගලවයි ද දන්නේ නැහැ" කියලා. දැන් හරි. දැන් seal එක ගැහුවා. දැන් බය වෙන්න දෙයක් නැහැ, වෛද්‍යවරුන්ට තම තනතුර කාර්වල වීදුරුවේ ගහගෙන යන්න පුළුවන්. හැබැයි, ඒ එක්කම ජනමාධ්‍ය ඇමතිවරයා ලෙස ඔබතුමා සොයා බලන්න, දිනමිණ පත්තරේ මේ ලිපිය දැම්මේ ඇයි කියලා. විශේෂයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් එහෙම දෙයක් දැම්මේ කොහොමද කියලා ඔබතුමා සොයා බලන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල් පද්ධතිය කෙරෙහි, අභිංසක ග්‍රාමීය ජනතාව වෙසෙන බුලත්සිංහල වාගේ ප්‍රදේශවල, අගලවත්ත වාගේ ප්‍රදේශවල තිබෙන ග්‍රාමීය රෝහල් කෙරෙහි, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.45]

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විවාදයට ගන්නේ ඖෂධ මිල පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිල නියාමනයට අදාළව ඉදිරිපත් කර තිබෙන නියෝග පාර්ලිමේන්තුවේ සම්මත කිරීමේ අවශ්‍යතාව පිළිබඳවයි. මෙහි නීතිමය පදනම පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය ඇමතිතුමා පැහැදිලි කිරීමක් කළා. ඇත්තටම මේ කරුණ සමස්ත ජනතාවටම බලපාන කරුණක්. විශේෂයෙන්ම පිළිකා, තැලසීමියා, වකුගඩු රෝග වැනි නිදන්ගත රෝගවලින් පෙළෙන රෝගීන් දීර්ඝ කාලයක් තිස්සේ ඖෂධ භාවිත කරනවා. ඒ වාගේම හදිසි අනතුරු, ආපදාවලට ලක් වන්නන්ට ඒ අවස්ථාවලදී ඖෂධ මිලදී ගන්න වනවා. ඒ වාගේම ආබාධිත ප්‍රජාවත් දීර්ඝ කාලයක් තිස්සේ ඖෂධ පාවිච්චි කරනවා. ඒ වාගේම සෞඛ්‍ය සේවකයින්ට, ඖෂධ සැපයුම්කරුවන්ට, ෆාමසි හිමිකරුවන්ට, නිෂ්පාදකයින්ට, ආයතනික සේවකයින්ට සහ ඖෂධ බෙදාහරින්නන්ට අපි මේ ඉදිරිපත් කරන මිල සූත්‍රය වැදගත් වනවා. ඒ වාගේම රජයට හා රටේ ආර්ථිකයටත් මෙය වැදගත් වනවා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21වැනි පිටුවේ සඳහන් වනවා, සාධාරණ මිලකට ඖෂධ ආරක්ෂිතව ලබා දීම අපේ වගකීම කියලා. විශේෂයෙන්ම ආරක්ෂිත ඖෂධ සහ උපකරණ ගුණාත්මකව සාධාරණ මිලකට ලබා දීම අපේ වගකීමක් වනවා. මේ මිල සූත්‍රය නිසා සැපයුම්කරුවන්ට, බෙදාහරින්නන්ට, ෆාමසි හිමිකරුවන්ට සාධාරණ ලාභයක් ලබා ගැනීමේ විවෘතභාවයක් ඇති වනවා. ඒ වාගේම කාර්යක්ෂම ආයතනික සේවාවක් ලබා ගන්නට අපට හැකි වනවා. මේ තුළින් සේවා සපයන්නන්ට කලට වේලාවට අවශ්‍ය ඖෂධ, උපකරණ, සැපයුම් ලබා දීමෙන් ඔවුන්ට සේවා තෘප්තිය ඇතිව ඔවුන්ගේ සේවාව ලබා දීමටත් හැකි වනවා. මේ තුළින් රටේ සංවර්ධනයට දායක විය හැකි නිරෝගීමත් ජනතාවක් බිහි වනවා වාගේම ඒ ජනතාවට අවශ්‍ය ඖෂධ වර්ග පහසුවෙන් ලබා ගැනීමේ හැකියාවත් ලැබෙනවා.

අපට ඖෂධ සඳහා මිල සූත්‍රයක් අවශ්‍ය වන්නේ ඇයි? අපි භාවිත කරන බටහිර වෙදකමට අවශ්‍ය ඖෂධ, උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය සියයට 85ක් පමණ එන්නේ පිටරටින්. විශේෂයෙන් රජයේ රෝහල්වලට සියයට 65ක් පමණ එන්නේ අපි ආනයනය කරන ඖෂධ. සියයට 35ක් පමණ තමයි දේශීයව නිෂ්පාදනය කරන ඖෂධ තිබෙන්නේ. පෞද්ගලික අංශය ආනයනය කරන ඖෂධ ප්‍රමාණය සියයට 95ක් විතර වනවා. එතකොට අපි ඉන්දියාවෙන් සියයට 50ක් විතර, ඇමෙරිකාවෙන් සියයට 16ක් විතර හා අනෙක් රටවලින් සියයට 1ත්, 6ත් අතර ප්‍රමාණයක් ඖෂධ ආනයනය කරනවා. පාකිස්තානය,

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

බංග්ලාදේශය, ප්‍රංශය, ඉන්දුනීසියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය හා මලයාසියාව වාගේ රටවලින් අපේ රටට ඖෂධ ආනයනය කරනවා. මේ ඖෂධ ආනයනය කරන්නේ පෞද්ගලික සැපයුම්කරුවන්. ඔවුන් ඒ සඳහා වියදමක් දරනවා. ඒ නිසා තමයි, විශේෂයෙන්ම CIF අගය පිළිබඳව අපි මේ මිල සූත්‍රයට ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ ඔවුන්ට පිරිවැයක් යොදවන්න වෙනවා, රක්ෂණය කරන්න වෙනවා, භාණ්ඩ ප්‍රවාහනය කරන්න මිලක් ගෙවන්න වෙනවා. ඒ වාගේම තීරු බදු ඇතුළු අනෙකුත් බදු සහ අනෙකුත් ගාස්තුත් ඔවුන්ට ගෙවන්න වනවා. අපි බදුවලින් නිදහස් කරලා තිබෙන දේවල්වලට ඖෂධත් අයත් වනවා. නමුත්, අවශ්‍ය අවස්ථාවලදී තීරු බදු වාගේ ගෙවීම් කරන්න සිද්ධ වනවා. ඒ වාගේම total supply chain එකේ ඉන්න අය හැටියට ආනයනයකරුවන්ට, බෙදාහරින්නන්ට සහ ෆාමසි හිමිකරුවන්ට ඖෂධ බෙදාහැරීමේදී සහ ඖෂධ ලබා දීමේදී යම්කිසි පිරිවැයක් දරන්න වනවා. එය සැලකිල්ලට ගෙන තමයි මේ මිල සූත්‍රය සකස් කරලා තිබෙන්නේ.

මිල පාලනයක් නැති වුණොත් සැපයුම්කරුවන් තමන්ට අවශ්‍ය මිල නියම කරනවා. ෆාමසි හිමිකරුවන් ඒ මිල අනුව විකුණුම් මිල සකස් කරනවා. වෙනත් භාණ්ඩ වාගේ නොවෙයි, ගුණ-අගුණ, හොඳ-නරක දන්නේ නැතුව පාරිභෝගිකයන්ට ෆාමසියෙන් දෙන ඖෂධ මිලට ගන්න සිද්ධ වනවා. වෙනත් පාරිභෝගික භාණ්ඩ වාගේ නොවෙයි ඖෂධ. ඒ කියන්නේ අල, ලූනු, හාල් වාගේ දේවල් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාට තමන්ට අවශ්‍ය ප්‍රමිතියෙන් ඒවා තිබෙනවාද, තමන් ඒවා ගන්නවාද, නැද්ද කියලා තීරණය කරන්න පුළුවන්. හැබැයි, ඖෂධවල ප්‍රමිතිය පාරිභෝගිකයාට තීරණය කිරීමේ හැකියාවක් නැහැ. මේ නිසා තමයි 1971 වාගේ ඈත කාලයේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වාගේ ආයතන බිහි කරන්න මහාචාර්ය සේනක බිබිලේ, ආචාර්ය එස්.ඒ. වික්‍රමසිංහ වාගේ අය මැදිහත් වෙලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තේ. නමුත්, 1977න් පසු අපි දැන් භාවිත කරන ආර්ථික ක්‍රමය වෙළෙඳ පොළ ඉල්ලුමට සහ සැපයුමට අදාළව විවෘත වනවා. ඒ නිසා දැන් සියල්ල වෙනස් වෙලා. වෙනත් රටවල ඖෂධ නිෂ්පාදනය කරන පෞද්ගලික ඖෂධ නිෂ්පාදන සමාගම් නිසා රජයට සෘජුවම ඖෂධ ආනයනය කිරීමට දැන් බාධක ඇති වෙලා තිබෙනවා.

අපේ රටේ නිෂ්පාදනය තමයි මේකට විසඳුම. නමුත්, ඒ සඳහා අවශ්‍ය වන අමු ද්‍රව්‍ය ගෙන්වීමට විදේශ විනිමය වැය වනවා. ඒ නිසා නිෂ්පාදන වියදම ඉහළ යනවා. ගුණාත්මකභාවය සහතික කිරීමට රසායනාගාර පහසුකම් අවශ්‍යයි. නමුත්, දැන් අපට තිබෙන්නේ සීමිත රසායනාගාර පහසුකම් ප්‍රමාණයක්. ඒ නිසා අපි රජයක් හැටියට බලාපොරොත්තු වනවා, රසායනාගාර පහසුකම් වැඩිදියුණු කර ගන්න. ඒවා වැඩිදියුණු කර ගැනීම තුළ තමයි, මෙරට නිෂ්පාදනය වන ඖෂධවලට අවශ්‍ය ප්‍රමිතිය පවත්වා ගත හැකි වන්නේ. එම නිසා අපි ඉක්මනින්ම ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. දැනට සියයට 15ක් විතර තමයි මෙරට ඖෂධ නිෂ්පාදනය වෙන්නේ. නමුත්, අපි ආණ්ඩුවක් හැටියට බලාපොරොත්තු වනවා, මෙරට නිෂ්පාදනය කරන ඖෂධ ප්‍රමාණය සියයට 35ක්, 40ක් දක්වා වැඩි කර ගන්න. මේ නිසා ඇත්තටම අපට ඖෂධවල මිල පාලනය කර ගැනීමට, ඖෂධ ගෙන්වා ගැනීමට විශාල අභියෝග රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, අපේ රටේ ජනතාවට බටහිර වෙදකම ගැන තිබෙන අවබෝධය අල්පයි. ඔවුන් වෛද්‍යවරයා නියම කරන ඖෂධය ගන්න පෙලඹෙනවා. වෛද්‍යවරුනුත් ඖෂධීය නාමයෙන්ම ඖෂධ වට්ටෝරුව ලිවීම නිසා ගැටලු මතු වෙලා තිබෙනවා. එහෙත් බොහෝ වෛද්‍යවරු තමන්ගේ සේවාදායකයන්ට ඖෂධ පිළිබඳ උපදෙස් ලබා දෙනවා. හැකි සෑම විටම ඖෂධීය නාමයෙන් ඖෂධ වට්ටෝරුව ලියනවා. නමුත්, සමහර අය පුරුදු වෙලා තිබෙනවා, විවිධ ලාභ ප්‍රයෝජන සඳහා හෝ විවිධ සමාගම්වලින් ගෙන්වන ඖෂධ නියම කරන්න. ඒ සඳහා වෙළෙඳ නාමය භාවිත කරනවා. එයට කුමක් හෝ හේතුවක් සපයනවා. මේ පිළිබඳව සමාජයේ නොයෙකුත් කතන්දර, අදහස් හුවමාරු වෙනවා. විවෘත වෙළෙඳ පොළේ මිල පාලනය නොකළොත් සාමාන්‍ය ජනතාවට ඖෂධ සඳහා අධික මිලක් වැය කරන්න සිද්ධ වනවා.

පොදුවේ සෞඛ්‍ය සේවාව සඳහා රජයේ මුදල් වැය වෙනවා. ඒ, ජනතාවගේ බදු මුදල්. නමුත්, රජයේ රෝහල්වල නැති ඖෂධ මිලදී ගැනීමේදී එහෙම නැත්නම් පෞද්ගලික සේවය හරහා සේවා ලබා ගැනීමේදී ජනතාවට බදු ගෙවීමට අමතරව එදිනෙදා ජීවිතය පවත්වාගෙන යෑමට ඇති දෛනික හෝ මාසික ආදායමෙන් ඒ වෙනුවෙනුත් මුදල් වියදම් කරන්න සිදු වෙනවා. මේකට අපි out-of-pocket expenditure කියලා කියනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, තමන්ගේ ආදායමින් සියයට 10ක් හෝ එදිනෙදා නිවසේ ආහාර සඳහා වියදම් කිරීමෙන් පසු ඉතුරු වන මුදලින් සියයට 40කට වඩා වියදම් කිරීමට සිදු වුවහොත් ඒකට අපි "catastrophic health expenditure" එකක් කියලා කියනවා. එහෙම වුණොත් පවුලකට ඒක දරා ගන්න බැරි වෙනවා. එවිට රෝගීන් සඳහා මිලදී ගන්න ඖෂධ ප්‍රමාණය අඩු කරනවා. එහෙම නැත්නම් ගත යුතු මුළු දින ගණනටම ඖෂධ ගන්නේ නැහැ. මේ නිසා අතුරු ආබාධ ඇති වෙන්න පුළුවන්, රෝගීන් අකාලයේ මිය යන්න පුළුවන්. මෙය බෝ නොවන රෝගීන් සඳහා විශේෂයෙන් බලපානවා. මොකද, රජයේ රෝහල්වල සායනවලට පැමිණෙන, පිටතින් ඖෂධ මිලදී ගැනීමට සිදු වන ජනතාවට මෙය බරපතළ ලෙස බලපානවා.

මේ නිසා තමයි අපට ඇත්තටම මිල සූත්‍රය ඉතාම වැදගත් වෙන්නේ. මිල සූත්‍රය අපේ රටට විතරක් නිශ්චිත, පොදු වුණු එකක් නොවෙයි. ඉන්දියාවේ National Pharmaceutical Pricing Authority එක මේ විධියටම මිල සූත්‍රයක් පාවිච්චි කරලා, මිල නියම කරනවා. ඒ වාගේම බංග්ලාදේශයේ Directorate General of Drug Administration මේ විධියටම මිල සූත්‍රයක් භාවිත කරලා, අත්‍යවශ්‍ය ඖෂධවලට මිලක් නියම කරනවා. ඉන්දුනීසියාවේත් ඒකේ මිල අනුව මේ වාගේම price cap එකක් දාලා මිල නියම කරනවා. වියට්නාමයත් මේ වාගේම cost එක සහ ඒගොල්ලන්ගේ declared pricing rule එක පාවිච්චි කරලා, මේ වාගේම මිල සූත්‍රයක් පාවිච්චි කරනවා. මේක අපේ රටේ විතරක් අනුගමනය කරන ක්‍රමයක් නොවෙයි. ලෝකයේ බොහෝ රටවල් වෙළෙඳ පොළේ තිබෙන ඖෂධ තමන්ගේ ජනතාවට සාධාරණ මිලකට ලබා දෙන්න මේ ක්‍රමය අනුගමනය කරනවා. හැබැයි, මේ ක්‍රමය අනුගමනය කිරීමේදී වැදගත් කාරණය තමයි, අපට තවදුරටත් මිල ගණන් නියාමනය කරන්න - monitor කරන්න - සිදු වන එක. එහෙම කළොත් තමයි අපට ඇත්තටම ඖෂධවල මිල නියමාකාරයෙන් පවත්වා ගනිමින් ජනතාවට සාධාරණ මිලට ඖෂධ ලබා දෙන්න පුළුවන් වෙන්නේ. එම නිසා අපි විශ්වාස කරනවා, අද පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා මේ නියෝග හරහා අපේ රටේ ජනතාවට අවශ්‍ය කරන ඖෂධ සාධාරණ මිලට ලබා ගන්න හැකි වෙයි කියලා. ගුණාත්මක ඖෂධ ආරක්ෂිතව ලබා දෙන්න මේ රජය ගන්නා උත්සාහයට එය විශාල පිටුවහලක් වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 1.56]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ඉදිරිපත් කර විවාද කරන මේ මොහොතේදී අපේ සෞඛ්‍ය සේවාවට අදාළව වර්තමානයේ මතුව තිබෙන කරුණු කිහිපයක් ගැන යමක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයේ ඉඳලාම වෙදකමටත්, හෙදකමටත් නමක් දිනාගෙන ඉන්න රටක් තමයි, අපේ රට. ගෙවුණු දශක කිහිපය තුළ ලංකාවේ සෞඛ්‍ය සේවාව ජාත්‍යන්තර ඇගැයීමට ලක් වුණු වාර ගණනාවක් පිළිබඳව අපට මතකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016 වර්ෂයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මැලේරියාව තුරන් කළ රටක් ලෙස ශ්‍රී ලංකාව නම් කළා. ඒ විතරක් නොවෙයි. සෞඛ්‍ය සේවාව තුළ හොඳම තීන්දු - තීරණ ගන්න රටක් ලෙසත් අපේ මේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරවත් පසුගිය කාලයේ ඇගැයීමට ලක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022දී රට තුළ ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක අපේ රටේ සෞඛ්‍ය සේවාවටත් කණ කොකා හැඬුවා. ඒකේ ප්‍රතිඵලයක් ලෙස රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධ වාගේම ජීවිත ආරක්ෂක ඖෂධවලත් බරපතළ හිඟයක් ඇති වෙන්න පටන් ගත්තා. ඒ අර්බුදය භාවිත කරමින් අසරණ රෝගීන්ගේ බෙහෙත් පෙත්තෙන් පවා වංචා කිරීමට තරම් අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉතාම පහළ මට්ටමකට ඇද වැටුණා කියන එක අපි දැක්කා. බොහොම බලවත් උදව්ය පවා පහත් මට්ටමට වැටී තිබුණු බව අපි දැන් දිගින් දිගටම දකිමින් සිටිනවා.

එහෙම එදා කඩා වැටුණු සෞඛ්‍ය සේවාව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් හිඟන්නාගේ තුවාලය වාගේ මුළුමනින්ම සුව වන තත්ත්වයට පත් වෙලා නැහැ. අද වනවිටත් අපේ රටේ රෝහල් ගණනාවකම අත්‍යවශ්‍ය ඖෂධ වාගේම වෛද්‍ය උපකරණවලත් සැලකිය යුතු හිඟයක් පවතිනවා. ඖෂධ කාණ්ඩ 100ක පමණ හිඟයක් තිබෙන බව අපට ආරංචි වනවා. ඒ අතර අත්‍යවශ්‍ය මෙන්ම ජීවිත ආරක්ෂක ඖෂධත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රෝග විනිශ්චය සඳහා වැදගත් වන, සායනික රෝග හඳුනා ගැනීමට භාවිත කරන උපකරණ බොහොමයකුත් අක්‍රිය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පසුගිය දිනවල මාධ්‍ය වාර්තා කරලා තිබුණා, කොළඹ ජාතික රෝහලේ MRI scanners තුනක්ම අක්‍රියයි කියලා. මේ තත්ත්වය රෝගී සත්කාර සේවාවලට දැඩි බලපෑමක් එල්ල වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මාධ්‍ය වාර්තා කරලා තිබුණා, මහනුවර මහ රෝහලට ගෙනැත් තිබුණු වකුගඩු රෝගීන් සඳහා භාවිත කරන උපකරණයක් බොහෝ කාලයක් තිස්සේ පාවිච්චියට නොගෙන නිකම්ම තිබෙන බව. රට පුරා සිටින වකුගඩු රෝගීනුත් ඖෂධ සහ උපකරණ හිඟය නිසා බරපතළ පීඩාවට පත් වී සිටිනවා. මේ දිනවල පවතින තවත් ප්‍රධානම ගැටලුවක් තමයි, රුධිර කාන්දුකරණයේදී රෝගියා සහ භාවිත කරන යන්ත්‍රය සම්බන්ධ කරන කටුවල පවතින බරපතළ හිඟය. අද උදේත් විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඇසූ ප්‍රශ්නයක් තුළින් ඒ ගැන දීර්ඝව කථා කළා. ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. මට හමු වුණා, වකුගඩු රෝගයෙන් පෙළෙන, ඊට ප්‍රතිකාර ගන්න මේ පාර්ලිමේන්තුවේ සේවක මහත්මයෙක්.

මහ රෝහලේ වකුගඩු ඒකකයට රුධිර කාන්දුකරණයට පැමිණෙන රෝගීන් මුහුණ පාන අසරණ තත්ත්වය ගැන ඔහු මා එක්ක කිව්වාම මට පුදුමත් හිතුණා. මම හිතන විදියට ඔබතුමා මේ විෂය ගැන හොඳටම දන්නා, ප්‍රායෝගික අවබෝධයක් තිබෙන, පොළොවේ පය ගහලා ඉන්න ඇමතිවරයෙක්. ඔබතුමා කොච්චර දැනගෙන හිටියත් එවැනි පුද්ගලයකුවත් විනාඩි 5කට හරි ඔබතුමාගේ කාර්යාලයට ගෙනැල්ලා ඒ දුක්ඛිත කතන්දරය ඇහුවොත් ඒ අත්දැකීම්වලිනුත් ඔබතුමාට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු කියනවා ඒ රෝගීන්ට ප්‍රමාණවත් ඇඳන් පහසුකම් පවා නැහැ කියලා. තමන්ගේ අවස්ථාව පැමිණෙන තුරු පැදුරකට වෙලා ඉන්න තමයි රෝගීන්ට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අපහසුතාව ඇත්ත වශයෙන්ම අහනකොටත් පුදුමයි.

ගරු ඇමතිතුමනි, තුවාලවලට මැහුම් දමන්න ගන්න නයිලෝන්වලත් හිඟයක් තිබෙනවා. හදිසියකදී තුවාලයක් වෙලා මැහුම් දමන්න වුණොත් රුපියල් දෙතුන් දාහක් වියදම් කරන්න ඕනෑ ෆාමසි එකට ගිහිල්ලා ඒ අවශ්‍ය කරන බඩු ටික ගෙනත් දෙන්න. තවත් බරපතළම ගැටලුවක් තමයි හෘදය ශල්‍යකර්මවලටත්, CT, MRI පරීක්ෂණ කර ගන්නත් හැම තැනකම විශාල පොරොත්තු ලේඛනයක් දික් ගැස්සෙමින් පවතින එක. ඒ වාගේම රෝහල්වල ග්ලූකෝස් පරීක්ෂණවලට භාවිත කරන පටිවලත් හිඟයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අපේ කරාපිටිය රෝහල ගැන කථා කළොත්, පිළිකා ඖෂධ ඇතුළු ඖෂධවල බරපතළ හිඟයක් අනෙක් රෝහල්වල වාගේම තිබෙනවා. කරාපිටිය කියන්නේ දකුණු පළාතේ විතරක් නොවෙයි සබරගමුව, ඌව වාගේ පළාත්වලින් පවා රෝගීන් දහස් ගණනක් ප්‍රතිකාර ගන්න එන රෝහලක්. අපට බොහෝදෙනෙක් කියන කථාවක් තමයි කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයට - ICU එකට- රෝගියෙකු ඇතුළු කළාම ඉස්සර අවශ්‍ය කරන සනීපාරක්ෂක භාණ්ඩ ලැයිස්තුවක් කොළ කැල්ලක් හැටියට දෙනවාලු, දැන් එහෙම කොළ දෙන්නේ නැහැලු. වයසක, වයෝවෘද්ධ,_අසරණ, අහිංසක රෝගීන් ගියාම අර ලැයිස්තුව කියාගෙන කියාගෙන යනවා. ඒ මිනිස්සුන්ට ඒකෙන් භාගයක්වත් මතක හිටින්නේ නැහැ. ඒ නිසා ඒක පොඩ්ඩක් බලන්න. මොකද, හුඟක් වෙලාවට රෝගීන් හරිම අසරණ වෙනවා ඔය වාගේ පොඩි පොඩි දේවල් නිසා. ඒ වාගේම කරාපිටියේ දන්ත X-ray එකක් ගන්න ගියාම ඒකේ X-ray පිටපත්වල ප්‍රශ්නයක් තිබෙනවාලු. රෝගීන් අටදෙනෙක් එකතු වුණාම තමයි දන්ත රෝගීන්ගේ X-rays ගන්නේ. නවවෙනියෙක් හිටියොත් එයාට ඉන්න වෙනවා තවත් හත්දෙනෙක් එනකම්. ඒක නිසා හුඟක් අයට පෞද්ගලික රෝහල්වලට ගිහින් මුදල් වියදම් කරලා තමයි dental X-ray එකක් ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මම මීට පෙරත් දවසක් ගරු ඇමතිතුමාට කථා කරලා කිව්වා ගාල්ල කරාපිටිය රෝහලේ ගිලන් රථ 11ක් තිබුණාට 5යි වැඩ කරන්නේ කියලා. ගරු ඇමතිතුමනි, අදටත් බැලුවොත් 5යි වැඩ කරන්නේ. නමුත් එදා ඔබතුමා රෝහලට දුරකථනයෙන් කථා කරලා අහලා කිව්වා 5ට වැඩිය වැඩ කරනවා කියලා. නමුත් මම ඔබතුමාට කියනවා රෝහලෙන් කියන විස්තරයම පිළිගන්නේ නැතිව ඔබතුමා කවුරු හරි යවලා පොඩ්ඩක් සොයලා බලන්න. මොකද, 5ක් කියන්නේ හැරෙන්නවත් මදි කරාපිටිය වාගේ රෝහලකට.

අවසාන වශයෙන් තව කාරණයක් කියන්න ඕනෑ. මේ දිනවල සමාජයේ බොහොම කථාබහට ලක් වුණු එකක් තමයි, 1990 සුවසැරිය ගිලන් රථ සේවය. ඒ ගැන විවිධ ප්‍රචාර ගියා. අද ඒක හුඟක් දුරට පැහැදිලි වුණා. ඇත්ත වශයෙන් අපටත් පුදුම හිතුණා. ඒ වාගේ දේවල් කරන්න යයිද කියලා සැකත් හිතුණා. නම වෙනස් කරන්න හදනවා කිව්වා, පාට වෙනස් කරන්න හදනවා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කිව්වා, "1990" වෙනුවට "8889" කියලා දාන්න යනවා කියලාත් කථාවක් ගියා. ගරු ඇමතිතුමනි, ලෝක බැංකුවත් පිළිගත්තා ලොව ගිලන් රථ සේවා අතර වේගයෙන්ම ප්‍රතිචාර දක්වන සේවාවක් බව 1990 සුවසැරිය ගිලන් රථ සේවාව. මෙය, අපේ හර්ෂ ද සිල්වා මැතිතුමන්ලා බොහොම මහන්සි වෙලා මේ රටේ ඇති කළ දෙයක්; විවේචන රාශියක් මැද්දේ ඇති කළ දෙයක්. බිල්ලෝ රාශියක් මැව්වා ඕක ගේනකොට. 2016 ඉඳලා, සුවසැරිය පටන් ගත්ත දවසේ ඉඳලා මේ වෙනකොට ලක්ෂ 20කට පමණ සේවය සලසා දෙන්න සමත් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඇමතුමක් ලැබිලා මිනිත්තු කිහිපයක් ඇතුළත රෝගියාව ළඟම තිබෙන රෝහලට හෝ සත්කාර මධ්‍යස්ථානයකට ගෙනියන්න 1990 සුවසැරිය සමත් වෙලා තිබෙනවා. මුලදී නාගරික ප්‍රදේශවල තමයි මේක බහුලව දකින්නට ලැබුණේ. නමුත් අද රට පුරාම මේක ක්‍රියාත්මක වෙනවා. 1990ට ලැබෙන ඇමතුම්වලින් සියයට 63ක්ම ලැබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවලින් කියලා හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව මේ ගිලන් රථ සේවය ජනතාවට ඉතාම සමීපයි. සුවසැරිය කිව්වාම නොදන්නා කෙනෙක් නැහැ. "1990" කියන්නේ හැමෝගේම හදවතේ තිබෙන අංකයක්. ඒ නිසා මේවා වෙනස් කරන්න එපා. දේශපාලන වශයෙන් ගෙනාපුවා නොවෙයි මේවා, මහජන සේවා හැටියට ගෙනාපුවා. මේවායින් හැම පක්ෂයකම රෝගීන් එහෙට මෙහෙට යනවා. ඒ නිසා මේක කිසිම කප්පාදුවක් කරන්නේ නැතිව, වෙනසක් කරන්නේ නැතිව දියුණු කිරීමට කටයුතු කරන්න කියලා අපි මතක් කරනවා.

මගේ කාලය අවසන් කියලා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා කියන්න හදන්නේ.

ඒ නිසා අවසාන වශයෙන් මේ කාරණය කියලා මම අවසන් කරන්නම්. අද ගෙනැවිත් තිබෙන නියෝගවලට අපේ සම්පූර්ණ සහයෝගය තිබෙනවා. ගුණාත්මක ඖෂධ ගෙන ඒමටත්, උපරිම සිල්ලර මිලක් සහ උපරිම බෙදා හැරීමේ මිලක් ඒ හරහා නියම කරන්නත් කටයුතු කර තිබෙනවා. වැඩි මිලට ඖෂධ අලෙවි කරනන්නට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නත් අද දින මේ නියෝග සම්මතයෙන් පස්සේ පුළුවන් වීම කෙරෙහි අපේ සහාය තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වෛද්‍ය ජනක සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ගෙනැල්ලා මේ වෙනකොට අවුරුදු දහයහමාරක් වෙනවා. 2015 මාර්තු 19 තමයි මේ පනත ගෙනැවිත් තිබෙන්නේ. මෙම පනතේ සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අරමුණු කිහිපයක් සඳහන් වෙනවා. මුලින්ම සඳහන් වෙනවා, "ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම" කියලා. ඊළඟට, දෙවැනි අරමුණ විධියට සඳහන් වෙනවා, "මේ දේවල් සම්බන්ධ ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය, මිල නියම කිරීම, ආනයනය ආදී සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම" කියන කාරණය. තවත් කරුණු කිහිපයක් ඇතුළත් වෙනවා. එතකොට මේ අවුරුදු දහය හමාරක් ගිහිල්ලාත්, මේ පනතේ, මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගන්න අපේ රටට බැරිවෙලා තිබෙනවා.

සෞඛ්‍ය සම්බන්ධයෙන් ලෝක තත්ත්වය ගත්තාම, අපි හිතාගෙන ඉන්නවා, පසුගිය කාලයේ අපේ රට සෞඛ්‍ය දර්ශක අතින් ගොඩක් ඉදිරියෙන් ඉන්නවා කියලා. සමහර දර්ශක සම්බන්ධයෙන් ඒක සත්‍යයක් වුවත්, 2018 දී ලෝක සෞඛ්‍ය සංවිධානය "100 Core Health Indicators" කියන ලියවිල්ල ඉදිරිපත් කර තිබෙනවා, ලෝකයේ රටවල්වලට තමන්ගේ සෞඛ්‍ය පද්ධතිය ගොඩනැඟීම සඳහා, නැත්නම් සෞඛ්‍ය පද්ධතිය කොච්චර හොඳින් ක්‍රියාත්මක වෙනවාද කියලා අධීක්ෂණය කර ගැනීම සඳහා මාර්ගෝපදේශයක් විධියට. මේකේ indicators 100ක් තිබෙනවා. මෙම indicators 100 කොටස් 4කට බෙදලා තිබෙනවා, Inputs and processes, Output, Outcome, Impact වශයෙන්. අපි මෙච්චර කාලයක් මේවායින් අපේ රටේ ඉහළින් තිබුණාය කියන දර්ශක තුන තිබෙන්නේ මෙන්න මේ Impact කියන එකේ. ඒ තමයි, මාතෘ මරණ අනුපාතය, ළදරු මරණ අනුපාතය සහ උපතේදී මරණ අනුපාතය. මේ කියන්නේ අර 100න් එක්තරා කාරණා තුනක් විතරයි.

මෙහි සඳහන් Input කියන එකට තමයි අපි ගොඩක් අවධානය දීලා තිබෙන්නේ. Input එකක් නැතුව අපට output එකක්, outcome එකක්, නැත්නම් impact එකක් ගන්න බැහැ. මෙහි Input එකේ කොටස් 4ක් තිබෙනවා. ඒ තමයි, health financing, health workforce, health infrastructure සහ health information නැත්නම් health governance. මෙහි health financing කියන එක ඇතුළේ කාරණා කිහිපයක් තිබෙනවා. ඒකෙන් එකක් තමයි, GDP එකෙන්, නැත්නම් දළ ජාතික නිෂ්පාදියෙන් අපි කොපමණ ප්‍රතිශතයක් - percentage එකක් - සෞඛ්‍යයට වෙන් කරනවාද කියන එක. ඒ වාගේ තවත් කිහිපයක් තිබෙනවා. Health workforce එක ගත්තාම, පසුගිය කාලයේ අපේ රටේ හෙද විද්‍යාල වහලා තිබුණා, ඒ වාගේම අවුරුදු 4ක්, 5ක් හෙද හෙදියන් බඳවා ගත්තේ නැහැ. දැන් අපි දහස් ගණනින් බඳවා ගනිමින් යනවා. ඊළඟට, health infrastructure. ඒ යටතේ තිබෙනවා, health facility density and distribution. ඒ කියන්නේ, සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාප්ත වෙලා තිබෙන්නේ කොහොමද, කොපමණ ඝනත්වයක් තිබෙනවාද කියන එක. ඒක වැඩිදියුණු කරන්න තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි සියලු ජනතාව ආවරණය වන විධියට රට පුරා අලුතින් ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන - PMCUs - ඇති කරන්නත්, තිබෙන ඒවා සංවර්ධනය කරන්නත් වැඩ සටහනක් කරගෙන යන්නේ. ඒ යටතේ පසුගිය දවසක ලංකාව පුරා එහි නියමු ව්‍යාපෘතියක් විධියට PMCUs 5ක් දිස්ත්‍රික්ක 5ක ආරම්භ කළා. ඉන් එකක් අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇත්ඹය කොට්ඨාසයේත් ආරම්භ කළා. මෙවැනි Input එකක් කළොත් තමයි අපට output එකක්, outcome එකක්, ඒ වාගේම impact එකක් ගන්න පුළුවන් වෙන්නේ.

මේ Impact කියන එකේ finanical risk protection එකකුත් තිබෙනවා. ඒ වාගේම catastrophic health expenditure කියලා එකක් තිබෙනවා. අපේ ගරු වෛද්‍ය නිහාල් අබේසිංහ මැතිතුමාත් ඒ ගැන පැහැදිලි කළා. ඒ කියන්නේ, ගෙදරක සමස්ත වියදමින් සියයට 10කට වැඩි ප්‍රමාණයක් සෞඛ්‍ය වෙනුවෙන් වියදම් වෙනවා නම්, ඒක ව්‍යසනකාරී සෞඛ්‍ය වියදමක් වෙනවා. ඒ පවුල දුප්පත් වීමට එම සෞඛ්‍ය වියදම හේතු වෙනවා. ඒ වාගේම ආහාරවල වියදම ඇරුණාම ඉතිරි වියදමින් සියයට 40ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සෞඛ්‍ය වෙනුවෙන් වැය වෙනවා නම්, එය එම පවුල දුප්පත් වීමට හේතුවක් වෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානය තමන්ගේ Sustainable Development Goals 3.8.2 කියන එකේ මෙන්න මේ catastrophic health expenditure එක අඩු කර ගන්න ඉලක්ක කරලා තිබෙනවා. ඒ වාගේම 2030 වෙනකොට සෞඛ්‍ය වියදම නිසා දුප්පත් බවට පත් වීම නැවැත්විය යුතුයි කියලා ඉලක්ක කරලා තිබෙනවා. මෙන්න මේ catastrophic health expenditure එක, එහෙම නැත්නම් තමන්ගේ පවුලේ ආදායමෙන් සියයට 10කට වැඩි වියදමක් සෞඛ්‍ය වෙනුවෙන් වැය වීම අපේ රටේ සැලකිය යුතු මට්ටමකට තිබෙනවා.

මේ සම්බන්ධව පර්යේෂණයක් කරලා තිබෙනවා. 2024 සැප්තැම්බර් 12වැනි දා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, BMC Health Services Research කියන website එකේ. දිස්ත්‍රික්ක හතරක රෝගීන් 2,300කට අධික පිරිසක් යොදාගෙන කරපු ඒ පර්යේෂණයෙන් පෙන්වා දී තිබෙනවා, ලංකාවේ රෝහල්වලට admit වෙන ලෙඩුන්ගෙන් සියයට 13.5කට ව්‍යසනකාරී සෞඛ්‍ය වියදමක් -catastrophic health expenditure එකක් - තිබෙනවා කියලා; ඒ වාගේම, සායනවලට යන අයගෙන් සියයට 6.1කට ව්‍යසනකාරී සෞඛ්‍ය වියදමක් තිබෙනවා කියලා. රටක් විධියට අපේ out-of-pocket expenditure ගත්තොත්, පුද්ගලයෙකුගේ සෞඛ්‍ය වියදමින් සියයට 50ක් විතර තමන් විසින් තනිවම දරා ගන්නවා. ඒක එච්චර හොඳ තත්ත්වයක් නොවෙයි.

අපේ රටේ අවුරුද්දකට මිලියන 7ක් විතර -ආසන්න වශයෙන් ලක්ෂ 70ක් විතර - රෝහල්වලට admit වෙනවා. ඒ වාගේම clinicsවලට ලක්ෂ 30ක් විතර යනවා. රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් - OPDsවලින්- මිලියන 55ක් විතර ප්‍රතිකාර ලබා ගන්නවා. පෞද්ගලික අංශයෙනුත් ඒ වාගේම ප්‍රමාණයක් ප්‍රතිකාර ලබා ගන්නවා. බෝ නොවන රෝග - NCDs - සම්බන්ධයෙන් තමයි වැඩි පුරම වියදමක් දරා තිබෙන්නේ. ලංකාවේ බෝ නොවන රෝග ගත්තාම, අධිරුධිර පීඩනය - high blood pressure or hypertension - තිබෙනවා, වයස 18ට වැඩි අයගෙන් සියයට 20කට විතර. ඒ වාගේම, NCD deaths එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. මේ වනකොට අපේ රටේ මරණවලින් සියයට 80ක් විතර NCD නිසායි, ඒ කියන්නේ බෝ නොවන රෝගවලිනුයි සිදු වන්නේ. ඒක කාලයත් එක්ක එන්න එන්න වැඩි වෙමින් පවතිනවා. 2000දී සියයට 74ක් වෙච්ච, බෝ නොවන රෝග නිසා සිදු වුණු මරණ සංඛ්‍යාව 2010දී සියයට 76ක් වෙලා, 2019 වෙද්දී සියයට 83ක් වෙලා තිබෙනවා.

ඒ නිසා බෝ නොවන රෝගවලින් සිදු වන මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමටත්, ව්‍යසනකාරී සෞඛ්‍ය වියදම තුළින් දුප්පත් වීම වළක්වා ගැනීමටත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙන එන මෙම නියෝග මහෝපකාරී වෙයි කියලා අපි විශ්වාස කරනවා. මේ මඟින් රෝගීන්ගේ සෞඛ්‍ය වියදම හෙවත් ඖෂධ සඳහා දරන වියදම විශාල වශයෙන් අඩු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.13]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்றைய விவாதத்தின் போது 2022ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டத்தைத் திருத்துவது தொடர்பாக எனது கருத்துக்களை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

2022ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டமானது, இலங்கையில் தனிப்பட்ட தரவுகளைச் செயன்முறைப்படுத்துவதனை ஒழுங்குபடுத்து வதற்கும் அவற்றைப் பாதுகாப்பதற்கும், தரவோடு தொடர்பு பட்டோரது உரிமைகளை அடையாளம் காண்பதற்கும் பலப்படுத்துவதற்கும், தரவுப் பாதுகாப்பு அதிகாரசபை ஒன்றை நிறுவுவதற்கும் அவற்றோடு தொடர்புபட்ட கருமங்களை ஆற்றுவதற்குமான ஒரு சட்டமூலமாகும். இந்தச் சட்டமூலமானது, ஐரோப்பிய ஒன்றியத்தின் பொதுத் தரவுப் பாதுகாப்பு ஒழுங்குமுறை மற்றும் சிங்கப்பூரின் தனிநபர் தரவுப் பாதுகாப்புச் சட்டம் ஆகியவற்றின் மாதிரியைப் பின்பற்றி இலங்கையில் ஒரு விரிவான தரவுப் பாதுகாப்புச் சட்டத்தை நிறுவ முனைகின்றது. மேற்படி தரவுப் பாதுகாப்புச் சட்டத்தை நடைமுறைப்படுத்துவதில் உள்ள நிருவாகச் சுமைகளைக் குறைக்கும் நோக்கிலும், பன்னாட்டுப் பொது நடைமுறைக்கு நெருக்கமாக்கும் வகையிலும், டிஜிட்டல் பொருளாதார அமைச்சர் 2025ஆம் ஆண்டு மே மாதம் 08ஆம் நாள் நாடாளுமன்றத்தில் இச்சட்டத்தில் பல முதன்மையான மாற்றங்களை முன்மொழிந்துள்ளார்.

அவையாவன:

(1) காலக்கெடு: 2002ஆம் ஆண்டின் 09ஆம் எண்கொண்ட சட்டப் பிரிவு 17இற்கமைய, தரவோடு தொடர்பு பட்டோரின் கோரிக்கைக்குக் கட்டுப்பாட்டாளர் அல்லது செயன்முறைப்படுத்துநர் 21 வேலை நாட்களுக்குள் விடையளிக்க வேண்டும். இது, "ஒரு மாத காலத்துக்குள் விடையளிக்கலாம்" என மாற்றப்பட்டுள்ளதோடு "நியாயமான காரணங் களுக்காக மேலும் இரண்டு மாத காலம் என மொத்தமாக மூன்று மாதங்கள் வரை விடையளிக்கக் கால நீட்டிப்புக் கோரலாம்" எனத் திருத்தம் செய்யப்பட்டுள்ளது. மக்களுக்கு வினைத்திறனான முறையில் சேவையினை அளிப்பதாயின் காலத்தைக் குறைக்க வேண்டுமே தவிர நீடிக்கக் கூடாது; இதிலே காலம் நீடிக்கப்பட்டுள்ளது.

(2) கோரிக்கைக் கட்டணம்: அடிப்படைச் சட்டத்தின் பிரிவு 17இற்கமைய, "தரவுடன் தொடர்புபட்டவரின் கோரிக்கைகளுக்கு விதிமுறைகளின்படி கட்டணம் அறவிடப்படலாம்" எனக் குறிப்பிடப்பட்டிருந்தது. இது மாற்றப்பட்டு, "கோரிக்கை கட்டணமின்றி வழங்கப்பட வேண்டும் என்பதோடு, சில சூழ்நிலைகளில் மட்டும் கட்டணம் அறவிடத் தரவுப் பாதுகாப்பு அதிகாரசபை விதிகளை உருவாக்கலாம்" என மாற்றம் செய்யப்பட்டுள்ளது.

(3) தரவுப் பாதுகாப்பு அதிகாரி நியமனம்: இச்சட்டப் பிரிவு 20க்கு அமைய, அமைச்சுகள், அரசாங்கத் திணைக் களங்கள் மற்றும் அரச கூட்டுத்தாபனங் களுக்குத் தரவுப் பாதுகாப்பு அலுவலர் நியமனம்

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

கட்டாயமாக் கப்பட்டிருந்தது. புதிய சட்டத் திருத்தத்தின்மூலம் அரச கூட்டுத்தாபனங்களுக்கு தரவுப் பாதுபாப்பு அலுவலருக்கான நியமனத் தேவை நீக்கப் பட்டுள்ளதோடு, "இனித் தரவுப் பாதுகாப்பு அலுவலரின் பங்கு கட்டுப்பாட்டாளருக்கு மதியுரைத் தலாக இருக்கும்" எனக் குறிப்பிடப்பட்டுள்ளது.

(4) தரவுப் பாதுகாப்புத் தாக்க மதிப்பீடு சமர்ப்பிப்பு: 2022ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட சட்டப் பிரிவு 24க்கு அமைய, "தரவுக் கட்டுப்பாட்டாளர், தரவுப் பாதுகாப்புத் தாக்க மதிப்பீட்டைத் தரவுப் பாதுகாப்பு அதிகாரசபைக்குக் கட்டாயம் முன்வைக்க வேண்டும்" எனக் குறிப்பிடப்பட்டிருந்தது. இந்த ஒழுங்குவிதி, "தரவுப் பாதுகாப்பு அதிகாரசபை எழுத்துமூலம் கோரினால் மட்டுமே முன்வைக்க வேண்டும்" என மாற்றப்பட்டுள்ளது.

அதுபோல், இச்சட்டத்தின் பிரிவு 25க்கு அமைய, தரவுடன் தொடர்புபட்டோரின் உரிமைகளுக்குத் தீங்கு விளைவிக்கும் ஆபத்தொன்றை விளைவிக்கக்கூடும் எனத் தரவுப் பாதுகாப்புத் தாக்க மதிப்பீடு ஒன்று சுட்டிக்காட்டுமிடத்து, கட்டுப்பாட்டாளர் தரவுப் பாதுகாப்பு அதிகாரசபையிடம் முன் ஆலோசனை பெறுவது கட்டாயமாக்கப்பட்டிருந்தது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යම් පැටලැවිල්ලක් වෙලා තිබෙනවා ඔබතුමාට. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වන නියෝග ගැන තමයි අද සාකච්ඡා කරන්නේ.

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
මේක දෙවෙනි යෝජනාව විධියට තියෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නමුත් පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයක් අද නැහැ.

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
ඒක අද දෙවැනි යෝජනාව විධියට තියෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අද තිබෙන්නේ ඒහි කාරක සභා අවස්ථාව විතරයි; විවාදයක් නැහැ. ඔබතුමා අදහස් දක්වන්න, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ගැන.

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
දෙවෙනි යෝජනාව විධියට තියෙන නිසා තමයි ඒ ගැන කථා කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කමක් නැහැ, ඔබතුමා අදහස් දක්වන්න.

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
இத்திருத்தச் சட்டமூலத்தின்படி தரவுப் பாதுகாப்பு அதிகாரசபையின் ஒப்புதல் இல்லாமல் தணிக்கப்படாத ஆபத்துத் தொடர்பில் ஆலோசனை பெறும் தேவை நீக்கப்பட்டு, சட்டப் பிரிவு 25இன் 2ஆம், 3ஆம், 4ஆம், 5ஆம் மற்றும் 6ஆம் உட்பிரிவுகளும் நீக்கப்பட்டுள்ளன.

எல்லைக்கு அப்பாலான தரவுப் பரிமாற்றம்: 2022ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட சட்டப் பிரிவு 26க்கு அமைய, பொது அதிகாரசபை தவிர்ந்த, கட்டுப்பாட்டாளர் அல்லது செயன்முறைப்படுத்துநர் ஒரு தரவைச் செயன்முறைப் படுத்துமிடத்து, 02ஆம் உட்பிரிவின் 'போதுமாந்தன்மை முடிவுகள்' தேவையைப் பின்பற்றி பரிந்துரைக்கப்பட்ட மூன்றாம் நாடொன்றில் இதனைச் செயற்படுத்தலாம். இது தற்பொழுது மாற்றீடு செய்யப்பட்டு விடயத்துக்கேற்ப, பொது அதிகாரசபை தவிர்ந்த கட்டுப்பாட்டாளர் ஒருவர் அல்லது செயன்முறைப்படுத்துநர் ஒருவர் பரிந்துரைக்கப்பட்ட மூன்றாம் நாடொன்றில் இச்சட்டத்தின் ஏற்பாடுகளுக்கு இணங்கி ஒழுகுவதனை உறுதிப்படுத்துமிடத்து, தரவுத் தொடர்பு பட்டோரின் வெளிப்படையான ஒப்புதல் அல்லது ஒப்பந்த நிறைவு, சட்ட உரிமை கோரல், பொது நலன், அவசரகாலத் தேவை போன்ற காரணங்களுக்காகத் தரவுப் பாதுகாப்பு அதிகாரசபை குறிப்பிடும் ஆவணங்கள் இல்லாமலே எல்லைக்கப்பாலான தரவு ஓட்டத்தில் ஈடுபட விதிவிலக்கு அளிக்கப்பட்டுள்ளது.

இச்சட்டத்தின் 51ஆம் பிரிவில் வழிகாட்டுதல் நெறிகளின்கீழ் '51அ' என்ற புதிய பிரிவு சேர்க்கப்படுகின்றது. இதன்மூலம் வழிகாட்டுதல் நெறிமுறை ஊடாகத் தரவுப் பாதுகாப்பு அதிகாரசபையானது 2022ஆம் ஆண்டின் 09ஆம் எண் கொண்ட சட்டத்தின் 12ஆம் பிரிவில் குறித்துரைக் கப்பட்ட தரவுப் பாதுகாப்பு முகாமை நிகழ்ச்சித்திட்டம் தொடர்பான கருமங்கள் உட்பட இச்சட்டத்தில் குறித்துரைக்கப்பட்ட செயற்பாடுகள் தொடர்பில் காலத்துக்குக் காலம் வழிகாட்டல் நெறிமுறைகளை வழங்கலாமெனத் திருத்தப்பட்டுள்ளது.

பொது அதிகாரசபை: இச்சட்டப் பிரிவு 56க்கு அமைய பொது அதிகாரசபை என்பதன் வரையறையில் அரச கூட்டுத் தாபனங்கள், சபைகள், திணைக்களங்கள், அமைச்சுகள், மாகாண சபைகள் மற்றும் உள்ளூர் அதிகாரசபைகள் உள்ளடக்கப்பட்டிருந்தன. புதிய சட்டத் திருத்தம்மூலம் அரச கூட்டுத்தாபனங்கள் மற்றும் கம்பனிச் சட்டத்தின்கீழ் கூட்டிணைக்கப்பட்ட நிறுவனங்கள் ஆகியவை பொது அதிகாரசபை என்ற வரையறையில் இருந்து விலக்கப் படுகின்றன. எனினும், திணைக்களங்கள், அமைச்சுகள், மாகாண சபைகள் மற்றும் உள்ளூர் அதிகாரசபைகள் இதன் வரையறைக்குள் தொடர்ந்தும் இருக்கும்.

மேற்படி திருத்தங்கள், பொது அதிகாரசபைகள் மீதுள்ள நிர்வாகச் சுமைகளைக் குறைக்கவும் ஆவணப்படுத்தலை எளிதாக்கவும் கொண்டுவரப்பட்டுள்ளன. குடிமக்களின் தனியுரிமை மற்றும் அடிப்படை உரிமைகளின் வலுவான பாதுகாப்பை வழங்க முனைகின்றன. தரவோடு தொடர்பு

பட்டோரின் உரிமைகளுக்கான விடையளிப்புச் செயன் முறையை மறுசீரமைக்கின்றன. பன்னாட்டுத் தரவுப் பரிமாற்ற விதிகளை மறுசீரமைக்கவும் எண்மப் பொருளாதார முறைமையோடு இயைந்து செல்லவும் முயல்கின்றன. உள்நாட்டு மற்றும் வெளிநாட்டு முதலீட்டாளர்களுக்குச் சட்டத் தெளிவு வழங்க முனைகின்றன.

எனினும், இந்தத் திருத்தச் சட்டமூலம் தொடர்பில் பின்வரும் கவலைகளும் காணப்படுகின்றன:

1. தரவுப் பாதுகாப்பு ஆணையத்திற்குத் திறமையான வல்லுநர்கள், தொழில்நுட்ப உட்கட்டமைப்பு மற்றும் போதுமான நிதி உள்ளதா?
2. வெளிப்படைத்தன்மையை உறுதிப்படுத்தும் பொருட்டாக, தரவுப் பாதுகாப்பு ஆணையம் ஆண்டறிக்கையை நேரடியாக நாடாளுமன்றத்தில் முன்வைக்குமா?
3. தரவுப் பாதுகாப்பு ஆணையத்தின் சுதந்திரம் மற்றும் பொறுப்புக்கூறலை நாடாளுமன்றம் எவ்வாறு உறுதி செய்யும்?
4. எல்லைதாண்டிய தரவுப் பரிமாற்ற விதிகள் தேசியப் பாதுகாப்பு மற்றும் குடிமக்களின் தனியுரிமையைப் போதுமான அளவு பாதுகாக்கின்றதா?
5. தேசியத் தரவுத்தளங்கள், இலத்திரனியல் அடையாளங்கள் அல்லது நலன்புரி முறைகளிலுள்ள குடிமக்களின் உணர்வு சார்ந்த தரவுகளைச் சட்டம் எவ்வாறு கையாளும்?
6. தண்டனை மற்றும் குறை தீர்க்கும் வழிமுறைகள் சாதாரண குடிமக்களுக்கு நியாயமானதா? நடைமுறைப்படுத்தக்கூடியதா? அணுகக்கூடியதா?
7. திருத்தப்பட்ட சட்டத்தை முழுமையாகச் செயற்படுத்துவதற்காக முன்மொழியப்பட்டுள்ள காலக்கெடு என்ன?
8. தரவுப் பணி இரட்டிப்பைத் தவிர்க்கத் தரவுப் பாதுகாப்பு அதிகாரசபை, இலங்கைத் தகவல் தொடர்பாடல் முகவர் நிலையம், இலங்கை தொலைத் தொடர்பு ஆணையம் மற்றும் பிற ஒழுங்குபடுத்தி களுக்கு இடையே தெளிவான ஒருங்கிணைப்பு மேற்கொள்ளப்படுமா?

இவற்றைத் தீர்க்க அமைச்சர் என்ன செய்யப்போகின்றார் என்பதைத் தெளிவுபடுத்த வேண்டும்.

இத்தனிப்பட்ட தரவுப் பாதுகாப்பானது வெவ்வேறு நாடுகளில் வெவ்வேறு பெயர்களால் அழைக்கப்படுகின்றது. எடுத்துக்காட்டாக கனடா நாட்டில் இது Social Insurance Number - 'சமூகக் காப்புறுதி எண்' என்று அழைக்கப் படுகின்றது. இந்த எண்ணானது வருமான வரி அறவிடல், வரி பிடித்தல் சரிபார்ப்பு, வரிச் சலுகை வழங்கல், தொழில் காப்பீடு, ஓய்வூதியத் திட்டம், முதியோர் நலன்புரித் திட்டம், வட்டி வருமானம் அல்லது முதலீட்டு வருமானத்தைக் கணிப்பிடுதல் உள்ளிட்ட 12 அடையாளங்களைப் பேணுவதற்குப் பயன்படுத்தப்படுகின்றது. கனடாவின் கொள்கைகள் மற்றும் சட்டங்கள் சமூகக் காப்புறுதி எண்ணின் பயன்பாட்டைப் பாதுகாப்பதில் முக்கிய பங்காற்றுகின்றன. சட்ட அடிப்படையில் தேவைப்படாதபொழுது ஒரு தனியார் துறை நிறுவனம் சமூகக் காப்புறுதி எண்ணை வழங்குமாறு ஒருவரைக் கட்டாயப்படுத்த முடியாது.

ஐக்கிய அமெரிக்காவில் இந்தத் தனிப்பட்ட தரவுப் பாதுகாப்பு எண்ணானது, 'சமூகப் பாதுகாப்பு எண்' - Social Security Number - என அழைக்கப்படுகின்றது. இது அமெரிக்கக் கூட்டாட்சி நிர்வாகத்தில் தனிநபர்களின் நிதி மற்றும் இருப்புப் பற்றிய தகவல்களை அணுகுவதற்கான மிகவும் சக்தி வாய்ந்த ஒற்றை அடையாளங்காட்டி ஆகும். இந்த எண்ணானது ஒருவரின் தனிப்பட்ட வரலாறு, ஊதியப் பதிவுகள், வரி செலுத்துதல்கள், வரித் தாக்கல் நிலை, சரிசெய்த வருமானம், மருத்துவ விபரங்கள் உள்ளிட்ட 11 அடையாளங் களைப் பேணுவதற்குப் பயன்படுத்தப்படுகின்றது.

ஐரோப்பிய ஒன்றியத்தில் இந்தத் தனிப்பட்ட தரவுப் பாதுகாப்பு எண்ணானது, 'பொதுத் தரவுப் பாதுகாப்பு ஒழுங்குமுறை' - General Data Protection Regulation - என அழைக்கப்படுகின்றது. பொதுத் தரவுப் பாதுகாப்பு ஒழுங்குமுறை என்பது ஐரோப்பிய ஒன்றியத்தால் வகுக்கப் பட்ட ஒரு விரிவான சட்டக் கட்டமைப்பாகும். இது ஐரோப்பிய ஒன்றியத்தில் இருக்கும் தனிநபர்களின் தரவைப் பாதுகாப்பதில் கவனம் செலுத்துகிறது. இதன்கீழ் 'தனிநபர் தரவு' என்ற சொல் மிகவும் விரிவான முறையில் வரையறுக்கப்பட்டுள்ளது. ஓர் உயிருள்ள, அடையாளம் காணப்பட்ட அல்லது அடையாளம் காணக்கூடிய தனிநபருடன் தொடர்புடைய எந்தவொரு தகவலையும் இது உள்ளடக்குகின்றது. இந்த எண்ணானது 12 அடையாளங்களைப் பேணுவதற்குப் பயன்படுத்தப் படுகின்றது.

இந்தியாவில் இந்தத் தனிப்பட்ட தரவுப் பாதுகாப்பு எண்ணானது, 'தனிநபர் ஆதார் அடையாள அட்டை எண்' என அழைக்கப்படுகின்றது. 'ஆதார்' என்பது இந்திய தனிநபர் அடையாள ஆணையத்தால் இந்தியாவின் ஒவ்வொரு குடியிருப்பாளருக்கும் வழங்கப்படும் தனித்துவமான, 12 இலக்க அடையாள எண் ஆகும். இது நாட்டின் பொது நலன்புரி விநியோக முறைகளில் இருக்கும் மோசடி மற்றும் போலிப் பதிவுகளைக் குறைப்பதன்மூலம் சேவைகளை நெறிப்படுத்துவதை முதன்மை நோக்கமாகக் கொண்டது. இந்த எண்ணானது ஒருவரது முழுப்பெயர், பிறந்த நாள் அல்லது வயது, பாலினம், முகவரி, மின்னஞ்சல், கைரேகைகள், இரு கருவிழி வருடி, முகப் புகைப்படம் உள்ளிட்ட 9 அடையாளங்களைப் பேணுவதற்குப் பயன்படுத்தப் படுகின்றது. இது, குடிமக்கள் பாதுகாப்பாக எடுத்துச் செல்லக் கூடியது. நாடு முழுவதிலும் உலகளாவிய அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட எண்மிய அடையாளத்தை இது வழங்குகின்றது.

இந்திய தனித்துவ அடையாள ஆணையத்தின் அடிப்படைச் செயற்பாடு, ஒரு தனிநபரைக் கண்டறிய அதிகபட்ச தரவைச் சேகரிப்பதாகும். இருப்பினும், பரிவர்த்தனை நடைபெறும் பொழுது, அங்கீகாரம்கோரும் நிறுவனத்திற்கு மிகக் குறைந்தபட்சத் தரவுகளை மட்டுமே அனுப்புவது அல்லது வெறும் 'ஆம்/இல்லை' என்ற பதிலை மட்டும் வழங்குவது என்ற அடிப்படைக் கொள்கையின்மீது 'ஆதார்' கட்டமைப்பு நிறுவப்பட்டுள்ளது. 'ஆதார்' எண்ணானது தனிநபர் உயிர் அளவியல் தரவுகளுடன் இணைக்கப்பட்டுள்ளதால், போலி அடையாளங்கள் மற்றும் பிரதிகளைக் கண்டறிவதன்மூலம் கசிவுகள் மற்றும் மோசடிகளைத் தவிர்க்க முடியும். மேலும், இந்தியாவின் எந்தப் பகுதியிலிருந்தும் சேவைகளை வழங்கும் நிறுவனங்கள் மத்திய தரவுத் தளத்தைத் தொடர்புகொண்டு பயனாளியின் அடையாளத்தை உறுதிப்படுத்த முடியும். 'ஆதார்' எண்ணானது தனிநபர்களைச் சாதி, மதம், வருமானம், ஆரோக்கியம் அல்லது

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

புவியியல் அடிப்படையில் சுயவிபரப் படுத்துவதில்லை. இது எந்தவிதமான உளவுத் தகவல்களையும் கொண்டிருக்கவில்லை. இதன் கட்டமைப்பு ஒரு மூலோபாய நிருவாகத்தைச் செயற்படுத்துகின்றது.

அனைத்து மக்கள் தொகை மற்றும் உயிர் அளவியல் தரவுகளையும் ஒரே இடத்தில் அதிக பாதுகாப்புடன் குறியாக்கம் செய்யப்பட்ட களஞ்சியத்தில் மையப்படுத்துவதன் மூலம், இந்திய தனித்துவ அடையாள ஆணையமானது முக்கிய தரவுகளை வைத்திருக்கும் நிறுவனங்களின் எண்ணிக்கையைக் குறைப்பதன்மூலம் பாதுகாப்பை அதிகப்படுத்துகின்றது. இதன் விளைவாக 'ஆதார் சட்டம்' மைப்படுத்தப்பட்ட ஒரு நிறுவனத்தின்மீது கடுமையான கட்டுப்பாடுகளைச் செயற் படுத்துவது எளிதாக உள்ளது. இது பரிவர்த்தனையின்பொழுது மூலத் தரவின் வெளிப்பாட்டைக் குறைப்பதற்கான ஒரு தெளிவான வடிவமைப்புத் தேர்வாகும்.

இந்த நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம், இலங்கையில் பாதுகாப்பான, பொறுப்புக்கூறல் மற்றும் புதுமைகளுக்கு ஏற்ற எண்மிய சூழல் அமைப்பை உருவாக்கு வதற்கான குறிப்பிடத்தக்க ஒரு படியாகும். தனியுரிமைகள், தேசிய நலன்கள் மற்றும் பொருளாதார வாய்ப்புகள் ஆகியவற்றுக்கிடையேயான சமநிலையைக் கருத்திற்கொண்டு, குடிமக்கள் பாதுகாப்பு மற்றும் எண்மிய முன்னேற்றம் இரண்டையும் நிலைநிறுத்துவதை உறுதிசெய்யும் வகையில் இறுதிச் சட்டம் அமைய வேண்டும். நான் ஏற்கனவே குறிப்பிட்டவாறு கனடா, ஐக்கிய அமெரிக்கா, ஐரோப்பிய ஒன்றியம், இந்தியா ஆகிய நாடுகளில் பின்பற்றப்படும் தனிநபர் தரவுப் பாதுகாப்பு ஒழுங்குகளை ஆய்வுசெய்து, அவற்றில் உள்ள நல்ல கூறுகளை உள்வாங்கி, இந்த நாட்டின் தனிப்பட்ட தரவுகளைச் சேர்க்கவும், அவற்றைப் பேணிக் காக்கவும் ஆவன செய்ய வேண்டுமெனக்கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.26]

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙනෙන නියෝගවලට අදාළව අද දවසේ සිදු කෙරෙන මේ විවාදයට සම්බන්ධ වී මේ මොහොතේ අදහස් ඉදිරිපත් කරන්නට ලැබීම සතුටට කරුණක්.

මගේ අදහස් ඉදිරිපත් කිරීමට පෙර මා කැමැතියි වෙනත් කාරණාවක් ගැන කියන්න. විශේෂයෙන් විපක්ෂය පැත්තෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා තම අදහස් දැක්වීමේදී සඳහන් කළා, රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් එතුමන්ලා පුදුමයට පත් වෙනවා කියලා. ඒ යටතේ එතුමන්ලා කියපු කාරණා කිහිපයක් තිබෙනවා. පොරොත්තු ලේඛන දිග්ගැස්වීමක් තිබෙනවා, පොරොත්තු ලේඛනවල රෝගීන් ඉන්නවා, ඒ වාගේම රෝගීන් සංඛ්‍යාව අධිකයි, සමහර රෝගීන් බිම නිදාගෙන ඉන්නවා, රෝගීන් අසරණයි කියලා කිව්වා; ඒ ගැන පුදුමයට පත් වෙනවා කිව්වා. එතුමන්ලා නඟපු ඒ තර්ක සම්බන්ධයෙන් මට දැනුණු දෙයක් තිබෙනවා. අපට මේක අසාමාන්‍ය දෙයක් නොවෙයි. මොකද, මහ පොළොවේ හිටපු මිනිසුන් විධියට අපි දන්නවා, මෙහෙම ඇත්ත තත්ත්වයක් තිබෙන බව. රෝගීන් අසරණයි, රෝගීන්ට ඉන්න හරියාකාර තැනක් නැහැ, නේවාසික පහසුකම්වල ගැටලු තිබෙනවා, රෝගීන් පොරොත්තු ලේඛනවල ඉන්නවා, හෘදය රෝගියෙකු ආවොත් එම රෝගියාට operation එක කර ගන්න ඊළඟ අවුරුද්ද වනකල් ඉන්න සිදු වෙනවා කියන කාරණා අපි දන්නවා. එවැනි තත්ත්වයක් මේ භූමිය මත තිබෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ කාරණය අලුතින් දැනගෙන, පුදුමයට පත් වෙනවා කියන තත්ත්වය තුළම තිබෙනවා, ඒ මන්ත්‍රීතුමන්ලා මහ පොළොවෙන් කොච්චර ඈතක ජීවත් වුණාද කියලා. ඒකෙන් කියැවෙන්නේ ඒකයි. "මේ ගැන දන්නේ නැහැ, මේ ගැන පුදුමයි" කියන්නේ ඒකයි. පුදුම වෙන්න දෙයක් නැහැ. සාමාන්‍යයෙන් ඕනෑම රෝහලකට ගිහිල්ලා බැලුවොත් මේ කියන බරපතළ තත්ත්වය පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා රටේ පාලකයන් විධියට අප හැමෝටම බරපතළ වගකීමක් පැවරෙනවා. ඒ වෙන මොකවත් නිසා නොවෙයි. එවැනි පීඩා විඳින අහිංසක මිනිසුන්ගේ, බෙහෙත් පෙත්තක් ගන්න නැතුව ඉන්න මිනිසුන්ගේ, හිසට වහලක් නැතිව ඉන්න මිනිසුන්ගේ, තමන්ගේ මූලික අවශ්‍යතා, තමන්ගේ මූලික සනීපාරක්ෂක පහසුකම් සපුරාගන්න බැරුව ඉන්න මිනිසුන්ගේ ජීවිත වඩා ඉහළ තැනකට ගෙනෙන්න අපට සාමූහික වගකීමක් තිබෙනවා.

ඒ නිසා ඒ සම්බන්ධවත් කරුණු ඉදිරිපත් කරමින් මා සඳහන් කරන්න කැමැතියි, විශේෂයෙන්ම ජනතාව එම තත්ත්වයෙන් ඉහළට ඔසවන්නට, රටේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ තැනකට ගෙන එන්නට ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අප දුන් පොරොන්දු අනුව යමින් මේ රටේ ගරු ජනාධිපතිතුමා, ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු සමස්තය උත්සාහ කරමින් සිටින බව. ඒ අනුව ප්‍රාථමික සත්කාර ඒකක පිහිටුවීම, වතු සෞඛ්‍ය සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය සේවය ඇතුළු දේශීය වෛද්‍ය සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම විතරක් නොවෙයි, සාමාන්‍ය රෝහල්වල තිබෙන සත්කාර පහසුකම් ඇතුළු සමස්ත සෞඛ්‍ය සේවයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම උදෙසා රජය විධියට අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වෙනුවෙන් කරන එක් කටයුත්තක් විධියට තමයි අද දවසේ 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වන නියෝග ඉදිරිපත් කරනු ලබන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම ලංකාවට ඖෂධ ගෙන්වීම, මිල දී ගැනීම, බෙදා හැරීම, ලබා දීම විතරක් නොවෙයි, ඖෂධ ලබා දීමෙන් පසුව ඇති වන සංකූලතා පිළිබඳව නියාමනය කිරීමේ වගකීමත් ජාතික ඖෂධ නියාමන අධිකාරියට - NMRA එකට - පැවරෙන බව අපි දන්නවා.

ඒ අනුව ඖෂධවල මිල සාධාරණව පවත්වාගෙන යෑම විතරක් නොවෙයි, ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සම්බන්ධවත් නියාමන භූමිකාවක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට - NMRA එකට - පැවරෙනවා. මිනිසුන්ගේ ජීවිතවලට වග කියන, මිනිසුන්ගේ ජීවිතවල අනාගතය තීරණය වන, තමන්ගේ රෝගී තත්ත්වයට තමන් ලබා ගන්නා ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳව තහවුරුවක් කෙරෙන බරපතළ වගකීමක් NMRA එකට පැවරෙනවා. ඒ අනුව තමයි අපේ ගරු ඇමතිතුමා කියපු විධියට MRP - Maximum Retail Price - එකයි MCP එකයි තීරණය කරන්නේ කොහොමද කියන කාරණා දෙකටම අදාළ කාරණා මේ Regulationsවල අන්තර්ගත කරලා තිබෙන්නේ.

අපි අතීතයට ගිහින් බලමු, NMRA එක කොහොමද ඒක use කළේ, කොහොමද ඒක භාවිතයට ගත්තේ කියලා. පසුගිය දවසක COPE එකට ආපු වාර්තාවක සඳහන් වෙනවා, NMRA එක එය භාවිත කරලා තිබෙන ආකාරය පිළිබඳව. COPE එකට ආපු එම වාර්තාවේ එකී කාරණාවේ මෙන්න මෙහෙම සඳහන්ව තිබෙනවා:

"COPE discloses that the NMRA's Waiver of Registration - WOR - has been issued through a special procedure without formal committee approval."

අනුමැතියක් ලබා ගන්නේ නැතුව ඖෂධ මිල දී ගැනීම ගැන විතරක් නොවෙයි, ඖෂධ ගෙන ඒම සඳහා කූඨ ලේඛන හදලා, ව්‍යාජ ලිපිලේඛන හදලා, හොරකමින් යුක්තව කටයුතු කරපු ආකාරය පිළිබඳවත් මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ සමහර තීන්දු තීරණ ගත්තු විධිය ගැන මෙහි මෙන්න මේ ආකාරයෙන් වැඩිදුරටත් සඳහන් කරනවා:

"It was further disclosed that the Chief Executive Officer who held office in 2022 was involved in this special mechanism and that approval for the bulk purchase of medicines was sought during a dinner event held at a prominent hotel in Colombo."

කොළඹ හෝටලයකදී තමයි තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ. NMRA එක හරහා human immunoglobulin කියන ඖෂධය ගෙන ඒම සඳහා තීන්දු තීරණ ගන්නේ අන්න ඒ වාගේ තැනක ඉඳලායි. මේක ලංකාවේ සිදුවෙච්ච අතිශයින්ම දූෂිත ගනුදෙනුවක් කියලා මෙහි සඳහන් කරලා තිබෙනවා. සෞඛ්‍යයට අදාළව ගත්තොත්, මිනිස්සුන්ගේ ජීවිතය, මරණය තීරණය වන තැන්වලදී ඉතාම critical විධියට, බරපතළ විධියට, මිනිස්සුන්ගේ ජීවිතවලට සෘණාත්මක බලපෑමක් ඇති වෙන විධියට NMRA එක හරහා තීන්දු තීරණ අරගෙන තිබුණා. මේ ඖෂධ නියාමන අධිකාරිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඖෂධ මිලදී ගැනීමේ ඉඳලා සමස්ත ක්‍රියාවලිය තුළම ඔවුන්ට බලතල ලබා දීලා, ස්වාධීන ආයතනයක් විධියට නඟා සිටුවන්න තමයි මේකේ තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අප්‍රේල් මාසයේදී WHO එකෙන් ඉදිරිපත් කළ Report එකක සඳහන් වෙනවා, - මේක ඒගොල්ලන්ගේ official web page එකෙත් තිබෙනවා - "ලංකාවේ NMRA එක ශක්තිමත් කිරීම සඳහා වර්තමාන ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ග පැසසුමට ලක් කරනවා" කියලා. ඒකේ ශීර්ෂ පාඨයක මෙසේ සඳහන් කර තිබෙනවා:

"Landmark initiative to strengthen integrity in medicine regulation: Sri Lanka takes the lead with support from WHO and UNODC"

එහි තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:

"This marked a significant step towards ensuring transparency, accountability, and integrity within the pharmaceutical regulatory sector."

ඖෂධ නියාමන අධිකාරිය තුළ විනිවිදභාවය - transparency, වගවීම සහ එහි තිබෙන integrity එක ආරක්ෂා කිරීම සඳහා වර්තමාන රජය විසින් ගන්නා ලද තීන්දු තීරණ මෙහිදී පැසසුමට ලක් කරලා තිබෙනවා. එම වාර්තාවේ අවසානයේ, Ms. Saima Wazed, Regional Director, WHO South-East Asia විසින් මෙසේ සඳහන් කර තිබෙනවා:

"Sri Lanka has recently made excellent progress towards strengthening its regulatory system, including medical devices, with the full engagement of the Government of Sri Lanka. This is evident in the excellent decision of NMRA to organize the first assisted self-assessment of the risk of corruption, ..."

ඒ වාගේම, ඖෂධ මිලදී ගැනීමේදී සිදුවන corruption අඩු කිරීම සඳහා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳවත් මෙහි සඳහන් කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම වාර්තාවේ තවත් කාරණාවක් මෙසේ සඳහන් කරනවා:

" 'There is no doubt that this will serve as inspiration not just in our South-East Asia region, but beyond as well.' "

අග්නිදිග ආසියාවට විතරක් නොවෙයි, ඉන් ඔබ්බටත් මේක හොඳ ආදර්ශයක් කියලා සඳහන් කරලා තිබෙනවා.

" 'I am pleased that UNODC and WHO are partners in this.' "

So, that is the process of the NMRA.

අපි ආණ්ඩුවක් විධියට මේක බලාත්මක කරන්න කටයුතු කරමින් සිටිනවා. මේ රටේ පැනඩෝල් පෙත්තක් ගන්න බැරිව දුක් විඳින අහිංසක මිනිස්සුන්ගේ ජීවිත සෞඛ්‍ය සම්පන්න කරන්න විතරක් නොවෙයි, ඒ මිනිස්සුන්ගේ ජීවිතවලට අවශ්‍ය කරන ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහාත් ජාතික ජන බලවේග ආණ්ඩුව මේ තිබෙන නියාමනයන් - regulations, මේ තිබෙන අධිකාරීන් ශක්ති සම්පන්න කරලා, ස්වාධීන කරලා අවශ්‍ය සේවාවන් ගුණාත්මකව සපයන්න අවශ්‍ය කරන මැදිහත් වීම කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
(மாண்புமிகு வசந்த புஷ்ப குமார)
(The Hon. Wasantha Pushpa Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂ දවසක්. ඒකට හේතුව, අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතට යම් සංශෝධනයක් එකතු කරනවා. මේක විශේෂයෙන්ම අපට වැදගත් වන්නේ, මේ තීන්දුව නිසා ජනතාවාදී රජයක් වෙච්ච අපට ජනතාවට වැඩි සේවාවක් සලසන්න අවස්ථාවක් ලැබෙන නිසායි.

අපි බොහෝ දෙනෙකු උපන්දා ඉඳලාම බලාගෙන හිටියා, මේ සමාජය වඩා හොඳ සමාජයක් බවට පරිවර්තනය වෙනකම්. මේ සමාජය වඩා හොඳ සමාජයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවුරුදු 76ක් තිස්සේ අපේ සමාජය විසින් මේ ගරු පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයින් පත් කරලා එව්වා. හැබැයි, අපි ඒ නියෝජිතයින් පත් කරලා එව්වේ, ජනතාව

[ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා]

වෙනුවෙන් යම් නියෝජනයක් කරලා ජනතාවට වඩා සුබවාදී නීති, අණ පනත් සම්පාදනය කිරීමේ අදහසින්. නමුත් වසර 76ක් තිස්සේ බලයට පැමිණි සියලුම පාලකයන්; මහජන නියෝජිතයන්ගේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුවට පැමිණි පිරිස බොහෝ වෙලාවට ජනතාව පාලනය කරන තැනකට තමයි අවසානයේ පත් වුණේ. ඒකේ ප්‍රතිඵලයක් විධියට දේශපාලන අධිකාරිය හැමවිටම තමන්ට, නැත්නම් බලධාරින්ට වැඩි වරප්‍රසාද ලබාගෙන, ජනතාවට අඩු වරප්‍රසාද ප්‍රමාණයක් ලබා දෙන තැනට තමයි හැම වෙලාවේම මේ සමාජය හසුරවමින් හිටියේ.

ඒ අය මොන තරම් වරප්‍රසාද භුක්ති වින්දාද කියනවා නම්, අපේ රටේ හිටපු පරණ පාලකයෝ තමන්ට උණක්, කැස්සක්, හෙම්බිරිස්සාවක් හැදුණත් ඒකට බෙහෙත් ගන්න ගියේත් අපේ අසල්වැසි රටකට. එහෙම නැත්නම් සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් රෝහලට. හැබැයි, ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් ටිකවත් ලබා දෙන්න ඒ පාලකයෝ සමත් වුණේ නැහැ. මේකට තව හොඳ උදාහරණයක් තිබෙනවා. මේ පිරිස මේ සැප සම්පත් ටික, එහෙම නැත්නම් මේ වරප්‍රසාද ටික ගත්තෙත් අපේ බදු මුදල් පාවිච්චි කරමින්. ඒකට උදාහරණය තමයි පසුගිය පාලකයන් විසින් ජනාධිපති අරමුදලෙන් කොච්චර මුදල් ප්‍රමාණයක් අවභාවිත කරලා තිබෙනවාද කියන එක. පාලකයන්ට විතරක් නොවෙයි එතුමන්ලාගේ පවුලේ උදවියටත්, ඥාතීන්ටත්, හිතවතුන්ටත් මිලියන ගණන් මුදල් අවභාවිත කර තිබෙනවා. ජනාධිපති අරමුදලේ තිබෙන පොදු ජනතාවගේ යහපත සඳහා යොදා ගන්න තිබුණු මුදල් ඒ කට්ටියගේ සුබවිහරණය සඳහා යොදා ගත් ආකාරය අපි දැක්කා. අඩුම තරමින් ජනතාවට මේ මුදල් පහසුවෙන් ලබා ගන්න පුළුවන් ක්‍රමයක්වත් ඇති කරන්න මේ කට්ටියට හැකියාවක් තිබුණේ නැහැ. හැබැයි අපට; ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට; එහෙම නැත්නම් අපේ ජනතාවාදී ආණ්ඩුවට පුළුවන් වුණා, ජනතාවට ජනාධිපති අරමුදල වඩා පහසුවෙන් භාවිත කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වාම මේ කාර්යයන් ඉතා පහසු කරමින් ජනතාවට මේ සුබසාධන පහසුකම් ලබා දෙන්න පුළුවන් ක්‍රමයක් ස්ථාපනය කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

මෙන්න මේ කාරණාත් එක්ක තමයි අපේ රටේ ජනතාව පසුගිය කාලයේ පැවතුණු ඡන්ද ගණනාවකදීම system change එකක් වෙනුවෙන් පෙළ ගැසුණේ. අපේ රටේ ජනතාව system change එකක් වෙනුවෙන් පෙළ ගැසිලා පසුගිය කාලයේ පැවතුණු ඡන්ද ගණනාවකදීම අපේ රටේ හිටපු පාලකයන් වෙනුවට ඇත්ත ජනතා නියෝජිතයන්, එහෙම නැත්නම් සැබෑ ජනතා නියෝජිතයන් පත් කර ගත්තා. එහි ප්‍රතිඵලයක් විධියට අපට - ජාතික ජන බලවේගයට- ඉතාම හොඳ, ජනතාවාදී ආණ්ඩුවක් හදා ගන්න පුළුවන් වුණා. එහෙම නම් මේ හදා ගත්ත ජනතාවාදී ආණ්ඩුවේ මූලික අරමුණ වෙන්න ඕනෑ, පාලකයන් වෙනුවෙන් තීරණ නොගෙන, පාලකයන්ට තිබෙන වරදාන, වරප්‍රසාද යම් ප්‍රමාණයකින් අඩු කරමින් ජනතාවට අවශ්‍ය වරදාන, වරප්‍රසාද ලබා දෙන එක. එතකොට අද කථා කරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ සිදු කරන සංශෝධනය අපට ඉතාම වැදගත් වෙනවා. හේතුව තමයි 2025 ජූලි 21වන දින අංක 2446/34 ගැසට් පත්‍රයේ සඳහන් පරිදි උපරිම සිල්ලර මිල - maximum ceiling price - ශ්‍රී ලංකාවට ආනයනය කරන හෝ නිෂ්පාදනය කරන ලද ඕනෑම වෙළඳ නාමයක, නිෂ්පාදනයක මිල තීරණය කිරීමේ අයිතිය, එහෙම නැත්නම් මිල තීරණය කිරීම සඳහා සූත්‍රයක් හැදීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට මේකෙන් බලය ලැබී තිබෙනවා. එහෙම නැත්නම්, අපට මේක පාවිච්චි කරන්න හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා.

මේකත් එක්කම අපට පුළුවන් වෙනවා, අපේ රටට ගෙන්වන ඖෂධ, එහෙම නැත්නම් නිෂ්පාදනය කරන ඖෂධවල එකම කාණ්ඩය - generic name එකක් - යටතේ තිබෙන බොහෝ ඖෂධවලට උපරිම මිල සීමාවක් තීරණය කරන්න. එහෙම නැත්නම් අපට MCP එකක් තීරණය කිරීමේ හැකියාව ලැබෙනවා. MCP එකක් තීරණය කිරීම නිසා වෛද්‍යවරුන් විසින් නිර්දේශය කරන විවිධ brand names යටතේ තිබෙන ඖෂධවලත්, ෆාමසිවලින් විකුණන විවිධ brand names යටතේ තිබෙන ඖෂධවලත් උපරිම මිල සීමාව පාලනය කිරීමේ හැකියාවක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට මේක හරහා ලැබෙනවා. එතකොට මේ තුළින් සිදු වන වාසිය තමයි, ජනතාව මෙච්චර කාලයක් ඉතා විශාල මුදලක් වැය කරලා මිලදී ගත් සමහර ඖෂධ ඉතා පහළ මිලකට ගෙන ඒමේ හැකියාව මේ නියාමන සූත්‍රය හරහා ලැබීම. අපි ජනතාවාදී ආණ්ඩුවක් විධියට අපේ රටේ තිබෙන බොහෝ දේවල්; නීති, අණපනත් වෙනස් කරමින් ජනතාවට සුබසාධනය ගෙනෙන්න, එහෙම නැත්නම් ජනතාවගේ පැත්තට වරප්‍රසාද වැඩි කරන්න කටයුතු කරන මොහොතක්, මේක. මේක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරක් සිදු කරන කටයුත්තක් නොවෙයි. විශේෂයෙන්ම අපි මේ දවස්වල අධ්‍යාපන ක්ෂේත්‍රය, ප්‍රවාහන ක්ෂේත්‍රය වාගේම නීතිය පැත්තෙනුත් බොහෝ දේවල් වෙනස් කරමින්, අලුත් නීති, අණපනත් සම්මත කරමින් අපේ රට මෙහෙයවමින් ඉන්නවා.

අපි හැමෝම දැක්කා, පසුගිය 20වෙනි දා අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්, අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය විවෘත කළ ආකාරය. ඇත්තටම මේ වාගේ තීන්දු තීරණ අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ අපේ රටේ වෙනසක් ඇති කිරීම වෙනුවෙන් ජනතාව අපට ඡන්දය දුන් නිසායි. මේ වාගේ අලුත් නීති, අණ පනත් සම්මත කරලා අපට ජනතාවට විශේෂ වරප්‍රසාද ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම අපේ රටේ නීතිය අවභාවිත කරමින්, අපේ රට වැරදි පාරට යොමු කරමින් හිටපු පිරිසට දඬුවම් දෙන්නත්, ඒ අය රැස් කර ගත් ධනය ආපසු ලබා ගන්නත් අවශ්‍ය ක්‍රමවේද ගණනාවක් සූදානම් කරන්න මේ ජනතාවාදී ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙනවා.

මේ වෙලාවේ මේ ජනතාවාදී ආණ්ඩුවේ අරමුණ වෙන්න ඕනෑ, පසුගිය පාලකයන් කරපු වැරදි සියල්ල නිවැරදි කර ගනිමින්, රට යළි හොඳ මඟට ගනිමින් මේ රට ඉතා හොඳ දිශානතියකට අරගෙන යන එකයි. එය තමයි අපේ වගකීම වෙන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.42]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වූ නියෝග පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කරනවා. මේ වෙලාව, රජයේ රෝහල්වල සිටින රෝගීන් තමන්ට අවශ්‍ය ඖෂධවල

හිඟතාව නිසා දැඩි දුෂ්කරතාවකට පත් වෙච්ච වෙලාවක්. මේ වන විටත් රෝහල්වල ඖෂධ 61ක හිඟයක් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධ හිඟ නම්, ඖෂධ නැත්නම් ෆාමසියෙන් ඖෂධ ගන්න කියලා යෝජනා කරන ඇමතිවරයෙක් සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව වග කියන මේ මොහොතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙන එන නියෝග පාර්ලිමේන්තුවේ විවාද කිරීම ඉතාම කාලෝචිත, ඉතාම වැදගත් කටයුත්තක් විධියට අපි දකිනවා කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ මූලික අවශ්‍යතාවක් වන සෞඛ්‍ය කියන්නේ, මේ රටේ මිනිසුන්ගේ බදු මුදලින් නඩත්තු වන රජයේ සුබසාධන කාර්යයක්. ඒ සුබසාධන කාර්යය තුළ පවතින මේ ඖෂධ හිඟය නිසා, රෝහල්වලට අවශ්‍ය උපකරණ හිඟය නිසා රෝගීන් දැඩි අසරණතාවකට, ගැටලු රාශියකට මේ වෙලාවේ මුහුණ පා තිබෙනවා. ඒ වාගේම රෝහල්වලට අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු ඒ අනෙකුත් කාර්ය මණ්ඩලවල හිඟතාව නිසාත් මේ මොහොතේ රෝගීන් ගැටලුවකට මුහුණපානවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හෘදය සැත්කමක් වෙන්න පුළුවන්, වකුගඩු සැත්කමක් වෙන්න පුළුවන්, අක්ෂි කාච බද්ධයක් වෙන්න පුළුවන්, වෙනත් කටයුත්තක්, පරීක්ෂණයක්, වෙනත් සැත්කමක් වෙනුවෙන් දීර්ඝ කාලයක් මේ අසරණ රෝගීන්ට බලාගෙන ඉන්න සිදු වෙලා තිබෙනවා. ඒ සඳහා දීර්ඝ පොරොත්තු ලේඛන තිබීම නිසා ජනතාව තමන්ගේ අසරණභාවය මත ගෙවල් දොරවල් උගසට තියලා පෞද්ගලික අංශයේ රෝහල් හරහා ඒ කටයුතු කර ගැනීම නිසා සමාජය ගැටලු රාශියකට මේ වෙලාවේ මුහුණ පා තිබෙනවා.

ඊළඟට, බාහිර රෝගී අංශ ගත්තොත්, විශේෂයෙන්ම මා නියෝජනය කරන කරාපිටිය ප්‍රදේශයේ තිබෙන කරාපිටිය රෝහලේ බාහිර රෝගී අංශය තුළ අද වන විට විශාල තදබදයක් පවතිනවා. මොකද, ඒ රෝගීන්ට අවශ්‍ය තරම් ධාරිතාවක් රෝහල තුළ නොමැතිවීම නිසා විශාල ගැටලු රාශියක් මේ වෙලාවේ ඇති වෙලා තිබෙනවා. මේ වෙලාව, එවැනි තත්ත්වයකට සෞඛ්‍ය ක්ෂේත්‍රය පත් වෙච්ච වෙලාවක්. නමුත් අද දවසේ මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට වග කියන රජයේ ඇමතිවරයා එදා විපක්ෂයේ ඉන්නකොට මේ කටයුතු පිළිබඳව හඬක් නැඟුවා. එතුමා වෘත්තීය සමිති නායකයෙකු විධියට, සටනක් විධියට, ඔවුන්ගේ සටන්පාඨ විධියට මම මේ කියන කරුණු ඉදිරිපත් කළා. හැබැයි, වෘත්තීය සමිති නායකයෙකු විධියට, මේ ගැටලු අවබෝධ කර ගත්, මේ විෂය ගැන දන්නා ඇමතිවරයෙකු විධියට එතුමා මේ ආණ්ඩුව තුළ යම් සුබවාදී ගමනක් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ගෙනයාවි කියලා අපි විශ්වාස කළා. නමුත් තවම අපට ඒ දිශානතිය දකින්න ලැබෙන්නේ නැහැ කියන කාරණයත් මා මේ මොහොතේ සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ අවධියේ මේ රට තුළ නිෂ්පාදනය කළේ මේ රටට අවශ්‍ය ඖෂධවලින් සියයට 16ක් පමණයි කියන එක. නමුත් එතුමාගේ කාලයේදී එතුමා ඒ ප්‍රමාණය සියයට 25 දක්වා වර්ධනය කළා. ඒ විතරක් නොවෙයි. එතුමා එදා ඔයාමඩුව ප්‍රදේශයේ ඉදි කරපු "සුව සිරිපුර" ඖෂධ නිෂ්පාදන ගම්මානයත් මේ පද්ධතියට එකතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එකතු කිරීම තුළින් එතුමා බලාපොරොත්තු වුණා, මේ රටට අවශ්‍ය ඖෂධ 236ක්, ශල්‍ය වෛද්‍ය උපකරණ 44ක් මේ රට තුළ නිෂ්පාදනය කරන්න. මේ ආණ්ඩුව ඒ කටයුත්ත ඉදිරියට ගෙන යනවා කියන කාරණය අපි මේ මොහොතේ දකින්නේ නැහැ. නමුත් අපි විශ්වාස කරනවා, මේ ආණ්ඩුව ඒවා ඉදිරියට ගෙන යයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම ඉතාම කෙටියෙන් කියනවා නම්, අය වැයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා, SPC ආයතනයේ කාර්යයන් ඩිජිටල්කරණය සඳහා මුදල් වෙන් වුණත්, තවම ඒ කටයුතු සිදු වනවා කියන කාරණය අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ඖෂධ සැපයුම් හා වෛද්‍ය සැපයුම් සහතික කිරීමටත් අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කළා. ගුණාත්මක ඖෂධ වෙනුවෙන් ඒ ප්‍රතිපාදන වැය කරන ආකාරය නම් අපට තවම දකින්න ලැබෙන්නේ නැහැ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ගැටලු රාශියක් සෞඛ්‍ය පද්ධතිය තුළ තිබෙන වෙලාවේ මෙවැනි නියෝග ගෙන ඒම තුළින් මේ රටේ ජනතාවට අවශ්‍ය සුවදායී දිශානතිය කරා සෞඛ්‍ය ක්ෂේත්‍රය ගෙන යයි කියලා අපි සුබවාදීව බලා ඉන්නවා.

මේ මොහොතේ පවතින තවත් ගැටලුවක් පිළිබඳ කරුණු සභාව හමුවේ තබන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුල්මුඩේ ඛනිජ වැලි සමාගමට බඳවා ගත් අනියම් කම්කරුවන්ට වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් වන ගැටලුව මා විසින් මීට මාස කිහිපයකට පෙර මේ පාර්ලිමේන්තුවේදී විෂය භාර ඇමතිවරයාට යොමු කළා. ඒ සම්බන්ධව එතුමාගේ ප්‍රකාශයේදී ඉතාම පැහැදිලිව සුබවාදී උත්තරයක් දුන්නා. එතුමා ප්‍රකාශ කළා, මෙම අවුරුද්දේ මාර්තු මාසයේ සිට එම ආයතනය බඳවා ගත් සේවකයන්ට වැටුප් ගෙවීමට කටයුතු කරන බවට. නමුත් දැන් අවුරුදු එකහමාරක් ගතව තිබෙනවා, තවම ඔවුන්ට කිසිදු මුදලක් ගෙවා නැහැ. ඔවුන් තමන්ගේ අතේ සල්ලි වියදම් කරමින් තමයි ඒ රැකියාව කරන්නේ. මේ මොහොත වන විටත් ඔවුන් පුල්මුඩේ ඛනිජ වැලි සමාගමට ඉතා ඉහළ දායකත්වයක් ලබා දෙනවා. අද ඔවුන් උපවාසයක නිරත වෙමින් සිටිනවා. ඒ නිසා මම විශේෂ ඉල්ලීමක් කරනවා, එම කාරණය පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරන්න කියලා. අවුරුදු එකහමාරක් තිස්සේ ඔවුන් නොමිලේ මේ රජයට තමන්ගේ සේවය ලබා දෙනවා. විශේෂයෙන්ම මේ රජය කම්කරුවන්ගේ අයිතීන් දිනා දෙනවා කියලා, කම්කරුවන්ට නායකත්වය දීලා සටන් කරපු රජයක්. ඒ නිසා අපි බලාපොරොත්තු වනවා, අසරණභාවයට පත් වෙච්ච පුල්මුඩේ ඛනිජ වැලි සමාගමේ එම සේවක මහත්ම මහත්මීන්ගේ රැකියා සුරක්ෂිත කර, ඔවුන්ගේ රැකියා ස්ථිර කිරීමේ කටයුතු වෙනුවෙන් ඔබතුමන්ලා අවධානය යොමු කරයි කියලා. ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න කියන කාරණයත් සිහිපත් කරමින්, අද දවසේ ගෙනෙන මේ නියෝග තුළින් අනාගතයේ මේ රටේ සෞඛ්‍ය පද්ධතිය ඉදිරියට ගෙනයන්න හැකියාව ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.48]

ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය රෝහල්වල බෙහෙත් නැති වන විට මුදල් ගෙවා රෝහලෙන් පිට බෙහෙත් මිලදී ගන්නය කියන කාරණාව අපේ සෞඛ්‍ය ඇමතිතුමා කිසිම

[ගරු මුනීර් මුලාෆර් මහතා]

අවස්ථාවක සඳහන් කළේ නැහැ. වගකීමක් සහිත ජනතා රජයක් ලෙස, ජනතාවගේ හෘදය සාක්ෂිය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන, පීඩා විඳින ජනතාව පිළිබඳ අවබෝධයක් තිබෙන රජයක් ලෙස ප්‍රාදේශීය රෝහල්වල එවැනි බෙහෙත් හිඟයක් ඇති වන විට රජය විසින් මුදල් වෙන් කර ඒ බෙහෙත් ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා තිබෙනවා. විශේෂයෙන් අපේ රජය ඒ සඳහා සියලු සැලසුම් සකසා තිබෙන වග පැහැදිලිව මම කියන්න කැමැතියි.

අපට මතකයි, අද සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ජනතාව පීඩාවට පත් වෙනවාය, මේ රජය යටතේ ජනතාව අද විශාල සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දෙනවාය කියන ඒ දේශපාලන පක්ෂය නියෝජනය කරන අය එදා ආණ්ඩුවේ සිටිමින් කටයුතු කළ ආකාරය. ඒ බෙහෙත් එකේ නම කියන්නත් අමාරුයි. එහෙම නේද? බෙහෙත් වෙනුවට වතුර ගෙනැල්ලා දීපු ඒ සෞඛ්‍ය ඇමතිවරයාට පක්ෂව පාර්ලිමේන්තුවේ ඡන්ද දීලා ඔහුව ආරක්ෂා කරලා, මේ රටේ පීඩා විඳින, වේදනාවට පත් වෙච්ච, සංවේදී වෙච්ච ජනතාවට වස දීපු අය අද මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු පිළිබඳව, මේ රටේ ජනතාව සෞඛ්‍යයෙන් විඳින පීඩාව පිළිබඳව කථා කිරීම මහා විහිළුවක් වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ විතරක් නොවෙයි. අද ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කථා කරන විපක්ෂය තමන්ට සෞඛ්‍ය ගැටලු ඇති වුණාම කවදාවත් මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව විශ්වාසය තැබුවේ නැහැ.

ඒගොල්ලන් විශ්වාස කළේ වෙනත් රටවල තිබෙන සෞඛ්‍ය ක්ෂේත්‍ර, එහෙම නැත්නම් විශේෂයෙන් සිංගප්පූරුවේ තිබෙන මවුන්ට් එලිසබෙත් රෝහල වැනි රෝහල් පිළිබඳවයි. හැබැයි, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය විශ්වසනීයම සෞඛ්‍ය ක්ෂේත්‍රය බවට පත් කරන්න අවශ්‍ය සියලු පියවර ජාතික ජන බලවේග රජයක් ලෙස අපිත්, අපේ මන්ත්‍රීවරුනුත් ගන්නවා කියන කාරණාව අපි කියන්න කැමැතියි. ඒ නිසා අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව කළේ මොනවාද, පසුගිය කාලයේ සෞඛ්‍ය ඇමතිවරු ඒ වෙනුවෙන් මොන වාගේ දේවල්ද කළේ කියන වගත් මේ රටේ හෘදය සාක්ෂියක් තිබෙන සෑම පුරවැසියෙක්ම හොඳින්ම දන්නවා. එදා නීතිය හමුවට රැගෙන ආපු සමහර ඇමතිවරුන්ට අද වෙනකොටත් හිරේ සිටින්න සිදු වෙලා තිබෙන්නේ ඒ අය සෞඛ්‍ය ක්ෂේත්‍රයට කරපු අමිල සේවය නිසා තමයි! ඒකත් අපි තේරුම් ගන්න ඕනෑ.

මම විශේෂයෙන් මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. අපි හැමකෙනාම දන්නවා, ඖෂධ කියන එක මිනිස් ජීවිතය හා බැඳුණු සංවේදීම දෙයක් කියලා. ඒ සංවේදී දෙය පිළිබඳව සංවේදී වෙච්ච ආණ්ඩුවක් ලෙස ඒ කාරණා පිළිබඳව නිතර හිතමින් කාලාන්තරයක් තිස්සේ මේ පියවර ගැනීම සඳහා විවිධ උත්සාහයන් දැරුවත්, මේ වෙලාවේදී ජනතාවට ඒ ඖෂධ සාධාරණ මිලට, ගුණාත්මකව ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න අද දින මේ පනත යටතේ ගෙගෙන නියෝග හරහා අපිට පුළුවන් වෙලා තිබෙනවා. සමහර දේශපාලන නායකයන් මේ ඖෂධ පිළිබඳව කථා කරන විට තමන් එක කාරණාවක් හොඳින්ම මතක් කරගත්තා නම් හොඳයි කියලා මම හිතනවා. රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා, කඩා වැටිලා, ජනතාව කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත් වෙලා, ඔවුන්ට ඖෂධ ලබා ගැනීමට බැරි වනකොට, විශේෂයෙන්ම රුපියලේ අගය බාල්දු වනවිට ඖෂධ මිල වැඩි වීම වැනි පීඩාකාරී තත්ත්වයන් තුළ, අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අර්බුදය ගැන කථා කරන අය ඒ ආණ්ඩුව තුළ හැසිරුණේ කෙසේද කියන එක අපි මතක් කර බලන්න ඕනෑ. අපිට මතකයි, ඒ මොහොතේදීත් Rapid Antigen Test kitsවලින් ගසා කෑවේ කොහොමද කියලා. ජනතාව පීඩාවට පත් වෙලා අමාරුවෙන් හිටපු ඒ වෙලාවේදී ඒකෙනුත් මුදල් හොයන තත්ත්වයකට පත් වෙච්ච ඒ පාලකයෝ තමයි මේ පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය ගැටලු ගැන මතක් කරන්නේ. ජනතාව එහෙම පීඩා විඳින විට තමන්ට හෘදය සාක්ෂියක් තිබෙන්න ඕනෑ, විශේෂයෙන් ඒ වාගේ මොහොතකදීවත් එහෙම දේවල් නොකර ඉන්න. සමහර විට ණයට ලැබිච්ච මුදල්වලින්, විදේශ රටවලින් ණය පහසුකම් යටතේ ලැබිච්ච මුදල්වලින් කොහොමද ගසා කෑවේ කියන එක අපි දැක්කා. බාල බෙහෙත් අරගෙන ඇවිල්ලා ජනතාවගේ ජීවිත උකසට තබා කටයුතු කරපු යුගයක් අපේ රට තුළ තිබුණා.

විශේෂයෙන් අපි මේ පනත් හරහා හැම විටම උත්සාහ කරන්නේ වගකිව යුතු රජයක් ලෙස කටයුතු කරන්නයි. ඒ වාගේම, මේ රටේ ජනතාවගේ හෘදය සාක්ෂිය අපි හොඳින්ම දන්නවා. මේ ආණ්ඩුව හැම විටම ගනු ලබන තීරණ ගත්තාම, එදා ජනාධිපතිතුමා සඳහන් කළා වාගේම මේ රටේ ජනතාව පීඩාවට පත් කරන කිසිම තීන්දුවක් හෝ පනතක් අපි ගෙනෙන්නේ නැහැ. විශේෂයෙන් ජනතාවගේ සුව පහසුව වෙනුවෙන්, ඔවුන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් හැම විටම ඔවුන් ගැන හිතමින් ඒ සඳහා අවශ්‍ය පනත් තමයි අපි ගෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් දෙයක් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මම ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය ඇමතිවරයා ලෙස අවුරුද්දක් විතර කටයුතු කළා. එසේ කටයුතු කළ කාලය තුළ මා පිළිබඳව නොතිබුණු බොහෝ චෝදනා, කරුණු කාරණා මා ආගමික හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස වැඩ භාර ගත්තාට පසුව කියන්න පටන් ගත්තා. මම කියන්න කැමතියි, අපි ඇති තරම් ලේ හලා තිබෙන රටක් බව. අපි ඇති තරම් ගහ මරාගෙන තිබෙනවා. මා හිතන විධියට, මේ රටේ ඉන්න සියලු පුරවැසියන්ට සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජාති භේදයකින් තොරව, ආගමික භේදයකින් තොරව විශේෂයෙන් වුවමනා වෙලා තිබෙන දේ තමයි සාමය.

සාමය අපි හැම කෙනාටම අවශ්‍යයි. අපි දන්නවා, ශ්‍රේෂ්ඨ බෞද්ධ දර්ශනය තුළත් තිබෙන්නේ "වෛරයෙන් වෛරය නොසන්සිඳේ" කියන එක බව. විශේෂයෙන් සමහරු නඟන ප්‍රශ්නවලට උත්තර දීම තුළින් මම හිතන විධියට තව තවත් මේ රට තුළ වෛරය ඇති කළ යුතු නැහැ. ඒ නිසා විශේෂයෙන් අපි සත්‍යවාදීව මේ දේශපාලනය තුළ යෙදෙන්න ඕනෑ කියා මම හිතනවා. අපි ආගමික නායකයන් ලෙසත්, දේශපාලන නායකයන් ලෙසත්, ශ්‍රී ලාංකිකයන් ලෙසත් හැම දෙනාම හැම විටම උත්සාහ දැරිය යුත්තේ ජනතාවගේ මනස සුවපත් කරන්න මිසක් එය අවුළුවන්නවත්, ගිනි තියන්නවත්, නැති කරන්නවත් නොවන වග පැහැදිලිව මම කියන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම මේ කාරණයත් මතක් කරන්න කැමතියි. 2013, 2014 කාලයේදී අලුත්ගම ගිනි ගන්නකොටත්, දිගන ගිනි ගන්නකොටත්, ඒ වාගේම රටේ විවිධ තැන් ගිනි ගන්නකොටත්, එදා ඒ දේශපාලනය හැම දාමත් ජනතාව අතර බෙදීම් ඇති කරන්න සහ ජනතාව අතර භේද භින්න ඇති කරන්න කටයුතු කරනකොටත්, ජාතික ජන බලවේගය ලෙස අපි වේදිකාගත වෙලා මේ රටේ ආදරණීය මිනිස්සුන්ට ලබා දුන්නේ, "අපි මිනිස්සු" කියන පණිවුඩයයි. "අපි මිනිස්සු" කියන පණිවුඩය අප හැම තැනකටම අරගෙන ගියා. අපිට විවිධ ධර්මයන් තුළ පවතින්න පුළුවන්. අපිට විවිධ දර්ශන පවතින්න පුළුවන්. ගිනි තියන එක බොහොම පහසුයි. හැබැයි, මනස සුවපත් කරන එක, නිවන එක ලෙහෙසි දෙයක් නොවෙයි. ඒ නිසා අපි අවුරුද්දක් තුළ ඒ ජාතිවාදය පරාජය කර තිබෙනවා. අපි සියලුදෙනාට ආරාධනා කරනවා, ඒ ජාතිවාදය පරද්දලා, රට තුළ සාමය ගොඩනඟලා, මේ රටේ සංවර්ධනය වෙනුවෙන් අපි හැම කෙනාම එකතු වෙලා වැඩ කරමු කියලා.

අද මේ පනත යටතේ ගෙනෙන නියෝග මේ රටේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට, පීඩා විඳින පුරවැසියන්ට සහනයක් රැගෙන එන විශේෂ නියෝග බව මට කියන්න පුළුවන්. හැම විටම ඒ සියලුදෙනාටම සතුටෙන් ජීවත් වෙන්න පුළුවන්, පහසුවෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් අපි හදමු, ඒ වෙනුවෙන් එකතු වෙමු කියලා ආරාධනා කරමින්, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද ලලිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

ගරු චමින්ද ලලිත් කුමාර මහතා
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ගැන කථා කරන වෙලාවේ විවිධ සාකච්ඡා හා අදහස් මේ සභාවේ ඉදිරිපත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්නයක් වෙච්ච සෞඛ්‍ය ක්ෂේත්‍රය නංවාලීම පිළිබඳව රජයට තිබෙන ඒ වුවමනාව මුදුන්පත් කර ගනිමින් අද ගරු සෞඛ්‍ය ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රමුඛ මේ රජය, අපේ ගරු ජනාධිපතිතුමා යන ගමන ඔස්සේ අවශ්‍ය සියලු අවශ්‍යතා සම්පූර්ණ කරමින් ඉන්නවා. ඒ අතරේ නෛතික වශයෙන් අපිට තිබෙන අවස්ථා මේ ජනතාව දීපු බලයෙන් ඉෂ්ට කරන එක් අවස්ථාවක් තමයි, මේ අවස්ථාව. ඉතින් මේ වෙලාවේදී මේ පනත යටතේ මෙම නියෝග ගෙන ඒම පිළිබඳව ඇති අවශ්‍යතාව අපි කාටත් තේරෙද්දී, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙක් ඉදිරිපත් කරපු අදහස් දිහා බැලුවාම මට යම් ලජ්ජාවකුත් ඇති වුණා. ඒවාට ප්‍රතිචාරයක් වශයෙන් යම් අදහසකුත් මට කියන්න සිද්ධ වුණා. බෙහෙත්වල ගුණාත්මකභාවය, බෙහෙත් හිඟය, එහෙම නැත්නම් මේවා දැකලා පුදුම වෙන ස්වභාවයක් අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමාගේ කථාව තුළින් ඉදිරිපත් කළා. ඒකට යම් ප්‍රතිචාරයක් අපේ මන්ත්‍රීතුමෙක් විසින් දැක්වූවාට, මම අහන්න කැමැතියි ඇත්තටම ඔබතුමන්ලා බලය තිබෙන වෙලාවේ නොදැකපු දේවල් දැන් දකින්නේ රෝහල්වලට ගිහිල්ලා ද නැත්නම් මේ කාගේ හරි කට කථාවලින්ද කියලා. සේවකයින් බඳවා ගන්නේ නැතුව, විශ්‍රාම යන සේවකයින් වෙනුවට ආපහු සේවකයෝ සපයන්නේ නැතුව, බාල බෙහෙත් දීපු අය වෙනුවෙන් පෙනී ඉඳලා, විවිධ විහිළු සැපයූ විපක්ෂයක් දැන් ඒ ගැන අදහස් කියනකොට අපිට හිනා වෙන්න වෙන්නේ කොයි පැත්තෙන් ද, කටින්ද නැත්නම් වෙනත් පැත්තකින් ද කියාත් අපට හිතෙනවා. ඒ වාගේම අපේ චානක සම්පත් මාදුගොඩ මැතිතුමා -නම කියන්න මට සිද්ධ වුණා- අපේ ආදරණීය ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ මේ අමාත්‍යාංශය ගෙන යමින් සිටින වෙහෙසකර කටයුත්ත බොහොම හාස්‍යයට ලක් කරමින්, එහි බර නොතේරෙනවා වාගේ අදහස් දක්වපු ආකාරය පිළිබඳව මට යම් කම්පනයකුත් ඇති වුණා.

විශේෂයෙන්ම එතුමාගේ වචනවලින් ගත්තොත් නම්, එතුමා සම්බන්ධ කරාපිටිය රෝහලට ලූ. එතුමාට අපේ දිශානතිය පේන්නේ නැහැ කිව්වා. *[බාධා කිරීමක්]* ඔබතුමාට හානියක් වෙන දෙයක් මම කිව්වේ නැහැ. දිශානතිය පේන්නේ නැහැ කිව්ව නිසා දිශාව පෙන්වන්න මට හිතෙනවා. මොහොතකට කරාපිටියෙන් මිදිලා එන්න, මේ අහල පහළ රෝහලක් තිබෙනවා-*[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාත් එක්ක වාදයකට යනවා නොවෙයි. ඇත්තටම, ඔබතුමා ඉතාම හොඳින් කරුණු ඉදිරිපත් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වාදයකට යන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට කියන්න අවශ්‍ය වුණේ මේකයි. ගරු නලින්ද ජයතිස්ස සෞඛ්‍ය ඇමතිතුමා මාධ්‍ය ප්‍රකාශක විධියට ප්‍රවෘත්ති සාකච්ඡාවකදී තමයි කිව්වේ, බෙහෙත් නැත්නම් ෆාමසියෙන් බෙහෙත් ගන්න කියලා. මම ඒ voice-cut එක ඔබතුමාට දෙන්නම්. මම මේ විවාදයකට යනවා නොවෙයි. ඔබතුමන්ලාගේ සෞඛ්‍ය ඇමතිතුමා තමයි කිව්වේ බෙහෙත් නැත්නම් ෆාමසියෙන් ගන්න කියලා. මම ඒ කාරණය තමයි සඳහන් කළේ. එහෙම නැතුව හාස්‍යය උපදවන කාරණයක් නොවෙයි.

ගරු චමින්ද ලලිත් කුමාර මහතා
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ඒ සම්පූර්ණ කථාවම අහන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. එහෙම නැත්නම් මේ අහල පහළ රෝහලක් තිබෙනවා. මට ඒක පෙන්වන්න වෙනවා. හිත රිදුණා නම් සමාවෙන්න. මම හිත රිදෙන අදහසකින් කිව්වා නොවෙයි.

කොහොම වුණත් අපට පැවරුණේ නතර වෙලා තිබ්ච්ච රටක්. මේ රට පවත්වාගෙන යැමේදී සෞඛ්‍ය කියන්නේ අත්‍යවශ්‍ය අංශයක්. මේ සම්බන්ධයෙන් ජනතාව විඳපු පීඩා කොච්චරද කියලා ලියනවා නම්, ලොකු පොතක් ලියන්න පුළුවන්. බෙහෙත් නැති රෝහල්, අවශ්‍ය උපකරණ නැති රෝහල්, රෝගීන් විතරක් නොවෙයි වෛද්‍යවරුත් හඬා වැලපෙන, කාර්ය මණ්ඩල හිඟ, මිනිස්සු පීඩාවට පත් වෙච්ච රෝහල් තිබෙනවා. අම්මා කෙනෙක් තමුන්ගේ දරුවා වෛද්‍යවරයෙක් කරන්න උත්සාහ කරන්නේ නැහැ, සමහර රෝහල්වල වෛද්‍යවරු කන කට්ට දැක්කාම. රෝගීනුත්, කාර්ය මණ්ඩලත්, වෛද්‍යවරුත් එක විධියකට පීඩාවට පත් වුණු රෝහල් පද්ධතියක් සහිත නතර වෙච්ච රටක් තමයි අපි මෙහෙමවත් හුස්ම ගන්න පුළුවන් තැනට දැන් පත් කරමින් ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මොනවා කිව්වත් උගුරට හොරා බෙහෙත් බොන්න බැහැ. ඔබතුමන්ලාට තේරෙනවා, ජනතාවට පහසුකම් සපයන්න මේ ආණ්ඩුව දරන උත්සාහය. ගරු අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ බර කර ගහගෙන මේ කටයුතු කරගෙන යැම ගැන.

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

ඒ වාගේම රජයක් හැටියට මේ ක්‍රියාමාර්ග ගන්නකොට, අණ පනත් සම්මත කරනකොට, ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පහසුකම් ටික සපයන්න ඒ රෝහල් එක්ක ළඟින් බැඳෙන සංවිධාන ව්‍යූහයක් අපට ඕනෑ වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ගරු අමාත්‍යතුමා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. උදාහරණයක් හැටියට අපේ මීරිගම ප්‍රදේශයේ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ රෝහල් ගණනාවක රෝහල් කමිටු පිහිටුවන්න පටන් ගත්තා. ඒවා පිහිටුවා තිබුණා. හැබැයි, අක්‍රිය වෙලා තිබුණා. ඒ අනුව, රෝහල් කමිටු පිහිටුවමින් රෝහල්වලට අලුත් හුස්මක් දෙන්න සූදානම් වෙලා තිබෙනවා. මීරිගම රෝහලේ විදේශ ආධාර යටතේ සියලු පහසුකම් සහිතව හදපු ලොකු ගොඩනැඟිල්ලක් තිබෙනවා. ඒක විවෘත කරගන්න බැරි අපහසුවකින් ඉන්නවා බඳවා ගැනීම් සම්බන්ධ ප්‍රශ්න නිසා. ඒ පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, නව පත්වීම් එක්ක ඒ රෝහලේ සේවය ඉක්මනින් ජනතාවට දෙන්න අවස්ථාව උදා වෙයි කියලා.

තව කිව යුතු එක දෙයක් තිබෙනවා. කලින් කථා කළ මන්ත්‍රීතුමෙක් කිව්වා, ඖෂධවල ප්‍රමිතිය නියාමනය කරගන්න තැනක් නැහැ කියලා. ඒ සඳහා හදපු ආයතන තිබෙනවා. ඒ ආයතන හරහා ඒ දේවල් කරගෙන යනවා. ඒවා කරගෙන යනකොට, ඒවා කෙරෙන්නේ නැහැ කියනවා නම්, හිතා මතා වංචාසහගත අදහසක් ඉදිරිපත් කළාද කියලා හිතෙනවා. ඖෂධ පිළිබඳව නියාමනයක් කළත්, පෞද්ගලිකව තිබෙන අත්දැකීම් එක්ක මට අමතර යෝජනාවක් කරන්න තිබෙනවා. යම් නගරවල තිබෙනවා, කොළඹ ප්‍රධාන රෝහල්වලින් ඉවත් කළා යැයි හිතෙන උපකරණ සහිත රසායනාගාර. ඒ උපකරණ තිබෙනවා.

ඒ labsවල තිබෙන උපකරණ පිළිබඳව සමහර වෛද්‍යවරුන් කියන කථා එක්ක බැලුවාම, එකම නගරයේ වුණත් ආයතන දෙකකින් රුධිර සාම්පල් පරීක්ෂණයක් කළොත් විවිධ අගයෙන් යුත් ප්‍රතිඵල ලැබෙනවා. මම කියන්නේ ඒ පිළිබඳවත් යම් නියාමනයක් අපට අවශ්‍ය වෙනවා කියන එකයි. ඒ කාරණයත් සඳහන් කරමින්, මේ රජය කරගෙන යන්න ක්‍රියා මාර්ග එක්ක, ජනතාව රෝහලට නැවිත් ගෙදරදීම, සමාජය තුළදීම සුවපත් වන ක්‍රමවලට යමින් රජය කටයුතු කරනවා. විපක්ෂය "ගොළුවා කසාය බිව්වා වාගේ" ඉන්නේ නැතුව ඒවාට අවශ්‍ය සහයෝගය දෙනවා නම්, ඒක ජනතාවටත්, රටටත් කරන සේවයක් බව කියමින්, මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මහාචාර්ය සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මහාචාර්ය සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 3.07]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ඉදිරිපත් කරන මේ අවස්ථාවේ අපට දැන ගන්න ලැබුණා, මේ පිළිබඳව නඩු කටයුත්තක් තිබෙනවා කියලා. විශේෂයෙන්ම ඖෂධ ආනයනය කිරීමේ සංගමය විසින් නඩු කටයුත්තකට ගිහිල්ලා තිබෙනවා කියලා දැනගන්නට ලැබුණා. එහෙම නඩු කටයුත්තක් තිබෙන අවස්ථාවක මෙවැනි නියෝග ගෙන ඒම තුළින් යම් ගැටලුවක් මතු වෙන්න පුළුවන්.

මේ රටේ ජනතාව වෙනුවෙන් ඖෂධ මිල නියාමනය කිරීමේදී, මිල තීන්දු කිරීමේදී, නිවැරදි මිල තෝරන විට එක පැත්තකින් ආනයනකරුවන්ට අසාධාරණයක් නොවන විධියටත්, අනෙක් පැත්තෙන් පාරිභෝගිකයින්ට සාධාරණයක් වෙන්නත් කටයුතු කරන්න ඕනෑ. දැන් අමාත්‍යවරයා කියන්නේ, මේ තුළින් ඇත්තටම පාරිභෝගිකයන්ට සාධාරණයක් වෙනවා කියලායි. හැබැයි, මේ CIF value එක පාවිච්චි කරමින්, මිල තීරණය කිරීම පිළිබඳ සතුටුදායක තත්ත්වයක් විශේෂඥයන් දැනුවත් කරන්නේ නැහැ. දැන් මගේ අතේ තිබෙනවා, ලෝක සෞඛ්‍ය සංවිධානය - World Health Organization - විසින් නිකුත් කර තිබෙන "WHO guideline on country pharmaceutical pricing policies" කියන එක. මේ guideline එකේ ඉතා පැහැදිලිව තිබෙනවා, "Countries generally should not use cost-plus as an overall pharmaceutical pricing policy" කියලා. ඒ වාගේම තවදුරටත් තිබෙනවා, "Countries using a cost-plus method as an overall policy that wish to change their strategy should consider replacing or complementing the cost-plus approach with other policies, including those covered in this guideline" කියලා.

එක පැත්තකින් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් එහෙම guideline එකක් දීලා තිබියදී, Institute for Health Policy - IHP - එකත් ඉතා පැහැදිලිව ප්‍රකාශයක් කරලා තිබෙනවා. 2015 යහ පාලන ආණ්ඩුව කාලයේ රාජිත සේනාරත්න මැතිතුමා සෞඛ්‍ය අමාත්‍ය ධුරය දරන කොට, මහාචාර්ය අසිත ද සිල්වා මැතිතුමා NMRA එකේ සභාපති ධුරය දරන කොට, Institute for Health Policyහි Executive Director ඉතා පැහැදිලිවම ලියලා තිබෙනවා, "We were pleasantly surprised by your use of IMS data

support for the proposed pricing formula that was disclosed at the Senaka Bibile Commission on the 23rd" කියලා. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. ඒ වාගේම "Pharmaceutical price control in Sri Lanka" යනුවෙන් Dr. Shilpa Modi Pandav විසින් report එකක් දීලා තිබෙනවා. ඒක ලෝක සෞඛ්‍ය සංවිධානයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතැනදීත් ඉතා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, "Cost-plus pricing formula and fixed markup on CIF are not suitable mechanisms of pharmaceutical price control for Sri Lanka" කියලා.

මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද සුවසැරිය ගිලන් රථ සේවාව පිළිබඳව සාකච්ඡා වුණා. සෞඛ්‍ය අමාත්‍යවරයා කියනවා, සුවසැරියට අදාළව කිසිම වෙනසක් කරන්නේ නැහැ කියලා. නමුත්, රජය නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කියනවා, සුවසැරියෙහි යම් වෙනසක් සිදු විය යුතුයි, ඒ පාට වෙනස් කරනවා, 1990 අංකය වෙනුවට වෙන අංකයක් යොදනවා කියලා. ඒ පිළිබඳව ඒ ආකාරයේ දේවල් කියලා තිබෙනවා. අපි ඉතා පැහැදිලිව කියනවා, 1990 සුවසැරිය කියන්නේ, මේ රටේ ඉතාම වැදගත් ව්‍යාපෘතියක් බව. එය මේ රටට ලබා දුන්නේ ඉන්දියාවෙන්. අපි ඒක අගය කරන්න ඕනෑ. එම සේවාව තවත් ශක්තිමත් විය යුතුයි. ඒ පිළිබඳ විශාල වුවමනාවකින් අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කටයුතු කරනවා. එතුමාගේත් අදහස් අරගෙන එම සුවසැරිය සේවාව තවදුරටත් ශක්තිමත් කරනවා මිස, එය විනාශ නොකළ යුතුයි. මොකද, එය ලංකාව තුළ ඉතාම වැදගත් මෙහෙයක් ඉටු කරන සේවාවක් නිසා. තමුන්නාන්සේලා ඒක දේශපාලනීකරණය කරලා විනාශ කරන්න යන එක නතර කරන හැටියට ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ 2025.07.21 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2025.10.07 දින ඉදිරිපත් කරන ලද නියෝග සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඖෂධ දසදහස් ගණනක් සංසරණය වෙනවා. ඒ වාගේම, වෛද්‍ය උපකරණ දහස් ගණනක් සංසරණය වෙනවා. මේ සියල්ල යම් මධ්‍යගතභාවයකින් නියාමනය කර ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවෙයි. නමුත්, එහෙම නියාමන කටයුත්තකට මේ දක්වා පැවැති රජයන් හරියාකාරව අත ගහලා තිබුණේ නැහැ. විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කරුණු දක්වන කොට අපට හිතෙන්නේ, එතුමන්ලා ලෝකයේ දියුණු සෞඛ්‍ය සේවාවක් අපට ලබා දුන්නා, නමුත් දැන් ටිකක් සවුත්තුයි වාගේ අදහසක්.

මම යම් උපුටා ගැනීමක් කරන්න කැමැතියි, 2023 අප්‍රේල් 02වැනි දා "දිවයින" පුවත් පතේ ඉරිදා සංග්‍රහයෙහි පළ වුණු, ලංකාවේ සෞඛ්‍ය සේවාව හා සම්බන්ධ ප්‍රවෘත්තියකින්. එහි ප්‍රධාන සිරස්තලය වන්නේ, "කෝටි 92ක බාල බෙහෙත් රටට ගෙනත්... භාවිතයෙන් ඉවත් කරලා" යන්නයි. කෝටි 92ක බාල බෙහෙත් රටට ගෙනැවිත් භාවිතයෙන් ඉවත් කරලා ලු. මේ කියන්නේ පැවැති සෞඛ්‍ය සේවය ගැන. ඊළඟට, මෙහි විවිධ මාතෘකා යටතේ යම් කරුණු දැක්වීමක් කර තිබෙනවා. ඒ එක මාතෘකාවක් තමයි, "ඖෂධ හිඟයෙන් බැටකන රෝගී ජීවිත" කියන එක. ඒ යටතේ කරුණු ටිකක් සඳහන් කර තිබෙනවා.

"රෝගීන්ට බාල බෙහෙත් ලබාදීලා" කියන මාතෘකාව යටතේ තවත් කරුණු ටිකක් තිබෙනවා. එම ලිපියෙහි සඳහන් තවත් මාතෘකා කීපයක් තමයි මේවා.

"රුපියල් මිලියන 99ක් වැයකොට ඉදිකළ ඖෂධ රසායනාගාරය භාවිතකොට නැහැ" ;"සමහර ඖෂධ සඳහා භාවිත කරන එන්නත් ගෙන්වීමේදි ගහපු ගැහිල්ල"; "ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද නිසා, ඖෂධ මිලදී ගැනීමට, රුපියල් මිලියන 5166ක, අතිරේක වියදමක් දැරීමට සිදුවෙලා" ;"වෛද්‍ය සැපයුම්කරුවන් රුපියල් මිලියන 600කට වැඩි මුදලක් පොලු තියලා"; "වෛද්‍ය සැපයුම්වල ප්‍රමාදය" ; "මකා දමා තිබූ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ දත්ත පද්ධතියග"

මේ ප්‍රවෘත්තිවලින් අපට පෙනෙන්නේ අප භාර ගත්තේ බිඳ වැටුණු සෞඛ්‍ය සේවාවක් කියන එකයි. එහෙම නම්, එම සේවාව නිවැරැදි දිසාවට ගෙන යෑමට, ලෝකයේ තිබෙන දියුණු සෞඛ්‍ය සේවාවක් බවට පත් කිරීමට තමයි රජය වශයෙන් අප විශේෂයෙන් කටයුතු කරමින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාෂායට කරුණක් තිබෙනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වූ නියෝග පිළිබඳ විවාදය වෙලාවේ ම මම ඒ සම්බන්ධයෙන් යම් කාරණයක් ඉදිරිපත් කරන්න කැමැතියි. බාල බෙහෙත් ගෙන්වපු හිටපු සෞඛ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ල මහත්මයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආවා. ඒ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය වෙලාවේ, අද මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන, විශේෂයෙන්ම අද ඒ ගැන අදහස් දැක්වූ රෝහිත අබේගුණවර්ධන වාගේ මන්ත්‍රීවරුන් පවා කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමා බේරා ගැනීම වෙනුවෙන්, ඔහු කළ කටයුතු සාධාරණීකරණය කිරීම වෙනුවෙන් තමයි කථා කරලා තිබෙන්නේ. ඒ මන්ත්‍රීවරු කිහිප පොළක් අදත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. මේ වාගේ විවාද අවස්ථාවලදීත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ලැබීම සමහර විට ඔවුන්ගේ දෛවයේ සරදමක් වෙන්න ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධ ගෙන ඒමේදී ගැටලු විශාල ප්‍රමාණයක් රට ඇතුළේ ගොඩනැගෙමින් තිබුණා. එකක් තමයි, රජයේ අනුමත ප්‍රසම්පාදන නීති උල්ලංඝනය කරමින් ඖෂධ ගෙනැවිත් තිබීම. එවැනි ප්‍රසම්පාදන ගැටලු තිබුණා. ආයතනික පරිපාලන නිලධාරින්ගේ ගැටලු තිබුණා; අත යට ගනුදෙනු සිද්ධ වුණා; අසම්මත මිල දී ගැනීම් සිද්ධ වුණා. විනිමය අනුපාතය උච්චාවචනය වීම මඟිනුත් ඖෂධ ගෙන ඒමේදී යම් යම් ගැටලු ඇති වුණා.

එවැනි ගැටලු තිබුණු සෞඛ්‍ය සේවාව අප භාර ගත්තාට පසුව අපේ අරමුණු වුණේ මොනවාද? ඖෂධ සම්බන්ධයෙන් ගත්තාම අපේ එක අරමුණක් තමයි, රෝහල් පද්ධතියට කාර්යක්ෂමව ඖෂධ ලබා දීම. තවත් එකක් තමයි, ඒ ඖෂධවල

[ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා]

ගුණාත්මකභාවය පිළිබඳව සැලකිලිමත් වීම. අනෙක තමයි, ගෙන්වන ඖෂධ රෝගීන්ට දරා ගත හැකි මිලකට ලබා දීම. මෙන්න මේ අරමුණු වෙනුවෙන් තමයි අපි වැඩ කරමින් ඉන්නේ.

ඖෂධයක් ගෙන්වනවා කියන එක කඩේකට ගිහින් බඩුවක් ගන්නවා වාගේ සරල කාරණයක් නොවෙයි. විශේෂයෙන්ම රජයේ රෝහල්වල ඖෂධ සම්බන්ධ කමිටු තිබෙනවා. එම කමිටු මසකට වරක් පමණ රැස් වෙනවා. ඔවුන් ඖෂධ පිළිබඳ තත්ත්වය වෛද්‍ය සැපයුම් අංශයට දැනුම් දෙනවා. සාමාන්‍යයෙන් අවුරුදු දෙකකට අවශ්‍ය ඖෂධවල පුරෝකථනයක් කළ යුතුයි. ඒ කියන්නේ, 2027 වසරට අවශ්‍ය ඖෂධවල පුරෝකථනය අපි 2025 අවුරුද්දේ -මේ අවුරුද්දේ- කරනවා. එහෙම කරලා තමයි මේ රටට අවශ්‍ය ඖෂධ ප්‍රමාණය ගෙන්වන්නේ. දැන් අපි 2025 වර්ෂයේ ඉන්නේ. 2023දී අදාළ පුරෝකථනය කරලා මේ වසරට අවශ්‍ය ඖෂධ ප්‍රමාණය ලංකාවට ගෙන්වා තිබුණා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන ඖෂධ හිඟය දැන් ඇති වෙන්නේ නැහැ. එදා එතුමන්ලා මොකුත් නොකර, අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ නැතුව ඉඳලා දැන් එක පාරටම හීනෙන් බය වෙලා වාගේ ආණ්ඩුව පැත්තට ඇඟිල්ල දිගු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝග හරහා උපරිම සිල්ලර මිල තීරණය කිරීම, උපරිම සිල්ලර මිල සීමා කිරීම -MCP- කියන ක්‍රම තුළින් දැන් ඖෂධ මිල අඩු වීමක් සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධවල quality එක ගැනත් කථා කළා. ඖෂධවල තත්ත්වය පරීක්ෂා කරන්න අපට දැනට රසායනාගාරයක් තිබෙනවා. ඒ තමයි, NMQAL එක. දැන් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සමඟ එකතු වෙලා ලෝක ප්‍රමිතියට අනුකූලව තවත් රසායනාගාරයක් ඉදි කරන්න. අප දැනට කරන්නේ මෙම රසායනාගාරයෙන් මොකක් හෝ ඖෂධයක් fail වුණොත් පිට රටකට යවා වාර්තා ලබා ගැනීමයි. ඉහත කී රසායනාගාරය ඉදි කිරීම මඟින් ඒ ක්‍රමය මඟ හැරෙනවා. ඖෂධවල quality එක සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්නත් පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන විනාඩි දෙක තුළ මම අවධානය යොමු කරවන්න කැමැතියි විපක්ෂය කී කාරණා කීපයක් කෙරෙහි. එකක්, සුවසැරිය ගිලන් රථ සේවාව ගැනයි. විපක්ෂය ඒ පිළිබඳව අදහස් දැක්වීමක් කළා. එහි පාට ගැනත් කිව්වා. ලෝකයේ බොහෝ රටවල ගිලන් රථවල පාට, සුදු පසුබිමේ රතු පාටයි. මම දන්නේ නැහැ මෙහේ තිබෙන සුවසැරිය ගිලන් රථ කොළ පාට වුණේ කොහොමද කියලා. අපි වෙනම සොයන්න ඕනෑ, ලෝකයේ ගිලන් රථවල පාට රතු නම් මෙහේ ඒවා කොළ පාට වෙන්නේ කොහොමද කියලා. ඊළඟට ඇහුවා, 1990 කියන අංකය අයින් කරලා වෙන මොකක් හෝ අංකයක් දානවාද කියලා. එහෙම එකක් නැහැ. ගරු සෞඛ්‍ය ඇමතිතුමා විශේෂයෙන් සඳහන් කළා, රජයේ අරමුණ වන්නේ මේ අංකය තවතවත් ජනප්‍රිය කරවීම බව. දැනට සුවසැරිය සේවාවේ ගිලන් රථ හිඟයක් තිබෙනවා. මොකද, ගිලන් රථ 250ක වාගේ ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. විනාඩි 10ක්, 15ක් යනවා respond කරන්න. ඒ කියන්නේ, call එකක් දුන්නාම ඒ ලෙඩා ගන්න යන්න ගත වන කාලය වැඩියි. ඒ සම්බන්ධයෙන් දැන් ලෝකයේ තිබෙන standard එක තමයි, විනාඩි 5-7. එහෙම නම්, අපි අඩුම වශයෙන් එය විනාඩි 7ක සීමාවටවත් ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා කාර්ය මණ්ඩලය වැඩි කර ගන්න ඕනෑ, ambulances ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ. ගරු සෞඛ්‍ය ඇමතිතුමා සඳහන් කළා, අපි ඒ සඳහා ගෙන තිබෙන පියවර මොනවාද කියලා. අපි මේ වාගේ විශාල වැඩ කොටසක් කරමින් ඉන්නවා, සුවසැරිය සේවාව තිබෙන තත්ත්වයට වඩා උඩට ගන්න.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සඳහන් කළා, CT, MRI, X-ray machines සම්බන්ධයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක් දෙන්න.

රෝහල්වල තිබෙන එම යන්ත්‍ර බොහොමයක් අවුරුදු 10කට වඩා පරණයි. ඒ කියන්නේ, ඒවායේ warranty කාලයත් ඉක්මවා ගිහින් තිබෙනවා. එම නිසා අපි දැන් කටයුතු කරමින් ඉන්නවා අලුත් machines ගෙනැල්ලා මේ තිබෙන ගැටලුව විසඳාගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් තත්පර 30ක් පමණ ගන්නවා, අපේ දිස්ත්‍රික්කයට අනන්‍ය වෙච්ච ප්‍රශ්නයක් කථා කරන්න. ඒ තමයි, මත් ද්‍රව්‍ය සහ පාතාල ක්‍රියාකාරකම් කියන ප්‍රශ්නය. ගෙවුණු අවසාන සති දෙක තුළ වාගේ දකුණු මුහුදු තීරයේදී හෙරොයින්, අයිස් කිලෝ ග්‍රෑම් 800කට වඩා වැඩි ප්‍රමාණයක් සොයා ගත්තා. ඒ වාගේම බෝට්ටුවකින් ප්‍රවාහනය කරමින් තිබුණු හෙරොයින් කිලෝ ග්‍රෑම් 56ක පමණ ප්‍රමාණයක් සොයා ගත්තා. එහෙම නම්, මුළු දකුණම ඖෂධවලින් නොවෙයි, මත් ද්‍රව්‍යවලින් වැසිලා තිබෙනවා. අපි හිතනවා, මේ මත් ද්‍රව්‍ය ලංකාවට, දකුණු ප්‍රදේශයට ගෙනා පළමු වතාව මෙය නොවෙයි කියලා.

මීට කලිනුත් මේ විධියටම මේවා ගෙනෙන්න ඇති. මේවා පිටුපස්සේ දේශපාලනඥයන් ඉන්න ඇති. අපි දැක්කා, පොදුජන පෙරමුණේ සමහර මන්ත්‍රීවරුන්ගේ ප්‍රධාන මාතෘකාවක් බවට මේ මත්ද්‍රව්‍ය පත් වෙලා තිබෙනවා. සමහර දේශපාලනඥයන් හිතපු නැති සීමාවට පොලීසිය ළඟා වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන් භයවෙලා තිබෙනවා. ඒ භයට විකාර කියවනවා. රජය මේ සම්බන්ධයෙන් තරාතිරම, පුද්ගලයා, එයා ලොකුද, පොඩිද කියන එක බලන්නේ නැතිව මත්ද්‍රව්‍යවලින් තොර රටක් නිර්මාණය කරන්න කටයුතු කරමින් සිටිනවාය කියන එකත් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.21]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පැරණි ජන වහරේ කියමනක් තිබෙනවා, "පනින්න පෙර හිතා බලන්න" කියලා. ජන වහරේ එන "පනින්න පෙර සිතා බලන්න" කියන ඒ කියමන පසුගිය ආණ්ඩුව පැවති කාල පරිච්ඡේදයේ යම්තාක් දුරකට වෙනස් කරලා "ගිලින්න පෙර සිතා බලන්න" කියන මට්ටමට පත් වුණා කියලා මම හිතනවා. පැරණි ජන වහරේ එන ඒ කියමන "ගිලින්න පෙර හිතා බලන්න" කියන මට්ටමට වෙනස් කරන්න වුණේ ඇයි? අපේ රටේ සෞඛ්‍ය සේවාව පිළිබඳව, බොන බෙහෙත් පෙත්තේ ඉඳලාම මහජනතාවට පුදුම අවිශ්වාසයක් තිබෙන්නේ. ඒ නිසා තමයි "ගිලින්න පෙර හිතා බලන්න" කියන මට්ටමට ඒ පැරණි කියමන වෙනස් කරන්න සිද්ධ වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේත්, ලෝකයේ විවිධ රටවලත් සිද්ධ වෙන විවිධ අපරාධ ගත්තාම නම්බුකාර අපරාධකාරයෝ කරන සුදු කරපටි අපරාධ - white-collar crimes - ගැන අපි අහලා තිබෙනවා . උගත්කම, රාජ්‍යතාන්ත්‍රිකභාවය, තනතුර පාවිච්චි කරලා තමන්ටත් නොදැනෙන්න සමාජයට දරුණු ගණයේ අපරාධ කරන්න අපේ රටේ සෞඛ්‍ය සේවාව තුළ දේශපාලන වශයෙන් තීන්දු තීරණ ගත්ත දේශපාලන අධිකාරිය බොහොම සූක්ෂමව කටයුතු කළා. දැන් ඔවුන් බන්ධනාගාරගතව එහි ප්‍රතිඵල භුක්ති විඳිමින් ඉන්නවා. ඒ අය අනීතිකව උපයා ගත්ත දේපොළ දැන් තහනමට ලක් වෙලා තිබෙනවා. ඒ දේශපාලනික තීන්දු තීරණවල අතකොලු වුණු, ඒවාට විවිධාකාරයෙන් පහසුකම් සපයපු රාජ්‍ය නිලධාරින් නීතියට අනුව එහි ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටිනවා.

බොන බෙහෙත් පෙත්තේ ඉඳලාම අපේ රටේ පැවති ඒ ගුණාත්මක සෞඛ්‍ය සේවාව බිඳ වට්ටපු ඒ මූසල, මුස්පේන්තු අඳුරු යුගය පසු කරලා ජනතාව අපට ජන වරමක් දීලා තිබෙනවා, මේ රට නැවත ගොඩ නඟන්න. එහි එක් පැත්තක්තමයි සෞඛ්‍ය සේවාව කියන්නේ. අපි ආණ්ඩුව අරගෙන ඒ මූසල, මුස්පේන්තු අඳුරු යුගය පසු කරලා රටේ ජනතාවට පොරොන්දු වුණු විධියට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සපයමින් සිටිනවා. සන්තෝෂයි කියන්න, ඒ අතරේ පසුගිය දවසක ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු සහ අග්නිදිග ආසියාතික කලාපීය සමුළුවේ සභාපතිත්වය පවා අපේ ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යවරයාට ලැබුණා. ඒ අන් කිසිවක් නිසා නොවෙයි. අපේ රටේ දවසින් දවස, පියවරින් පියවර හිස ඔසවන ජනතාවගේ විශ්වාසය සමඟ සෞඛ්‍ය සේවාව ගුණාත්මක තත්ත්වය කරා නැවත තල්ලු වෙන මේ ගමනේදී, ලෝකයත් ගෝලීය වශයෙන් එය පිළිගන්න නිසා. ඒ නිසා එහි සභාපතිත්වය අපේ ආණ්ඩුවේ වර්තමාන සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයාට ලැබෙනවා. එතකොට අපි බොහොම ප්‍රගතිශීලී ගමනක් යමින් සිටින මොහොතක තමයි අද මේ විවාදයේදී අපට මේ විධියට කරුණු පෙළගස්වන්න ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පැහැදිලිවම කියලා තිබෙනවා, අපි මානවයන් විධියට මේ ලෝකයට බිහි වුණාම අපට බොහොම ගුණාත්මක සුරක්ෂිත සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකමක් හිමි වෙනවා කියලා. ඒ සෞඛ්‍ය සේවාව සඳහා අපට මානවයන් වශයෙන් තිබෙන අයිතිවාසිකම උල්ලංඝනය වෙන විධියට යම්කිසි ආකාරයේ බාධාවක් සිද්ධ වෙනවා නම් ඒක අයිතිවාසිකමක් කඩවීමක් විතරක්ම නොවෙයි, ඒක මිනිසුන්ගේ මානව හැඟීම් පීඩාවට පත් කරන ආකාරයේ ම්ලේච්ඡ ක්‍රියාවලියක් කියලා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පූර්විකාවේ සඳහන් කරලා තිබෙනවා. ඒක ම්ලේච්ඡ ක්‍රියාවක්. මනුෂ්‍යයෙකුට නිදහස් සෞඛ්‍ය සේවාවක් සඳහා ඇති අයිතිවාසිකම බිඳ වට්ටවන විධියට යම් කිසි රාජ්‍යයක පාලනාධිකාරයක් පාලනය අරගෙන ගියා නම්, එවැනි අඳුරු යුගයක් තමයි අපි මේ පසු කරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

විපක්ෂයේ මන්ත්‍රීවරු අද මේ විවාදය පුරාවට අදහස් දක්වනකොට සාධනීය අදහස් එකතු කළා වාගේම, යම් යම් විවේචනත් එකතු කළා. අවම වශයෙන් කිලෝමීටර් තුනක දුර සීමාවක සිටින ජනතාවට පහසුවෙන් ඒකරාශි වෙන්න පුළුවන් තැනක, මිනිසුන් දසදහසකට ප්‍රවේශ වෙන්න පුළුවන් එක ප්‍රාථමික සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයක් බැගින් ඉදිකරන්න රජයක් විධියට අපි මූලික පියවර අරගෙන තිබෙනවා. දැනට මිනිසුන් 10,000කට එක් වෛද්‍ය මධ්‍යස්ථානයක් තමයි තිබෙන්නේ. අපි එය ඉලක්ක කරලා තිබෙන්නේ, 5,000කට එකක් දක්වා අරගෙන එන්න. ඒක හොඳ දෙයක්. මිනිසුන්ට නිදහස් සෞඛ්‍ය සේවාවක් සඳහා තිබෙන ප්‍රවේශය, ඒ අයිතිය තමයි අපි තහවුරු කරමින් යන්නේ. ඒ අතරේ තමයි අපි අද මේ විවාදය පවත්වමින් ඉන්නේ.

අපි දන්නවා, අපේ රටේ මිනිසුන්ට අවශ්‍ය බෙහෙත් වෙළෙඳ පොළෙන් මිලදී ගන්නකොට තිබෙන තරගයත් එක්ක වෙළෙඳ පොළේ විවිධ මිල ගණන් යටතේ ඖෂධ සහ උපකරණ තිබෙනවා. මේ තරගයට දායක නොවී ජනතාවට උපරිම මිල සීමාවක් යටතේ බෙහෙත් මිලදී ගැනීම සඳහා අවශ්‍ය පරිසරය සකසා දීම තමයි අපි මේ හරහා කරන්නේ. ඒ නිසා අපි මේ නීතිමය ක්‍රියාමාර්ග හරහා බලාපොරොත්තු වෙන්නේ, රෝගියා කේන්ද්‍ර කරගෙන, රෝගියාගේ රෝගී තත්ත්වයට පිළියම් දෙන සෞඛ්‍ය සේවාවක් අපේ රටේ ජනතාව වෙනුවෙන් බිහි කිරීමයි. අන්න එතැනදී කාර්යක්ෂමතාවකින් යුක්ත සෞඛ්‍ය සේවාවක්, ප්‍රවේශය සහ කාලෝචිත බව සලකන සෞඛ්‍ය සේවාවක්, හැම තිස්සේම ධාරිතාව යාවත්කාලීන වන සෞඛ්‍ය සේවාවක්, ජනතාවගේ සුරක්ෂිතතාවත්, සාධාරණයත් ගුරුකොට ගත් සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑම සඳහා තමයි අපේ වැඩ පිළිවෙළ මේ විධියට එළාගෙන යන්නේ.

අන්න එතැනදී අපි බලාපොරොත්තු වෙන්නේ, බෙහෙත් පෙත්තේ ඉඳලා ජනතාව මුළා කරපු ඒ වංචනික, දූෂිත පාලන ක්‍රමය වෙනුවට, ජනතාවට නිරෝගීව, සෞඛ්‍ය සම්පන්නව ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කරන සෞඛ්‍ය සේවයක් අපේ රටේ අරගෙන යෑමයි. අන්න එතැනදී අපි මේ උපරිම සිල්ලර මිල කියන එක, ඒ නීතිමය තත්ත්වය පවත්වාගෙන යමින් ජනතාවට සාධාරණ සෞඛ්‍ය සේවාවක් සඳහා ඇති අයිතිය තව දුරටත් තහවුරු කරමින් තමයි මේ ගමන යන්නේ. ඒ ගමනේදී අපි වරින් වර විවිධ ජයග්‍රහණ වාර්තා කරමින්, මේ රටේ ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින්, මේ රටේ ජනතාවගේ උතුම්ම සැපත, උතුම්ම ලාභය තමයි අපේක්ෂා කරන්නේ. ඒක තමයි නීරෝගීකම. ලෝකයට අන්න ඒක සපථ කරමින් යන ආණ්ඩුවක් විධියට අපි මේ ගමන ගෝලීය වශයෙන් අත්වැල් බැඳගෙන යනවා. ඒ සඳහා අපි විපක්ෂයටත් ආරාධනා කරනවා. ඔබේ සාධනීය ප්‍රතිචාර, සාධනීය ආකාරයෙන් ඉස්මතු කරගෙන අපි මේ ගමන ඉදිරියට යමු. මොකද, හොඳ සෞඛ්‍ය සේවාවක් තිබුණොත්, අනෙක් ජනතාවට වාගේම විපක්ෂයටත් එහි ප්‍රතිඵල භුක්ති විඳින්නට පුළුවන්.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.29]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ "අඳුරු, මූසල, මුස්පේන්තු යුගය", මේ රටේ සෞඛ්‍ය සේවය රටවල් 200කින් 85වැනි තැනට, 75වැනි තැනට ගෙනාපු යුගයක් ගරු මන්ත්‍රීතුමියනි. රටවල් 200ක් අරගෙන බලනකොට, ධනවත් රටවලත් නැති සෞඛ්‍ය පහසුකම් මේ දියුණු වෙමින් පවතින රටේ තිබෙනවා කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා. ඒ මූසල යුගයේ ඒක දැක්කේ නැද්ද? ඒ යුගයට තමයි ඔබතුමිය "මූසල යුගය" කියලා කථා කරන්න පටන් ගත්තේ. මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. එහෙම වුණොත් මට මේ පනත් කෙටුම්පත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ගැන කථා කරන්න වේලාව මදි වෙනවා. නැත්නම් මට ඔය ඔක්කෝටම උත්තර දෙන්න පුළුවන්.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

අපි මුලින්ම ගත්තොත්, ඖෂධ මිල අඩු කිරීමට ආණ්ඩුව ගන්නා වූ ක්‍රියාමාර්ගයට එක හෙළාම, සියයට 100කින්ම අපි එකඟයි. නැත්නම් හැමදාම පටන් ගන්නවා වාගේ, ඩිජිටල් ත්‍රස්තවාදීන් දාලා මේ මිල සූත්‍රවලට, අනන් මනන්වලට අපි විරුද්ධයි කියලා තමයි අදත් පටන් ගන්නේ. ඒ නිසා මේ කථාව පටන් ගන්නකොටම කියන්න ඕනෑ, රටේ සාමාන්‍ය ජනතාවට විශේෂයෙන්ම අඩු මුදලට බෙහෙත් ලබා දෙනවා නම් ඕනෑම ආණ්ඩුවක්, ඕනෑම පක්ෂයක් කැමැතියි කියන කාරණය. ඒ නිසා මේකට කාටවත් විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. විපක්ෂය හැටියට අපි මතු කරන කාරණාව තමයි, මේවායේ තිබෙන තාක්ෂණික ප්‍රශ්න පෙන්වා දීම. එහෙම නැත්නම් අඩු පාඩු රහිතව මේ වැඩේ කර ගන්නේ කොහොමද කියන කාරණාව පෙන්වා දීම.

ඖෂධ මිල පිළිබඳව එක්තරා මිල සූත්‍රයක් තමයි මේ ආණ්ඩුව අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක හොඳ වැඩක්. හැබැයි ප්‍රශ්නය තමයි, මෙතෙක් කල් මිල සූත්‍ර ගෙනෙනකොට මේ අය විපක්ෂයේ ඉඳගෙන කියපු කථා ටික දැන් විපක්ෂයෙන් නොකියන එක. මේ කථාව වෙනකොට වර්තමාන ජනාධිපතිතුමා විපක්ෂයේ සිටියා නම්, අද බලන්න තිබුණා මිල සූත්‍රය ගැන කියන කථා ටික. එහෙම වුණා නම් ගම්වල මිනිසුන්ට ඇඬෙනවා, ඒ කථාවල තිබෙන වේදනාව අහලා.

සෞඛ්‍ය ඇමතිතුමා දැනට මේ සභාව තුළ පෙනෙන්නට නැහැ. නියෝජ්‍ය ඇමතිතුමාත් දැනට පෙනෙන්නට නැහැ. එතුමන්ලා පාර්ලිමේන්තුවේ කොහේ හරි ඇති කියලා මම හිතනවා. එතුමන්ලා කථා කරද්දී විපක්ෂය පැත්තේ කවුරුවත් හිටියේ නැත්නම් ඒකත් එතුමන්ලාට ලකුණක් දාගන්න පාවිච්චි කරනවා. එතුමන්ලා සභා ගර්භයෙන් එළියට ගිහිල්ලා ඇති. තව ටිකකින් එයි. ආවාම, මට උත්තරයක් දෙන්න කියනවා. මෙතැන ඉන්න කවුරු හරි සටහන් කර ගන්න, මම මේ මතු කරන පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒවා එතුමාට ඉදිරිපත් කරලා මේක සංවාදයක් බවට පත් කරන්න උදව් කරන්න කියලා ඉල්ලනවා.

මිල සූත්‍රය ගෙන ඒමේදී NMRA එකේ ගැසට් එකට විරුද්ධව රිට් ආඥා දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. එයට විරුද්ධව 517/19 සහ 491/2024 කියන රිට් ආඥා දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම නම් මේකේ පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තිබෙන බව පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඊළඟ කාරණාව මෙයයි. ඖෂධ ආනයනකරුවන්, සමස්ත ලංකා පෞද්ගලික ඖෂධශාලා හිමියන්ගේ කණ්ඩායම් මේ සියලුදෙනාම ඒකරාශි කර ගත්ත යාන්ත්‍රණයක් හදන්න ඕනෑ කියලා තමයි 2015දී සෞඛ්‍ය ඇමති විධියට හිටපු රාජිත සේනාරත්න ඇමතිතුමා විසින් 2015 අංක 5 දරන පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඊට කලින් තිබුණේ ඔබතුමන්ලා ඔය කියන කිසිම නියාමනයක් නැති බෙහෙත් අලෙවි කිරීමේ ක්‍රියාවලිය.

මේ තමයි මම ඉදිරිපත් කරන ප්‍රශ්න ටික. අද ඉදිරිපත් කරන මේ නියෝග පිළිබඳව WHO එක එකඟද කියලා මම පළමුවැනි කාරණය විධියට ආණ්ඩුවෙන් අහන්න කැමැතියි. දෙවැනි කාරණාව මෙයයි. මේ ක්‍රමය පිළිබඳව IHP එක නිවැරදි නැහැ කියලා යම් යම් තැන්වල සඳහන් කරලා තිබෙන බව මම දැක්කා. ආණ්ඩුවෙන් දැන ගන්න කැමැතියි, ඒ පිළිබඳව ඔබේ මතය මොකක්ද කියලා. IHP එක කියනවා, මේ පිළිබඳ ප්‍රශ්න තිබෙන බව. WHO එක කියනවා, මේ පිළිබඳ ප්‍රශ්න තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IHP එකෙන් එවා තිබෙන වාර්තාව සහ එයට සම්බන්ධ තවත් වාර්තා කීපයක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ පිළිබඳව ආණ්ඩුවේ මතය මොකක්ද? මේ ක්‍රියාවලිය හරහා සිදු වෙන්න පුළුවන් හොඳ සහ නරක දෙකක් තිබෙනවා. හොඳ අරමුණක් තිබෙනවා. මොකක්ද ඒ අරමුණ? බෙහෙත් මිල අඩු කරන එක. විය හැකි අනතුරුදායක තත්ත්වය තමයි බෙහෙත් හිඟවීම. හේතුව? දැනටත් ලංකාවේ රෝහල්වල බෙහෙත් හිඟයක් තිබෙනවා. මේ වෙද්දී රජයේ රෝහලේ බෙහෙත් නැති වෙනකොට පෞද්ගලික අංශයේ ෆාමසි එකකට ගිහිල්ලා තමයි ඒ බෙහෙත අරගෙන එන්නේ. ඒ බෙහෙත් හිඟ වුණොත්, මේ අපේක්ෂා කරන අරමුණ ඉෂ්ට කර ගන්න බැරිව යනවා. මේ වාගේ ඇති වූ තත්ත්වයක් ගැන කථා කරනවා නම්, රසායනික පොහොර ගෙන්වීම යහපත් අරමුණකින් නැවැත්වීම නිසා රටේ පොහොර පිළිබඳ ප්‍රශ්නයක් නිර්මාණය වුණා. යහපත් අරමුණකින් ඒ තීරණය ගත්තත්, ඒ ක්‍රියාවලිය ඇතුළේ ඇති වෙච්ච අර්බුදය නිසා පොහොර හිඟයක් ඇවිල්ලා, ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා.

මෙහි තිබෙන ගැටලු ගැනත් අපි සාකච්ඡා කරන්න ඕනෑ. 2015දී මේ ක්‍රියාවලියට මොකක්ද වුණේ? අපි උදාහරණයකට metformin කියන බෙහෙත ගනිමු. ඒ බෙහෙතට එකම මිලක් තියෙන්න ඕනෑ කියලා තීරණය කළා. කලින් තිබුණේ එක එක මිල ගණන්. මම ඒ පිළිබඳ පොඩි පොඩි සටහන් ටිකකුත් දාගෙන ආවා. සමහර සමාගම් රුපියල් 4.50ට විකුණුවා. සමහර සමාගම් ඒ බෙහෙත් පෙත්තම රුපියල් 11කට විකුණුවා. මේ සියලුදෙනාට තනි මිලක් ගෙන ඒමේ ක්‍රියාවලිය තමයි 2015දී කළේ. ඒ ක්‍රියාවලියේ තවත් දිගුවක් ලෙස තමයි අද ඔබතුමන්ලා මේ නියෝග ගෙන එන්න උත්සාහ කරන්නේ. මෙතැන තිබෙන අමාරු කෑල්ල මෙයයි. මෙතෙක් කාලයක් වෙළෙඳ පොළේ තෝරා ගත් බෙහෙත් වර්ග 40කට වාගේ cap එක දාලා තිබුණා. පළමුවැනි වතාවට ඔබතුමන්ලා සමස්ත වෙළඳ පොළටම cap එකක් දාන්න උත්සාහ කරනවා. මේවා තමයි මම අහන ප්‍රශ්න. Brand name එක මත පදනම්ව cap එකක් දාලා සාර්ථක වෙච්ච රටවල් තිබෙනවාද කියලා මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි. ඊළඟ ප්‍රශ්නය මෙයයි. CIF value එක කියන කාරණාව මත පදනම්ව මිල නියම කරන්න ගියොත් ඖෂධීය ගුණාංගයට නොවෙයි මිල එන්නේ, brand name එකට. පෙර කාල සීමාවේ මේ ප්‍රශ්න පිළිබඳව දිගින් දිගටම කථා කළා.

ඔබතුමන්ලාගේ පක්ෂය 1970 ඉඳලා සේනක බිබිලේ ප්‍රතිපත්තිය කෙරෙහි විශ්වාසය තියපු පක්ෂයක්. හැබැයි, දැන් ඖෂධ නාමය වෙනුවට වෙළඳ නාමය මත පදනම්ව මිල නියම කිරීමේ ක්‍රියාවලියකට නේද මේ යන්නේ කියන ප්‍රශ්නයත් මම අහන්න කැමැතියි. මොකක්ද මේ ක්‍රියාවලියේ තිබෙන විශේෂත්වය? මේ ක්‍රියාවලියේ තිබෙන විශේෂත්වය මෙයයි. ඔබතුමා දාලා තිබෙනවා, මේ නියෝගවලින් පස්සේ රුපියල් 40 ක් වන පෙත්තක් රුපියල් 70 දක්වා විකුණන්න පුළුවන්, රුපියල් 2,000ට තිබෙන පෙත්තක් රුපියල් 3,300ට විකුණන්න පුළුවන් කියලා. රුපියල් 6,500ක බෙහෙතකට ලාභය එකතු කළාම රුපියල් 10,075යි. රුපියල් 6,500ට වඩා වැඩියෙන් වරායට ගෙනැල්ලා බාන බෙහෙතක් විකුණද්දී ඒක සියයට 45ක ලාභයක් තියාගෙන විකුණන්න ඕනෑ.

මේකේ තිබෙන ප්‍රධාන ගැටලුව මෙයයි. NMRA එකේ නිලධාරිනුත් මේ නිලධාරි මැදිරියේ ඉන්නවා ඇති. අපි මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරලා තිබෙනවා. එම සාකච්ඡාවලදී

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විශේෂයෙන්ම ප්‍රධාන ගැටලුවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ක්‍රියාවලියේ ඉන්නවා, ප්‍රධාන කණ්ඩායම් තුනක්. එක කණ්ඩායමක් තමයි, මේ බෙහෙත ගෙනෙන අය. දෙවැනි කණ්ඩායම තමයි, බෙදා හරින අය. තුන්වැනි කණ්ඩායම තමයි, විකුණන අය. මේ කණ්ඩායම් තුනට කොපමණ ලාභ ප්‍රතිශතයක් තියාගන්නවාද කියන එක මේ නියෝගවල නැහැ. ප්‍රශ්නය එන්නේ එතැනින්. හේතුව මේකයි. බෙහෙත ගෙනෙන කෙනා උපරිම ලාභයක් තියාගෙන ඒ බෙහෙත වෙළඳ පොළට දැම්මොත්, distribute කරන කෙනා සහ විකුණන කෙනා ඒ අයගේ වායු සමීකරණවලට, වාහනවලට සහ අනෙකුත් දේවල්වලට වියදම් දරලා ඒ බෙහෙත විකුණනකොට ලාභය ප්‍රමාණවත් නොවුණොත්, ඔවුන්ට ඒවා විකිණීමේ අර්බුදයක් එනවා.

මෙම නියෝගවල තිබෙන එක අඩුපාඩුවක් තමයි ලාභයේ උඩ cap එක දැම්මාට, මැද ස්ථර තුනට කොච්චර cap එක ඕනෑද කියන එක. මම මේ ගැන ආණ්ඩුවෙන් අහනවාට වඩා නිලධාරින්ගෙන් අහන්න කැමැතියි. ඇමතිතුමාත් මේ පිළිබඳව දැනුවත් ඇති. ඒකටත් උත්තරයක් දෙන්න කියා මා ඉල්ලනවා.

ඊළඟට, මෙම Act එකේ 118 වගන්තිය තුළ පැහැදිලිවම කියනවා, කණ්ඩායම් තුනක එකඟතාව අනුව තමයි මිල නියම කිරීමේ තීරණය ගත යුත්තේ කියලා. ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන්, මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා, මේ පනත යටතේ වන නියෝග අද දවසේ අනුමත කිරීමට ගෙනාවේ එම කණ්ඩායම් තුනේම එකඟතාවෙන්ද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න මේ වැඩේ සම්පූර්ණ කරන්න.

මම විශ්වාස කරන විධියට මේ පනතේ 118 වගන්තියට පරිබාහිරව තමයි මේ කටයුතු කර තිබෙන්නේ. මම ඒ අයට කථා කරලා බැලුවා. ඒ නිසා මෙම නියෝග ඉදිරිපත් කිරීමේදී ඔබ මේක හරියට සිද්ධ කළාද කියා මම මේ නිලධාරින්ගෙන් අහනවා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. NMRA එකේ නිල කමිටුවේ හිටපු සභාපති ආර්ථික විද්‍යා විශේෂඥ මහාචාර්ය සිරිමල් අබේරත්න මහත්මයා ගෙනා යෝජනාවලට මේ කණ්ඩායම් තුනම එකඟ වුණා. හැබැයි, අද ඒක ප්‍රතික්ෂේප කර අලුත් system එකක් ගෙනාවා. ආයෙත් මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, මහාචාර්ය සිරිමල් අබේරත්න මහත්මයා ගෙනා යෝජනාවලට එකඟ නොවී අලුත් යෝජනාවක් ගෙනාවේ ඇයි කියලා. මගේ ළඟ ඒ ලිපි තිබෙනවා. සමහර කරුණුවලට එකඟ වෙලා, ඊට පසුව ඒ එකඟතාවලට පිටින් අලුත් නියෝග ගෙනැල්ලා තිබෙන්නේ ඇයි කියන එකත් මම අහන්න කැමැතියි.

මම නැවත නැවතත් කියන්නේ තාක්ෂණික කාරණා පිළිබඳව විතරයි. මිල අඩු කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මිල අඩු කරන්න ඕනෑ. හැබැයි, මිල අඩු කිරීමේ අරමුණ යහපත් වුණත්, ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරගන්න බැරිව ගියොත් ප්‍රශ්නයක් ඇති වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම තවපොඩි වෙලාවක් අරගෙන මේ කාරණයත් කියා අවසන් කරන්නම්.

මේ වාගේ පාලන මිලක් ගෙන ඒමේදී ඇති වන ප්‍රධාන අර්බුදය තමයි ගුණාත්මකභාවයෙන් ඉහළ, මිල වැඩි බෙහෙත් වෙළෙඳ පොළෙන් අයින් වෙලා, ගුණාත්මකභාවයෙන් අඩු බෙහෙත් වෙළෙඳ පොළේ රැඳෙන්න ඉඩ තිබීම. ආණ්ඩුවෙන් අපි අහනවා, සමස්ත පද්ධතියම control කරද්දී ඔබ ඖෂධීය ගුණය පරීක්ෂා කරන labs හදා තිබෙනවාද, නැත්නම් හදන්න ආරම්භ කළාද කියා. මොකද, සමහර විටෙක ගුණාත්මකභාවයෙන් අඩු බෙහෙත් ලාබෙට එයි. ඔබතුමන්ලා මේ කරන්න උත්සාහ කරන්නේ ලොකු වැඩක්. ඖෂධවල ගුණාත්මකභාවය රැක ගනිමින් මේ වැඩේ සාර්ථකව කර ගැනීමේදී, වෙළෙඳ පොළ තුළ බෙහෙත් හිඟයක් ආවොත්, ඒ වෙනුවෙන් ආණ්ඩුව හදිසි බෙහෙත් මිලදී ගැනීම් වාගේ දේවල්වලට යන්න එපා. එහෙම වුණොත් අනිවාර්යයෙන්ම එයින් දූෂණයට ඉඩක් ලැබෙනවා.

මම පොඩි වෙලාවක් අමතරව ගැනීම පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට වැඩිපුර වෙලාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.38]

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ඉදිරිපත් කරනු ලබන නියෝග පිළිබඳ විවාද කරන මේ වෙලාවේ, ආණ්ඩුවක් හැටියට අපි බලාපොරොත්තු වන, අපේක්ෂා කරන අරමුණුට මෙම නියෝගවලින් ලැබෙන පිටුබලය මොකක්ද කියන කාරණය පිළිබඳවත්, ඒ වාගේම විපක්ෂය පැත්තෙන් මෙම යෝජනාව සම්බන්ධයෙන් මතු කළ කාරණාත් සැලකිල්ලට ගනිමින් කරුණු කිහිපයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී මූලික කාරණය හැටියට අපි කවුරුත් පිළිගන්නා පොදු මූලික සිද්ධාන්තයක් තිබෙනවා. ඒ පොදු මූලික සිද්ධාන්තය ජාතික ජන බලවේගය ආණ්ඩුවේත් සෞඛ්‍ය සම්බන්ධ පොදු මූලික ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි කවුරුත් පිළිගන්නා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුව ගත්තත්, සෞඛ්‍යය කියන්නේ රටක ජනතාවගේ මූලික අයිතිවාසිකමක්. මූලික අයිතිවාසිකමක් හැටියට, මානව අයිතිවාසිකමක් හැටියට සෞඛ්‍ය සේවාව පිළිගනිමින් සෞඛ්‍ය සේවාව තුළ රෝගීන් සවිබල ගැන්වීම, රෝගියා කේන්ද්‍ර කරගත් සෞඛ්‍ය සේවාවක් රටට දායාද කිරීම, ජනිත කිරීම අරමුණු කරගත් සෞඛ්‍ය ප්‍රතිපත්තියක්, සෞඛ්‍ය සේවාවක් තමයි අපි මේ වනවිට ක්‍රියාත්මක කරමින් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි තිබෙන ඉතා වැදගත්ම කාරණය මේකයි. සෑම පුද්ගලයෙකුටම මූල්‍ය දුෂ්කරතාවකින් තොරව අවශ්‍ය ගුණාත්මක සෞඛ්‍ය සේවාව අවශ්‍ය පරිදි සහ

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

අවශ්‍ය ඕනෑම තැනකදී ලබා ගන්න හැකියාව තිබෙන්න ඕනෑ. කෙනෙකුගේ සෞඛ්‍යය තීරණය වන්නේ පොකැට්ටුවේ බරට අනුව නම්, කෙනෙකුගේ සෞඛ්‍යය තීන්දු වෙන්නේ ඔහුගේ හෝ ඇයගේ සාක්කුවේ තිබෙන ආදායමට අනුව නම්, මම හිතන විධියට එම පුද්ගලයාගේ සෞඛ්‍යයට අත්පත් වන ඉරණම පිළිබඳව අප සාකච්ඡා කළ යුතු වෙනවා.

ඒ නිසා සෞඛ්‍ය සේවයේ ප්‍රවර්ධනයේ සිට රෝග වැළැක්වීම, ප්‍රතිකාර ලබා ගැනීම, පුනරුත්ථාපනය, සහන ප්‍රතිකාර දක්වා වූ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවල පූර්ණ අඛණ්ඩතාව ආවරණය කළ යුතු වනවා මෙන්ම, ඒ පූර්ණ අඛණ්ඩතාව අපි පිළිගනු ලබනවා. රෝගියාගේ ආරක්ෂාව කියන්නේ, සෞඛ්‍ය ආරක්ෂණය සහ අතුරු ප්‍රතිඵලවලින් ඇති විය හැකි අනවශ්‍ය හානියේ අවදානම පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමයි. මේක තමයි අපේ stand එක බවට පත් වන්නේ.

හැබැයි, පසුගිය කාලයේ අපේ රටේ සෞඛ්‍ය සේවයේ විතරක් නොවෙයි, අපේ රටේ හිටපු සෞඛ්‍ය ඇමතිවරුන්ගේ පවා stand එක ප්‍රශ්නයකට ලක් වුණා. සෞඛ්‍ය සේවයේ ඉන්න අයගේ විතරක් නොවෙයි, අනෙක් සියලුදෙනාගේ තත්ත්වයත් පහළ මට්ටමකට වැටුණු රටක් තමයි අපට උරුම වෙලා තිබුණේ. එවැනි සෞඛ්‍ය සේවයක් තමයි අපට දායාද වෙලා තිබුණේ. එවැනි සෞඛ්‍ය සේවයක සිට වඩාත් දියුණු මට්ටමකට රෝගියාගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය ආරක්ෂණය ගෙන ඒමත්, අතුරු ප්‍රතිඵලවලින් ඇතිවිය හැකි අනවශ්‍ය හානිය අවම මට්ටමකට ගෙන ඒමත් තමයි අපේ මූලික අරමුණ හා අභිප්‍රාය බවට පත් වන්නේ. සෞඛ්‍ය සේවයේ ආරක්ෂාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි පාලන ක්‍රියාවලිය සමඟ ආරක්ෂාව සහ තත්ත්ව නියාමන පද්ධති ඒකාබද්ධ කිරීම තමයි මේ නියෝග හරහා සිදු කරනු ලබන්නේ.

අපි කවුරුත් පිළිගන්නා කාරණයක් තිබෙනවා. 2021 අවුරුද්දේ UNICEF වාර්තා අනුව ලංකාවේ සෞඛ්‍ය සේවය සඳහා අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 1.5කට ආසන්න ප්‍රමාණයක් තමයි වෙන් කළේ. නමුත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට අනුව සෞඛ්‍ය පහසුකම් සඳහා පවුලක සාමාන්‍ය ආදායමින් වෙන් කළ යුතු මුදල සියයට 20කට වඩා අඩු විය යුතුයි. ඒක සියලුදෙනාම පිළිගන්නා පොදු කාරණයක් බවට පත්ව තිබෙනවා. කෙසේ වෙතත්, නිදහස් සෞඛ්‍ය සේවයක් පවතින ශ්‍රී ලංකාවේ ඒ අගය සියයට 50කට ආසන්න ප්‍රමාණයක් බවට පත්ව තිබෙනවා. ඒ කියන්නේ, අපි උපයන ආදායමින් වැඩි ප්‍රමාණයක් වැය බරක් හැටියට සෞඛ්‍ය සඳහා වැය කරනවා. අපි කවුරුත් පිළිගන්නා කාරණයක් තමයි, ප්‍රතිකාරවලට සහ ඖෂධවලට අසීමාන්තික මුදලක් අපට ගෙවන්න සිද්ධ වෙලා තිබෙන බව. ප්‍රතිකාරවලට, ඖෂධවලට, වෛද්‍ය සේවාවලට අසීමාන්තික මුදලක් ගෙවන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. අපේ ආදායමින් වැඩි ප්‍රමාණයක්, රටේ ජනතාවගේ ආදායමින් වැඩි ප්‍රමාණයක්, ඒ කියන්නේ සියයට 50කට ආසන්න ප්‍රමාණයක් සෞඛ්‍ය සඳහා වැය කරන්න සිදු වෙලා තිබෙනවා. මේක වළක්වා ගත යුතු කරුණක්. අන්න ඒ නිසා තමයි අපේ රටට ඖෂධ සඳහා මිල නියාමනයක් අවශ්‍ය වන්නේ.

මීට කලින් අපේ රටේ ඖෂධ සඳහා නිශ්චිත මිල නියාමනයක් තිබුණේ නැහැ. විපක්ෂයෙන් මතු කළා වාගේ 2015 අවුරුද්දේ ට හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා තෝරාගත් ඖෂධ වර්ග 40ක් සඳහා පමණක් මිල නියාමන යාන්ත්‍රණයක් සකස් කළා. නමුත්, ඒක එතැනින් එහාට ක්‍රියාත්මක වුණේ නැහැ. අපේ රටේ රෝගීන් පාවිච්චි කරන ඖෂධ අතරින් මිල නියාමනයක් නැති ඖෂධ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මිල නියාමනය නිශ්චිත ලෙස කර ගැනීමට මේ 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත හරහා හැකියාව ලැබෙනවා. ඒ අනුව මින් ඉදිරියට අපේ රටේ ඖෂධ සම්බන්ධයෙන් නිශ්චිත මිල නියාමන යාන්ත්‍රණයක් සකස් වනවා. එය සකස් වුණාට පස්සේ ඒ මිල නියාමන යාන්ත්‍රණය අනුව තමයි ඖෂධවල මිල තීන්දු වන්නේ.

අපි කවුරුත් දන්නවා, මෑත කාලීනව අපේ රටේ තිබෙන වැඩිම ලාභ ලබන ව්‍යාපාර මොනවාද කියලා. ඕනෑම කෙනෙකුට ඉතා කෙටි කාලයක් ඇතුළත අසීමාන්තික ලාභයක් සහිතව දියුණු වෙන්න පුළුවන් ව්‍යාපාර කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මත් ද්‍රව්‍ය වෙළෙඳාම. මේ දවස්වල වැඩිපුර සාකච්ඡා කරන ජනප්‍රිය මාතෘකාවක් තමයි, මත් ද්‍රව්‍ය වෙළෙඳාම.

දෙවැනි එක ආයුධ වෙළෙඳාම. මත් ද්‍රව්‍යත් එහෙමයි, ආයුධත් එහෙමයි. ඊළඟට තුන්වැනි එක තමයි ඖෂධ වෙළෙඳාම. ඒ තුළින් වැඩි ලාභයක් හොයන්න පුළුවන්. මොකද, නිශ්චිත මිලක් නැහැ. මට මතකයි, සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, රුපියල් හත්සිය ගණනට විකුණන්න තිබෙන බෙහෙතක් රුපියල් හැත්තෑහයදාහට විකුණපු අවස්ථාවක් ගැන. ඒකට හේතුව, මිලෙහි නිශ්චිත නියාමනයක් නැති එක. ඒ නිසාම ඖෂධ වෙළෙඳාම වැඩි ලාභ ලබන ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා.

නමුත් එය නියාමනය කළ යුතු වනවා. ඒක නියාමනය කරන්න තමයි ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත හරහා නියාමන ක්‍රමයක් සකස් වන්නේ. ඊට අදාළව 2025 ජූලි 21වැනි දින අංක 2446/34 දරන ගැසට් පත්‍රයේ සඳහන් උපරිම සිල්ලර මිල නියාමනය කිරීමේ බලය මේ නියාමන අධිකාරියට පැවරෙනවා. මිල නියාමනය කිරීමේ ක්‍රියාවලිය තුළ මතු වන, මතු කළ යුතු මූලික කාරණා කීපයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් විපක්ෂයෙන් මතු කරපු අදහස් කීපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, රිට් ආඥා දෙකක් පිළිබඳ කාරණය. මීට කලින් මිල නියාමන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය ක්‍රියාත්මක නොවුණු එකට විරුද්ධව ඖෂධ ආනයනකරුවන් විසින් අධිකරණයේ නඩුවක් පවරා එය විභාගයට ලක් වුණා. අධිකරණයේ විභාගයට ලක් වෙච්ච නඩු නිමිත්ත හේතු කොටගෙන තමයි එම රිට් ආඥාව නිකුත් කළේ.

රටේ ජනතා පරමාධිපත්‍යය බලය තුළ, පාර්ලිමේන්තු බලය තුළ මේ රටේ ජනතාවට වඩා සහනදායී මිලකට ඖෂධ මිලදී ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීමට සහ එහි ප්‍රතිඵල, ප්‍රතිලාභ මේ රටේ සුවහසක් දුක් විඳින රෝගී ජනතාවට අත්පත් කර දීමේ වුවමනාව, වගකීම, ඒ කාර්යභාරය කරට ගත් ජනතාවාදී ආණ්ඩුවක් හැටියට තමයි අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙනෙන නියෝග පාර්ලිමේන්තුවේදී අපි සම්මත කරන්නේ. ඒ නිසා විපක්ෂය පැත්තෙන් ඒකට බාධා නොකර, අකුල් නොහෙළා මේ ජනතාවාදී ක්‍රියාමාර්ගයට සහාය දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[3.49 p.m.]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Hon. Presiding Member, thank you very much for granting me this opportunity to speak on matters related to the Regulations under the National Medicines Regulatory Authority Act.

Sir, I rise today to speak on a matter of great national concern, the rising cost of medicines and the urgent need to strengthen the role of the National Medicines Regulatory Authority - NMRA- in ensuring fair, affordable and accessible healthcare for all citizens in this country. Having access to essential medicines is a fundamental right of every citizen. Yet, today, many families are struggling to buy the drugs they need to survive. The sharp increase in medicine prices over the past years has placed an unbearable burden on ordinary citizens, particularly on the poor, the elderly and those who suffer non-communicable disease or chronic illnesses.

While global market fluctuations, import costs and currency depreciation have contributed to these price increases, we must also recognize the critical role of domestic regulation. The NMRA was established to ensure that all medicines available in Sri Lanka are safe, effective and reasonably priced. However, due to institutional weaknesses, insufficient oversight and monitoring and limited enforcement capacity, this Authority has not always been able to fulfil its mandate effectively in the past. Therefore, Sir, we must take decisive action to strengthen the NMRA so that it could play a central role in reducing medicine prices through transparent, efficienct and evidence-based regulation.

So, it is time to introduce an MRP and an MCP. Firstly, the NMRA should develop and implement a scientifically-grounded and transparent pricing formula for essential medicines. This formula must consider international reference prices, local production costs and reasonable profit margins for importers and pharmacies. By doing so, we can ensure fairness to both the consumers and suppliers.

Secondly, the Authority must expand and modernize its monitoring mechanism. A digital system for price surveillance, registration and market review should be established to identify unjustified price hikes in real time. Such a system will prevent artificial shortages and speculative pricing.

Thirdly, we must encourage pharmaceutical manufacturing locally. The NMRA, together with the Ministry of Health and Mass Media and the Ministry of Industry and Entrepreneurship Development, should prioritize and fast-track the registration of high-quality locally produced medicines. Strengthening domestic production would reduce dependency on imports and protect our economy from rise in prices globally.

Fourthly, greater transparency and accountability within the NMRA are essential. The process of registration of medicines, giving approval and pricing should be made public fully. All decisions should be based on scientific evaluation and subject to independent audits.

Also, public confidence in the NMRA must be restored through openness and integrity.

The quality of drugs is also very much important. To evaluat the quality of medicines or drugs used in Sri Lanka, a quality control laboratory of international standard should be established. I know that because I was working as a Director or an administrator of a hospital. We receive lots of drugs from the MSD and after three or four days, we would get notifications stating that a particular batch of medicine is not up to the standard or is substandard and should be withdrawn immediately. That types of cases cause loss of a lot of money to the country and are a burden on patients as well.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Sir, give me two more minutes, please.

Another vital step is to strengthen consumer awareness, which is of equal importance. The public should have easy access to the list of approved medicines and their Maximum Retail Prices, which should be published online and displayed at all pharmacies. Informed consumers are empowered consumers, and that transparency itself would help drive prices down through competition and accountability.

Furthermore, the NMRA should collaborate closely with the State Pharmaceuticals Corporation and the State Pharmaceuticals Manufacturing Corporation to ensure continuous supply of essential drugs at affordable prices across the Island. The Government's bulk purchasing and generic substitution could further reduce the cost of drugs for patients.

Sir, this is not merely an economic issue, but a moral imperative. The affordability of medicines directly affects the health, productivity and dignity of our people. So, we cannot allow a system where life-saving drugs are priced beyond the reach of those who need them most. Therefore, I urge this House to support the legislative and administrative measures needed to strengthen the NMRA, enhance its independence, modernize its operations and empower it to regulate medicine prices with fairness and firmness.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Lastly, Hon. Members, every rupee saved on medicine is a rupee saved for a family's well-being. Therefore, every reform we make today will bring relief to thousands of Sri Lankans tomorrow.

Thank you, Hon. Presiding Member.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.57]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் கௌரவ சுகாதார அமைச்சரினால் கொண்டுவரப்பட்டு இருக்கின்ற தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் உண்மையிலேயே சிறந்ததொரு விடயமாகும். மருந்துப் பொருட்களுடைய விலையை ஒழுங்குபடுத்தி, அவற்றை நோயாளர்களுக்கு வழங்குகின்ற இந்தத் திட்டமானது உண்மையிலேயே வரவேற்கக்கூடிய ஒரு விடயமாக இருந்தாலும், அதில் சில விடயங்கள் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றன. அந்த விடயங்களையும் கருத்திற்கொண்டு, தரமான மருந்துகள் நோயாளிகளுக்குக் கிடைக்கப் பெற வேண்டும் என்பதுதான் எல்லோருடைய எதிர்பார்ப்பாகவும் காணப்படுகின்றது. அந்த அடிப்படையில், கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்த விடயத்தை நாங்கள் வரவேற்கின்றோம்.

இன்று சுகாதாரத் துறையில் பல்வேறு தேவைப்பாடுகளும் குறைபாடுகளும் காணப்படுகின்றன. எந்தக் கட்சி ஆட்சியில் இருந்தாலும், சுகாதாரத் துறையில் கவனம் செலுத்த வேண்டும். இன்று பல பிரதேசங்களிலுள்ள வைத்தியசாலைகளில் பல்வேறு தேவைப்பாடுகள் காணப்படுகின்றன. அவற்றின் மூலம் எங்களுடைய மக்களுக்கு நூறு சதவீத சேவையை வழங்க முடியாவிட்டாலும்கூட, குறைந்தபட்சம் அவர்களுக்குத் தேவைப்படுகின்ற சேவைகளையாவது வழங்க வேண்டும் என்றுதான் நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் அதிகமான நோயாளிகள் பயன்படுத்துகின்ற வைத்தியசாலைகளாக கிண்ணியா, மூதூர் தள வைத்தியசாலைகள் காணப்படுகின்றன. இந்த இரண்டு வைத்தியசாலைகளும் மாகாண சபையால் நிருவகிக்கப்படுகின்ற வைத்தியசாலை களாகக் காணப்படுகின்றன. இன்றைய சூழ்நிலையில், இவற்றை மாகாண சபையால் பராமரிக்க முடியுமா? என்ற கேள்வி எழுகின்றது.

திருகோணமலை மாவட்டத்திலுள்ள மாவட்ட பொது வைத்தியசாலை, கந்தளாய் வைத்தியசாலை என்பன மத்திய அரசாங்கத்தின்கீழ் காணப்படுகின்ற வைத்தியசாலைகளாக இருந்தாலும், கூடுதலான நோயாளிகள் பயன்படுத்துகின்ற வைத்தியசாலைகளாக கிண்ணியா வைத்தியசாலையும் மூதூர் வைத்தியசாலையுமே காணப்படுகின்றன. மாகாண சபைக்குக்கீழ் காணப்படுகின்ற இந்த இரண்டு வைத்தியசாலை களையும் மத்திய அரசாங்கத்துக்குக்கீழ் கொண்டுவருமாறு நாங்கள் அரசாங்கத்திடம் கோருவதன் நோக்கம், அந்தப் பிரதேசங்களில் இருக்கின்ற நோயாளிகள் கூடுதலான சுகாதார சேவையைச் சிறந்த முறையில் பெற வேண்டும் என்பதே ஒழிய, கிழக்கு மாகாண சபையிடம் இருக்கின்ற அதிகாரங்கள் குறைக்கப்பட வேண்டும் என்பதற்காக அல்ல. இந்த இடத்தில் பேசுவதற்குப் பல விடயங்கள் இருந்தாலும், நேரம் போதாமல் உள்ளது.

தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் அவர்கள் இல்லை. அவர் வைத்தியசாலைகளுக்கு விஜயம் செய்கின்றார். எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படு கின்ற கிண்ணியா, மூதூர், தம்பலகாமம், புல்மோட்டை வைத்தியசாலைகள் பெயரளவில்தான் தரமுயர்த்தப்பட்டு இருக்கின்றன. இன்று அவற்றில் தேவைப்பாடுகள் கூடுதலாகக் காணப்படுகின்றன. ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் எங்களுடைய மாவட்டத்திலுள்ள வைத்தியசாலைகளுக்கும் வருகை தந்து, அங்கிருக்கும் குறைபாடுகளைக் கேட்டறிந்து, அவற்றை நிவர்த்தி செய்துதர வேண்டுமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற இன்னொரு பிரச்சினையைக் கூறி, எனது உரையை நிறைவு செய்யலாமென நினைக்கின்றேன். இன்று ஐந்தாவது நாளாகவும் இலங்கை கனிய மணல் கூட்டுத்தாபனத்தின் ஊழியர்கள் அதன் வளாகத்தில் அமைதியான முறையில் ஆர்ப்பாட்டமொன்றை மேற்கொண்டு வருகின்றார்கள். அங்கு கடமை புரியும் 83 ஊழியர்களுக்கு சுமார் 15 மாதங்களாக சம்பளம் வழங்கப்படவில்லை. தமக்குரிய சம்பளத்தை வழங்குமாறு கோரியே அவர்கள் கவனயீர்ப்புப் போராட்டத்தை முன்னெடுத்து இருக்கிறார்கள். உண்மையிலே இது கவனத்திற்கொள்ளப்பட வேண்டிய ஒரு விடயமாகக் காணப்படுகின்றது. சென்ற அரசாங்கத்தால் வழங்கப்பட்ட வேலைவாய்ப்புகள் தொடர்பில் குறைகள் சொல்லப்படுகின்றன; அவை தொடர்பில் பல விடயங்கள் பேசப்படுகின்றன. அரசாங்கம் என்ற அடிப்படையில், நீங்கள் இது தொடர்பில் நடவடிக்கை எடுக்க வேண்டும். அந்த ஊழியர்களுக்கு 15 மாதங்களாக சம்பளம் வழங்கப்படாத காரணத்தால் அவர்களுடைய குடும்பத்தினர்- மனைவிமார், பிள்ளைகள் - கஷ்டத்தில் இருக்கிறார்கள். இந்த 83 ஊழியர்களுடைய குடும்பத்தினரின் நிலையைக் கருத்திற் கொண்டு, அவர்களுக்கான சம்பளத்தை வழங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

අවසන් කරන්නම්.

குறித்த ஊழியர்களும் பல்வேறு முயற்சிகளைச் செய்திருக்கிறார்கள். அவர்கள் அமைச்சர்கள், செயலாளர்கள், உரிய அதிகாரிகள் எனப் பலரைச் சந்தித்து, தங்களது பிரச்சினைகளை எடுத்துக்கூறிய போதிலும், இன்னும் அவர்களுக்கான தீர்வு வழங்கப்படவில்லை என்பது

கவலையளிக்கிறது. இன்று ஐந்தாவது நாளாகவும் அவர்கள் போராட்டத்தில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள். ஆகையால், தயவுசெய்து இந்த 83 ஊழியர்களுடைய சம்பள நிலுவை தொடர்பில் சரியானதொரு தீர்வை அரசாங்கம் வழங்க வேண்டுமென இந்த இடத்தில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.03]

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ඉතාම වැදගත්, කාලෝචිත මාතෘකාවක් සම්බන්ධයෙන් තමයි කථා කරමින් සිටින්නේ. 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙනෙන නියෝග සම්මත කිරීමටයි අද සාකච්ඡාව සිදු වන්නේ. අපේ ගරු අමාත්‍යතුමා සහ අනෙක් ගරු මන්ත්‍රීවරු මේ ගැන විස්තරාත්මකව කථා කළා, කොහොමද මේක බලාත්මක වන්නේ, කොහොමද මේ ඖෂධ මිල අඩු කරන්නේ කියලා. ඇත්තටම ඖෂධ කියන්නේ ආහාර තරමටම ජීවිතයට අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක්. ඖෂධ අත්‍යවශ්‍ය දෙයක් පමණක් නොවෙයි, තීරණාත්මක දෙයක් බවට පත් වන අවස්ථා තිබෙනවා. සමහර මිනිසුන්ට ජීවිත කාලය පුරාම ඖෂධ ලබා ගැනීමට සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ගේ ජීවිත රඳා පවතින්නේ ඒ ඖෂධ මත. අවශ්‍ය වෙලාවේදී ඖෂධ නොලැබුණොත් ඔවුන්ගේ ජීවිත අනතුරුදායක තත්ත්වයකට පත් වෙන්න පුළුවන්. සමහරවිට මරණය පවා සිද්ධ වෙන්න පුළුවන්. මේ ඖෂධ මෙතරම් මිනිස් ජීවිතයට තීරණාත්මක සහ අත්‍යවශ්‍යම දෙයක් නිසා එය වැඩි වටිනාකමක් හිමි කරගෙන තිබෙනවා. ආයුධ සහ ඖෂධ කියන්නේ ලෝකය තුළ පවතින විශාල වෙළඳ ව්‍යාපාර දෙකක්. ඉහළම ලාභ ලබන වෙළඳාම් දෙකක් තමයි ආයුධ සහ ඖෂධ වෙළඳාම් කියන්නේ.

අද උදේ කථා කරපු සමහර මන්ත්‍රීවරු සඳහන් කළා නඩුවක් තිබෙන නිසා මේ මාතෘකාව සාකච්ඡා කරන්න සුදුසුද කියලා. මට හිතෙනවා, මේ වාගේ ජනතාවට බලපාන, ජනතාව සුව කරන්න අවශ්‍ය ඖෂධ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම නුසුදුසුයි කියලා හිතන කණ්ඩායමක් පාර්ලිමේන්තුවේත් ඉන්නවාද කියලා. ඖෂධ ජාවාරම්කාරයන්ගේ ඒජන්තයින් මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවාද කියලා යම් සැකයක් නිර්මාණය වෙනවා ඔවුන්ගේ සාකච්ඡා තුළින්. මිනිස් ජීවිත රැකගන්න ලබා දිය යුතු ඖෂධවලින් තමන්ගේ සාක්කු පුරවාගෙන, මිනිස් ජීවිත මාරයාට බිලි දෙනවා නම් ඒක හරිම අවාසනාවන්ත සිදුවීමක්.

පසුගිය කාලයේදී ඒ වාගේ මිලේච්ඡ අත්දැකීමකට අපට මුහුණ දෙන්න සිදු වුණා. ඔබතුමන්ලා දන්නවා, මේ පාර්ලිමේන්තුවේත් ඒ ගැන සාකච්ඡා කළා. පිළිකාව වැනි මාරාන්තික රෝගයකට ගොදුරු වුණු රෝගීන් වෙනුවෙන් කිසිම සීමාවක් නැතිව අපි ඖෂධ ලබා දිය යුතුයි. එය රජයේ වගකීමක්. ඒ සඳහා මහජන මුදලින් වැටුප් ගෙවන අමාත්‍යවරයෙක් රජය විසින් පත් කර තිබෙනවා. එතුමාගේ වගකීම වාගේම වගවීම තමයි රෝගීන් වෙනුවෙන් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑම. ලෙඩ රෝගවලට ප්‍රතිකාර කිරීම මෙන්ම රෝග නිවාරණයත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වෙනවා. ඒ සියලු කටයුතු මෙහෙයවමින් ඊට නායකත්වය දීම සෞඛ්‍ය අමාත්‍යවරයාගේ වගකීමක්. වාසනාවකට අද දවසේ අපට එහෙම සෞඛ්‍ය අමාත්‍යවරයෙක් සහ නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයෙක් සිටිනවා මේ සම්බන්ධව වැඩකටයුතු කරන්න. ඒ වාගේම යම් නිලධාරි මණ්ඩලයකුත් සිටිනවා. නමුත්, පසුගිය ආසන්නම කාල වකවානුවේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සෞඛ්‍ය අමාත්‍යවරයා කුමක්ද කළේ? ඔබ දන්නවා ඒ පිළිබඳව. මාරාන්තික පිළිකා රෝගයට ගොදුරුව සිට, ජීවිත ඉල්ලා හඬන අහිංසක රෝගීන්ට ලබා දිය යුතු ඖෂධ වෙනුවට ඔවුන් ලබා දුන්නේ ඇල් වතුර. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒක කොච්චර මිලේච්ඡ ද? අධම ද? මේ රටේ මිනිස්සු සම්බන්ධයෙන් මෙවැනි ක්‍රියා මාර්ග ගන්න පුළුවන්ද? මනුෂ්‍යත්වය තිබෙන කෙනෙක් කිසිම හතුරෙකුටවත් නොකරන දෙයක් තමයි, ජීවිතය ඉල්ලද්දී මනුෂ්‍යයෙකුට මරණය දෙන එක. ඇත්තටම ඒ ගැන හිතා ගන්නත් අමාරුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, පසුගිය කාලයේ රටේ එහෙම දෙයක් සිද්ධ වුණා. ඔවුන් ඇත්තටම මේ ඖෂධ ජාවාරම කළා; මනුෂ්‍යයන්ට ඖෂධ කොයි තරම් අත්‍යවශ්‍යද කියන කාරණය මුදල් හම්බ කිරීම සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණා. ඒ හිටපු අමාත්‍යවරයාගේ පවුලේ සියලුදෙනාම ඉතා කෙටි කාලයක් තුළ විශාල වශයෙන් පොහොසතුන් බවට පත් වුණා. ඇත්තටම ඔවුන් කොහොමද එවැනි විශාල ධනයක් රැස් කර ගත්තේ? ඒවාට වන්දි ගෙව්වේ අසරණ රෝගීන්. ඔවුන්ට ජීවිතයෙන් පවා වන්දි ගෙවන්න සිද්ධ වුණා. නිසි කලට ඖෂධ නොලැබීමෙන් රෝගීන් විශාල ප්‍රමාණයක් මිය ගියා. බාල බෙහෙත් භාවිත කිරීම නිසා කී දෙනෙකුගේ ඇස් අන්ධ වුණාද? ඇත්තටම බාල බෙහෙත් භාවිතය හේතුවෙන් රෝගී තත්ත්වය උත්සන්න වීමත් වුණා.

මේ සියලු අපරාධවලට පාර්ලිමේන්තුව නියෝජනය කරපු සෞඛ්‍ය ඇමතිවරයෙක් වග කියන්න ඕනෑ. ඔහුගේ ඒ දූෂ්‍ය ක්‍රියා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු අවස්ථාවේදී, මීට ඉස්සෙල්ලා කථා කරපු, සෞඛ්‍ය සම්බන්ධයෙන් බණ දේශනා කරපු අපේ ගාල්ල ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම 2029දී මේ රටේ ජනාධිපති වෙන්න සිහින දකින, සාටක පොරව ගත් මන්ත්‍රීවරු ඒ ඇමතිවරයාට විශ්වාසය පළ කළා. එහෙම තත්ත්වයක් තමයි මේ රටේ තිබුණේ. ඒක තමයි මේගොල්ලන්ගේ දේශපාලනය. ඒ මුළු දේශපාලනයම රැඳී තිබුණේ ඒ ධනය සහ බලය මත. ඔවුන්ගේ ඒකායන අරමුණ වුණේ මුදල් උපයන එක විතරයි. ඇත්තටම හිතා ගන්න බැරි මුදල් කන්දරාවක් ඔවුන් සතුව තිබුණා. ඒ හැම මුදලක්ම අපරාධ මුදල්. ඒ හැම රුපියලක්ම සොයාගෙන තිබුණේ මේ රටේ අහිංසක මිනිසුන්ගේ කඳුළු දහඩිය අතරින්.

ඖෂධ නියාමනය සඳහා අපේ රටට ප්‍රතිපත්තියක් අවශ්‍යයි. මොකද, මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේම ඖෂධ වෙළෙඳාම කියන්නේ මාෆියාවක්. ඒ මාෆියාවෙන් බේරෙන එක ඉතාම දුෂ්කරයි. ඔබතුමන්ලා දන්නවා, මහාචාර්ය සේනක බිබිලේ ඒ සඳහා උත්සාහ කළ බව. රටට අවශ්‍ය ඖෂධ වර්ග සහ ඒවායේ ප්‍රමාණය පිළිබඳව එතුමා යම්කිසි ලේඛනයක් සකස් කළා. නමුත් රටට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීම නිසාම තමයි අවසානයේදී බොහෝ ඈත විදේශ රටක පාළු මුහුදු වෙරළකදී ඝාතනය වීමට එතුමාට සිද්ධ වුණේ. එදා පටන් ගෙවී ගිය පසුගිය වසර ගණනාවේදීම පත් වෙච්ච රජයන් සේනක බිබිලේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනවා කියන කාරණය තමයි පැහැදිලිව සමාජගත කළේ. නමුත් ඔවුන් එතුමා අළෙවි කළත්, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්න උත්සාහ කළේ නැහැ. ඒ සඳහා හැකියාවක් හෝ වුවමනාවක් ඇත්තටම ඔවුන්ට තිබුණේ නැහැ.මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජාවාරම පිටුපස

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

දේශපාලනඥයන් වාගේම දේශපාලනඥයන් සමඟ සමහර රාජ්‍ය නිලධාරින්ද හිටියා. ඒ අයත් ඒවාට වග කියන්න ඕනෑ. ඔවුන්ටත් ඉදිරියේදී නීතිය හරියාකාරව ක්‍රියාත්මක වන බව මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

මේ සියලු අභියෝගවලට මුහුණ දෙමින් ජාතික ජන බලවේගය රජය ජනතාව වෙනුවෙන් පැහැදිලි ප්‍රතිපත්ති රාමුවක සිටිනවා. සෞඛ්‍ය සේවය සම්බන්ධයෙන් ගත්තොත්, ඖෂධවල මිල පාලනය කරලා හෙට දවසේ මේ රටේ ජනතාවට සහන සැලසීමට සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වැඩ පිළිවෙළ ජයග්‍රහණය කරවන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිතනවා, මින්පසු කිසිම දිනක මේ රටේ රෝගීන්ට බාල ඖෂධ ලැබෙන්නේ නැහැ කියාත්, රෝගීන්ගේ ජීවිත අනතුරේ හෙළමින් මඩිය තර කර ගන්නා සෞඛ්‍ය ඇමතිවරුන් මේ රජය යටතේ බිහි වන්නේ නැහැ කියාත්. ජනතාවගේ ජීවිත සුවපත් කිරීමේ වගකීම අප සියලුදෙනාට තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබත් අප සමඟ එකතු වෙන්න කියා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.12]

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய கால கட்டத்துக்குப் பொருத்தமானதொரு சட்டத் திருத்தம் கொண்டுவரப்படுவது உண்மையிலேயே வரவேற்கத் தக்கது. ஏனென்றால், இன்று மருந்துகளுக்கு விலை நிர்ணயமில்லாமல் இருக்கின்றது. இது பாரிய பிரச்சினை யாகும். மருந்துப் பொருட்களுக்கு மாத்திரமல்லாமல், பொதுவாகவே எல்லாப் பொருட்களுக்கும் இதுபோன்ற நிலைதான் இருக்கின்றது. அந்த அடிப்படையில், மருந்து களுக்குக் கட்டுப்பாட்டு விலையை நிர்ணயிப்பதற்குப் பொருத்தமான ஒழுங்குவிதிகளைக் கொண்டுவருவது உண்மை யிலேயே பாராட்டக் கூடியது.

குறிப்பாக, பல முக்கியமான மருந்துகளுக்கு இன்று பாரிய பற்றாக்குறை நிலவுகின்றது. வைத்தியசாலைகளுக்குப் போனால் அங்கு சில மருந்துகள் இல்லை. அதேபோன்று, private pharmacyகளில்கூட சில மருந்துகளுக்குத் தட்டுப்பாடு இருக்கின்றது. அந்த நிலைமைகளை விரைவாகச் சரிசெய்ய வேண்டும். கடந்த காலங்களில் 'மருந்துகளுக்குத் தட்டுப்பாடு' என்ற குற்றச்சாட்டுகள் இருந்தது. ஆனால், ஒரு system change என்ற அடிப்படையில் மக்கள் உங்களுக்கு அதிகாரத்தைத் தந்து கிட்டத்தட்ட ஒரு வருடமாகியும் அந்த நிலைமையில் முன்னேற்றம் இல்லை என்பதையும் இந்த இடத்தில் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இதேபோன்று எதிர்காலத்திலும் பாரிய பிரச்சினைகளுக்கு நாம் முகங்கொடுக்க வேண்டிய நிலைமைகள் காணப்படு கின்றது. அதாவது, கடந்த காலங்களில் MBBS doctorக்குப் பதிலாக RMO ஊடாக மருத்துவ சேவைகள் கிடைக்கப் பெற்றது. அந்தப் பதவிக்குத் தற்போது நியமனம் செய்யப்படாமை காரணமாக, இன்னும் 6 - 7 மாதங்களில் பலர் pensionஇல் போகக்கூடிய நிலை இருப்பதனால், doctorக்குப் பாரியளவு பற்றாக்குறை ஏற்பட இடமிருக்கின்றது. RMO என்ற பதவிக்கு இப்போது நியமனங்கள் செய்யப்படாதுவிட்டால், மாற்றீடாக MBBS doctors மூலம் வெற்றிடங்களை நிரப்ப வேண்டும். ஆனால், அந்த நிலைமைகள் இல்லை. எனவே, பாரியளவு பற்றாக்குறை ஏற்படவிருப்பதால், இன்னும் 6 மாதத்திற்குப் பின்னர் இதைப் பற்றி பேசுவதைவிட இப்பொழுதே இதற்குரிய மாற்று வழியைக் கையாள்வது பற்றி நீங்கள் சிந்திக்க வேண்டிய நிலைமை காணப்படுகின்றது. இவ்வாறான நிலைமையால் கூடுதலாகப் பாதிக்கப்படுவது நகரப்புறங்களிலுள்ள மக்கள் அல்ல, கிராமப் புறங்களிலுள்ள மக்கள்தான். அவர்கள்தான் உண்மையில் வறுமைக் கோட்டின்கீழ் இருக்கின்றார்கள். அவர்களுக்குரிய மருத்துவ வசதிகள் பாரியளவில் கிடைப்பதில்லை. அவ்வாறான நிலையில் கிராமப்புறத்தில் இருக்கின்ற மக்களுக்குத்தான் பாரியளவிலான பாதிப்புகள் ஏற்படுகின்றன.

மேலும், சுகாதாரத் துறையில் ஊழியர்கள் பற்றாக்குறை என்பது பாரியதொரு பிரச்சினையாக இருக்கின்றது. குறிப்பாக, எமது மாவட்டமான வவுனியாவை எடுத்துக் கொண்டாலும்சரி, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களை எடுத்துக்கொண்டாலும்சரி, அங்கிருக்கின்ற பிரதேச வைத்தியசாலை, ஆரம்ப சுகாதார நிலையம், central dispensary போன்றவற்றில்கூட ஊழியர்கள் பற்றாக் குறையால் மக்கள் பாரிய பிரச்சினைகளுக்கு உள்ளாக வேண்டியிருக்கின்றது. இந்த நிலைமை எதிர்காலங்களில் பாரிய பிரச்சினையாக மாறாத வகையில் நீங்கள் உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென நாங்கள் கேட்டுக்கொள்ளுகின்றோம்.

அதேபோன்று மேலும் பல பிரச்சினைகள் இருக்கின்றன. உதாரணமாகச் சொல்வதென்றால், கிராமிய வைத்திய சாலைகளை அல்லது பிரதேச வைத்தியசாலைகளை எடுத்துக்கொண்டால் அங்கிருக்கின்ற வைத்தியர் petty cashஇல் இருந்து 5,000 ரூபாய் வரையான செலவுகளைச் செய்யலாம்; அந்த நடைமுறை இப்பொழுதும் இருக்கின்றது. அதுபோல், கடந்த காலத்தில் building fund என்பதன்கீழ் RDHS approval உடன் 25,000 ரூபாய் வரையான சில வேலைத் திட்டங்களைச் செய்யலாம். இப்போது அதைச் செய்ய முடியாதுள்ளது; tender முறைக்குப் போக வேண்டும். சாதாரணமாக ஒரு motor repair செலவு 7,000 ரூபாய் என்றால் உடனே அதனைச் செய்ய முடியாது. Tender முடிவாகி வரும்வரை - 2 மாதங்கள்வரைகூட - காத்திருக்க வேண்டிய நிலைமை இருக்கின்றது.

Tender மூலம் பொருட்களைக் கொள்வனவு செய்வதற் குரிய அனுமதிக்கப்பட்ட கடைகள் நகரப்புறங்களில்தான் இருக்கின்றது, கிராமப்புறங்களில் இல்லை. இதனால் குறித்த வைத்தியசாலையின் சேவைகளுக்குப் பாரிய பாதிப்புகள் ஏற்படுகின்றது. எனவே, கடந்த காலங்களில் இருந்தது போன்று அங்குள்ள doctor அந்தச் செலவுகளைச் செய்யக்கூடிய நிலைக்கு விதிகளை மாற்ற வேண்டும். இதற்கு ஊழல் நடைபெறுவதைக் காரணமாகச் சொல்லப்படுகின்றது. ஊழல் நடைபெறுகின்றது என்பதற்காக அங்குள்ள வைத்திய சாலைகளை ஸ்தம்பிக்க வைக்க முடியாது. அது பின்னர் பாரிய

பிரச்சினையாக மாறும். ஆகவே, கடந்த காலங்களில் எப்படி 25,000 ரூபாய்க்குள் அவர்களால் செலவழிக்க இயலும் என்ற நிலைமை இருந்ததோ அந்த நிலைமையை மறுபடியும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும். இதேபோல பல பிரச்சினைகள் இருக்கின்றன.

குறிப்பாக, எங்களுடைய பகுதிகளை எடுத்துக்கொண்டால், அங்கு NMRAஇல் பதிவுசெய்யப்பட்ட கிட்டத்தட்ட 50 சதவீதமான 'பாமசி'களில் pharmacists இல்லை. Pharmacist இல்லாமல்தான் அங்கு மருந்து கொடுக்கிறார்கள். பதிவுசெய்யும்போது மட்டும் 'பாமசிஸ்ட்'களின் பெயரைப் பதிவுசெய்கிறார்கள். ஆனால், மருந்து கொடுக்கும்போது pharmacist இல்லை. அதேபோல, எங்களுடைய பகுதிகளில் நடத்தப்படும் 50 சதவீதமான clinics எந்தவித பதிவுகளும் இல்லாதவை. இதனால் எமது வைத்தியத் துறையில் நம்பகத்தன்மை இல்லாத நிலை ஏற்படுகின்றது. ஆகவே, இவற்றைச் சரியான முறையில் கையாள வேண்டும். எதற்கு எடுத்தாலும் கடந்த காலத்தைக் குறை கூறுகிறார்கள். அப்படி கடந்த காலத்தைப் பற்றி கூறாமல் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்; அதற்காகத்தான் மாற்றத்தை ஏற்படுத்தியிருக்கிறார்கள் மக்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

இவ்வாறு பாரிய ஊழல் சம்பவங்கள் நடைபெறுகின்றன. அண்மையில் சுகாதார அமைச்சுக்குச் சொந்தமான CKD வாகனமொன்றில் வெலிஓயாவிலிருந்து குடும்பநல உத்தியோகத்தர்களைக் கொண்டுசென்று யாழ்ப்பாணம் PDHS Officeஇல் இறக்கிவிட்டு வரும்போது, குறித்த வாகனச் சாரதியும் அவருடைய உதவியாளரும் மதுபோதையில் இருந்ததை பிரதேச சபை உறுப்பினர் ஒருவர் கண்டதையடுத்து, அதிகமான 'மீடியா'களில் அது news ஆகப் போயிருக்கிறது. அது தொடர்பாக எந்தவிதமான சட்ட நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. ஆனால், சம்பந்தப்பட்டவர்கள் அவர்களைப் பாதுகாப்பதில்தான் குறியாக இருக்கின்றார்கள். இவ்வாறான பிழைகளை இனிமேல் விட வேண்டாம். அது மக்களின் நம்பிக்கைத் தன்மையை இழக்க வைக்கும்.

அதேபோல நாங்கள் குறிப்பாகக் கூறுவதென்றால், -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

2023-2024ஆம் கல்வியாண்டுக்காக அனைத்துப் பல்கலைக்கழகங்களிலும் மாணவர்கள் உள்வாங்கப்பட்டுக் கல்வி நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டிருந்தாலும் ருகுணு பல்கலைக்கழகத்தில் Bachelor of Pharmacologyக்கு விண்ணப்பித்த மாணவர்கள் இதுவரை சேர்த்துக் கொள்ளப்படவில்லை. சில பல்கலைக்கழகங்களில் 2025க்கும் மாணவர்களைச் சேர்த்துக் கொள்கின்றார்கள். ஆனால், ருகுணு பல்கலைக் கழகத்தில் குறித்த பாடநெறிக்கு விண்ணப்பித்த மாணவர்கள் ஒரு வருடமாக வீட்டில் சும்மா இருக்கிறார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන.

අපි දන්නවා, අද අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශේෂ දවසක් බව. අපේ රටේ ජනතාවගෙන් බොහෝදෙනෙක් දුක් විඳිනවා, ඖෂධවල මිල වැඩි නිසා. විශේෂයෙන් ඖෂධවලින් සියයට 50ක්ම මිලදී ගන්නේ private sector එකෙන්. මොකද, රජයේ රෝහල්වල OPDsවලට සමහර ඖෂධ එන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් අද විශේෂ දවසක්.

ඖෂධ මිල ගැන සඳහන් කරද්දී සාමාන්‍යයෙන් කියන කථාවක් තිබෙනවා. යම් ඖෂධයක මිල වැඩි නම් සමහර අය ප්‍රචාරයක් ගෙනිහිල්ලා තිබෙනවා, ඒකේ quality එක වැඩියි කියලා. මේක සත්‍ය දෙයක් නොවෙයි. ඖෂධ ව්‍යාපාරය ගත්තාම, ලෝකයේ ලාභ ලබන ලොකු ව්‍යාපාරයක්. අපි මේකට කියන්නේ ඖෂධ ජාවාරම කියලා. ඇයි ඒ? ශත 50 බෙහෙත රුපියල් 15,000ට විකුණන සමාජයක් අද තිබෙන්නේ. මෙන්න මේ ඖෂධ ජාවාරමට එරෙහිව ගෙන එන යම් නියෝග මාලාවක් තමයි අද සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම අපි දන්නවා, අපේ රටේ දූෂිත දේශපාලනඥයෝ ඉන්නවා කියලා. හැබැයි ඒ දේශපාලනඥයෝ දූෂණ විරෝධීන් කියලා මිනිස්සු ඉදිරියේ පෙනී හිටිනවා. අපි දන්නවා, කුඩු ව්‍යාපාරය සහ පාතාලය ගැන. පාතාලයට, කුඩුවලට සම්බන්ධ දේශපාලනඥයෝ කුඩුවලට විරුද්ධ මත දරනවා කියලා ජනතාවට පෙන්වා පෙළපාළිත් ගියා අපට මතකයි, කුඩු විරෝධීයි කියලා. හැබැයි ඒගොල්ලන් කුඩු ව්‍යාපාරයට සම්බන්ධයි. අපි මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය උදාහරණයට ගනිමු. අපේ රටේ තිබිච්ච දේශපාලන ව්‍යාපාර, විවෘත ආර්ථිකයත් - open economy එකත් - එක්ක බැඳිච්ච අන්ත ධනේශ්වර ව්‍යාපාර, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන කිය කියා අපේ සේනක බිබිලේ මැතිතුමාගේ නම විකුණමින් ඒකට විරුද්ධව තමයි කටයුතු කළේ.

ඒ වාගේම අපි දන්නවා, අපේ රටේ හිටපු සෞඛ්‍ය ඇමතිවරුන් ගැන. අපි දන්නවා, කෙහෙළිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය ඇමතිතුමා මේ ඖෂධත් එක්ක කොයිතරම් දූෂණයක යෙදිලා තිබෙනවාද කියලා. අපි එතුමා ගැන විතරක් කියන්නේ නැහැ. ඒ

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

ඇමතිතුමා පොහොට්ටුවේ. හැබැයි එතුමාගේ මුල් පක්ෂය පොහොට්ටුව නොවෙයි, එක්සත් ජාතික පක්ෂය. අපේ රටේ හිටපු සියලු සෞඛ්‍ය ඇමතිවරු ගත්තොත් ඔවුන් එක පක්ෂයක හිටපු අය නොවෙයි. එක්කෝ ඔවුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්කෝ පොහොට්ටුවේ, එක්කෝ සජබයේ, එක්කෝ UNP එකේ. ඒ, හැම පක්ෂයකම හිටපු අය. ඒ කියන්නේ ඒගොල්ලන්ට ප්‍රතිපත්තියක් නැහැ, එක පක්ෂයක් නැහැ. නමුත් ඒගොල්ලන්ට එකම ඖෂධ ප්‍රතිපත්තියක් තිබුණා. ඒ ප්‍රතිපත්තිය මත තමයි මේ රටේ ඖෂධවල මිල ඉහළ ගිහිල්ලා තිබුණේ. වැඩිම ඖෂධ මිල තිබුණේ 2022දී. අන්න ඒ විධියට තමයි අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය අභාවයට ගියේ.

නමුත් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත මඟින් අපට යම් සහනයක් ලැබුණා. ඊට පස්සේ එවකට හිටපු සෞඛ්‍ය ඇමතිවරුන් විසින් ඖෂධ මිල යම් මට්ටමකට - ඖෂධ 48කට- පාලනය කිරීමට උත්සාහ ගත්තා. නමුත් ඒවා පැලැස්තර විසඳුම්. ඊට පස්සේ ඒක ඖෂධ 60ක් දක්වා වැඩි වුණා. ඒ වාගේ බොහොම සීමිත දෙයක් තමයි ඒ කාලයේ සිද්ධ වුණේ. නමුත් අද වෙද්දී ඖෂධ මිල සම්බන්ධයෙන් උපරිම සීමාවක් දාලා තිබෙනවා. නමුත් ඖෂධ කාණ්ඩයකට තමයි ඒ උපරිම මිල සීමාව දාලා තිබෙන්නේ. එක ඖෂධයකට නොවෙයි, generic name එකේ ඖෂධ කාණ්ඩයකට. එම නිසා එම කාණ්ඩයේ ඖෂධවල මිල ඊට වඩා ඉහළ නංවන්න බැහැ.

අපි ලෝකයේ දියුණු රටවල් ගත්තොත්, ඒ දියුණු රටවල ඖෂධවලට අදාළ trade names තිබෙන්නේ බොහොම කිහිපයයි. නමුත් අපේ රටේ එහෙම නොවෙයි. අපේ රටේ trade names පිරිලා. ඇත්ත නම තිබෙන ඖෂධය තිබෙනවා. ඒකට අදාළව trade names ගොඩක් තිබෙනවා. එහෙම නැහැ දියුණු රටවල. අපි දන්නවා, අපේ රෝහල් ගත්තොත් රෝහල් ඉස්සරහ නිල මැස්සෝ වාගේ සමහර අය campaign කරනවා, මේ ඖෂධ තමයි හොඳ කියලා. අපේ සමහර අයත් ඒවාට අහුවෙනවා. අපි කථා කරනවා, සාක්ෂි මත පදනම් වූ - evidence-based - management එකක් ගැන. නමුත් evidence-based නොවෙයි, සමහර වෙලාවට ඖෂධ ව්‍යාපාරයේ ජාවාරම්කරුවන් කියන විධියටත් වැඩ කරන අය අපේ රටේ ඉන්නවා.

අද ඒ තත්ත්වයට මේ ධනේශ්වර සමාජය පත්ව තිබෙනවා. පසුගිය කාලයේ රුපියල් 300 බෙහෙත රුපියල් 76,000ට දුන්නා කියලා අපි දන්නවා. අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගෙන එන මේ නියෝග එක්ක එවැනි අවස්ථාවක් ඉදිරියට ඇති වන්නේ නැහැ. මොකද, අපි ඉහළම මිලක් නියම කරනවා. CIF value එක, අනෙකුත් වියදම් ඇතුළු හැමදේම බලලා තමයි ඒ උපරිම මිල තීරණය කරන්නේ. ඒ නිසා මේක ඉතා හොඳ නියෝග මාලාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය ගැනත් මම කියන්න ඕනෑ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කියන්නේත් ඒ තරමම හොඳ ස්ථානයක් නොවෙයි. සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අපි ඖෂධවල මිල අඩු කළ යුතුයි. නමුත්, ඒ විතරක් මදි. තවත් අපට කළ යුතු දේවල් ගොඩක් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපේ ඖෂධවල ප්‍රමිතිය ගැනත් බලන්න ඕනෑ. මේකත් NMRA එක කළ යුතු දෙයක්. නමුත්, අපට එක පාර ඔක්කෝම කරන්න බැහැ. අපට හොඳ lab එකක් තිබෙන්න ඕනෑ, ඖෂධවල ප්‍රමිතිය තීරණය කරන්න. එහෙම ප්‍රමිතිය තීරණය කරනවා නම් දේශීය ඖෂධ නිෂ්පාදනයටත් ඒක පිටිවහලක් වනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, අපේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේත් හොඳ labs, හොඳ ආයතන තිබෙන බව. අපි බලාපොරොත්තු වනවා, NMRA එකත්, අපේ ආයතනත් එකතු වෙලා ඖෂධවල ප්‍රමිතිය - drugsවල quality එක - ගැන ඉස්සරහට වැඩ කටයුතු කරන්න. නමුත් අපි දන්නවා, NMRA එකේ සමහර අය ඒවාට කැමැති නැහැ කියලා. NMRA එකේ හොඳ නිලධාරින්, අවංක නිලධාරින් ඉන්නවා. නමුත්, NMRA එකේ ඉන්න හැමෝම එහෙම නොවෙයි. සමහරුන් ජාවාරම්කාරයෝ එක්ක සම්බන්ධයි. ඒගොල්ලන් ඇතුළේ ගේම් ගහනවා. ඉස්සර ඒගොල්ලන් ගේම් ගැහුවේ දේශපාලනඥයන් එක්ක. අද සමහරු අපේ කකුලෙනුත් අදිනවා. ඖෂධ නියාමන අධිකාරියේ හිටපු ප්‍රධාන විධායක නිලධාරියා යන්න ගියා. මොකද ඉන්න දෙන්නේ නැහැ. මේක තමයි ඒක ඇතුළේ තත්ත්වය. අපි දැන් දේශපාලනඥයන් සුද්ධ කරලා තිබෙන්නේ. දැන් අපට නිලධාරින් සුද්ධ කරන්නත් වෙලා තිබෙනවා. ඒගොල්ලන් මෙහෙම කටයුතු කරනවා නම් ඒගොල්ලන්ට විතරක් නොවෙයි, ඒගොල්ලන්ගේ පරම්පරාවටත් අපි කියනවා, අපට ඕනෑ පිරිසිදු නිලධාරින් කියන එක. ගේම් ගහලා, ඕනෑකමින් registrations පරක්කු කරලා, ඖෂධ අඩු කරලා, ඊට පස්සේ හදිසියේ ඖෂධ අරගෙන ගේම් ගහපු අය මේ NMRA එකේ ඉන්නවා. ඒ නිසා අපි ඒවාත් සුද්ධ කරනවා කියන එක කියන්න ඕනෑ.

ඒ වාගේම සමහර අය කියනවා, දේශීය ඖෂධ නිෂ්පාදනයට මේක ප්‍රශ්නයක් වෙනවා කියලා. නැහැ, අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. දේශීය ඖෂධවලට වෙනම සූත්‍රයක් තිබෙනවා. අපේ අමාත්‍යාංශය විධියට අපි දේශීය නිෂ්පාදකයන්ට අත හිත දෙන්න කැමැතියි. අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා, pharmacistsලා නැහැයි කියලා. ඔව්, අපේ රටේ රෝහල් අතර සෞඛ්‍ය සේවකයෝ බෙදී ගිහින් තිබෙන්නේ කොහොමද කියන එක ගැන අපි බලන්න අවශ්‍යයි.

අද විපක්ෂය කථා කරනවා, private medical colleges ගැන. අද වන විට අපේ රටේ අවුරුද්දකට doctorsලා 2,000කට වඩා pass out වෙනවා. මේ අය කොහේද වැඩ කරන්නේ? මේ අයට අවුරුදු 5කට පස්සේ සීමාවාසික පුහුණුව - internship - දෙන්න ඕනෑ. සීමාවාසික පුහුණුව සීමිත දෙයක්. සීමාවාසික පුහුණුව දෙන්නේ විශේෂඥ වෛද්‍යවරයෙක් යටතේ. ඉතින් එහෙම නම්, අද එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ඉදිරියේදී වෛද්‍යවරුන් පිටවීම තවත් වැඩි වුණොත්, ඒගොල්ලන්ට සීමාවාසික පුහුණුව දෙන්නේ කොහොමද? අනිවාර්යයෙන්ම අපේ රටේ ඒ සීමාවාසික පුහුණුව දිය යුත්තේ රජයේ විශ්වවිද්‍යාලවලින් වෛද්‍ය පීඨවලට ඇතුළත් වන අයට විතරයි. අපට එහෙම කරන්න වෙනවා. වෙන උත්තරයක් නැහැ.

ඒ වාගේම අපි දන්නවා, සියලු වෛද්‍යවරුන් අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට උරාගන්න බව. ඒ අය එතැනට එනවා. ඒක තමයි සාමාන්‍යයෙන් වෛද්‍ය ක්ෂේත්‍රයේ පුරුද්ද. නමුත්, වෛද්‍යවරු විශාල පිරිසක් එකවර විශ්වවිද්‍යාලවලින් එළියට ආවොත් ඔවුන්ට රස්සා දෙන්නේ කොහෙන්ද? අපේ taxවලින් ගන්න සල්ලි ඔක්කෝම වෛද්‍යවරුන්ගේ පඩි ගෙවන්න දෙන්නද? අපේ ජනගහනයෙන් 10,000කට වෛද්‍යවරයෙක් අවශ්‍යයි කියලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. අපි එහෙම දැම්මත්, වෛද්‍යවරු සංඛ්‍යාව වැඩියි. මේ යන විධියට ඉස්සරහටත් ඒ සංඛ්‍යාව වැඩි වෙනවා. විපක්ෂයේ කිහිප දෙනෙක් කථා කළා, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ගැන. මේවා නිකම් බොරු. ඒකෙන් වුණේ අපේ රටේ තිබෙන පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට සමාජමය ප්‍රශ්නයක් ඇති වීමයි. ඒ විතරක් නොවෙයි, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට යන ළමයින්වත් අතරමං කළා, ඒ අයගේ දෙමව්පියනුත් අතරමං කළා. ඒ නිසා මේ වගේ තීරණවලට අපට ඉඩ දෙන්න බැහැ.

අපි දන්නවා, අපේ රටේ ජනගහනයෙන් 800දෙනෙකුට එක වෛද්‍යවරයෙක් සිටින බව. නමුත්, WHO එක කියන්නේ, අද වන විට ජනගහනයෙන් 1,000කට එක වෛද්‍යවරයායි කියලා. නමුත් අපට කියන්න බැහැ. අපට UK level එකට, USA level එකට යන්න බැහැ, අපේ රටේ ආර්ථිකයත් එක්ක. අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරන්න නම් ඖෂධ පැත්තෙන් දියුණු වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ nursesලා ඉන්න ඕනෑ, pharmacistsලා ඉන්න ඕනෑ, අතුරු වෛද්‍ය සේවකයින් ඉන්න ඕනෑ. යම් සමතුලිතතාවක් තිබෙන්න ඕනෑ. අන්න ඒ විධියේ affordable, හොඳ සෞඛ්‍ය සේවයක් ජනතාවට ඉදිරියේදී ඇති විය යුතුයි.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[பி.ப. 4.32]

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்திலுள்ள இறக்காமம் கிராமமானது, தனியான பிரதேச சபை மற்றும் பிரதேச செயலகம் என்பவற்றைக் கொண்ட மூவின மக்களும் வாழுகின்ற ஒரு கிராமமாகும். இங்கு சுமார் 22,000 மக்கள் வாழ்வதுடன், 12 கிராம சேவகர் பிரிவுகளும் 13,500 வாக்காளர்களும் உள்ளனர். 1915ஆம் ஆண்டு காலப்பகுதியில் இங்கு மத்திய மருந்தகம் ஒன்று ஆரம்பிக்கப்பட்டு இருந்தது. தற்போது அது “C” தர பிரதேச வைத்தியசாலையாக இயங்கி வருகின்றது. அதிக வளக் குறைபாடுகளுடன் காணப்படும் இந்தப் பிரதேச வைத்தியசாலையானது தரமுயர்த்தப்படல் வேண்டும். இங்குள்ள நோயாளர்கள் அம்பாறை மாவட்ட பொது வைத்தியசாலைக்குச் செல்வதென்றால், எல்லைக் கிராமங்களில் இருந்து 15-20 கிலோமீற்றர் தூரம் பயணம் செய்யவேண்டி உள்ளது. அது மட்டுமன்றி, அம்பாறை மாவட்ட பொது வைத்தியசாலையில் அவர்கள் மொழிப் பிரச்சினைக்கும் உள்ளாகின்றனர். இந்த வைத்தியசாலையில் மகப்பேற்றுப் பிரிவொன்றை ஆரம்பிக்க வேண்டுமென கடந்த பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் பிரதேச சபைத் தவிசாளர் முஸ்மி அவர்களும் உப தவிசாளர் ஆசிக் அவர்களும் உறுப்பினர் கே.எஸ். சமீம் அவர்களும் தெரிவித்ததை நான் இந்த இடத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நிந்தவூர் பிரதேசத்தில் இயங்கி வருகின்ற தொற்றா நோய்க்கான ஆயுர்வேத ஆராய்ச்சி வைத்தியசாலையானது 2017இல் ஆரம்பிக்கப்பட்டது. இதற்கான நிரந்தரக் கட்டிடம் அமைக்கப்படுவதற்கான நிலம் கொள்வனவு செய்யப்பட்டு, முன்னாள் சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ இராஜாங்க அமைச்சர் பைஸல் காசிம் அவர்களின் முயற்சியால் கட்டிட வேலைகளும் ஆரம்பிக்கப்பட்டன. எனினும், அது நிறைவுறாத நிலையில் உள்ளது. தற்போது இந்த வைத்தியசாலையானது, வேறோர் இடத்தில் எந்தவிதமான அடிப்படை வசதிகளுமின்றி பல்வேறு சிரமங்களுக்கு மத்தியில் இயங்கி வருகின்றது. இந்த வைத்தியசாலையானது மத்திய அரசின் கீழே இருக்கின்றது. எங்களுடைய உள்நாட்டு மருத்துவ முறையில் காணப்படுகின்ற விசேட மருத்துவ முறைகளையும் மருந்துகளையும் ஆராய்ச்சி செய்து, அதன் முடிவுகளை விஞ்ஞான ஆராய்ச்சி முறையில் பெற்று, அதன் பிரதிபலனை நாட்டுக்கும் மக்களுக்கும் திறம்பட செயன்முறையில் வெளிக்காட்டுவதே இதன் முக்கிய நோக்கமாகும்.

இந்த வைத்தியசாலையை அபிவிருத்தி செய்வதன் மூலம் green tourism, holistic மருத்துவ முறை மற்றும் இயன் சிகிச்சை முறை ஊடாக நாட்டு மக்களுக்கும் வெளிநாட்டவர்களுக்கும் மிகக்கூடிய பலன்களை வழங்கலாம். எனவே, குறையிலுள்ள கட்டிட வேலைகளை விரைவாக நிறைவுசெய்து, தொற்றா நோய்க்கான ஆயுர்வேத ஆராய்ச்சி வைத்தியசாலையை சிறப்பாக இயங்க வைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பல்வேறு சிரமங்களுக்கு மத்தியில் அங்கு கடமைபுரிகின்ற வைத்தியர் எம்.வை. இஷாக் அவர்களுக்கு இந்தச் சபையில் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் இயங்குகின்ற பொத்துவில் சுகாதார வைத்திய அதிகாரி காரியாலயமானது, 48,000 மக்களுக்கு தாய் சேய் நலன் சேவையை வழங்கி வருகின்றது. 296 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்ட இக்காரியாலயத்துக்கு 16 பொதுச் சுகாதார மருத்துவ மாதுக்கள் தேவையாக உள்ளனர். 2017இல் அங்கு 13 ஆளணியினர் இருந்தபோதிலும், இன்று 10 பேர் மட்டுமே கடமை புரிகின்றார்கள்.

மேலும், கல்முனை RDHS பிரிவில் ஆளணி அதிகமாக இருப்பதாக சுகாதார அமைச்சின் தகவல்கள் கூறுகின்றன. அவ்வாறாயின், ஏன் கடந்த எட்டு வருட காலமாக பொத்துவில் சுகாதார வைத்திய அதிகாரி காரியாலயத்தில் இந்த வெற்றிடங்கள் காணப்படுகின்றன? என நான் இந்தச் சபையில் கேட்க விரும்புகின்றேன். எனவே, மிக விரைவாக பொத்துவில் சுகாதார வைத்திய அதிகாரி காரியாலயத்துக்கு பொதுச் சுகாதார மருத்துவ மாதுகளை நியமனம் செய்து, அப்பிரதேசத்தில் சுகாதார சேவையை மேம்படுத்துவதற்கு இந்தச் சபை நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த 35 ஆண்டுகளாகச் சிறந்த சுகாதார சேவையை வழங்கி வந்த அண்மையில் ஓய்வுபெற்ற

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

மேற்பார்வை சுகாதாரப் பரிசோதகர் அப்துல் மலிக் அவர்களுக்கும், பல்வேறுபட்ட சிரமங்களுக்கு மத்தியில் பணியாற்றும் சுகாதார வைத்திய அதிகாரி உவைஸ் பாறூக் அவர்களுக்கும் என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கோமாரி ஆரம்ப மருத்துவ பராமரிப்பு நிலையமானது, பொத்துவில் ஆதார வைத்தியசாலையில் இருந்து 16 கிலோமீற்றர் தூரத்திலே இருக்கின்றது. அங்கு காலை 8.00 மணி முதல் பிற்பகல் 4.00 மணி வரைக்குமே சுகாதார சேவைகள் இடம்பெறுகின்றன. இதனால் அப்பிரதேசத்திலுள்ள 12 சிறிய கிராமங்களைச் சேர்ந்த மக்கள் இரவு வேளைகளில் காட்டுப் பிரதேசம் ஊடாகப் பயணம் செய்து, பொத்துவில் ஆதார வைத்தியசாலைக்குச் சென்றே சிகிச்சை பெறவேண்டி உள்ளது. அவ்வாறு அவர்கள் செல்லும் வழியில் யானைத் தாக்குதல் மற்றும் விபத்துகளுக்கு முகம்கொடுக்க வேண்டிய நிலைமைகளும் ஏற்படுகின்றன. எனவே, போக்குவரத்து மற்றும் ஏனைய சிரமங்களைக் கவனத்திற்கொண்டு கோமாரி ஆரம்ப மருத்துவ பராமரிப்பு நிலையத்தை பிரதேச வைத்தியசாலையாகத் தரமுயர்த்த நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். மேலும், அங்குள்ள மகப்பேற்றுப் பிரிவுக் கட்டிடத்தைத் திருத்தம் செய்து, அப்பிரிவை இயக்குவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். அத்துடன், வாரத்தில் ஒரு நாளிலாவது அங்குள்ள பற்சிகிச்சைப் பிரிவை இயங்கவைக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

கோமாரி ஆரம்ப மருத்துவ பராமரிப்பு நிலையத்துக்குரிய ambulance வண்டியானது, கொரோனா தொற்றுக் காலத்திலிருந்து திருக்கோவில் வைத்தியசாலையின் தேவைகளுக்குப் பயன்படுத்தப்பட்டு வருகின்ற நிலையில், இன்றுவரை மீள ஒப்படைக்கப்படவில்லை. எனவே, அந்த ambulance வண்டியை மீளவும் கோமாரி ஆரம்ப மருத்துவ பராமரிப்பு நிலையத்துக்குப் பெற்றுக்கொடுப்பதற்கு இந்தச் சபை நடவடிக்கை எடுக்க வேண்டும். அங்கு பல்வேறுபட்ட சிரமங்களுக்கு மத்தியில் கடமைபுரிகின்ற வைத்தியர் ஆகில் அவர்களுக்கு இந்தச் சபையில் நன்றிகளைத் தெரிவித்துக்கொள்வதோடு, ஆளணி அடிப்படையில் மேலும் ஒரு வைத்தியரை அங்கு நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, மேற்படி விடயங்களை என்னுடைய கவனத்துக்குக் கொண்டுவந்த சுபோதரன் அவர்களுக்கு எனது நன்றிகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

பொத்துவிலின் தெற்குப் புறமாக இயங்குகின்ற P/05 சவாளை ஆரம்ப சுகாதார வைத்திய நிலையமானது, P5, P18, P19 ஆகிய மூன்று கிராம மக்களுக்கு மட்டுமன்றி, அறுகம்பைக்கு வருகின்ற சுற்றுலாப் பயணிகளுக்கும் மிகச் சிறந்த மருத்துவ சேவைகளை வழங்கி வருகின்றது. அங்கு ஒரு மருத்துவர் மட்டுமே கடமை புரிந்து வருகின்றார். ஆளணி அடிப்படையில் அங்கு இன்னுமொரு வைத்தியர் நியமிக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது. மேலும், அங்கு ஓர் அபிவிருத்தி உத்தியோகத்தர் நியமிக்கப்பட்டால் வேலைகளை இலகுவாகச் செய்ய முடியுமென நாம் எதிர்பார்க்கின்றோம்.

இந்த ஆரம்ப சுகாதார வைத்திய நிலையமானது, தங்குமிட வசதி உட்பட பல தேவைகளைக் கொண்டிருக்கிறது. அவற்றை நிவர்த்தி செய்ய நடவடிக்கை எடுப்பதுடன், யானைகளின் தாக்குதலில் இருந்து பாதுகாப்பதற்கு இந்த ஆரம்ப சுகாதார வைத்திய நிலையத்தைச் சுற்றி யானை வேலிகளை அமைப்பதற்கும் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அங்கு பல்வேறு சிரமங்களுக்கு மத்தியில் கடமைபுரிந்து வருகின்ற வைத்தியர் ஏ.யூ. ஸமத் அவர்களுக்கு இந்தச் சபையில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எதிர்காலத்தில் இந்த ஆரம்ப சுகாதார வைத்திய நிலையத்தை 24 மணி நேரமும் இயங்க வைப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். மேற்படி ஆரம்ப சுகாதார வைத்திய நிலையம் சம்பந்தமான தகவல்களை எனக்கு வழங்கிய துணைத் தவிசாளர் மாபீர் அவர்களுக்கும் யாஸீன் ஸியாத் அவர்களுக்கும் எனது நன்றிகளைக் கூறி, விடைபெறுகின்றேன். வஸ்ஸலாம்!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.37]

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ කථා කරන, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වූ නියෝග පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ජාතික ජන බලවේගය රජයේ ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශය මෙවැනි එඩිතර තීන්දුවක් ගැනීම පිළිබඳව මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, අපේ රටේ දෙකෝටි විසි ලක්ෂයක ජනතාවක් ඉන්නවා නම්, ඒ සියලුදෙනාටම බලපාන ප්‍රශ්නයක් තමයි මේ ඖෂධ ප්‍රශ්නය. ඒගොල්ලන්ට විතරක් නොවෙයි, මේ මොහොතේ අම්මා කෙනෙකුගේ කුසේ දරුවෙක් ඉන්නවා නම්, ඒ දරුවාටත් මේක බලපානවා. අනාගතයේ උපදින්න ඉන්න දරුවන්ටත් බලපාන ප්‍රශ්නයක් පිළිබඳව අභීත තීන්දුවක් තමයි ඔබතුමන්ලා අද මේ ගත්තේ.

වෛද්‍ය විද්‍යාව දියුණුවීම, ඖෂධ දියුණුවීම දීර්ඝ ඉතිහාසයක ඉඳලා සිද්ධ වෙච්ච දෙයක්. අපි මානව ඉතිහාසය පිළිබඳව සොයා බලද්දී මිනිස්සු තමන් ලෙඩ වෙනවා කියන එක හඳුනාගෙන තිබුණේ, තමන්ට හතුරුකම් කරන අද්භූත බලවේගයක් විසින් මේ නස්පැත්තිය කරනවා කියලායි. ඒ නිසා අතීතයේ මිනිස්සු බලිතොවිල්, යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් වාගේ දේවල් තමයි ප්‍රතිකාර විධියට කළේ. නමුත්, ඒවාට බලපාන හේතු මොනවාද කියලා

මිනිස්සු අත්දැකීමෙන් තේරුම් ගත්තා, විග්‍රහ කර ගත්තා. මිනිස්සු ඒවාට ඖෂධ සොයන්න පටන් ගත්තා. විශේෂයෙන්ම මිනිස්සු අනාදිමත් කාලයක සිට සමහර ලෙඩ රෝගවලට ශාක සහ සත්ව කොටස් පාවිච්චි කරලා, උත්තර සොයන්න පටන් ගත්තා. ඒකේ දියුණුවීම තමයි, අපි ආයුර්වේද වෛද්‍ය විද්‍යාව කියලා හඳුන්වන්නේ. ඒ විධියට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව දියුණු වුණා. අපේ රටෙත් ඈත ගම්වල මීට අවුරුදු සිය ගණනකට පෙර හිටපු ඒ වෛද්‍යවරු ස්වේච්ඡාවෙන් තමන්ගේ ගමේ අවට ජනතාවට සේවය කළා. තමන් සොයා ගත්ත දැනුමෙන්, ඒක පෝෂණය කරමින් තමයි මේ ඖෂධ සොයා ගත්තේ. ඒ නිසා, අපේ රටේ විතරක් නොවෙයි. ඉන්දියාව, චීනය වාගේ ලෝකයේ දියුණු අතීත ශිෂ්ටාචාර තිබුණු රටවල පවා මේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව දියුණු වෙලා, රසායනික විද්‍යාවත්, වෛද්‍ය විද්‍යාවත් දියුණුවීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ ඖෂධ නිර්මාණය වෙන්නේ.

මේ ඖෂධ නිර්මාණය වෙනකොට, මේක අත්හදා බලපු බොහෝ අය මිය ගියා, ආබාධිත වුණා. එහෙම පරිත්‍යාගයෙන් තමයි මේ ඖෂධ හදා ගත්තේ. ඒ නිසා මිනිස් ජීවිතයේ වැදගත්ම එකක් තමයි ඖෂධ කියලා කියන්නේ. ධනවාදී ආර්ථික ලෝකයේ ධන කුවේරයන් විසින් ලාභ ඉපැයීම සඳහා ඒ ඖෂධ තමන්ගේ ග්‍රහණයට නතු කරගෙන තිබෙනවා. ඒ ලාභ කොටස වැඩි කර ගැනීම සඳහා ජාවාරම් කල්ලියක් බිහි වෙලා තිබෙනවා. අපේ රටෙත් එවැනි අවස්ථා අපි හොඳ හැටි දැකලා තිබෙනවා. ඒ වාගේම, වර්තමාන වෛද්‍ය විද්‍යාවේ දියුණුවේ ප්‍රතිඵල පසුගිය කාලයේ අපේ රටේ ජනතාවට ලැබුණේ නැහැ. ඒකට හේතු තිබෙනවා. වරින්වර බිහි වෙච්ච ආණ්ඩුවල ඇමතිවරු වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරනවා වෙනුවට තමන්ගේ දේශපාලන වුවමනාවන් සඳහා, බඩජාරිකමට තමන්ගේ ධනවත්වීමේ උපාය මාර්ගය බවට සෞඛ්‍ය ක්ෂේත්‍රය පත් කර ගැනීමයි කළේ.

අද සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපාන බරපතළ ගැටලු ගණනාවක් තිබෙනවා. අවශ්‍ය කාර්ය මණ්ඩලය එදා ඉඳලා බඳවා ගෙන තිබුණේ නැහැ. විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ අනුමත cadre එක සම්පූර්ණ කරලා තිබුණේ නැති නිසා අද වන විට විශාල ගැටලු ගණනාවකට අපි මුහුණ දීලා තිබෙනවා. රෝහල් පද්ධතිය නවීකරණය කරලා, ඒවාට අවශ්‍ය නවීන යන්ත්‍රසූත්‍ර ගෙනැවිත් දීලා නැහැ. මෙතැන ඉන්න විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් උදේ කියනවා ඇහුණා, අහවල් රෝහලේ අර උපකරණය කැඩිලා, මේ උපකරණය කැඩිලා කියලා. ඒවායේ ඉතිහාසය සොයා බැලුවාම, එම උපකරණ අරගෙන දීලා තිබෙන්නේ මීට අවුරුදු 25කට, 30කට කලින්. ඒවායේ ආයු කාලයත් අවසන්. හැබැයි, ඒවා ඉක්මනින් නවීකරණය කර ගැනීම සඳහා අපි සූදානම් වනවා. ඒකට යම් කාලයක් ඕනෑ.

ඒ වාගේම තමයි ඖෂධ සම්බන්ධයෙන් තිබෙන ගැටලුව. අපි දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවත් එක්ක අරගළ කළා, පැවති ආණ්ඩුවලට බල කළා, මේ රටේ ජන ජීවිත සුරක්ෂිත කරනවා නම්, අධ්‍යාපනය, සෞඛ්‍ය වාගේ දේවල් ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට ගේන්න ඕනෑය කියලා. විශේෂයෙන්ම අපේ රටේ ජනතාව රෝහල්වලට ඇදිලා ගියේ තමන්ගේ ජීවිතයට යම් හෝ සහනයක් බලාගෙන. හැබැයි, ඇඳක දවස් ගණන් ඉන්නකොට, බෙහෙත් නැති බව දන්නකොට, ක්ලිනික් එකට ගියාම තමන්ගේ රෝගයට අවශ්‍ය බෙහෙත නැති බව දැනගන්නකොට මොන තරම් දුක්ඛිත ජීවිතයක්ද ඒගොල්ලන් ගෙව්වේ? ග්‍රාමීය ප්‍රදේශවල අම්මලා, තාත්තලා ෆාමසියට ගිහිල්ලා, බෙහෙත් ලියපු පොත පෙන්වලා, "මහත්තයෝ, මේකේ ගණන කීයද?" කියලා අහලා දවසකට බෙහෙත් ගන්නවා, එක්කෝ ආපහු හැරිලා යනවා. ඒ නිසා ඖෂධ ජාවාරම් පිටුපස තිබෙන මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ පරද්දන්න නම් මේ වාගේ පනත් යටතේ ගෙන එන නියෝග සම්මත කළ යුතුයි. ඒක අපි බලාපොරොත්තුවෙන් හිටියා. ඒක අද යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්තමාන ආණ්ඩුව ගත් ඉතාම නිර්භීත තීන්දුවක් තමයි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ඖෂධ මිල පාලනය සඳහා ගෙනාපු මේ අදහස. සමහර මන්ත්‍රීවරුන් බිල්ලෝ මවනවා, මේ නිසා ඉදිරියේදී ඖෂධ නැතිවෙයි, බාල ඖෂධ එයි කියලා. ඔව්, කමක් නැහැ. ඕනෑම හොඳ වැඩක් කරන්න ගියාම බාධා එනවා, ගැටලු එනවා. ආණ්ඩුවක් හැටියට අපි ඒ හැම ගැටලුවකටම උත්තර හොයාගෙන, බාධක බිඳලමින්, මේ රටේ ජනතාව වෙනුවෙන් ඖෂධ මිල නියාමනය කිරීම සඳහා වූ නීති, අණ පනත් සම්මත කර ගන්නවා. විශේෂයෙන්ම අපේ පක්ෂයේ හොඳ, දක්ෂ වෛද්‍යවරුන් ගණනාවක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපි කවුරුත් එකතු වෙලා ජනතාවට හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා කටයුතු කරන බව මතක් කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම අද සිදු වන්නේ, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ඖෂධවලට මිල සූත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා වූ නියෝග අනුමත කිරීම. ඇත්තටම ජීවිතය කියන්නේ, ඖෂධත් එක්ක, එහෙම නැත්නම් වෛද්‍යවරුනුත් එක්ක බැඳිච්ච දෙයක්. රෝහල කියන්නේ, හැම කෙනෙකුටම ජීවිතය ලබා දෙන තැනක්. ඒ නිසා යම් කෙනෙකුට සෞඛ්‍ය අමාත්‍ය ධුරය ලැබීමත් එක්තරා විධියක පිනක් හැටියට මා දකිනවා. වර්තමාන සෞඛ්‍ය අමාත්‍යවරයා ලොකු වෙහෙසක් ගන්නවා, මේ වැඩසටහන කරන්න. ඒක හොඳයි. හැබැයි, මෙතැන ප්‍රශ්න කිහිපයක් දැන් ඇති වෙලා තිබෙනවා.

අද වෙනකොට අපට වාර්තා වෙලා තිබෙනවා, ඖෂධ වර්ග 100ක විතර හිඟයක් තිබෙනවා කියලා. ඒ, අත්‍යවශ්‍ය ඖෂධත් එක්ක. මේ ඖෂධ හිඟය නිසා යම් තැනක, රෝහලක, යම්කිසි රෝගියෙක් මිය ගියොත්, ඒකට වගකියන්නේ කවුද? ඒකට රජයට විතරක් නොවෙයි, අප සියලුදෙනාටම වගකියන්න වෙනවා. හිටපු කැබිනට් අමාත්‍යවරයෙක්, සෞඛ්‍ය කටයුතු සම්බන්ධව ගත් වැරදි තීන්දු මත, කරපු ජාවාරම් මත අධිකරණයට ඉදිරිපත් කරලා හිර කුඩුවේ ඉන්න සැලැස්වූයේ අපි. පක්ෂයක් හැටියට අද අපි සතුටු වෙනවා, රටේ ජනතාව වෙනුවෙන් ඒ දේ කරන්න ලැබීම ගැන. ඒක කළේ එතුමන්ලාත් එක්ක තිබෙන තරහකට නොවෙයි. එහෙම කළේ එතුමන්ලා අතින් පැහැදිලිවම මේ රටට විශාල විනාශයක් සිදු වෙච්ච නිසායි. ඒ විනාශයෙන් ජනතාව බේරාගන්න ඕනෑ නිසා තමයි අපි ඒ කටයුත්ත කළේ.

මේ අවස්ථාවේදී තවත් විශේෂ කාරණා කිහිපයක් මම මතක් කරන්න ඕනෑ. රෝහල් සඳහා සමහර ඖෂධ ප්‍රාදේශීය වශයෙන් මිලදී ගැනීමට අවස්ථාව ලබා දී තිබෙනවා. මේ රටේ නිෂ්පාදනය කරන ඖෂධ තිබෙනවා, පිට රටින් ගෙන්වන ඖෂධ තිබෙනවා. මේවාට එක එක මිල ගණන් තිබෙනවා. අපි මේවා මිල සූත්‍රයක්

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

යටතට යන්න ගියාට, ප්‍රාදේශීය වශයෙන් යම් කිසි රෝහලකට ඖෂධ මිලදී ගන්න අවස්ථාව දුන්නොත් ඒ මිල සූත්‍රය යටතේ, එහෙම නැත්නම් ඒ ආකාරයෙන්ම ඖෂධ මිලදී ගන්න පුළුවන්ද? ඒ මිල ගණන් යටතේ ඖෂධ මිලදී ගන්න හැකි වෙයිද? මොකද, එතැන තරගකාරිත්වයක් තිබෙන්නේ පෞද්ගලික අංශයත් එක්ක. ඒ තරගකාරිත්වයත් එක්ක අපට සටන් කරන්න හැකි වෙයිද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. එහෙනම් ඉස්සෙල්ලාම අපට ප්‍රාදේශීය වශයෙන් ඖෂධ මිලදී ගැනීමට ලබා දෙන අවස්ථාව අඩු කරන වැඩ පිළිවෙළක් හදන්න වනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඖෂධවලට අමතරව සායනික උපකරණවලත් හිඟයක් තිබෙනවා. එම නිසා සායනික උපකරණවල හිඟයටත් යම් කිසි වැඩ පිළිවෙළක් හදන්න වනවා. හැබැයි, ඒ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් හදද්දී අපි යම් දෙයක් දකිනවා. විශේෂයෙන්ම ඔබතුමාට දිගින් දිගටම අපි මේ කථාව කියනවා. අපි සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් එදා ඉඳලා ලොකු සටනක් දුන්නා. ඔබතුමාට මතක ඇති, එදා පාර්ලිමේන්තුවේ ඉන්න කාලයේ ඔබතුමාත් මේ පැත්තේ ඉඳලා සටන් කළා, සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධ කාරණා වෙනුවෙන්. පසුගිය පාර්ලිමේන්තුවේ ඔබතුමා හිටියේ නැහැ, ගරු ඇමතිතුමනි. නමුත්, ඔබතුමන්ලාගේ කණ්ඩායම ලොකු සටනක් කළා, අපිත් එක්ක ඒ වැඩ කටයුතු කරන්න. ඔබතුමා, ජාතික ඖෂධ නියාමන අධිකාරියට සුදුසුකම් ලත් ප්‍රධාන විධායක නිලධාරියෙක් පත් කර තිබෙනවා. ඒක හරි. හැබැයි, ඒ සභාපතිවරයා සුදුසුකම්ලත් කෙනෙක්ද? ඔහුට අධ්‍යක්ෂ මණ්ඩලය ගැන, ඖෂධ ගැන, ඒ තත්ත්ව සම්බන්ධව, නියාමනය ගැන ප්‍රමාණවත් විධියට දැනුමක් තිබෙනවාද, නැද්ද?

ඊළඟ කාරණය මෙයයි. NMRA එකේ සභාපතිවරයාට පුළුවන්ද, private hospital එකකට ගිහිල්ලා channelling කරන්න? Channelling කළාම මොකක්ද එතැන වෙන්නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් යම් කිසි දෙයකට සම්බන්ධ වුණාට පස්සේ එතැන වැරැද්දක් සිද්ධ වුණොත්, it is a conflict of interest. එතකොට Dr. Ananda Wijewickrama NMRA එකේ සභාපති හැටියට කටයුතු කරද්දී, ඔහු private hospital එකක channelling කරද්දී, අර අය කියන විධියට වැඩ කළොත්, ඒකෙන් වැරැද්දක් සිද්ධ වුණොත් මොකද වෙන්නේ? ඒ නිසා මේ රටට ඖෂධ ටික නියමිත වෙලාවට ආවේ නැත්නම්, ඒ අය කියන විධියට සමහර ආයතන ලියාපදිංචි නොකර නතර කළොත්, ඒ ප්‍රශ්නය ඇති කළොත්, අභ්‍යන්තරිකව සිදු වන ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කවුද කියන්න. මේ රටේ ජනතාව තමයි ඒකට මුහුණ දෙන්නේ. *[බාධා කිරීමක්]* මම මේ ඇහුවේ මේක හරිද, වැරදිද, එහෙම චැනල් කරන්න පුළුවන්ද, ඒක සදාචාර ද, නැද්ද කියලා. ඒක විතරක් ඔබතුමා කියන්න. හැබැයි, මගේ වෙලාව දෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහත්මයා සැහෙන කාලයක් තිස්සේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති හැටියට වැඩ කරනවා. ඇත්තටම එතුමා අපේ ආණ්ඩුව පත් වෙන්න කලිනුත් එහි සභාපති හැටියට කටයුතු කළා. එතුමා නිවැරදිව සේවය කරපු නිසා සහ මේ රටේ වෛද්‍ය සේවාවට, සෞඛ්‍ය සේවාවට විශිෂ්ට සේවාවක් කරන කෙනෙකු හැටියට අපි එතුමාව එම සභාපති ධුරයේ දිගටම තියාගත්තා. මෙතෙක් කල් එතුමා සම්බන්ධයෙන් කිසිම පැමිණිල්ලක් ලැබිලා නැහැ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ඉදිරි අය වැය කාලය තුළදී අපි ඔබතුමාට කරුණු කාරණා ඉදිරිපත් කරන්නම්, ගරු ඇමතිතුමනි. එතකොට ඔබතුමා ඒ ගැන පියවරක් ගනියි කියලා අපි විශ්වාස කරනවා. *[බාධා කිරීමක්]* හොඳයි, කමක් නැහැ. ඔබතුමන්ලා කලබල වෙන්න එපා. අපි මෙතුමාට උදවු කරන්න යන්නේ. මෙතුමාගේ රාජකාරිය, විශේෂයෙන්ම මෙතුමා ජනතාව වෙනුවෙන් කරන සේවය ශක්තිමත් කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න යන්නේ. එතුමා පත් කළ කෙනෙක්ව අපි අයින් කරන්න කිව්වේ නැහැ. අපි කිව්වේ, මෙහෙම දෙයක් තිබෙනවා, මේක වැරදිද, නිවැරදිද කියන්න කියලායි. මොකද, ඔය වාගේ දිගින් දිගටම කියලාත් කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයා ඇහුවේ නැහැ. හැබැයි, අවසානයේ මොකද වුණේ? අනුන්ගේ පරිප්පු කන්න ඕනෑ නැහැ නේ. ඒ නිසායි මම ඒ ගැන කිව්වේ.

කාල වේලාව හුඟක් නැති නිසා, දැන් මම මගේ දිස්ත්‍රික්කය ගැන පොඩ්ඩක් කථා කරන්නම්. දංකොටුව ප්‍රාදේශීය රෝහලේ eye clinic එක සහ dental clinic එක මේ වනකොට වහලා තිබෙන්නේ. කරුණාකරලා මේ සම්බන්ධව විශේෂ උනන්දුවකින් සොයා බලන්න. මේ දිස්ත්‍රික්කයේ අහිංසක ජනතාව වෙනුවෙන් ඔබතුමා මේ වැඩ කටයුත්ත හරියට කරයි කියලා විශේෂයෙන් මම බලාපොරොත්තු වනවා.

ඊළඟට මාරවිල මූලික රෝහල ගත්තොත්, එම රෝහලේ surgical ward එක, theater එකත් එක්ක complex එකක් විධියට හදන්න තිබෙන්නේ. හැබැයි, ඒකේ වැඩකටයුතු අවසන් වෙලා නැහැ. එහි ඉදිකිරීම් භාගෙට නතර වෙලා තිබෙනවා. Nursing quartersත් කඩලා තමයි ඒ කටයුතු පටන් ගත්තේ. හැබැයි, දැන් nursing quartersත් නැහැ, එම ගොඩනැඟිලි සංකීර්ණයේ වැඩ කටයුතු අවසන් වෙලාත් නැහැ. අද nursing quarters නැති නිසා ඒ අය වෙනම ස්ථාන කුලියට අරගෙන තමයි ඉන්නේ. ඒ නිසා එතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගොඩනැඟිලි සංකීර්ණය හදලා අවසන් කළොත් රෝහල් කාර්ය මණ්ඩලයට ලොකු සහයෝගයක් ලැබෙනවා වාගේම ප්‍රදේශයේ ජනතාවටත් ඒ තුළින් ලොකු සහනයක් ලැබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඔබතුමාට විශේෂයෙන් මේ කාරණය මම මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාට කිව යුතු තව කාරණාවක් තිබෙනවා. මේ කාරණාව කිව්වාට හදිසි වෙන්න එපා. මම මේ කියන්නේ, මාරවිල මූලික රෝහලේ මෝචරිය ගැනයි. එම මූලික රෝහලේ මෝචරිය ගිලා බැහැලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මේ වනකොට freezer එකයි වැඩ කරන්නේ. අනෙක් ඒවා වැඩ කරන්නේ නැහැ. එම නිසා මෘතදේහ නරක් වන අවස්ථා වැඩියි. ඒවා වෙනත් රෝහලකට යවන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. කියන්න බැරි කාරණයක් තිබුණත් එය කිව යුතු වනවා. අවසන් කටයුතු කරන්න පෙර මරණ පරීක්ෂණය කරද්දී දේහයක් කපන්න ඕනෑ. මෘතදේහ කපන ආයුධ කට්ටල ටික පරණයි. ඒවායෙන් කපන්න බැහැ. ඒක මැරුණු මිනිහෙක්ව දෙවතාවක් මරනවා වාගේ වැඩක්. එම ආයුධ ටික අවුරුදු හයකට වඩා පරණයි. එම නිසා ඒ ආයුධ පාවිච්චි කරන්න බැහැ. ඒ ගැනත් සොයා බලන්න කියලා ඔබතුමාගෙන් විශේෂයෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, උඩප්පුව ප්‍රාදේශීය රෝහල ගත්තාම ජනතාවට අවශ්‍ය ඖෂධවලින් රෝහලෙන් ලැබෙන්නේ සියයට 50ක් විතරයි. ඉතුරු සියයට 50 ලැබෙන්නේ විදේශගත වෙලා ඉන්න ශ්‍රී ලාංකිකයන්ගෙන්. ඔවුන් තමයි එම ප්‍රදේශයේ අයට ඖෂධ ටික අරගෙන දෙන්නේ. එම රෝහලේත් සේවය කරන වෛද්‍යවරුන්ට

quarters නැහැ. උඩප්පුව කියන්නේ ප්‍රවාහනය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙන ප්‍රදේශයක්. මේ සම්බන්ධව බලන්න කියාත් ඔබතුමාගෙන් විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම මම කල්පිටිය ප්‍රාදේශීය රෝහල පිළිබඳවත් මතක් කරන්න ඕනෑ. කල්පිටිය ප්‍රාදේශීය රෝහලේ ගොඩනැඟිල්ලක් හැදුවා. Surgical වාට්ටුවක් එක්ක තමයි ඒ රෝහල හැදුවේ. ඒ රෝහල හදද්දි Base Hospital එකක් හැටියට ඒක upgrade කළා, 2019දී. හැබැයි, එම රෝහලට තවම cadre එක ලබා දීලා නැහැ; වෛද්‍යවරු ලබා දීලා නැහැ. අවශ්‍ය නිලධාරීන් ලබා දීලා නැහැ. එතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එම රෝහලෙන් ප්‍රතිකාර ගන්න කල්පිටියේ අය එනවා; මන්නාරමේ අය එනවා. ඒ විතරක් නොවෙයි, විදේශිකයෝත් එම රෝහලෙන් බෙහෙත් ගන්න එනවා. කල්පිටිය මූලික රෝහල කියන්නේ, විශේෂිත වූ රෝහලක්. හැබැයි, කල්පිටිය මූලික රෝහලේ හදපු එම ගොඩනැඟිල්ල තවම විවෘත කරලා නැහැ. එය හැදුවේ අපි තමයි. හැබැයි, ඔබතුමා ගිහිල්ලා ගොඩනැඟිල්ල විවෘත කරලා එම ප්‍රදේශයේ ජනතාවට සේවය ලබා ගැනීමට අවශ්‍ය වැඩකටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මම මීට වඩා ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, කථා කරනවා නම් කියන්න කාරණා ගොඩක් තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, රෝහල්වල quarters ගැන විශේෂයෙන් සොයා බලන්න. මොකද, වෛද්‍යවරු ඉතා දුර බැහැර සිට රෝහලට එන්න ඕනෑ. ප්‍රවාහනය සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. වියදම වැඩියි. එම නිසා ඒ අයට නවාතැන් පහසුකම් ටික ලබා දෙන්න.

ඊළඟට, පුත්තලම මූලික රෝහල ජාතික රෝහලක් හැටියට උසස් කරන්න කියලා අපි ඉල්ලුවා. ඒ වෙනුවෙන් අපි කාලයක් තිස්සේ ලොකු සටනක් දුන්නා. පසුගිය ආණ්ඩු කාලයේදීත් අපි ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කළා. හැබැයි, ඒ කටයුත්ත කර ගන්න බැරි වුණා. ඔබතුමා ආපු ගමන් කිව්වා, ඒක කරලා දෙනවාය කියලා. දැන් එය කරලා දෙනවා නම් ඉතා වැදගත්. ඒ කටයුත්තත් කර දෙන්න කියලා අවසාන වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! විවාදයේ වැඩකටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.55]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ඉදිරිපත් කරන ලද නියෝග සම්බන්ධයෙන් අද දවසේ පැවැත්වෙන විවාදයේදී කරුණු කිහිපයක් මතු වුණා. මම හිතන විධියට, එහි පසුබිම සහ මෙම ආණ්ඩුවෙන් ඇයි මෙම නියෝග ගෙන එන්නේ කියන කාරණය මට කලින් කථා කළ අපේ ගරු ඇමතිතුමා සහ අපේ කථිකයන් සඳහන් කළා. මෙම පනත ගෙනැල්ලා 2015 වර්ෂයෙන් පසුව ජනතාවට සහනයක් වන ආකාරයටත්, අනෙක් පාර්ශ්වකරුවන්ට අසාධාරණයක් නොවන ආකාරයටත් නියමිත පටිපාටියට, නිසි ක්‍රියාවලියකින් ලංකාවේ ඖෂධවල මිල පාලනය කර ගැනීමේ අවශ්‍යතාව දිගටම තිබුණා. එහෙම තිබියදී තමයි මේ ක්‍රියාවලිය කල් ඇදෙමින් සහ විවිධ ගැටලු ඔස්සේ ඉස්සරහට ගියේ. 2019 ඔක්තෝබර් 21වැනි දා ඖෂධ මිල නියම කිරීමේ කමිටුව පිහිටවපු දින සිට මේ දක්වා අවුරුදු 5ක් ගත වෙලා තිබෙනවා.

ඒ කාලය තුළත් වරින් වර උත්සාහයන් ගත්තාට ඒකේ අවසාන තැනකට එන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. බෙහෙත් හිඟයි, දැන් අපි කරන්න යන මේ කටයුත්තෙන් තවත් බෙහෙත් හිඟයක් ඇති වෙන්න පුළුවන් වාගේ සාකච්ඡාවක් විපක්ෂයේ කථිකයන් ගෙනෙනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවේ බෙහෙත් හිඟය කියන එක මොකක්ද කියලා අපි දන්නවා. අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වූවා. අනෙක් කථිකයිනුත් කරුණු දැක්වූවා. ඒ අනුව, මේ මොහොතේ යම් යම් ඖෂධවල හිඟයක් තිබෙනවා. ඒ ඖෂධ හිඟය කියන එක මීට පෙර වසරවල මීට වඩා විශාල වශයෙන් පැවතුණා. ලංකාවේ ඖෂධ හිඟය මීට පෙර පැවතියේ මෙහෙම නියෝග ගෙනැල්ලා නොවෙයි. ලංකාවේ ඖෂධ හිඟය ගත්තාම, මේ රටේ මිනිස්සුන්ට ඖෂධ සම්බන්ධයෙන් මුහුණ පාන්න වුණු දුෂ්කරතා, අපහසුතා සහ සමහර මරණීය හේතු පැහැදිලිවම සම්බන්ධ වුණේ මීට කලින් මේ රටේ ඒවා පාලනය කළ අයගේ මේ සම්බන්ධ ක්‍රියාවලියත් එක්කයි. විශේෂයෙන්ම මේ ඖෂධ හිඟයට කාරණා දෙකක් බලපෑවා. එකක් තමයි, පසුගිය කාලයේ ආර්ථික අර්බුදය තුළින් මේ රට කඩා වැටුණාට පසුව මේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෙහෙත් සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වුණේ නැති එක. විපක්ෂයේ කථිකයෙක් මතු කරනවා මම අහගෙන හිටියා, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට කරන්නේ නැතුව හදිසි මිලදී ගැනීම්වලට යන්න එපා, එතකොට දූෂණ වෙනවා කියලා. ඒගොල්ලන් හොඳටම දන්නවා ඇති, ඒක කොහොමද වෙන්නේ කියලා. ඒක නොකර ඉන්න තමයි මේ වසර මුල සිට අපි මැදිහත් වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්තවලට අනුවත් යම් ඖෂධයක ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව ආරම්භ කළත් අවම වශයෙන් මාස 8ක්, 9ක් ගත වෙනවා, ඒවා අපේ රටට එන්න. ඇමතිතුමාත් කියපු විධියට මේ වෙද්දී ඒකේ සැලකිය යුතු ප්‍රමාණයක් කරලා ඉවරයි. පසුගිය වසරවලට සාපේක්ෂව ඉතා ඉදිරියෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය කරලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, 2024 ඔක්තෝබර් 20වැනි දා වෙද්දී, රුපියල් බිලියන 3.24ක පමණයි ඖෂධ සම්බන්ධ ටෙන්ඩර් award කරලා තිබුණේ. හැබැයි, 2025 මේ වෙද්දී, ඒ ගත වූ සමාන කාලය ඇතුළත රුපියල් බිලියන 24.52ක - අට වාගේ අට ගුණයක් - ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ ආණ්ඩුව විසින් අවසන් කරලා තිබෙනවා. ඒකෙන් අපි දෙන පණිවුඩය තමයි, ඉදිරියේදී මේ ක්‍රියාවලිය විධිමත් කරන්න පටන් අරගෙන තිබෙනවා, පසුගිය වසරවල ඒක විධිමත් නොවී තිබිලා තිබෙනවා, ඒ නිසා ඉදිරියේදී මේ රටේ ඖෂධ හිඟයක් ඇති

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

නොවෙන්න විධිමත් ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇති කරන්න මේ ආණ්ඩුව කාලයකට පස්සේ කටයුතු කර තිබෙනවාය කියන එක. ඒ අනුව අපි හිතනවා, මේ තිබෙන හිඟය සහ කාලයක් තිස්සේ හදපු හිඟය ඉදිරි මාස කිහිපය තුළ මේ ක්‍රියාවලිය නිසි පරිදි ඉටු කිරීම තුළින් වළක්වා ගන්න පුළුවන් වෙයි කියලා.

ඖෂධ හිඟය පිළිබඳව විතරක් නොවෙයි, ඖෂධවල quality එක සම්බන්ධයෙන්, ඖෂධ ගෙනැල්ලා මිනිස්සුන්ට වෙච්ච හානිය සම්බන්ධයෙන් බරපතළ සාකච්ඡා මේ සමාජය තුළ තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ ඒවා ගැන සාකච්ඡා වෙලා තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේදී සෞඛ්‍ය අමාත්‍යවරයෙකුට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. අද වෙද්දී ඔහුට නඩු පිට නඩු වැටෙමින් තිබෙනවා. ජීවිත බේරා ගත යුතු ඖෂධයක් වන human immunoglobulin කියන ඖෂධය වෙනුවට වතුර තිබුණා කියලා සහතික ඇවිල්ලා තිබෙනවා. එහෙම රටක තමයි දැන් මේ ආකාරයෙන් නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ගුණාත්මකභාවයෙන් යුතු ඖෂධ ගෙනැල්ලා, මේ ඖෂධ හිඟය නැති කරන්න උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රසම්පාදන ක්‍රියාවලිය එහෙම තිබියදී අනෙක් පැත්තෙන්, මේ නියෝග හරහා මිල පාලනය තුළින් බෙහෙත් හිඟයක් ඇති වෙයිද, මේ සම්බන්ධ පාර්ශ්වකරුවන්, ව්‍යාපාරිකයන් පසුබසීද කියලා කතිකාවක් ගෙනෙනවා. මේක නොවෙයි, මේ රටේ ඖෂධවල මිල අඩු කරන්න ගෙනාපු එකම ක්‍රමය. මේ රටේ ඖෂධ මිල අඩු කරන්න ගෙනාපු ක්‍රම දෙකේ වෙනසක් තිබෙනවා. මම ඒ ගැනත් කියන්නම්. මොකද, සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ගෙන්ම දිගටම මතු වුණා, IHP එකෙන් විවේචන තිබෙනවා, WHO එකෙන් විවේචන තිබෙනවා කියලා. ඒක වැරදියි. ඒ විවේචන තිබෙන්නේ ඔවුන් කළ ක්‍රමවේදයට. 2015දී මේ පනත ගෙනාවාට පසුව රාජිත සේනාරත්න සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියදී බෙහෙත් මිල අඩු කරන්න කටයුතු කළා. ඒ අනුව අවස්ථා කිහිපයකදී -2016, 2017 සහ 2018දී- පිළිවෙළින් ඖෂධ 47ක්, 48ක් සහ 23ක් ආදී වශයෙන් ඒ ආකාරයෙන් මිල අඩු වැඩි කිරීම් කළා. අපි ගැසට්ටුව හරහා හඳුන්වලා දීලා තිබෙනවා, MRP සහ MCP කියලා ක්‍රම දෙකක්. කලිනුත් ඒ ගැන කියැවුණා. Maximum Retail Price එකයි, Maximum Ceiling Price එකයි කියන්නේ දෙකක්. එතකොට සිල්ලර මිල - retail price එක - විතරයි මීට කලින් අඩු කළේ. වෙළෙඳ පොළේ මිල විතරක් අඩු කළාට පසුව ඇත්ත ප්‍රශ්නයකට සමහර අයට මුහුණ දෙන්න වෙනවා. ඒ වෙනුවට තමයි විද්‍යාත්මක ගණනය කිරීමක් හරහා, CIF ගණනය කිරීම හරහා - මේ ඔක්කෝම හරහා - MRP කියලා එකක් ගණනය කරන්නේ. ඒක හරහා මේ රටේ ඖෂධ නිෂ්පාදනය කරන්න යන වියදම්, රක්ෂණ වියදම්, භාණ්ඩ ප්‍රවාහන වියදම්, සැපයුම් දාමයට යන වියදම්, තීරු බදු, බදු කියන මේ සියල්ල එකතු කරලා, එක් එක් ඒවායේ මධ්‍යයන අගයක් - median - අරගෙන ඒ ඖෂධ සම්බන්ධයෙන් මිල නියම කිරීම තීරණය කරනවා. ඒ තුළින් එම ක්‍රියාවලිය අවම වෙනවා. නමුත්, අර කියපු IHP සම්බන්ධ විවේචනය මේකට එන්නේ නැහැ. හැබැයි, එහෙම තිබියදී ඒ කාලයේදීත් ලොකුවට කථා බහ වුණා, මේක හින්දා කට්ටිය යයි, නැති වෙයි, බෙහෙත් නැති වෙයි වාගේ කථා. සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු කියපු කථාව ඒගොල්ලන් ඕක කරද්දිත් කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

හොඳයි.

හැබැයි, එහෙම තිබෙද්දීත්, එක නිෂ්පාදනයක් විතරයි වෙළඳපොළෙන් අයින් වුණේ. එතකොට, මේක බොරු බිල්ලෙක් මැවීමක්. කොහොමත් මේ රටේ ජනතාවට මේ දේ කළ යුතුයි. එහෙම කරද්දී, මේ ආකාරයෙන් විවේචන එන්න පුළුවන්. නමුත් ඇත්ත කථාව ඒක නොවෙයි.

තව එක විවේචනයක් මතු වුණා, local purchasing ගැන. මම හිතන්නේ ඒක තේරෙන්නේ නැතුවද දන්නේ නැහැ, ඒ පොහොට්ටුවේ මන්ත්‍රීතුමා කිව්වා, සෞඛ්‍ය ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා ලු, ඉස්පිරිතාලේ බෙහෙත් නැත්නම් ෆාමසියෙන් බෙහෙත් ගන්න කියලා. එහෙම එකක් කිව්වේ නැහැ. ඔබතුමන්ලාගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ හොඳකම හින්දා ඖෂධවල අඩුවක් තිබුණා. එතකොට ඒක පියවා ගන්න ගත හැකි සියලු ක්‍රියාමාර්ග ආණ්ඩුව ගනිමින් හිටියා. ඒ ගැනීමේදී රෝහල්වල ක්‍රමයක් තිබෙනවා, local purchasing කියලා. ඒවා ප්‍රාදේශීයව කරන මිලදී ගැනීම්. ඒ මිලදී ගැනීම්වල ප්‍රමාණය වැඩි කරන්න, නැත්නම් ඒ මිල ගණන් වැඩි කරන්න අපි කටයුතු කළා, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ 26වෙනි දා නිකුත් කරපු චක්‍රලේඛයක් අනුව. එතකොට ඒ මිල ගණන් කුඩා රෝහල්වල ලක්ෂයේ සිට ලක්ෂ හතර දක්වා, ලක්ෂ පහේ සිට ලක්ෂ අටහමාර දක්වා වැඩි කළා. ඒ වැඩි කළේ ඒ රෝහල්වලට අවශ්‍ය බෙහෙත් එළියෙන් අරගෙන මිනිස්සුන්ට නිකම් දෙන්නයි. එතකොට මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කරන මාස කිහිපය තුළ, මේවා ගෙනෙන කාලය තුළ , මේවා හදන මාස කිහිපය තුළ, මේ ගත වෙච්ච අවුරුද්ද තුළ මේ රටේ ජනතාවට නිසි පරිදි ඖෂධ ලබා ගන්න තමයි මේ දේවල් කළේ. මම හිතන්නේ ඒක තේරෙන්නේ නැතුව එතුමා ඒක කිව්වා වෙන්න ඇති. නමුත් ඒක තමයි මෙහි පදනම.

ඒ වාගේම මෙහිදී එක තැනක කියැවුණා, පනතේ 118(4) වගන්තිය අනුව සියලු පාර්ශ්වල එකඟතාව ගත යුතුයි, නමුත් එහෙම අරගෙන නැහැ කියලා. නැහැ. ඒක වැරදියි. එහෙම එකඟතාව ගත යුතුයි කියලා එකකුත් නැහැ. තිබෙන්නේ සියලු පාර්ශ්වවලින් විමසා කටයුතු කළ යුතුයි කියලා. විමසා කටයුතු කරලයි තිබෙන්නේ. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම අර ලාභය බෙදී යෑම ගැන කියනවා. මට තේරෙන්නේ නැහැ එතුමා කාගේ අවශ්‍යතාවක්ද නියෝජනය කරන්නේ කියලා. නිසි ක්‍රමයකට හදනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක වෙළෙන්දාටත්, නිෂ්පාදකයාටත්, රෝගියාටත්, සියලුදෙනාටත් සාධාරණ ක්‍රමයක් විය යුතුයි. මිල සූත්‍රයක් හදනවා නම් ඒකේදී ඒ supply chain එකේ ඉන්න අයගේ ලාභ බෙදී යෑමේ ගැටලුව නොවෙයි අපි සාකච්ඡා කළ යුත්තේ, නිසි ලාභයක් අපි ලබා දෙනවා නම්. ඒ නිසා ඒක වැරදියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

අවසාන වශයෙන් මම තත්පර 30ක කාලයක් අරගෙන මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ රටේ සෞඛ්‍ය සේවය ගැන දිගටම අපි කළ විවේචන, පසුගිය ආණ්ඩු ගැන කරපු විවේචන ගැනත් මෙතැනදී අදහස් ඉදිරිපත් කළා. ඒ කාලය ගැන විවේචන කළාට, මේ රටේ සෞඛ්‍ය සේවය ගුණාත්මක කළේත් ඒගොල්ලන්ගේ ආණ්ඩුම තමයි කියලා කිව්වා. නැහැ, ඒක වැරදියි. මේ රටේ යම් කාලයකට කලින්, දශක කිහිපයකට කලින් මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවය ඇති කරලා එහි ගුණාත්මකභාවය වැඩි කරන්න උත්සාහ කළා තමයි. නමුත්, පසුගිය අවුරුදු 10 තුළ වුණේ මොකක්ද කියලා මතක් කර ගන්න. මේක අල්ලාගෙන හිටියේ වෙන කවුරුවත් නොවෙයි. මේගොල්ලෝ කළේ බෙහෙත් වෙනුවට වතුර එව්පු එක. වෛද්‍යවරු, හෙද හෙදියෝ, පවුල් සෞඛ්‍ය සේවිකාවන්, අනෙකුත් සේවකයන්, ගිලන් රථ රියැදුරන් දක්වා මේ රටේ සියලු සෞඛ්‍ය සේවකයන් ඉතාම දැඩි කැපවීමකින්, අවම සහ දුෂ්කර කොන්දේසි යටතේ වැඩ කරලා තමයි මේ තත්ත්වය අල්ලාගෙන සිටියේ. ඒක මේ ආණ්ඩුවලින් කරපු දේවල් නොවෙයි. මේ සංශෝධන සහ මේ දේවල් හරහා මේ ආණ්ඩුව, ඔවුන් දරාගෙන හිටපු ඒ වැඩේ ගුණාත්මකව ඉස්සරහට අරගෙන යන්න පහසුකම් සැපයීම සහ අදාළ ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

[අ.භා. 5.04]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විනාඩි කිහිපයක් අරගෙන මේ විවාදය අවසන් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ.

ඉස්සෙල්ලාම, ජනතාවට සාධාරණ මිලකට ඖෂධ ලබා දීම සඳහා ගෙන එන ලද මෙම නියෝග පාර්ලිමේන්තුවේ අනුමත කර ගැනීමට අදහස් දක්වපු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පුද කරන්නට කැමැතියි.

අද උදේ මගේ ආරම්භක කථාවේදී කිව්වා වාගේ මේක සැලකිය යුතු දීර්ඝ ක්‍රියාවලියක්. වර්තමාන ඇමතිවරයා හැටියට මට හෝ මට කලින් හිටපු ඇමතිවරුන්ට ගැසට් නිවේදනයක් නිකුත් කරලා ඖෂධ මිල අඩු කර ගැනීම සඳහා වාතාවරණයක් තිබුණේ නැහැ. සමහර ඇමතිවරු මේකට උත්සාහ කළා, මිල සූත්‍රයක් හඳුන්වා දුන්නා, ගැසට් නිවේදන නිකුත් කළා. නමුත්, ඖෂධ මිල අඩු කිරීමට එරෙහි කණ්ඩායම් සහ ඔවුන් දේශපාලනයෙන් නඩත්තු කරන කණ්ඩායම්, ඔවුන්ට මාධ්‍ය ප්‍රචාර ලබා දෙන කණ්ඩායම් විසින් විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ එම ගැසට් නිවේදන ක්‍රියාත්මක වීම වැළැක්වුවා. නමුත් අපට පුළුවන්කම ලැබුණා, ගැසට් නිවේදනයක් ඉදිරිපත් කරන්නත්, පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරන්නත්. ඒ අනුව MRP එක සහ MCP එක හඳුන්වා දීලා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචි වීමේදී සහ නව ලියාපදිංචි වීමේදී අපට දැන් පුළුවන්, සාධාරණ මිලක් ඉදිරිපත් කරන අයගේ ඖෂධ ලියාපදිංචි කරන්න.

ඒ වාගේම මම අහගෙන හිටපු සහ මට දැන ගන්න ලැබුණු හැටියට අද කථා කරපු මන්ත්‍රීවරු හැමදෙනාම එතුමන්ලාට ප්‍රාදේශීයව තිබෙන යම් යම් ප්‍රමාණයේ සෞඛ්‍ය ප්‍රශ්න ඉදිරිපත් කළා. ඒක සාධාරණයි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාට ඒක පෙනෙනවා. අපිත් ඒවා වෙනුවෙන් fight කරනවා. කාර්ය මණ්ඩලය බඳවා ගන්න, අවශ්‍ය ඖෂධ සපයන්න, අවශ්‍ය උපකරණ ටික සපයන්න කටයුතු කරනවා. ඒක තමයි අපේ කාර්යභාරය. නමුත්, එකම එක මන්ත්‍රීවරයෙක් විතරක් මෙච්චර කාලයක් මේ ගැසට් එක වළක්වන්නට සමාගම් ඉදිරිපත් කරපු තර්ක, අධිකරණයට ගෙනාපු තර්ක පාර්ලිමේන්තුවේදීත් කියලා තිබුණා. එම නිසා මම ඒ මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, ඔබතුමාට ගොඩක් දේවල් ඔබතුමන්ලාගේ කණ්ඩායමේ පරිණත මන්ත්‍රීවරුන්ගෙන් ඉගෙන ගන්නට තිබෙන බව.

මේ ගැසට් පත්‍රය නිකුත් කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ සඳහන් වන ආකාරයට ඒ පාර්ශ්ව විමසා සිටියා. ඒ අය එකඟ වෙන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් අපි විමසා සිටියා. අපි මොකක්ද කරන්නේ කියන එක අපි දැනුම් දුන්නා.

ඒ වාගේම අනෙක් පැත්තෙන් කියන්න උත්සාහ කරනවා, ඖෂධවල මිල අඩු කළාම සමහර සමාගම් ලංකාවෙන් යයි කියලා. එහෙම දෙයක් වෙන්නේ නැහැ. 2015දී රාජිත සේනාරත්න ඇමතිතුමන්ලා මේ පනත ගෙනාපු වෙලාවේත් ඔය මතයම කිව්වා. නමුත් සමාගම් ලංකාවෙන් ගියේ නැහැ. එකම එක ඖෂධ නිෂ්පාදකයෙක් - එක innovator කෙනෙක් - විතරක් රටින් පිටවෙලා ගිහින් තිබුණා.

ඊළඟ කාරණය තමයි, ඖෂධවල මිල අඩු කළාම, නැත්නම් සාධාරණ මිලකට ලබා දුන්නාම රටට එන්නේ බාල ඖෂධ කියන මතයක් ජනගත කරන එක. සේනක බිබිලේ චරිතාපදානය මම මෑතකදී නැවත වතාවක් කියෙව්වා. එතුමා 1970, 1971, 1972 කාලයේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් කරනකොට සහ SPC එක - රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - ගොඩනඟනකොට, ඒ කාලයේදීත් කියලා තිබුණු මතය තමයි, එක්කෝ දේශීයව ඖෂධ නිෂ්පාදනය කරලා, නැත්නම් පාලන මිලක් යටතේ ඖෂධ ආනයනය කළාම රටට එන්නේ බාල ඖෂධ කියන එක. දශක ගණනක් තිස්සේ තිස්සේ ගහන එකම බෙර පදය තමයි දැනුත් ගහලා තිබෙන්නේ. අදත්, අපි මෙච්චර දශක ගණනාවක් පහු කරලා තාක්ෂණය දියුණු වෙලා තිබියදීත් -මේවා ගැන හොයලා බලන්න පුළුවන් ලෝකයේ හැම තැනකින්ම- අපි මිල පාලනයක් කළාම රටට එන්නේ බාල ඖෂධ කියලා මන්ත්‍රීවරයෙක් කියපු එක ගැන මම කනගාටු වෙනවා. එහෙම වෙන්නේ නැහැ. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රමුඛතම කාර්ය භාරයන්ගෙන් එකක් තමයි, ඒ ඖෂධවල ගුණාත්මකභාවය සහතික කිරීම. එම නිසා මම සහතික කරලා කියනවා, අපි ඉන්නකල් මේ රටට බාල බෙහෙත් ගෙන්වන්න දෙන්නේ නැහැ කියලා. ඒක අපි සහතික කරලා කියනවා. මොකද, අපේ රටට බාල ඖෂධ ගෙන්වීම වැළැක්වීම සඳහා ක්‍රමයක් තිබියදී, ඒ ක්‍රම අමු අමුවේ උල්ලංඝනය කරලා, ඒ තිබුණු ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම පැත්තකට දාලා ඖෂධ ගෙන්වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඔය කථා කරන බාල ඖෂධ ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් අපි ඒවාට ඉඩක් ලබා දෙන්නේ නැහැ.

දැන් අප මුහුණ දෙමින් ඉන්නේ, අරගලයක් කරමින් ඉන්නේ ගුණාත්මක ඖෂධ අඛණ්ඩව සැපයීම සඳහායි. මා නිතර කියනවා වාගේ ඖෂධ කියන්නේ, මේ වෙලාවේ අවශ්‍යතාවක් ආවා නම්, අද ඉන්දියාවෙන් ඇණවුම් කරලා, හෙට උදේ නැවෙන් බාන එකක් නොවෙයි. සියයට 85ක් ඖෂධ සහ ඊට ආසන්න ප්‍රමාණයක ශල්‍ය උපකරණ, වෛද්‍ය උපකරණ අපි ඇණවුම භාර දුන්නාට පසුව තමයි නිෂ්පාදනය කරන්න පටන් ගන්නේ. ඒ නිසා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඒකට කාලයක් ගත වෙනවා. අන්න ඒ කාලය ගත කළ යුතුමයි. අපේ සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියත් ඖෂධ ගෙන්වීමේදී සමහර විට බාධාවක් කරනවා. මම ඒකත් කියන්න ඕනෑ. ඖෂධ ඇණවුම් කිරීමේ සිට ගෙන්වාගෙන බෙදා හැරීම දක්වා වූ සමස්ත ක්‍රියාවලියට යන කාලය සහ ඒ සඳහා වන ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් වෙනසක් තිබෙන නිසා ජනතාවට ඖෂධ ලබා දීම සඳහා පහසු වන හැටියට ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වුණත් යම් යම් සංශෝධන කළ යුතුයි කියන එක තමුන්නාන්සේලා හැම දෙනාම පිළිගනීවි කියා මම හිතනවා. අපි ඒ සඳහා යම් යම් සංශෝධන යෝජනා කරලාත් තිබෙනවා. ඒ සියල්ල එකතු වුණාට පසු අපට පුළුවන්කම ලැබේවි, ගුණාත්මක ඖෂධ ලැබීමේ අඛණ්ඩභාවය තහවුරු කරන්න.

පළමුවැනි කාරණය තමයි, ගුණාත්මක ඖෂධ අඛණ්ඩව සැපයීම. දෙවැනි කරුණ තමයි, ඒ තුළ සිදු වන වංචා, දූෂණ වැළැක්වීම. වංචා, දූෂණ වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග විසින් ඖෂධ සැපයීමට බාධාවක් වෙනවා නම්, ඒක අප බලාපොරොත්තු වන දෙය නොවෙයි. පළමුවැනි එක තමයි අඛණ්ඩ සැපයුම සහතික කරන එක. ඒ වෙනුවෙන් අප කටයුතු කරන බවත් කියන්න ඕනෑ. ඒ නිසා මේ යෝජනාවට සහයෝගය දක්වපු, මේ වෙනුවෙන් ඉතාම සාධනීය අදහස් ඉදිරිපත් කරපු සියලු ගරු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය වෙනුවෙන් මේ නියෝග සම්මත කරලා, අප ගන්නා ඉදිරි ක්‍රියාමාර්ගවලට සහයෝගය දෙන්න කියා ඉල්ලා සිටිමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
න්‍යාය පත්‍රයේ විෂය අංක 2, පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත, කාරක සභා අවස්ථාව.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත
தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்
PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]

1 සිට 9 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 9ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 9 ordered to stand part of the Bill.

10වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தின் 26ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 10.- *(Replacement of section 26 of the principal enactment)*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "10 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පාලකවරයකු හෝ දත්ත' "

(2) "10 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඊ) දත්ත පැවරීම, ශ්‍රී ලංකාව හරහා පෞද්ගලික දත්ත සංක්‍රමණය කිරීමක් පමණක් සංස්ථාපනය කරනු ලබන්නේ නම්; හෝ

(උ) මේ පනත යටතේ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 10, as amended, ordered to stand part of the Bill.

11වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தில் 51அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 11.- *(Insertion of new section 51_A in the principal enactment)*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'51අ. අධිකාරිය විසින්, කලින් කල, 33 වන වගන්තියේ (ච) ඡේදයේ සඳහන්, උපදේශක කමිටු විසින් සකස් කරනු ලබන සහ අධිකාරිය විසින් අනුමත කරනු ලබන ආංශික මාර්ගෝපදේශ සහ 12 වන' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***11* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 11, as amended, ordered to stand part of the Bill.

***12* සිට *15* තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

12ஆம் வாசகத்திலிருந்து 15ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 12 to 15 ordered to stand part of the Bill.

අලුත් වගන්තිය
புதிய வாசகம்
NEW CLAUSE

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 6 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම	12. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "මාස විසි හතරක් තුළ," යන වචන වෙනුවට "මාස තිස් හයක් තුළ," යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.' "

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, "අලුත් වගන්තිය දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අලුත් වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

புதிய வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Question, that the New Clause be added to the Bill, put and agreed to.

New Clause ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මට විනාඩි 6ක්ද ලැබෙන්නේ? කාලය මදි නේ. කොහොමද මේක කරන්නේ? මට තවත් කාලය අවශ්‍යයි. මොකද, මේ යෝජනාවත් ටිකක් දිගයි. යෝජනාවත් එක්ක පැහැදිලි කිරීමකුත් තිබෙනවා. මීට ඉස්සෙල්ලා සභාවේ කටයුතු අවසන් වනකල් කාලය ලබා දුන්නා. ඒ වාගේම මේ කටයුත්තටත් කාලය දීර්ඝ කරලා ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විපක්ෂයේ කථිකයෝ තුන්දෙනෙක් ඉන්නවා. එක පැත්තකට විනාඩි 15ක කාලයක් ලැබෙන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කවුද කථිකයෝ තුන්දෙනා?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉන්නවා, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාත් ඉන්නවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට වෙන් කර තිබෙන කාලයෙන් විනාඩි 2ක් එතුමාට ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒත් මදි වෙයි. කමක් නැහැ.

"දේශගුණික සමෘද්ධි සැලැස්ම" ක්‍රියාත්මක කිරීම
"காலநிலை சுபிட்சத் திட்டத்தை" நடைமுறைப்படுத்தல்
IMPLEMENTATION OF THE "CLIMATE PROSPERITY PLAN"

[අ.භා. 5.16]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ලෝකයේ ඇතිවන දේශගුණික විපර්යාස හේතුවෙන් අවදානමට ලක් වී ඇති රටවල් අතරින් එකක් වන ශ්‍රී ලංකාව, අධික උණුසුම, නියඟය සහ ගංවතුර වැනි ස්වාභාවික ආපදාවලින් පීඩා විඳිමින් සිටින අතර මෙමඟින් ආහාර, ජලය, බලශක්තිය වැනි ක්ෂේත්‍රවලට එල්ල කරන බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාව දැඩි පීඩාකාරී තත්ත්වයකට ගොදුරු වෙමින් සිටී. ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 74ක සාමාජිකත්වයෙන් යුත් දේශගුණික අවදානම් සංසදයෙහි මූලිකත්වයෙන් 2022 වර්ෂයේදී ඒකාබද්ධ ආර්ථික පරිවර්තන න්‍යාය පත්‍රයක් ලෙස දේශගුණික සමෘද්ධි සැලැස්ම සකස් කරන ලද අතර පරිසර අමාත්‍යාංශය විසින් මේ වනවිට එම දේශගුණික සමෘද්ධි සැලැස්ම නව ආකෘතිකරණයකින් යාවත්කාලීන කරමින් සිටින බව ගරු සභාවේ අවධානයට යොමු කරවමි.

පරිසරයට සිදුවන හානිය අවම කරමින් අඩු කාබන් සංවර්ධන උපාය මාර්ග තුළින් දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීම, රැකියා වෙළෙඳ පොළ වැඩිදියුණු කිරීම, උද්ධමනය අවම කිරීම, නවීන පරිසර හිතකාමී කෘෂිකාර්මික ක්‍රම සහ නව බලශක්ති ප්‍රභවයන් හඳුන්වා දීම සහ නව මූල්‍ය ආකර්ෂණයන් ඇති කර ගැනීම තුළින් ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධනයක් කරා යොමු කිරීම සඳහා මෙම දේශගුණික සමෘද්ධි සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ."

මේක විශේෂයි.

"ශ්‍රී ලංකාව තුළ දේශගුණික අවදානම් සංසදයේ කාර්යාලයක් ආරම්භ කිරීම, දේශගුණික අවදානම සඳහා වූ අරමුදල් වෙනුවෙන් ජාත්‍යන්තරව පිළිගන්නා ජාතික සංවර්ධන බැංකුවක් ආරම්භ කිරීම, කාබන් වෙළෙඳ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නව නීති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම සහ දේශගුණික අවදානම් සම්බන්ධ විෂය ක්ෂේත්‍රය සඳහා විශේෂඥ දැනුම ලබා ගැනීම ඉතා වැදගත් බවත්, මේ සඳහා දේශගුණික අවදානම් සංසදයෙහි අරමුදල් යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස දේශගුණික සමෘද්ධි සැලැස්ම අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකාවේ දේශගුණික සමෘද්ධි සැලැස්ම සම්බන්ධයෙන් තමයි මා විශේෂයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මෙහි ප්‍රධාන කාර්ය සටහන් හැටියට සඳහන් කළ හැක්කේ පුනර්ජනනීය බලශක්තිය හරහා දේශීය බලශක්ති අවස්ථා පුළුල් කිරීම, ස්වභාව ධර්මය පදනම් කර ගනිමින් විසඳුම් සහ මූල්‍ය ආරක්ෂාව හරහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම, විදේශ ආයෝජන ආකර්ෂණය කර ආර්ථික වර්ධනය සහ රැකියා වැඩි කිරීම, හරිතාගාර වායු විමෝචනය අඩු කරමින් ශුන්‍ය -සෘණ- විමෝචන වෙත සංක්‍රමණය වීම යනාදියයි.

මෙම සැලැස්ම 2022 වර්ෂයේ දියත් කළ දින සිට ශ්‍රී ලංකාව දේශගුණික ක්‍රියාමාර්ග සඳහා නිල මාර්ගෝපදේශක ලෙස ක්‍රියාත්මක වෙනවා. මෙතැනදී විශේෂයෙන්ම මතක් කළ යුතු කරුණු ටිකක් තිබෙනවා. මේ සඳහා බහුවිධ අරමුදල් මාර්ගවලට අපට යන්න පුළුවන්. මොකද, CVF එක හරහා තමයි CPP එක ආවේ. Climate Vulnerable Forum එක හරහා තමයි CPP එක ලංකාවට හඳුන්වා දුන්නේ. ඒ අනුව Climate Vulnerable Forum එකේ තමයි රටවල් 74ක් ඉන්නේ. රටවල් 74ක් නියෝජනය කරමින් තමයි CPP එක එන්නේ. CPP එකේදී අපි මෙන්න මේ කාරණා ටික බලාපොරොත්තු වෙනවා. එකක් තමයි, බහුවිධ අරමුදල් මාර්ග. මීට ප්‍රවේශ විය හැකි අරමුදල් මූලාශ්‍ර, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වශයෙන් හඳුන්වන්න පුළුවන්. ඒකෙදි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, හරිත දේශගුණික අරමුදල ගැන. අපි CPP එක හරියට ක්‍රියාත්මක කළොත් තමයි අපට රටක් හැටියට මේ කරුණු කාරණා ටික ක්‍රියාත්මක කරන්න හැකි වෙන්නේ. ඒ නිසා හරිත දේශගුණික අරමුදලේ - GCF එකේ - ඩොලර් මිලියන 500ක විභවයක් තිබෙනවා.

ඊළඟට, ගෝලීය පරිසර පහසුකම - GEF එක - තිබෙනවා. ඊළඟට, අනුවර්තන අරමුදල, ලෝක බැංකු දේශගුණික මූල්‍ය වැඩසටහන්, ආසියානු සංවර්ධන බැංකු - ADB - දේශගුණික අරමුදල තිබෙනවා. ඊළඟ එක තමයි, යුරෝපීය ආයෝජන බැංකුව - EIB -. පෞද්ගලික අංශය ගත්තොත් හරිත බැඳුම්කර නිකුත් කිරීම, බලශක්ති ව්‍යාපෘති මූල්‍යකරණය සහ විශේෂයෙන්ම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය - PPP - යටතේ තිබෙන ආකෘති ටික ක්‍රියාත්මක කිරීම සහ බලපෑම් සඳහා ආයෝජකයන් මඟින් අවශ්‍ය කරන සහයෝගය ලබා ගැනීම තිබෙනවා. ඊළඟට, විශේෂයෙන්ම CVF එකේ තිබෙනවා, V20 සාමාජිකත්වය මඟින් ගන්න පුළුවන් කියලා. V20 කියන්නේ, රටවල් 20ක ප්‍රධානීන් - ජනාධිපතිවරු, අග්‍රාමාත්‍යවරු ඇතුළු කණ්ඩායම - එකතු වෙලා සකස් කර තිබෙන වැඩ පිළිවෙළක්. ඒ යටතේ අපට ව්‍යාපෘති අරමුදල් සඳහා තාක්ෂණික සහාය ලබා ගන්න පුළුවන්. එතැනදී අවදානමට ලක් විය හැකි රටවල් 20 කණ්ඩායම තමයි, සාමාජිකත්වය දරන කණ්ඩායම හැටියට හඳුන්වන්න පුළුවන්. ඉස්සර දේශගුණික අවදානම් සංසදයේ දකුණු සහයෝගිතාව තිබුණේ බටහිරත් එක්ක. දැන් දකුණ-දකුණ එක්ක අපි සහයෝගිතාව ඇති කරගෙන තිබෙනවා. දකුණ-දකුණ සහයෝගීතාව ලබාගෙන තිබෙනවා වාගේම සාමූහික කතිකාවක්

නිර්මාණය කිරීම කියන මේ කරුණු ටික විශේෂයෙන්ම මේ CPP එක implement කිරීම හරහා අපට ලබා ගන්න පුළුවන්. මේ සියල්ල කළාට පසුව අපට ආධාර, ණය ආවරණ ලබා ගන්න පුළුවන්.

ඒ වාගේම වියදම් කරන අවස්ථා තිබෙනවා. බලශක්තිය, සූර්ය, සුළං, ජල විදුලිය, විදුලිබල පද්ධති නවීකරණය, ප්‍රවාහනය ගත් විට විදුලි වාහන ප්‍රවාහනය, ජනතා ප්‍රවාහනය, හරිත නාගරික ප්‍රවාහනය, කෘෂිකර්මාන්තය යටතේ දේශගුණික බුද්ධිමත් කෘෂිකර්මය, කාබනික ගොවිතැන, වන වගාව, කඩොලාන ප්‍රතිසාධනය ඇතුළු වන විශේෂ වගාව සඳහාත්, වාරිමාර්ග නවීකරණය සහ ජල කළමනාකරණය සඳහාත්, සංචාරක කර්මාන්තය ගත්තාම පරිසර සංචාරක කර්මාන්තය සහ තිරසාර සංචාරක යටිතල පහසුකම් සඳහාත්, අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත සඳහාත් අඩු පොලී මත ණය ආධාර අපට ලබා ගන්න පුළුවන්. මේ සියල්ලෙන්ම බලාපොරොත්තු වන්නේ, ඉදිරි කාලය තුළ පුනර්ජනනීය බලශක්තියෙන් මේ රටේ පරිසරය ආරක්ෂා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැඩසටහන් එක්ක තමයි ලෝකයේ රටවල් දියුණු වෙමින් පවතින්නේ, ආදායම් වැඩිපුර ලබන්නේ.

අද සතුටින්ම ඉන්න රට හැටියට හඳුන්වන්නේ භූතානය. මොන ප්‍රශ්න තිබුණත්, ආදායම් මාර්ගය කෙසේ වෙතත් ඒගොල්ලන් සතුටින් ජීවත් වෙනවා. ඒකට හේතුව මොකක්ද? ඒගොල්ලන් පරිසරය ආරක්ෂා කරමින් ජීවත් වන කණ්ඩායමක්. අපේ රටේ අද වනකොට දේශගුණික විපර්යාස ඇති වෙලා තිබෙනවා. අද වනකොට වහිනවා. ඒ නිසා හෙට-අනිද්දා වනකොට ගංවතුර තත්ත්වයක් ඇතිවෙලා විශාල ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. එතකොට අපි ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර මොනවාද? ඒ වාගේම අපට කාබන් සම්බන්ධ ප්‍රශ්න ගොඩක් තිබෙනවා, ලෝකයේ අනෙක් රටවල් එක්ක බෙදා ගන්න. තාක්ෂණය සම්බන්ධයෙන් අපට ලෝකයේ රටවල සහයෝගය ලබා ගන්න වැඩ පිළිවෙළක් තිබෙනවා. විශේෂයෙන්ම අපට කාබන් සම්බන්ධ ගොඩක් ප්‍රශ්න තිබෙනවා. මම හිතන විධියට අජිත් පී. පෙරේරා මැතිතුමාගේ කථාවේදී ඒ සම්බන්ධයෙන් හඳුන්වා දීමක් කරයි. මොකද, එතුමාට ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් තිබෙනවා. අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා, මම කලිනුත් කිව්වා වාගේම host country එකක් හැටියට CVF එකේ regional office එකක් ශ්‍රී ලංකාවේ ආරම්භ කරන්න. එහෙම කරන්න පුළුවන් නම් අපට අර කියපු CVF එකට අයිති රටවල් 74 එක්කම විශේෂ ගනුදෙනුවක් කරන්න පුළුවන්.

ඒ කියන්නේ, ශ්‍රී ලංකාවේ දේශගුණික සමෘද්ධි සැලැස්ම ඉතාම හොඳින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ශක්තිය, සහයෝගය, අනෙක් රටවල ණය, ආධාර ප්‍රමාණය වාගේම අලුත් තාක්ෂණය ඒක රාශි කරන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අපට හැකි වේවි. ඒ නිසා ශ්‍රී ලංකාවේ දේශගුණික සමෘද්ධි සැලැස්ම අපි මේ පාර්ලිමේන්තුව තුළ අනුමත කරමින් ඉදිරියට ක්‍රියාත්මක කරමු කියන එක තමයි මම යෝජනා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතාම වැදගත්, ඉතාම කාලීන යෝජනාවක්. මුලින්ම මා එම යෝජනාව ස්ථිර කරනවා. බ්‍රසීලයේ පැවැත්වීමට නියමිත COP30 සමුළුව ආරම්භ වීමට තව සති කිපයයි තිබෙන්නේ. ලෝකයේ ගෝලීය උණුසුම පාලනය කරන්නත්, ඒ වාගේම ධරණීය සංවර්ධනයක් උදෙසා ලෝකය පුරාම තිබෙන කැපවීම ප්‍රකාශ කරන්නත් සූදානම් වන අවස්ථාවක ශ්‍රී ලංකාව තුළ ධරණීය සංවර්ධනය උදෙසා අතිශයින් වැදගත් වන මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

මට ලැබී තිබෙන සීමිත කාලය තුළ මම විශේෂයෙන් එක ක්ෂේත්‍රයක් ගැන පමණක් සඳහන් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ස්වාභාවික පිහිටීම අපට වාසනාවක්. ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රය ගත් විට ජල විදුලිය අපට මහා සම්පතක්. ඒ වාගේම සූර්ය විදුලි බලය, සුළං විදුලි බලය සඳහා අනර්ඝ මූලාශ්‍ර අපට තිබෙනවා. ලෝකයේ විශිෂ්ටතම සුළං විදුලි මූලාශ්‍ර වාගේම සූර්ය විදුලි මූලාශ්‍ර අපට තිබෙනවා. ඒක එක අතකින් වාසනාවක් වාගේම තව අතකින් අවාසනාවක්. අද වනවිටත් අපි, අපේ රටේ බලශක්ති අවශ්‍යතාවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පුනර්ජනනීය මූලාශ්‍ර හරහා ලබා ගන්නවා. ජල විදුලිය ගත්තොත්, සියවසකට ආසන්න කාලයක් තිස්සේ අපේ රටේ තිබෙන ජල විදුලිබල අවස්ථා සියල්ලම වාගේ අපි උකහා ගෙන තිබෙනවා. නමුත්, විශේෂයෙන්ම අපේ රටේ උතුරුකරයේ තිබෙන ඉතා වටිනා සුළං විදුලි අවස්ථා අපි තවමත් උකහා ගෙන නැහැ. එම නිසා අපි ඒ සඳහා මහන්සි විය යුතුයි.

ඒ වාගේම සූර්ය විදුලි බලය ගත්තොත්, අපේ රට සර්ම කලාපීය රටක් හැටියටත්, දවස් 365ම සූර්ය ශක්තිය ලැබෙන වාසනාවන්ත රටක් හැටියටත් සූර්ය විදුලි බලය අපේ බලශක්ති අවශ්‍යතාව සඳහා උකහා ගත හැකියි. ඒ විතරක් නොවෙයි. එක පැත්තකින් අපි විදුලිය නිෂ්පාදනය කිරීමට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර පාවිච්චි කරනවා වාගේම ප්‍රවාහනය -පෞද්ගලික මෝටර් රථ, බස් රථ සහ දුම්රිය- සඳහා පුනර්ජනනීය බලශක්තිය පාවිච්චි කිරීම හරහා අවශ්‍ය ආකාරයට පරිසරය රකින ගමන් මහ පොළොවට වටිනාකමක් එකතු කරන්නත් අපට හැකියාව තිබෙනවා.

මෙහිදී ජාත්‍යන්තර සම්මුති අනුව carbon trading පිළිබඳව අපට තිබෙන අවස්ථාව සලකා බැලිය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි carbon trading පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ කථා කරනවා. මේ ක්ෂේත්‍රය පිළිබඳව වසර 10ක විතර බොහෝ කිට්ටු අත්දැකීම් මට තිබෙනවා. නමුත්, අපි තවමත් carbon trading පිළිබඳව සාකච්ඡා කරනවා, සම්මන්ත්‍රණවලට යනවා, කෙටුම්පත් කරනවා, කථා කරනවා. අපි ඒ පිළිබඳව බොහෝ දේ දන්නවා. හැබැයි, අද වනතුරු අපි විසින් ඵලදායී විධියට ලෝක පරිසරයට කරන දායකත්වය පිළිබඳ යම් වටිනාකමක් ලැබී නැහැ - මොකද, අපේ ජල විදුලි බලය හරහා අපි ලෝකයට වටිනාකමක් එකතු කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්න අවස්ථාව ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි, අපේ සුළං විදුලි බලාගාර හරහා ලෝකයට වටිනාකමක් එකතු කරනවා. 2016 සැප්තැම්බර් මස 06වැනි දා සූර්යබල සංග්‍රාමය ආරම්භ කරලා, ඒ හරහා අද වනකොට ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 2,000කට වැඩි වටිනාකමක් බලශක්තිය නිපදවීම හරහා අපි ලෝකයට එකතු කරලා තිබෙනවා. මේ හරහා කාබන්ඩයොක්සයිඩ් මුදා හැරීම, විමෝචනය අඩු කිරීම තුළ අපට ඒකට මූල්‍යමය වටිනාකමක් ලැබෙනවා. ඒක තමයි carbon trading කියන්නේ. එතකොට මේ carbon trading, ඒ කියන්නේ ලෝකය දූෂණය කරන රටවල් සහ ආයතනවලින් ලෝකය ආරක්ෂා කරන, ලෝකයේ උණුසුම සීමා කිරීමට දායක වන අපි වැනි රටකට ලැබිය යුතු යමක් තිබෙනවා. නමුත්, මේ carbon trading පිළිබඳව ඇති අවස්ථාව උකහා ගන්න අපි තවමත් අසමත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා ඉතා වටිනා වූ මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම ගරු මන්ත්‍රීතුමාට නැවත වරක් ස්තුති කරන අතර, විෂය භාර අමාත්‍යතුමා මේ carbon trading පිළිබඳ වර්තමාන තත්ත්වය මොකක්ද, මේ රටේ සංවර්ධනය උදෙසා carbon trading පාවිච්චි කරන්නේ කොහොමද කියන කාරණය ගැන සාරගර්භ, වටිනා තීරණාත්මක පිළිතුරක් ලබා දෙයි කියාත් විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.28]

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගෝලීය වශයෙන් ගත්තාම, පරිසරය සම්බන්ධ කතිකාව අද අපි පටන් අරගෙන තිබෙනවා. මොකද, ගෝලීය වශයෙන් මේක දැනෙනකොටම ලංකාවටත් ඒක ඒ මට්ටමින්ම දැනෙනවා. එවන් දෙයක් දැනෙන මොහොතක මේ කාලීන යෝජනාව ගෙන ඒම ගැන ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

දේශගුණික විපර්යාස ගැන කථා කරද්දී, දේශගුණික විපර්යාස නිසා අපි පීඩාවට පත් වන ආකාර ගැන සලකා බැලිය යුතුයි. ඒ අනුව, එක පැත්තකින් අධික උණුසුම නිසා අපට දැඩි නියඟවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. තව පැත්තකින් අධික වර්ෂාව නිසා ගංවතුර උවදුරට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මෙන්න මේ උවදුරු නිසාම අපි නැවත සැරයක් බරපතළ පීඩාවලට මුහුණ දෙනවා. ඒවා තමයි, ආහාර හිඟය, ජල හිඟය සහ අපි මුහුණ දෙන තත්ත්ව තුළ අපට බලශක්තිය සම්බන්ධව ඇති වන ගැටලු. ජලය හිඟ වනකොට අපට ජල විදුලිය නැතුව යනවා. ඒ වාගේම අධික වර්ෂාපතනයක් ඇද හැලෙනකොට අපට සූර්ය බල ශක්තියෙන් ප්‍රයෝජන ගන්න බැරිව යනවා. එතකොට මේ දේශගුණික විපර්යාස රටක ආර්ථිකයට සෘජුවම බලපාන්න පටන් ගන්නවා. ඒ වාගේම දේශගුණික විපර්යාස හේතු කොටගෙන ස්වාභාවික උවදුරුවලට රටවල් ගොදුරු වෙනවා. නමුත්, දියුණු වෙමින් පවතින එහෙම නැත්නම් සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට තමයි, ප්‍රබල විධියට මේ උවදුරු බලපාන්නේ. හැබැයි, මේ දේශගුණික විපර්යාස තුළින් වැඩියෙන්ම පීඩාවට පත් වෙන්නේ සහ ඒ වෙනුවෙන් අඩුම දායකත්වය ලබා දෙන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල්. අපේ ශ්‍රී ලංකාව වාගේම සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහොමයක් මේ පීඩාවට පත් වෙමින් පවතිනවා, මෙවැනි තත්ත්ව යටතේ.

හැබැයි, මේ පීඩාවලට අපි දායක වෙලා නැහැ, මේ දේශගුණික විපර්යාසවලට අපි දායක වෙලා නැහැ කියලා මේ පීඩාවලින් මිදෙන්නට අපි පැත්තකට වෙලා ඉඳලා හරි යන්නේත් නැහැ. ඒ නිසා අපිත් මේ සම්බන්ධ වගකීමක් භාර ගත යුතුයි. ඒ වගකීම් භාර ගන්නකොට, එක පැත්තකින් තනි තනියෙන් රටක් විධියට අපි මොන තරම් මුහුණ දෙන්න උත්සාහ කළත් මේවාට තනියෙන් මුහුණ දෙන්න බැහැ. ඒ නිසාම 2009 වර්ෂයේදී දේශගුණික අවදානම් සම්බන්ධ සංසදය බිහි වෙනවා. මාලදිවයිනේ තමයි මේ සංසදය බිහි වෙන්නේ. මේ විධියට දේශගුණික විපර්යාසවලට අඩුම දායකත්වයක් ලබා දෙමින් වැඩිම පීඩාවකට ලක් වන රටවල් විධියට අපි ඒවාට මුහුණ දෙමින් 2009දී මේ සංසදය ආරම්භ වෙනවා. 2009 වර්ෂයේදී ආරම්භ කරලා, මෙවැනි තත්ත්වවලට මුහුණ දෙන්නට ඒ සම්බන්ධ වැඩ පිළිවෙළක් හදා ගන්නවා. ඒ වැඩ පිළිවෙළ සඳහා ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 74ක දායකත්වයක් ලබා ගනිමින් මේ දේශගුණික විපර්යාසවලට අපි මුහුණ දෙන්නේ කොහොමද කියලා අපි කථා කර ගන්නවා. එහෙම කථා කර ගත්තාට පසුව අපේ රටට පැවරෙන භාරධූර වගකීමක් තිබෙනවා. ඒ භාරධූර වගකීම තමයි, 2026දී, එළඹෙන වර්ෂයේ ඉඳන් 2035 වර්ෂය වෙනකම් අපි කාබන්ඩයොක්සයිඩ් ඇතුළු විමෝචන වායු වර්ග නිදහස් කිරීම මෙට්‍රික්ටොන් 11,675,800කින් අඩු කරන්න ඕනෑය කියන එක. අපි ඉස්සරහ තිබෙන දැවැන්තම වගකීම සහ ඒ සම්බන්ධව තිබෙන අපේ අභියෝගය ඒකයි.

අද වෙනකොට අපි දකිනවා, පරිසර ඇමතිතුමාත්, පරිසර අමාත්‍යාංශයේ සියලු කාර්ය මණ්ඩලයත් ඒකාබද්ධ ආර්ථික ප්‍රතිපත්තිමය සහ පරිවර්තනීය වෙනස සඳහා වූ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න පෙළ ගැහෙමින් සිටින බව. මේ න්‍යාය පත්‍රය තුළින් බිහි වෙනවා, දේශගුණික සමෘද්ධි අවශ්‍යතාව වෙනුවෙන් වූ සැලසුම සකස් කර ගැනීමක් - climate planning එකක්. මේ රටේ මේ දක්වා අක්‍රිය වෙලා තිබුණු තත්ත්වය තුළ අද වනකොට පරිසරයට මැදිහත් වීම, පරිසර අමාත්‍යාංශයත් සමඟ කටයුතු කරන මට පරිසරවේදියකු හැටියට දැනගන්න ලැබීම විශාල සතුටක්. ඒක නිසා අපි නැවත නැවතත් ඉල්ලා සිටින්නේ මේකයි. පරිසරය සම්බන්ධව මැදිහත් වනකොට දේශපාලනය ගැන කථා කරන්නේ නැහැ. පරිසර ආර්ථික විද්‍යාව තුළ අපේ රටේ සියලු පුරවැසියන්ට, සියලු දේශපාලන පක්ෂවලට මේ පරිසර අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වැඩ පිළිවෙළත් සමඟ බද්ධ වෙන්න පුළුවන්කම ලැබෙනවා. ඒක නිසා මේ යෝජනාව කාලීන යෝජනාවක් විධියටත්, ඒ සියලු පාර්ශ්ව එකතු කරගෙන ඒ ජාත්‍යන්තර අභියෝගය ජයග්‍රහණය කරන්න ලැබුණු අවස්ථාවක් විධියටත් මා සලකනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.33]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்கள் முக்கியமான தொரு ஒத்திவைப்புப் பிரேரணையை முன்வைத்திருக்கின்றார். கௌரவ பிரதி அமைச்சர் அன்ரன் ஜயக்கொடி அவர்கள்தான் இந்த விவாதத்திற்குப் பதில் உரையாற்றுவார் என நான் எதிர்பார்க்கின்றேன். இன்றைய எனது உரையை மிக முக்கியமாக Ministry of Environment உடன் சம்பந்தப்பட்ட தொரு விடயத்தைச் சொல்லி ஆரம்பிக்கலாமென்று நினைக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, உண்மையில் கடந்த வருடம் வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற மக்கள் மாத்திரமன்றி ஒட்டுமொத்த கிழக்கு மாகாண மக்களும் பல அசௌகரியங்களுக்கு முகங்கொடுக்க வேண்டிய சூழலுக்குத் தள்ளப்பட்டார்கள். ஏனென்றால், அந்தக் காலப்பகுதியில் ஆட்சிக்கு வந்திருந்த புதிய அரசாங்கம் அதற்குத் தயார் நிலையில் இருக்கவில்லை. இருந்தபோதிலும் கடந்த ஒரு வருடத்திற்குள்ளே பல முன்மொழிவுகளை அரசாங்கத்துக்கு அனுப்பியிருக்கின்றோம். அதில் வேத்துச்சேனை - போரதீவுப்பற்று; பிரம்படித்தீவு - கோரளைப்பற்று தெற்கு; எருவில் கோடைமேடு - மண்முனை தெற்கு, எருவில்பற்று; பண்டாரியாவெளி - மண்முனை தென்மேற்கு ஆகிய நான்கு இடங்களில் Construction of Disaster Safety Centres பற்றிய முன்மொழிவு மிக முக்கியமானது. இது சம்பந்தமாக ஆய்வு செய்து அறிக்கை சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. தற்போது மழைக்காலம் தொடங்கியுள்ளது. இந்த வருடமும்கூட எமது மாவட்டம் வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்படலாம். எனவே, இந்த விடயம் சம்பந்தமாக முக்கிய கவனம் எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். இது சம்பந்தமாக மட்டக்களப்பு மாவட்ட அரசாங்க அதிபரால் அனர்த்த முகாமைத்துவப் பணிப்பாளர் நாயகம் அவர்களுக்கு அனுப்பப்பட்டுள்ள கடிதத்தின் பிரதியை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.** தயவுசெய்து இது சம்பந்தமாக நடவடிக்கை எடுக்க வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. හැබැයි, මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න මීන් ඉදිරියට අමාත්‍යාංශ දෙකක් සම්බන්ධ වෙන්න අවශ්‍යයි. මොකද, සෙනසුරාදා - ඔක්තෝබර් මාසයේ 18වැනි දා - නිකුත් කළ ගැසට් නිවේදනය අනුව GSMB එක මීන් ඉදිරියට පරිසර අමාත්‍යාංශය එක්ක සම්බන්ධයක් නැහැ. එම GSMB එක පරිසර අමාත්‍යාංශයෙන් ගලවා Ministry of Industry and Entrepreneurship Development වෙත ලබා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඇත්තටම ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා යෝජනා කරපු විධියට carbon credits වෙච්චා, G20, එහෙම නැත්නම් climate goals සඳහා යනවා නම්, එතුමා කරන මේ යෝජනාව ඉතාම forward-thinking සහ එය ඉදිරි කාලයේ ලංකාව තුළ වෙන්න ඕනෑ දෙයක් කියලා මම හිතනවා. හැබැයි, මේ වෙනකොට ආණ්ඩුව වහාම මැදිහත් වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මොකද, නැඟෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රදේශයේ මුහුදු තීරය මේ වන විට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ විනාශයට පත් වෙමින් තිබෙනවා. GSMB එකේ Chairman හැටියට හිටපු සන්ජේ පෙරේරා නමැති පුද්ගලයා දැන් ජේම්ස් ග්ලෝබල් කියලා පෞද්ගලික ආයතනයක consultant කෙනෙකු හැටියට ඇවිල්ලා ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා GSMB එකේ වැඩ කළා. ඔබතුමා දන්නවා, ලංකා ඉතිහාසයේ මේ වෙනකල් GSMB එක ඒ ප්‍රදේශයේ exploration licences විතරයි දීලා තිබුණේ කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ කරපු කථා දෙකක් හැන්සාඩ් වාර්තාවලින් මා ලබාගෙන තිබෙනවා. එම කථා දෙක දිනයත් එක්කම මට ලබා දෙන්න පුළුවන්. 2023.10.19වැනි දා එතුමාගේ එක් කථාවක් තිබෙනවා. ගරු රමේෂ් පතිරණ එවකට හිටපු ඇමතිතුමා එයට පිළිතුරු දීලා තිබෙනවා. ඉතා පැහැදිලිව එතුමා කරපු ප්‍රකාශය සහ 18වැනි දා දක්වා ඔබතුමා හිටපු වගකිව යුතු අමාත්‍යාංශය **යටතේ තිබූ ආයතනයේ** ක්‍රියාකලාපය පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අද ජේම්ස් ග්ලෝබල් ආයතනයට - එක් ආයතනයකට - විතරක් නැඟෙනහිර පළාතේ, කුච්චවේලි, මඩකලපුව ආදී සියලු ප්‍රදේශවල ඉල්මනයිට් ඛනිජ වැලි ඉවත් කරන්න දීලා තිබෙන මේ exploration licence එක, ඒ අවසරය පිටුපස ඉන්නේ කවුද? මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේකද? මේකටද ජනතාව මේ ආණ්ඩුව ගෙනාවේ? ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මේ වැදගත් යෝජනාවට සම්බන්ධ වී දැනට රටේ පවතින මේ ප්‍රශ්න පිළිබඳව කථා කරන්නට මට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 5.37]

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේශගුණ විපර්යාස පිළිබඳවත්, එහි ගොදුරු වන රාජ්‍යයන් පිළිබඳවත්, එම රටවල ජනතාව පිළිබඳවත්, එමඟින් ලෝකයේ ඉදිරි පැවැත්මට සිදුවන බලපෑම පිළිබඳවත්, එම තත්ත්වය වටහා ගනිමින් වගකිවයුතු මහජන නියෝජිතයන් විධියට රටේ අනාගතය ගැන සිතා සිදු කරන ආණ්ඩුකරණයක අවශ්‍යතාව පිළිබඳවත්, වසර 76ක දේශීය ජනතා පාලනයක් තුළ ඉන් අවස්ථා 3ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරපු විපක්ෂයේ සිටින අපේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් දක්වන්නට ලැබීම සතුටුදායක කාරණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විශ්වය ඉමක් කොනක් නැති විශ්වයක් විධියටයි අපි හඳුනාගන්නේ. මේ ඉමක් කොනක් නැති විශ්වයේ ජීවින් සහිත එකම ග්‍රහලෝකය විධියට හඳුනාගෙන තිබෙන්නේ දැනට අප ජීවත් වන පෘථිවියයි. ලෝකයේ බලවත් රාජ්‍යයන් විසින් තමන්ගේ කෑදර බල වුවමනාවන් වෙනුවෙන් මුළුමහත් විශ්වයම නග්න ලෙස සූරාකෑමට ලක් කර, සමස්ත ජීවී පද්ධතියේම පැවැත්ම අභියෝගයට ලක්වෙලා තිබෙන වෙලාවක එහි මිල පරිධියේ රාජ්‍යයන් විධියට අපටත්, තවත් රාජ්‍යයන් විශාල ප්‍රමාණයකටත් ගෙවන්න සිදු වෙච්ච කාල වකවානුවක තමයි ලෝකයේ තිබෙන මේ පරිසර පද්ධතිවල බිඳ වැටීම, ලෝකයේ දේශගුණ අවබලපෑම් පිළිබඳව සාකච්ඡා වෙන්නේ. හරිතාගාර වායු විමෝචනය ඉහළ යෑම, කෙටි කාලයක් තුළ ඇති වන අධික වර්ෂාව, ඒ සමඟම ඇති වන නායයෑම්, ගංවතුර සහ සුළි සුළංවලින් පරිධියේ රටවල් 74කට වැඩි ප්‍රමාණයක් පීඩාවට පත්වෙලා තිබෙන බව අපි දන්නවා.

මේ තත්ත්වයට මුහුණ දීම සඳහා 1993දී එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය එනවා. ලෝකයේ රාජ්‍යයන් එකතු වෙලා 2005දී එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ ක්‍යෝතෝ ප්‍රඥප්තියට එකඟ වනවා. ඉන් පසුව 2016දී එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් සම්මුතියට අපි කවුරුත් එකඟ වනවා. අපි රටක් ලෙස මේ ස්වාභාවික ආපදාවලින් නිරන්තරයෙන් පීඩාවට පත් වනවා. ඒ නිසා පැරිස් සම්මුතියටත්, ඊට පෙර තිබුණු සම්මුතිවලටත් අනුකූලව කටයුතු කිරීමේ බැඳීමක් අප කාටත් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, අපේ රටේ අවුරුද්දට දෙතුන් වතාවක් ගංවතුර තත්ත්ව ඇති වනවා කියලා. එතකොට මහජන නියෝජිතයන් ගිහිල්ලා බත් පැකට් බෙදනවා. එවිට ඒවා දේශපාලන ව්‍යාපෘති බවට පත් වනවා. නමුත් ප්‍රශ්නය එතැනමයි. මිනිස්සු තමන්ට ජීවත් වන්න සුදුසු යැයි හිතෙන තැන්වල ජීවත් වනවා. නමුත් ඔවුන් ජීවත් වන තැන් නායයෑම්වලට ලක් වනවා. මිනිස්සු පණ පිටින් මේ මහ පොළොවේ වැළලෙනවා අපි ඇස් දෙකෙන් දැකලා තිබෙනවා. අපට ලැබෙන වර්ෂාව නිසා ඇති වන ස්වාභාවික ව්‍යසන කළමනාකරණය කරගන්න බැරි අසමත් රාජ්‍යයක් විධියට තමයි මෙතෙක් කල් -දශක ගණනාවක් තිස්සේ- අපි පැවතුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්තාවට අනුව 2021 වසරේ ගංවතුර, නාය යාම්, සුළං, ගිනිගැනීම් හා අකුණුවල බලපෑම්වලට ලක් වූ පිරිස ලක්ෂ 13ට ආසන්න වනවා. මෙවැනි සිදුවීම් නිසා 2021 වසරේදී මරණ 184ක්, තුවාල සිදුවීම් 90ක්, අර්ධ නිවාස හානි 3,791ක්, පූර්ණ නිවාස හානි 96ක් වාර්තා වනවා. මේ ස්වාභාවික ව්‍යසන නිසා හැම වසරකම මේ වාගේ ප්‍රගතියක් තමයි අපේ රටේ ජනතාව භුක්ති විඳින්නේ.

පසුගිය කාලයේ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන - CRIP - තිබුණා. ඒ වෙනුවෙන් ඩොලර් මිලියන ගණනක් වෙන් කර තිබුණා. ඒ යටතේ කැලණි ගඟේ ගංවතුර බලපෑම අවම කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබුණා. නමුත් අවාසනාවකට 2019දී ඒ මුළු ව්‍යාපෘතියම අවලංගු කිරීම නිසා එය අපට අහිමි වුණා. ලැබිච්ච ව්‍යාපෘතිවලටත් පවා පයින් ගහපු රටක් අපේ රට. පැරිස් සම්මුතියට අනුව කාබන් විමෝචනය පිළිබඳව, කාබන් වෙළෙඳ පොළ පිළිබඳ සාකච්ඡාවක්, සංවාදයක් ඇතිවෙලා තිබෙනවා. ලෝකය තුළ අලුත් සංවාදයක්, සාකච්ඡාවක් ඇතිවෙලා තිබෙනවා, මේ කාබන් තිර කිරීමේ වැඩසටහන ලෝකයේ අලුත් ප්‍රාග්ධන අවශ්‍යතාවක්, ඉල්ලුමක් බවට පත් කරගන්න පුළුවන් කියලා. නමුත් ඒ පිළිබඳව නිශ්චිත, ස්ථිර තීරණයක තවම අපි නැහැ. ඒ වෙනස් වන තත්ත්වයන් පිළිබඳවත්, ලෝකයේ අවශ්‍යතා පිළිබඳවත් මේ කාබන් තිර කිරීමේ වැඩසටහන හෙට දවසේ අපේ රටට මොන මට්ටමෙන් වැදගත් වෙද කියන කාරණාව පිළිබඳවත් අවධානය යොමු කරමින්, ඒ සම්බන්ධයෙන් ඉදිරි තීන්දුවක් ගැනීමට අපි දැන් සාකච්ඡා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව විනාඩි කිහිපයකින් මගේ කථාව අවසන් කරනවා.

"Clean Sri Lanka" වැඩසටහනට සමගාමීව පැරිස් සම්මුතිය තුළින් ආ එකඟතා ඒකාබද්ධ කරමින් අපි අලුත් සාකච්ඡා වට ගණනාවක් සිදු කර තිබෙනවා. ඉදිරියේදී ඒ ජාතික සැලැස්ම කැබිනට් අනුමැතියකට ලක් කරන්නත් අපි සූදානම්ව සිටිනවා. ලබන වසර තුළ ඒ ජාතික සැලැස්ම පැරිස් සම්මුතියට අනුව ක්‍රියාත්මක කරනවා දැක බලාගන්නත්, ඒකට මැදිහත් වන්නත් අපට පුළුවන්.

වර්තමානයේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් අප ජීවත් වන කොළඹ දිස්ත්‍රික්කයට අදාළව බලපාන කැලණි ගඟේ ගංවතුර බලපෑම අවම කිරීම සඳහා වූ විධිමත් යන්ත්‍රණයක් සකස් කරමින් ඊට අවශ්‍ය කරන විධියේ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් අපි යෝජනා කරලා තිබෙනවා. මේ ආපදා තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා අපි වේගයෙන් කටයුතු කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.43]

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම දේශගුණික විපර්යාස ගත්තාම, ඒක කාලයත් සමඟ ක්‍රම ක්‍රමයෙන් තීව්‍ර වන සාධකයක්. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඒ පිළිබඳව ගෙනා යෝජනාව කාලෝචිතයි. ඒ වාගේම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. මම හිතන විධියට, මේ එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන තුන්වැනි අවස්ථාව. මේක කොච්චර තීව්‍ර වනවාද කියනවා නම් එතුමාගේ තුන්වැනි පාර්ලිමේන්තු වාරයේදී මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙනුත් එතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

දේශගුණික විපර්යාසවලින් එන ප්‍රතික්‍රියාව, damage එක කාලයත් සමඟ ක්‍රම ක්‍රමයෙන් තීව්‍ර වනවා. ඇත්තටම මේ සම්බන්ධයෙන් ගත්තොත්, මේක අපට විශාල ව්‍යසනයක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා. ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා, පොදුවේ සියලු මිනිසුන්ට, සියලු සත්ත්ව සීපාවන්ට, ජෛව විවිධත්වයට, අපේ සියලු පාරිසරික පද්ධතිවලට මේක දැවැන්ත විනාශයක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකේ මූලිකම සාධකය හැටියට අපට හඳුනාගන්න වන්නේ මේ දේශගුණික විපර්යාස මේ තැනට පත් වෙලා තිබෙන්නේ මොන හේතුවක් මතද කියන එකයි.

අපි දන්නවා, ගෝලීය උෂ්ණත්වය ඉහළ යන බව. එසේ වන්නේ හරිතාගාර වායු නිසා. ඒ සඳහා විශේෂ වූ හරිතාගාර වායු දෙකක් ප්‍රධාන වශයෙන්ම හඳුනා ගෙන තිබෙනවා. පළමු එක, කාබන් ඩයොක්සයිඩ්. ඊළඟ එක, මීතේන්. ඊට අමතරව කාබන් සහ හැලජන් කාණ්ඩයේ කුල එකතු වෙලා හදන වායුවලිනුත් මේ සඳහා යම් දායකත්වයක් සපයනවා. නමුත්, අපට සලකන්න වෙන්නේ විශාල වශයෙන්ම මේකට දායක වෙන්නේ කාබන් ඩයොක්සයිඩ් සහ මීතේන් කියන එකයි. මෙන්න මේක කොපමණ ද කියනවා නම් අපි දන්නවා, විශේෂයෙන්ම කාර්මික විප්ලවයත් එක්ක, එහෙම නැත්නම් පසුගිය දශක කිහිපය තුළ කාබන් ඩයොක්සයිඩ් parts per million 280 ඉඳලා 420 දක්වා වැඩි වෙලා තිබෙන බව. මේක ප්‍රධානතම ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ මෑත සියවස තුළ මීතේන් ප්‍රමාණය parts per billionවලින් ගත්තොත්, 1,650 ඉඳලා 2,000කට ආසන්න සංඛ්‍යාවකට වැඩි වෙලා තිබෙනවා. මෙන්න මේක තමයි සාධකය.

අපි දන්නවා, ගෝලීය උෂ්ණත්වය හේතුවෙන් දේශගුණික විපර්යාස සිදු වන බව. මෙන්න මේ ක්‍රියාවලිය අපට බිම් මට්ටමින් දකින්න පුළුවන්. බිමට මේක apply වන්නේ ගෝලීය උෂ්ණත්වය, දේශගුණික විපර්යාස, ආපදා - disasters - ඒ වාගේම දුප්පත්කම තුළිනුයි. මෙන්න මේ cycle එක තමයි අපේ බිම කැරකෙන්නේ. මේ අවස්ථාව වන විට මේක සමීකරණයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මා ඉහතින් සඳහන් කළ හේතු නිසා මේ වන විට ගෝලීය උෂ්ණත්වය ශීඝ්‍ර ලෙස වැඩි වෙමින් පවතිනවා. කාර්මික විප්ලවයෙන් පස්සේ දළ වශයෙන් සෙන්ට්‍රිග්‍රේඩ් අංශක 3කින් පමණ ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා තිබෙනවා. ඒත් එක්කම මෑත ඉතිහාසය ගත්තොත්, සෙන්ට්‍රිග්‍රේඩ් අංශක 1.5කින් ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා තිබෙනවා. මේ ගෝලීය උෂ්ණත්වය වැඩිවීම ප්‍රධාන වශයෙන්ම බලපා තිබෙන්නේ ජල චක්‍රයටයි. මේ විවිධ ස්ථානවලට මේ ගෝලීය උෂ්ණත්වය වැඩි වීම නිසා බලපෑම් ඇති වනවා. මෙන්න මේ බලපෑම නිසා අපට තිබෙන දැවැන්ත පාරිසරික පද්ධති අතර අන්තර් සම්බන්ධය බිඳ වැටිලා තිබෙනවා, කැඩිලා තිබෙනවා. අන්න ඒ ගැටලුවට තමයි අපි රටක් හැටියට මේ වන විට මුහුණ දෙමින් පවතින්නේ. මේකේ ප්‍රධාන ගැටලුව හැටියට අපට දකින්න පුළුවන්, බලශක්ති - energy - ක්ෂේත්‍රය. අපේ විදුලි උත්පාදන ධාරිතාවෙන් සියයට 40ක් hydropowerවලින් ලබා ගන්න අපි කල්පනා කර තිබෙනවා. නමුත් ගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා වාෂ්පීකරණය දෙගුණ වෙලා තිබෙන බව අපි දන්නවා. දවසකට ජලය මිලිමීටර් 3ක් වාෂ්ප වෙන එක දැන් මිලිමීටර් 6ක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මෙන්න මේ ගැටලුව නිසා දැන් අපේ ජල විදුලි - hydropower - උත්පාදනයට ඇඩි බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ සිදු වන අඩුව hydrocarbonවලින් පුරවාගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, උදාහරණයක් හැටියට මතු කළොත්, වික්ටෝරියා ජලාශය තමයි hydropowerවලින් ඉහළින්ම තිබෙන ජලාශය. මෙගාවොට් 210ක capacity එකක් මෙහි තිබෙනවා. ඒක උපරිමයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් විශාල වර්ෂාපතනයක් සිද්ධ වන අවස්ථාවකදී. හැබැයි, ඉතා කෙටි කාලයක් තුළදී මේ ජලාශය වියළී යනවා. එතකොට මෙහි ධාරිතාව පහළ බහිනවා, මෙගාවොට් 40ක වාගේ ප්‍රමාණයකට. මෙන්න මේ හේතුව නිසා ඉතිරි ටිකට අපට සිදු වෙනවා, hydrocarbonවලට යන්න. මේ නිසා ගල්අඟුරුවලින් - coalවලින් - kilowatt-hour එකක් නිපදවනකොට කාබන් ඩයොක්සයිඩ් ග්‍රෑම් 820ක් නිකුත් වනවා. මේ විධියට oilවලින් කාබන් ඩයොක්සයිඩ් ග්‍රෑම් 740ක්, ගෑස්වලින් කාබන් ඩයොක්සයිඩ් ග්‍රෑම් 420ක් නිකුත් වනවා. හැබැයි සුනිත්‍ය බලශක්තිවලින් - renewable energiesවලින් - පිට වන්නේ 50ට අඩු ප්‍රමාණයක්.

ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ දැවැන්ත කඩා වැටීමක් සිදුව තිබෙනවා. මේ නිසා දේශීය බීජ වර්ග සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. අපි දැන් hybrid බීජවලට ගිහිල්ලා තිබෙනවා. එම බීජ දේශගුණයත් සමඟ ඉතාම සංවේදීයි. මේ හේතුවෙන් ඵලදාව අඩු වෙලා තිබෙනවා. එම නිසා අපේ ගොවීන් කරන්නේ මොකක්ද? බිම් ප්‍රමාණය වැඩි කර ගන්න උත්සාහ කරනවා. මේ හේතුවෙන් විශාල වන හානියක් සිදු වෙලා තිබෙනවා. මේ තත්ත්වයත් යටතේ අලි-මිනිස් ගැටුම් ඇති වනවා. සියයට 44ක භූමි ප්‍රමාණයක් මිනිස්සු සහ වනසතුන් පරිහරණය කරන තැනකට අද පත් වෙලා තිබෙනවා. මේ ආකාරයටම ධීවර ක්ෂේත්‍රයේ, සංචාරක ක්ෂේත්‍රයේ යෙදෙන අයත් විශාල ගැටලු ප්‍රමාණයකට මුහුණ දීලා තිබෙනවා. පැරිස් සම්මුතියට අනුව ඉදිරියේදී අපි වනාන්තර ප්‍රමාණය සියයට 32ක ප්‍රතිශතයක් දක්වා වැඩි කර ගන්න ඕනෑ. ඒ වාගේම සුනිත්‍ය බලශක්තිය සියයට 70ක් දක්වා වර්ධනය කර ගැනීමට අපි උත්සාහ කරනවා. ඒ වාගේම අපි හරිත ආර්ථිකයක් කරා පියමං කිරීමට බලාපොරොත්තු වනවා. ඒ වාගේම cleaner production ගැනත් මා කිව යුතුයි. හැම production එකක්ම cleaner production එකක් බවට පරිවර්තනය කර ගන්න අපි උත්සාහ කරනවා. ඒ වාගේම, 2050 වසර වනවිට මේ carbon zero කියන සංකල්පයට අපි එනවා. ඒ සංකල්පය 2050 වසර සිට 2040ට ගේන්න අපි උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

2026 සිට 2035 වනකොට කාබන්ඩයොක්සයිඩ් විමෝචනය මිලියන 116කින් අඩු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග කිහිපයක් තිබෙනවා. ඒ අනුව, 2025දී රක්ෂිත 30ක් නම් කළා. ලෝකයේ රටවල් අතුරින් අපේ රටේ පමණක් සිටින බන්දුල පෙතියා කියන මාළු 150ක් වෙනුවෙන් රක්ෂිතයක්, අභය භූමියක් නම් කළා. ජලධරයන් සහ ජල උල්පත් සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක්, කඳු මුදුන්වල තිබෙන වනාන්තර සංරක්ෂණය කිරීමේ කටයුතු සහ පරිසර සුපෝෂණය සඳහා ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ ක්‍රියාවලියක් අපි ආරම්භ කර තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා මතු කරපු ආකාරයට, දේශගුණික සමෘද්ධි සැලැස්ම ඇත්තටම අපි මේ වෙනකොට සකසමින් පවතිනවා. ඒක නීතිපති දෙපාර්තමේන්තුවත්, කැබිනට් මණ්ඩලයත් අනුමත කරපු ගමන්ම අපි මෙහි කාර්යාලයක් හදන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, මේකට තව වැඩිපුර grants ප්‍රමාණයක් ලබා ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා. 2025දී මිලියන 475.5ක මුදල් ප්‍රමාණයක් grants හැටියට අපි ලබාගෙන තිබෙනවා. 2024දී ඒ ප්‍රමාණය මිලියන 376යි. 2026දී ඒ ප්‍රමාණය මීටත් වඩා වැඩි කරගන්න අපි උත්සාහ කරනවා. මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

කාබන් වෙළෙඳාම ගැන ඇත්තටම තවම ලෝකයේත් කථා කරනවා. 2030 වනකොට කාබන් මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 100ක් විතර වාගේ වේවි කියලා අපි විශ්වාස කරනවා. මේක සාකච්ඡා මට්ටමින් පවතිනවා. මේක දේශපාලනික ක්‍රියාවලියක්. අපි දන්නවා, සම්පත් බහුල රටවල් ගැන. නමුත්, අප්‍රිකානු රටවල් ගත්තොත්, දියමන්ති, මැණික්, ප්ලැටිනම් වාගේ සම්පත් තිබුණත් ඒ රටවල් අන්ත දුප්පත්. දේශපාලනිකව අපේ strategy එක හරියට අපි පාවිච්චි නොකළොත්, carbon tradingවලින් අපි බලාපොරොත්තු වන target එකට යන්න බැරි වෙනවා. මේ වෙනකොට අපි සාකච්ඡා කරමින් යනවා, අපේ රටට වාසිදායක හොඳ ප්‍රතිපත්තියක් carbon tradingවලින් ලබාගෙන එයින් විශාල වාසියක් ලබා ගන්න.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව බොහොම හොඳ යෝජනාවක්. ඇත්තටම ඒ යෝජනාව අපි දැනට ක්‍රියාත්මක කර තිබෙනවා. ඔබතුමාට බොහොම ස්තුතියි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවේදී මූල්‍ය බැංකුවක් සම්බන්ධයෙන් ඔබතුමා කරුණු මතු කර තිබෙනවා. ඇත්තටම, බැංකුවක් කියන්නේ, financial intermediation කරන ආයතනයක්. එතැන මුදල් අතිරික්තයක් තිබෙනවා. මුදල් අඩුපාඩු තිබෙන තැන්වලට ප්‍රාග්ධනයක් හැටියට ණය හරහා මුදල් ලබා දීමක් තමයි බැංකුවක සිද්ධ වෙන්නේ. පොලිය ලබා ගැනීමෙන් තමයි බැංකුවේ පැවැත්ම රඳා පවතින්නේ. නමුත්, බැංකුවක් ක්‍රියාත්මක කරන්න මෙන්න මේ පාරිසරික සාධක සමඟ grants හැටියට ලැබෙන මුදල් අවශ්‍යයි. අපට වෙනම මූල්‍ය ආයතනයක් පවත්වා ගෙන යෑම ප්‍රමාණවත්. ඒක බොහොම හොඳයි. නමුත්, මේ වනකොට ඒ ක්‍රියාවලිය Treasury එක හරහා සිද්ධ වෙනවා. ඉතින් මම හිතනවා, Treasury එක හරහා සිද්ධ වෙන ඒ ක්‍රියාවලිය හොඳ, විධිමත් ආකාරයට පවත්වා ගෙන යන්න පුළුවන් කියලා. පරිසරය රැක ගැනීම සඳහාත්, climate change mitigation සඳහාත් අවශ්‍ය කරන ප්‍රතිපාදන, මුදල් ආධාර අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය ඉතා ඉක්මනින් ගෙවී ගොස් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඔබතුමාට තත්පර කීපයක් ලබා දෙන්නම්.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම විශේෂ ස්තුතියක් පළ කරනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට. ඒ වාගේම මේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරපු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, විපක්ෂයේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ෂාණක්කියන් මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාටමත් ස්තුතිය පිරිනමනවා, මම ගෙනාපු කල් තැබීමේ යෝජනාව අනුමත කිරීම සම්බන්ධයෙන්. අපි විශේෂයෙන්ම බැංකුවක් ගැනයි සඳහන් කළේ. බොහෝ වෙලාවට දේශගුණික විපර්යාස සම්බන්ධව ලෝකයේ රටවලට ආධාර කරන්න වෙනත් මූල්‍ය ආයතනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසායි මේ කාරණය මම යෝජනා කළේ. නැවත වතාවක් සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා, මම ගෙනාපු යෝජනාව ස්ථිර කර එයට අවශ්‍ය කරන ශක්තිය ලබා දීම සම්බන්ධයෙන්.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.53ට, 2025 ඔක්තෝබර් 22වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.53 மணிக்கு, பாராளுமன்றம் 2025 ஒக்ரோபர் 22, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.53 p.m. until 9.30 a.m. on Wednesday, 22nd October, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.